

භද්‍රශ්‍රී
මහින්ද ජයතිලක

# බෝදිලිමාගේ ශාපය

සර්වෝදය විශ්ව ලේඛා ප්‍රකාශනයක්

Downloaded from sin... ooks.com

''කවුදෝ ඉදිරියෙන් ඇවිද යනු යන්තමට පෙනිණි. සෙමින් ගමන් කරන කුඩා රුවකි. සුදු සාරියක් දවටා ගත් ගැහැනියකි. ඇගේ අතක පන් මල්ලකි. මේ රෑ පාවිට තනියම ගැහැනියක් කොහේ යනවාද? මගේ සිත අදි මදි කරන්නට විය. ඇයව පසුකර යනවාද? නැත්නම් ඇයට යන්නට හැර හෙමින් යනවාද?

ඉදිරියෙන් යන රුව ඉතාම සෙමිනි ගමන් ගත්තේ. හිත දැඩි කරගත් මම ඒ අතට විදුලි පන්දම යොමු කරමින් වන්නක් වේවායි අඩිය ඉක්මන් කළෙමි.

ගැහැනියක් තමා. මැදිවියට ළංවූ ගැහැනියක් .

''තව පොඩ්ඩ දුරයි මහත්තයා''

මා යමක් කියන්නටත් පෙර ඇ කතා කළාය.

''කොහේ යනවද?''

''අර කන්දට''

''මං තව ටිකක් දුර යන්න ඕනැ. තෙමෙනවනෙ...

එන්න කුඩේ යටට.''

''අනේ පින් සිද්ධ වෙනව මහත්තයා''

ඇ කුඩයේ සෙවනට ආවාය.

''කොහේ ගියාද?''

''නුවර ගියා නංගි බලාලා එන්ඩ. පැනිදෙනියෙ. සනීප මදි. මහත්තය ඉතින් පරිස්සමෙන් යන්න. මං මෙතනින් උඩහට යනවා.''

''ඔය අහ ගෙවල් තියෙනවයැ.''

''මොකෝ නැත්තෙ මහත්තයා?'' ඇ බොල් හඬින් සිනාසුණාය.

එක්වනම ඇ කුඩයේ සෙවනෙන් ඇත්ව දකුණට වූ කන්ද නගින්නට වූවාය. ඇ නැංගා නොව පියෑඹුවා කියායි මට සිතුණේ. එතරම්ම කඩිනමකින් ඇ මානා පඳුරු අතරින් උඩට නැංගාය.

මම ඒ අතට විදුලි පන්දම යොමු කෙළෙමි. කන්ද මදක් දුර තවත් කවුදෝ බලා සිටී. ඔහු කළු කුඩයක් ඉහළාගෙන සිටින බව පෙනිණි. ගැහැනිය ඒ කුඩය යටට රිංගුවාය.

ඊළඟ මොහොතේ මට කවුදෝ සිනාසෙන්නාක් සේ ඇසිණි.

සිතේ බියක් මතුවෙන්නට විය. ඉතිපිසෝ ගාථාව මුමුණමින් මම දුවන්නට වුණෙමි.

Downloaded from sinhalaebooks.com

## හඳුපී වෙනත් නිර්මාණ

---

සුදු හංසයෝ ඉගිල ගියහ
දිය රැලි නිහඬයි
වැහි දවස
කහලුගල අන්දරය
උලමගෙ රාත්‍රිය
දෝන ලුවීසා සාධනිගේ කථාවෙන් කොටසකි
*(ඩී. ආර්. විජේවර්ධන සම්මාන ගෞරවණීය සඳහන්)*
සුරදූත පුර
හංස ගීතය
කුරුළු තලාව
සමුද්‍රසිරි
ඉසංකාගේ ලෝකය
හන්තානයි පුරාහඳයි
චිත්‍රපටිය - දශකයක ලියූ කෙටිකතා
වෙස්සන්තර සිද්ධිය සහ තවත් කතා
පරෙවි පොකුණ
සක්වල වහල්ලු
දොඹගල නිධානය
තුන්වන ලෝකයේ මාකෝපෝලෝලා
රූපවාහිනී සටහන්
සඳ වියරුව
පෙරදිග පහන (LIGHT OF ASIA TRANSLATION)
වැව් ඉස්මත්ත
ගිනි සහ සෙව්වන්දි
ශ්‍රී රාවණ්ණා පුවත
සැන්දරසං ඇත්තෝ
සංකර දූවරු
පවුරු බැඳි රාජ්‍යය (WINNER OF D. R. WIJEWARDANE
AWARD FOR BEST UNPUBLISHED NOVEL 1996)
නන්දනීගේ ස්වයංවරය
**HOTEL MADHU & OTHERS STORIES (English Edition)**
அநாதியான தேசாந்திரிகள்

Downloaded from sinhalaebooks.com

# හදුපී

මහින්ද ජයතිලක

1995 ඩී. ආර්. විජයවර්ධන සම්මාන
දිනූ නවකතාකරුගේ අලුත් ම නවකතාව

# බෝදිලිමාගේ සාපය

භයානක රසය දනවන
නවකතා ත්‍රිත්වයක දෙවැන්න

විශ්ව ලේඛා
ප්‍රකාශකයෝ

41 ලුම්බිණි මාවත රත්මලාන
1999

Downloaded from sinhalaebooks.com

පළමුවන මුද්‍රණය: 1999
© හදුප් මහින්ද ජයතිලක
ISBN 955-599-135-9

---

මෙම නවකතාවෙහි සියලු හිමිකම් ඇවිරිණි

විද්‍යුත් - ඉලෙක්ට්‍රෝනික හෝ අන් කවරාකාර මාධ්‍ය සඳහා
මෙම කෘතිය ප්‍රති නිර්මාණයට
කර්තෘගේ ලිඛිත අවසරය ලබා ගත යුතුය
මේ සම්බන්ධ විමසීම් සර්වෝදය විශ්ව ලේඛා ප්‍රකාශකයෝ
වෙත එවිය යුතුය

---

විශ්ව ලේඛා

41 ලුම්බිණි මාවත රත්මලාන

ග්‍රන්ථ නිෂ්පාදන සැලසුම: පී වික්‍රමගේ
පිටපත් සංස්කාරක: ඩබ්ලිව්. කේ. ඩී. නවරත්න

Downloaded from sinhalaebooks.com

## - පිළිගැන්වීම -

*දුරැ රටක හිඳ මගේ*
*සාහිත්‍ය කරණයට උවදෙස්*
*අදහස්*
*දෙන තිදෙනෙකුට*

චන්ද්‍රසිරි සේනාධීර
ලොකුබංඩා තිලකරත්න
ආනන්ද මාකලන්ද

සොහොයුරන්ට
අදරින් පිරිනමමි

**හදුපී**

Downloaded from sinhalaebooks.com

# BŌDILIMAGĒ SEPAYA

"THE CURSE OF THE CHAMELEON ELF"
THE SECOND NOVEL OF A HORROR TRILOGY

*BY BHADRAJI MAHINDA JAYATILAKA*
WINNER OF THE
D.R. WIJEWARDANE AWARD (1995)
FOR BEST NOVEL

*A SARVODAYA VISHVA LEKHA PUBLICATION*
*RATMALANA: SRI LANKA 1999*

සිංහල
EBOOKS

සිංහල නවකතා 1000කට අධික ප්‍රමාණයක් නොමිලේ
Ebook ආකාරයෙන් කියවන්න...
දැන්ම www.sinhalaebooks.com වෙත පිවිසෙන්න..

Downloaded from sinhalaebooks.com

## පෙරවදන

*සඳ වියරුව, බෝදිලිමාගේ සාපය සහ දුර කඳු මත අකුණු* නමින් භයානක රස දනවන නව කතා ත්‍රිත්වයක් ලියන්නට මම අදහස් කළෙමි. මේ කතා තුන එකට යා කරන්නේ චරිත නොවේ. භයානක රසයයි. නමුත් කතා තුනෙහි භය දනවන ආකාරය එකින් එක වෙනස්ය. මා කලකට ඉහත ලියූ “උලමගෙ රාත්‍රිය” නම් නවකතාවට ලද පාඨක ප්‍රතිචාර නිසාය, මෙසේ තවත් කතා තුනක් ලියන්නට පෙළඹුණේ.

බෝදිලිමාගේ සාපයෙන් ද ඔබ ඒ රසය නොඅඩුව ලබනු ඇතැයි සිතමි.

මෙය මුද්‍රණයෙන් ප්‍රකාශයට පත් කරන සර්වෝදය විශ්ව ලේඛා. ආයතනයටත්, එහි කළමනාකාර අධ්‍යක්ෂ සුසිරි ද සිල්වා මහත්මාටත් ස්තුතියි.

**හඳපී**

B.M. JAYATILAKA
633 SAN DIMAS ST
HEMET CA 92545
U.S.A

Downloaded from sinhalaebooks.com

# බෝදිලිමාගේ සාපය

හඳුපී මහින්ද ජයතිලක
ලියූ

භයානක රසය දනවන
නවකතා ත්‍රිත්වයේ දෙවැන්න

## 1

හබරවැව හන්දියේ අන්තිම බස්රියෙන් බැස්ස පසු මා ලීලාවතී මැණිකේගේ නවාතැන් පළ වෙත සැතපුම් තුන ගමන් ගත යුත්තේ පයිනි. හන්දියේ කඩ කීපයේත්, බැංකුවේත් විදුලි එළිය තිබුණ ද එතැනින් ඔබ්බේ මා යන මඟ තොටේ විදුලි පහන් නොමැත.

මුල්ම සතියේ මා බැංකුවේ රැකියාව කළේ සිතකින් නොවේ. කොළඹ ගොස් ගෙදර දවසක් ගත කොට, අම්මා උයා දෙන බත් වේලක් රස කරමින් කා, හවස් වරුවක රුවිනී දැක ගන්නට යෑම ගැන මම සිහින මැව්වෙමි. මුල් සතියේ සිකුරාදා සවස වැඩ අවසන් කළ සැණින් මා කළේ කොළඹ–ගෙදර යාමයි. සෙනසුරාදා හවස රුවිනී දැක කතාබස් කරන්නට ද මට අවස්ථාව සැලැසිණි. “ඔය රස්සාව හම්බු වෙච්චි එකේ අමාරුවෙන් දුක් විඳගෙන හරි ඔහොම දුර බ්‍රාන්ච් එකක අවුරුද්දක් වැඩ කරල මාරුව හදාගන්න, අනේ! ”යැයි රුවිනී මට කීවාය. “මුලින්ම හම්බ උන රස්සාව. එපා කියන්නද? කී දෙනෙක් මේ රස්සාවට වලි කනවද?” ඈ කී නොයෙකුත් වදන් තවමත් මා සිත හොල්මන් කළේය. දුක් විඳගෙන හරි හබරවැව අවුරුද්දක් ගත කරනවා යැයි මම ඉටා ගතිමි.

හබරවැව කුඩා ගමකි. නුවර බදුලු පාරේ විශ්ව විද්‍යාල භූමිය පසුකොට සැතපුම් විස්සක් තරම දුර යද්දී හබරවැවට යන අතුරුපාර වමතට මුණ ගැසේ. වරින් වර මහවැලියේ අතුගඟක රළ රභනු හබරවැව පාරේ ගමන් කරන්නෙකුට පෙනෙන්නේය.

Downloaded from sinhalaebooks.com

අවසන් බස් රථය අඳුර කපා ගෙන කඳු වංගු නඟිමින් බසිමින් හබරවැව හන්දියට එන්නේ රාත්‍රී දහයට පමණය. මේ රියේ යම් යම් ප්‍රමාද දෝෂයන් නිසා මා බසයෙන් බසින විට රාත්‍රී දහයමාරට පමණ විය.

හන්දිය සියල්ල නිදා ගත්තාක් වැන්න. දිනසිරි හෝටලයේ දොර පළු දෙකක් පමණක් ඇර තිබිණි. ඒ දෙසින් යන්තමට ගුවන් විදුලියක චුරු චුරුවක් ඇසිණි. පාරෙහි තැන තැන අලස ලෙස වැතිර ගත් බල්ලෝ හාමතෙන්දෝ මා ගැන තැකීමක් නොකරති. බස්රියෙන් බැස්ස කීප දෙනා කොහේ ගොස් සැඟවුණාදැයි නැත. බස් රියැදුරාද, කොන්දොස්තර ද හෝටලයෙන් තේ එකක් බී පෙරළා නුවර'තට යන්නෝය. මම තනිවම ලීලාවතී මැණිකේගේ ගෙදර අතට ඇවිද එන්නට වුණෙමි.

රාත්‍රී අහසේ නියපොත්තක් වැනි සඳකි. එහෙත් මෙහෙත් වලාකුළෙන් එබිකම් පානා තරු කැටවල ද නියපොතු සඳෙහි ද ආලෝකයක් ඇත්නම් එය අහසේම නතර වුනා සේය. මහ දෙපසම උස ගස්වැල්ය. යෝධ අඳුරු අවතාරය.

මම ගමන් මල්ලෙන් ගත් විදුලි පන්දම දල්වා ගතිමි. මගේ සිතෙහි එතරම් බියක් නැත. රාත්‍රියෙහි තනිව ගමන් කොට මට නොපුරුදුවා නොවේ. පාසලෙන් අස්වූ පසු මම නාට්‍යවල රඟපෑමට ගියෙමි. බොහෝ රාත්‍රියක නාට්‍ය රංගනයක් අවසන් වී මා ගෙදර එන්නේ ඌ දෙගොඩ හරියේය. සමහර රාත්‍රියක නුගේගොඩින් අන්තිම බස්රියකින් බැස්ස පසු මිරිහානට ඉතිරි දුර මා ගමන් ගෙන ඇත්තේ තනිවම පයිනි. ඉතා ඉක්මනින් අඩි තබන මට සිතේ බියක් ඇති නොවන්නේ ද නොවේ. ඈත යමෙක් ඇවිද යනු දකින මට ඒ හොල්මනක්දැයි සිතේ. එහෙත් මඳ වේලාවකින් ඒ චකිතය සිඳී යන්නේය.

මේ රාත්‍රියේ ද මා තුළ අඳුර පිළිබඳ බියක් නම් නොවීය. මගේ වමතට පාරෙන් පහත බෑවුමේ ලඳු කැලෑ අතරින් වරින් වර පෙනුණේ ගලා බසින ගංගාවේ දිය රළ රිදීයෙන් දිලිසෙන ආකාරයයි. මෙපිටින් නැඟුණු යෝධ උණ පඳුරුවල බඳ රිකිලි සුළඟට ඇඹරෙමින් කෙඳිරිලි හඬ නැඟූ අතර කොළ අතු සර සර නද නැඟීය. දකුණතට වූ කන්දේ මානා පඳුරු පෙනුණේ යන්තමටය.



Downloaded from sinhalaebooks.com

මෙසේ මඳ දුරක් ආ මට ගස් අතු අතරින් අමුතු ගඳක් නැඟ එනු දැනුණි. මේ ගඳ මා මීට පෙරද විඳ ඇත්තෙමි. ඇතැමෙක් එය හඳුන්වන්නේ පෙරේත ගඳ යනුවෙනි. මළ හෝන්තු ගඳක් යැයි ඇතැම්හු කියති. මා තර්ක කළේ මෙය රාත්‍රි කාලයට ගස්වැල්වලින් නිතැතින්ම නැඟෙන ගඳක් කියායි.

තවත් මඳක් තැන් යද්දී මේ ගඳ අතුරුදන් විය. මම විදුලි පන්දමේ එළිය ගස්වැල්වලට ද එල්ල කළෙමි. අතු අතර සිටි වවුලෙක් සට සට ගා පියාපත් සලා ඉහළට ඉගිලෙනු මට පෙනුණි. හැම චලනයකටම හේතුවක් ඇතැයි සිතුණෙන් මා මුවඟට සිනහවක් ද නැඟිණි.

මඳක් දුර ආ මට දකුණු පස කන්ද උඩින් ගැඹුරු කට හඬක් ඇසෙන්නට විය.

"මා ........" කියමින් නැඟුණු අදෝනා හඬක් බඳු ඒ හඬ මා ගත හිරිගඬු නංවමින් හද කීරි ගැස්විය. මම සිටිතැනම නතර වුණෙමි.

"මා...... විල වෙලේ මානා කොක් රඟන්නේ...... " සුළඟේ ඇදී ආවේ කන්ද උඩ අතු පැලක තනිවූ ගැමියකුගේ කට හඬයි.

මමද ඒ අනුව හඬ නඟා ගී හඬක් නැඟුවෙමි. මෙයින් පසු ගමන පහසු විය. මම මහක් දුර සිවුරුවම් කරමින් ආවෙමි. ගැමියාගේ කවි හඬ ඈත අඳුරේ තුනී වී නැසී ගියේය.

ගස් අතු සොලවමින් සුළඟ නඟන කෙඳිරිය පමණි මා අවට වූයේ. සීත මීදුමක් කෙමෙන් පරිසරය වසා ගති. එක්වනම මා ඉදිරියෙන් ම කුඩා අඳුරු සතකු දුව යන්නාක් සේය මට පෙනුණේ. මොහොතකට මම තිගැස්සුණෙමි. ඉත්තෑවකු, හෝතඹුවකු හෝ ඌරු මීයකු විය යුතු යැයි සිත හදාගත් මම අඩිය ඉක්මන් කළෙමි... යළිත් යමෙක් පය හැපුනෙන් මම පසෙකට පැන්නෙමි. මේ මොහොතේ මා අතවූ විදුලි පන්දම අතින් ගිලිහී වමතට වූ පල්ලමට වැටුණි. ගහ අතට පෙරළී ගිය එය මොහොතකට එළිය දහරක් විහිදුවා නිවී ගියේය. එය වැටුණ තැන පෙනුණ ද දැන් පැතිරුණ අඳුරෙන් මට හරිහැටි තැනක් සොයා ගත නොහැකිවිය. බෑගය කරේ ලා ගත් ගමන් බිමට පහත් වුණු මම මඳක් පල්ලමට යමින් අඳුරේම තණ පඳුරු අතගාන්නට වුණෙමි. තෙතමනයෙන් යුතු උස් තණ පඳුරු මා තුළ ඇති කළේ හිරිකිතයකි. පිනි පොද මා අත්ල ගැටෙද්දී , මා අතැඟිලි



Downloaded from sinhalaebooks.com

වැදුන සීතල විදුලි පන්දම තවත් පහළට පෙරළී ගියේය. සිත යටින් සාප කරමින්, විදුලි පන්දම පණ ඇති දඟකාරයකු සේ සලකා එයට කථා කරමින් මම තව මඳක් පහතට ඇවිද යන්නට අඩිය තැබුවා පමණයි. පය තැබූ තැන බිම සිදුරක් වූවා සේ පය පැකිළී මම තවත් පහළට තල්ලු වී ගියෙමි.

මෙවර මම උමතු වූවෙකු මෙන් අඳුරු තෙත් තණ බිම අතපත ගාන්නට වුණෙමි. විදුලි පන්දම කොතැනද? එය ඇති තැනක තිබෙන්නට හැර අඳුරේම නවාතැනට ගොස් හෙට දින හිරු පායා ආ පසු ඇවිත් එය සොයා ගන්නට ද නොසිතුණා නොවේ. මේ මොහොතේ මා අතැඟිලිවල යම්කිසි දියාරු සෙවල දෙයක් ගැටිණි. ජුගුප්සාවෙන් ඇදගත් අත මම සිඹ බැලුවෙමි. එයින් නැඟුණු වසුරු ගඳ මා තුළ ඔක්කාරය නංවන සුළුවිය.

"චීඃ" කියූ මම වෙන තැනක තණ ගොල්ලේ අත පිස දැමුවෙමි. වාසනාවට මෙවර මගේ අතට නොසිතාම, නොදැනීම විදුලි පන්දමේ යකඩ සීතලය දැනුණි. එය අතට ගත්තද දැන් එහි ආලෝකයක් නම් නොවීය. අඳුර අතරින් "චීඃ චීඃ චීඃ" කියන මූසික හඬක් ඇසිණි.

බිය මැඩගත් මම විදුලි පන්දමත් අතින් ගෙන – ආලෝකය නොමැති විදුලි පන්දම තවමත් දුගඳ හමන අතින් ගෙන – පාරට ගොඩ වුනෙමි. තියපොත්තක් වැනි සඳ අහසට මුදුන්ව බලා සිටියේය. මගේ මහ එළිය කළේ එය පමණි.

මඳක් දුර ගමන් ගත් මම මගේ වමතින්වූ බෑවුම දෙස බැලුවෙමි. මීදුම කැටිවෙන ගස්වැල් අතරින් ගඟ දිය යත්තමට පෙනිණි. එයින් මෙපිට මා නෙත ගැටුණේ දිලිසෙන විශාල දෑසකි. ඒ දෑස මිනිස් දෑසක් නම් නොවීය. බෝතල අඩි මෙන් රවුම් වූ කොළ පැහැ දිලිසෙන කඳුළු බර දෑසකි.

උණ හපුලුවෙක් යැයි සිත හදාගත් මා ඉතිරි මහ ආවේ දුවන දෙපයිනි.

මා ලීලාවතී මැණිකේගේ ගෙදරට ළං වන විට එහි සාලයේ චිමිනි ලාම්පුව දැල් වෙමින් තිබුණි.



Downloaded from sinhalaebooks.com

# 2

"අපි මේ බලන් හිටියා අයියා එනකල්" ඉස්තෝප්පුවේ අඩ අඳුරේ බලා සිටි අමරසිරි බංඩාරගේ කට හඬ මම හැඳින්නෙමි.

දහනව හැවිරිදි අමරසිරි බංඩාර, ලීලාවතී මැණිකේගේ එකම පුතායි. ඔහු ළඟම බලා සිටියේ නැඟණිය – එකොළොස් හැවිරිදි නයනායි.

"අනේ ජනකයියා එනකල් මං බයේ හිටියා" ඈ කීවාය. "මට හරියට කන්නත් බැරිවුණා."

"ඔන්න අම්මා බත් පංගුවකුත් බෙදලා වහලා තිබ්බා." අමරසිරි බණ්ඩාර හිඳ සිටි කෙටි බිත්තියෙන් මිදුලට පැන මා අතවූ මල්ල උදුරා ගත්තේය. "මොකද්ද අයියෙ මේ ගඳ?"

"මහදී එද්දී හරි වැඩක් උනා මල්ලියෙ. ඔක්කොටම ඉස්සෙල්ලා අතපය සෝද ගන්න ඕනැ" කියමින් මම ඉස්තෝප්පුවට ගොඩ වුණෙමි.

"මොකද්ද උනේ කියන්නකො ජනකයියා?" මා ළඟට ආ නයනා "හැබැට ගඳ නං තමා උරුලෑවෙක් වගේ"යි කීවාය.

"මගේ අතේ තිබුණ ටෝච් එක වැටුණා. ඒක අහුලන්න බැවුමේ තණ ගොල්ලෙ අතගෑවා. මොකක්ද ජරාවක් අතේ ගෑවුණා. දැන් ගඳයි."

Downloaded from sinhalaebooks.com

"ඉතිං ටෝච් එක හම්බ උනාද අයියා ?"

"ඒක හම්බ උනා. මේං. දැන් ඒක පත්තු වෙන්නෙත් නෑ."

"කෝ දෙන්න මට බලන්න" අමරසිරි බංඩාර විදුලි පන්දම ගනිද්දී අපේ කතා බහ අසමින් ගෙතුලේ සිටි ලීලාවතී මැණිකේත්, ඇගේ ලොකු දුවණිය වජිරාත් ඉස්තෝප්පුවට ආහ.

විසිතුන් හැවිරිදි වජිරා පසුගිය සතිය තුළ මා දුටුවේ එතරම් කතා නොකරන විළියෙන් පිරි තරුණියක ලෙසිණි. එහෙත් අද රාත්‍රී මා මුහුණපෑ අත්දැකීම ඇසූ ඇ පෙර කිසි දිනෙක නොවූ විලස දොඩමලු වුණාය. "ජනකට තියෙන්නෙ කොළඹ යනකොට හන්දියට බයිසිකලේකින් යන්න. එතකොට රෑ ආපහු එනකොට ඒකෙ එතැකි" ඈ යෝජනා කළාය.

"ඒකට ඉතිං බයිසිකල් එකක් ගන්න එපෑ නේද අයියෙ?" නයනා තර්කයක් ගෙනාවාය.

"කොයි හරියෙ ද ජනක පුතේ ඕක උණේ?"

ලීලාවතී මැණිකේ ඉස්තෝප්පුවේ අත් පුටුවකට බර දුන්නාය.

"වංගුව පහුකළාට පස්සෙ දකුණු අත පැත්තෙ කන්දක් තියෙන්නෙ, ඕං එතැන්දි. මට එතන උඩහ පැලකින් කවුදෝ කවියක් කියනවත් ඇහුණා," මා ඒ කී පසු මොහොතකට හැම තැන වුයේ නිහැඩියාවකි.

"ඔය කියන තැන කොයින් ද පැලක්?" ලීලාවතී මැණිකේ හඬ බර කොට කීවාය. "කලකට ඉස්සර නම් බක්කා ඔතන පැල් රැක්කා. අවුරුදු ගාණකට ඉස්සර. ඒ පැල ගිනි ගත්තා නෙව..."

"එහෙනං අයියට තැන වැරදිලා, ඊට එහා වෙන්න ඇති" අමරසිරි බංඩාර හේතුවක් සෙවීය.

"බක්කගෙ අවතාරයක් තියෙනව කියනවනෙ" වජිරා දෑත ළමැද හරහා බැඳ අත්තල වලින් උඩු අත්ගොබ පිරිමැද ගත්තාය. "මේන් බලන්න මගේ ඇඟේ හිරි ගඬු පිපුණා."

"කවුද බක්කා කියන්නෙ?" මම විමසිලිමත් වුනෙමි.

"බක්කා කියන්නෙ මේ ගමේ හිටි මහ විසාල මිනිහෙක්." අමරසිරි බංඩාර කතාව පටන් ගනිත්ම "සේරටම ඉස්සරවෙලා අතපය සෝදා ගන්න ඕනෑ" යි කී මම ඇතුළු ගෙට ගියෙමි.



Downloaded from sinhalaebooks.com

ලීලාවතී මැණිකේ ද, වජිරා ද මා අනුව ආහ. අම්මාගේ ඇණවුමෙන් වජිරා කුස්සියේ වූ වතුර බාල්දියක් පිටුපස පිලේ වූ බේසමට වත් කළාය. ඈ මට සබන් කැටයක් ද, තුවායක් ද ගෙනවුත් දී "අයියා ඉතින් බය වෙන්න ඇති නේද? "යි ඇසුවාය.

මෙතෙක් මට ජනක යැයි ඇමැතූ ඈ මට අයියා යැයි කීවේ අලුත උපන් සමීපත්වයකින් නොවේද? ඇගේ දැසේ ද ඒ වග කියැවිණි. මා අද රාත්‍රියේ මුහුණ දුන් බියකරු සිදුවීම නිසා ඈ මා හඳුනා මට සමීප වූවා සේය.

"මට ඒ තරං බයක් දැනුනෙ නැ නංගී"

"අයියා රෑ පානෙ තනියෙම්ම එන එක ගැන මං හිතුවා. අප්පච්චිට අමාරු වෙච්ච වෙලාවක මටයි, මල්ලිටයි සැරයක් දුවන්න උනා හන්දියට. අපි දෙන්නා එක පිම්මේ දුවල ගියේ." මෙසේ කී ඈ බාල්දියෙන් ජෝග්ගුවකට පිරවූ වතුර මගේ දැතට වත් කළාය.

"අනේ, අත් දෙක ගඳ නම් තමා. අත් දෙක සෝදාගෙන ඉන්නකෝ, බේසමට දාන්ඩ කලින්. කහළ ගොඩේ ලැගල ඇවිල්ලා." ඈ දැන් කතා කළේ මවක දරුවකුට කතා කරන දයා කරුණාවකිනි.

මෙයින් පසු මම මුහුණ සෝදන්නට වූනෙමි. බේසමෙන් හිස ඔසවා බලන විට වජිරා පෙනෙන අසලක නොවීය. ඈ පිලේ මිටි බංකුව මත තබා ගිය තුවායෙන් මුහුණ පිසදාගත් මම කෑම මේසය වෙතට ගියෙමි. ඇතුළු කාමරයක අක්ක නගෝ පහත් හඬින් කතා කරනු ඇසිණි. ලීලාවතී මැණිකේ මගේ බත් පිඟාන හැර දුන්නාය. බතුත් පොළොස් ඇඹුලත්, පරිප්පු ටිකත්, මගේ කුසගින්න අලුත් කළේය. මා කෑම අරඹත්ම, "පුතා රෑ එනකොට පරිස්සමෙන්" කී ලීලාවතී මැණිකේ ද මා තනිකොට ඉවත්ව ගියාය.

මා මඳක් බියවූ බව සැබැය. එහෙත් දැන්නම් මා සිතට කිසිදු බියක් නොවීය. මම හිතේ හැටියට කැකුළු බතුත්, ව්‍යංජනත් කැවෙමි. වෙනදාට මා රෑ කෑම කන්නේ අමරසිරි බංඩාර සමගයි. අද ඔහුත් පෙනෙන අහලක නොවීය. රෑ වූ නිසා යැයි මම සිතුවෙමි.

ඔවුන් නිදාගන්නා වේලාවත් පසුවෙලාය. ඔවුන් මෙතෙක් අවදිව සිටියේ මා එනතුරුය. දැන් හැම දෙනාටම සැනසිල්ලේ නිදාගත හැකි නොවේ දැයි මට සිතිණි. ඇතුළු කාමරයේ කෙල්ලන් දෙදෙනා දැන්



Downloaded from sinhalaebooks.com

නිහඬය. මුළුතැන් ගෙයින් ඇසෙන්නේ ලීලාවතී මැණිකේ එහි අස්පස් කරන හඬය. මා කා අහවරවී අත සෝදා ගෙන ආලින්දය අතට එනවිට සාලයේ දකුණතට වූ කාමරයෙන් අමරසිරි බංඩාර පිටතට ආවේය.

"මට නිදාගන්න බෑ අයියා.... අර කතාවට බය හිතෙනවා."

"මොන කතාවද?"

මා අනුව ඔහු ඉස්තෝප්පුවට ආ හෙයින් මම ද මගේ කාමරයට නොයා නැවතුණෙමි. මා නිදා ගත්තේ ඉදිරි කාමරයේයි. එහි දොර හැරුණේ ඉස්තෝප්පුවටයි. වෙනදා නම් රාත්‍රි කෑමෙන් පසු අමරසිරි බංඩාර මද වේලාවක් කතා බහක පැටලෙන්නේ මගේ කාමරයට විත් ඇඳ කෙළවරක හිඳගෙනය. අද ඔහු ඉස්තෝප්පුවෙන් ගෙතුළට යන ප්‍රධාන දොර ළඟ නතරවුනේ "බක්කගෙ කතාවට මට බය හිතුණ" කියමිනි. "අයියා දන්නෙ නැනෙ ඒ මිනිහගෙ පැල ගිනි ගත්තා. ඊළඟට මිනිහාට පිස්සු වැටිලා ගඟට පැන්නා. ඔය සේරම වුනේ බක්කගෙ ගෑනි ළමයෙක් වදන්න ගිහින් මැරුණට පස්සෙ."

"ඒ කොච්චර කල්ද?"

"දැන් අවුරුදු ගාණක් උනා අයියෙ. මම පොඩි දවස්වල. බක්කගෙ ගෑනි සිසිලින් මැරුණට පස්සෙත් මං හරි හරි කතා ඇහුවා."

හදිසියේම දොරකඩ මුහුණක් මතුවිය. අමරසිරි බංඩාර තිගැස්සුණේය. "අම්මා! මං බය උන තරම."

ලීලාවතී මැණිකේ ගෙයි තිබූ චිමිනි ලාම්පුව මා අතට දෙමින් "ඔන්න ඔය කතාව නවත්තල පුතාල නිදගන්නකො" යි කීවාය.

"දැන් මොකටද ඔය හොල්මන් කතා කරන්නෙ.? "

"මං අයියට පස්සෙ කියන්නංකො" රහසින් මෙන් කී අමරසිරි බංඩාර අම්මාත් සමග ගෙට ගියේය.

මා චිමිනි ලාම්පුවත් ගෙන මගේ කාමරයට යන අතර මහදොර වැසෙන හඬ ඇසිණි. ලීලාවතී මැණිකේ පුතාට යමක් කීවාය. කාමරයට ආ මම දොර ඇතුළතින් වැසුවෙමි. මගේ ඇඳ තිබුණේ දොරෙත් වම්පස ඉදිරි බිත්තයේ කවුළුවට පහතිනි. දොරට මුහුණලූ එහා බිත්තියේද එවැනිම යකඩ කූරු සහිත කවුළුවක් විය. මේ



Downloaded from sinhalaebooks.com

මොහොතේ ජනෙල් දෙකම හැර දමලාය. පිටත අඳුර දැඩිය. සීතල සුළඟක් ද සර සර ගාන්නේය.

මගේ බෑග් මල්ල කාමරයට ගෙන ආවේ නයනා විය යුතුය. බෑගයෙන් ගත් සරම හැඳගන්නට කලින් මම දොරත්, ජනේලත් වසා දැමුවෙමි. ජනෙල් පියන් වසද්දී යන්තම් බියක් මා සිත තුළ උපණි. පිටත කවුරු හෝ ඇද්ද? අන්තිම ජනෙල් පියන වැසුණේ අපහසුවකිනි. එය අදින්නට අත පිටතට දමද්දී යමෙක් මගේ අතින් අල්ලන්නා සේය හැඟුණේ......එය නොහමනයෙන් යුතු සුළං පහරක්ම පමණක් වුවද මා හද වේගයෙන් ගැස්සිණි. ගත පුරා ඒ සීතල හිරිය දුව ගියේය. කවුළු පියන්පත වැසෙන්නට මොහොතකට කලින් එපිට අඳුරේ ගස්වැල් අතරේ දිලිසෙන දෑසක් පෙනුණාද? ඒ නැත්නම් ඒ කණ මැදිරියන් ද? මගේ මනසේ මැවුන මායාවක්ද?

සරම හැඳගත් මම පහන නිවා ඇඳෙහි ඇළවුනෙමි. පිටත හුම් හුම් හඬක් නැගෙන්නට විය. "බකමූණෙකැ"යි මම අනුමාන කළෙමි. සිහින් සිරි පොදයක් සුළඟකුත් සමග හමා ගියේය. මම හුම් හුම් හඬ අසමින් නින්දට වැටුණෙමි.

එහෙත් එය කෙටි නින්දක් විය. තවමත් ගත වෙහෙස දැනුණද මට ඇඳෙහි ඇළවී සිටීම අපහසු විය. මා අඳුරු පාර දිගේ ඇවිද එද්දී දැනුණ පෙරේත ගඳ දැන් මේ කාමරය තුළ විය. "ගස් ගඳ" යැයි මම සිතුවෙමි.

ඇයි මට නින්ද නොයන්නේ? ඇඳෙහි පෙරළෙමින් මම නොයෙක් දේ ගැන සිතුවෙමි. බක්කා.....සිසිලින්....බක්කාගේ හොල්මන.....උන පඳුරු අතර දිලිසුන දෑස කාගේද? උණ හපුළුවෙක්? හෝතඹුවෙක්? ඒ නැත්නම්...විකාර....මම රුවිනී ගැන සිතන්නට වුනෙමි.රුවිනී....මා ආදරණීය රුවිනී.....මම ඇගේ මුහුණ සිත මවා ගතිමි. මා ගත හැඟුමෙන් පුබුදුවන්නට විය. මුළු සිරුරම රත් යවටක් සේ රත්වෙයි. ඇඳෙහි නිදාගත නොහී මම එහි කෙළවරක හිඳ ගත්තෙමි. මගේ සිත කියන්නේ බිම හිඳ ගන්නයි. කිසිම හේතුවක් නැතිව මම ඇඳ අසලම බිම හිඳගත්තෙමි. මගේ සිරුර තවමත් රත් යවටකි. මගේ ඉඳුරන් පිබිදී ඇත්තේ වෙන කිසිදාක නොවූ විරූ අයුරකිනි. මහා බැම්මක් බැඳ සිර කරන ලද ගංගාවකි මා තුළ තෙරපෙන්නේ. සිමෙන්ති පොළවේ සීතල පහස විඳිමින් මම එහි වැතිරුණෙමි. මෙසේ බිම



Downloaded from sinhalaebooks.com

වැතිර ගත් මම දැඩි වෙහෙසින් වුවද, පිබිදුනු ඉඳුරන් ස්පර්ශ කළෙමි. රුවිනී – රුවිනී – මගේ දෑත කඩිනම් විය. බැමි බිඳ මහා දිය කඳක් පිටාර ගැලුවා සේය. මම වෙහෙසින් බිම වැතිර ගත් තැනම නින්දට වැටුණෙමි.

මා උදෑසන අවදිවූයේ ද ඒ අයුරෙන් බිම වැතිරුණ ගමන්මය.

මෙතරම් ඇඳක් තිබියදී මා එසේ බිම නිදාගත්තේ ඇයි? හේතුවක් නම් නොවීය.

මට ඉමහත් කෙඩෙත්තු ගතියක් දැනිණ. මුහුණ ඉදිමුණාක් මෙනි. කවුළුව හැරිය මම ඒ ළඟම එල්ලා තිබුණු කැඩපතට එබී බැලුවෙමි. මගේ දකුණු කම්මුල හරහා සීරීම් ලකුණු තුනක් විය. හරියටම කවුදෝ නියපොතු තුනකින් සූරා දැම්මාක් මෙනි. මිදුණු සිහින් ලේ පාරවල් එතරම් ගැඹුරක් නොවුවද මුළු මුහුණේම වූයේ ඉදිමුණු ස්වභාවයකි.

කැරපොත්තෙක් හෝ වෙනත් කුරුමිණි සතෙක් හෝ මගේ මුහුණ හරහා ඉරි අඳිමින් ඇවිද ගියාද? තද නින්දේ සිටි මට එය නොදැනෙන්නට ඇති.මේ හැරෙන්නට මේ සීරීම් ලකුණුවලට වෙන පිළිතුරක් නම් නොවීය.

මා දොර හැරගෙන ඉස්තෝප්පුවට යත්ම අමරසිරි බංඩාර මා එනතුරු බලා සිටියාක් මෙන් "අයියට පරක්කු වෙනව නේද?" යි ඇසීය.

"මට හරියට නින්ද ගියෙ නැහැ" තුවාය කර ලාගෙන ළිඳ ළඟට යමින් මම කීවෙමි.

කඩිනමින් නා හැඳ පැළඳ ගත් මම ලීලාවතී මැණිකේත්, වජිරාත් එක්ව පිළියෙල කළ පිට්ටුත්, කිරිහොදිත් ගිල දමා පාරට ආවෙමි. මා අනුව ආවේ සුදු යුනිපෝමයක් හැඳගත් නයනායි. මේ ගෙදරින් පාසලට යන්නේ නයනා පමණි. වජිරා පාසලෙන් අස්වී වසර කීපයකි. අමරසිරි බංඩාර දෙවැනි වතාවටත් උසස් පෙළ විභාගයට හිඳ දැන් ගෙදර කල් මරයි. අප්පච්චි මිය යාමෙන් තමාගේ ඉගෙනීම කඩාකප්පල් වීයැයි ඔහු කියන්නේ චෝදනාවක් ලෙසිනි.



Downloaded from sinhalaebooks.com

මාත් නයනාත් කන්ද බැස පාරට එනවිට අමරසිරි බංඩාර පාර අද්දර බලා සිටියේය.

"අයියා ගෙදර ආවම මං අර කතාව කියන්නංකෝ" ඔහු කීවේය.

නයනා හෝ ඔහු හෝ මගේ මුහුණේ සටහන්වූ සීරීම් සලකුණු නොදැකීම එක් අතකට සහනයක් විය. මා සිතූ තරමට සීරීම් දරුණු නොවන්නට ඇත. නයනාත්, මමත් මදක් දුරක් කතාබහක් නොකර හන්දිය අතට ආවෙමු. අප යන මහ. පාසල් යන දරු දැරියන් කීප දෙනකුද, රැකියා සඳහා යන කීපදෙනකුද දැකිය හැකි විය.

මගේ විදුලි පන්දම පෙරදා රාත්‍රියේ වැටුණ තැනට ළංවෙන්ම වමතට අත දිගු කළ නයනා "අයියෙ, පැල් කවි කියනව ඇහුණෙ අර කන්දෙන්ද?" යි ඇසුවාය.

"ඔව්"

"එතැන පැලක් නැහැ අයියෙ. අර බලන්න තිකං මානා පඳුරු වැවුණ කැලේ "

"ඇත්ත තමයි නංගියෙ."

"ඉතිං අයිය කොහොමද එතැනින් කවි අහන්නෙ?"

"සමහර විට කවුරු හරි කන්දෙ ඉන්න ඇති"

"ඒ මොන මළ සමයමකටද?"

මට පිළිතුරු නොමැති විය.

"අයිය මීට පස්සෙ රෑ එනකොට පරිස්සමෙන් එන්න. හොඳ අයියනෙ."

ඉන්පසු හන්දියට එනතෙක් අප අතර කතා බහක් නොවීය. නයනා පාසල අතට ගිය අතර මම බැංකුවට පිය නැඟුවෙමි.

මේ කුඩා බැංකු ශාඛාවේ සේවය කළේ සුළු පිරිසකි. කළමනාකරු සිරි ජයතුංග හැරෙන්නට මෙහි සිටියේ. අතුලත්, චිත්‍රාත්, අනෝමාත්, මාත්, කාර්යාල කාර්ය සහායකයන් වූ ජයසිරිත්, ටිකිරි බංඩාත්ය.

මගේ මුහුණේ සීරීම් සලකුණු මුලින්ම දුටුවේ ජයසිරිය. "මේ මොකෝ මහත්තය මූණ හූරගෙන?"



Downloaded from sinhalaebooks.com

ඔහුගේ විශ්ම පිරි කටහඬ අසමින් ටිකිරි බංඩා ද මා සිටි මේසය වෙතට ආවේය. "ඔව්මයි මහත්තයා, මේ මොකද? ඊයෙ රෑ කවුදෝ එක්ක මොනවද කරල තියෙනව."

තව ටිකකින් අනෝමා ද එතැනය. "ඇත්තට ජනක මේ මොකද?" මා මෙහි ආ දා පටන් ඇ මා හා ඉතා කුළුපගය. "කවුද අනේ ඔයාගෙ මූණ හීරුවෙ? ඔයාට කවුද ඉන්නව නේද?" අනෝමා උවමනාවටත් වඩා මිතුරු වෙන්නට තැත් කරතැයි මට කීපවතාවක්ම සිතුණි. ඈය මෙයට පෙර වතාවක මගේ පෙම් සබඳතා ගැන හාරා අවුස්සන්නට ආ විට ද මම ඇයව මඟ හැරියෙමි.

"ඊයෙ රෑ මොනවද උනේ අනේ?" ඈ යළිත් ඇසුවාය.

"මං දන්නෙ කොහොමද? ඊයෙ කොළඹින් මං ආපහු ආවෙ රෑ වෙලා. බෝඩිමට යන මහදිනං ඔන්න මොකෙද්ද පාර හරහට දිව්වා. ඊ ළඟට කවුද කවි කියනව ඇහුණා. මගේ අතේ තිබුණ ටෝච් එක පල්ලමේ වැටිලා හොයා ගන්න වෙලා ගියා. ..."

මා විස්තරය කියාගෙන යද්දී අනෙක් අය උවමනාවෙන් අසා සිටියහ. "අපේ බෝඩිමේ ගෙදර අය නං කියන්නෙ මං හොල්මනක් දැකලලු."

"ඔය කියන තැන බක්කගෙ හොල්මන තියෙනව කියනවනේ" ජයසිරි කීවේය.

"ඔව් බක්කගෙ කතාව මං ඇහුව." මම කීවෙමි. "ඒ උනාට මං ඇහැට දැක්කෙ නැතෙ. කවුද කවියක් කිව්ව වගේ ඇහුණෙ"

"අනේ මගේ ඇඟේ මයිල් කෙළින් හිටියා." අනෝමා ගත සලිත කළාය.

"මහත්තය ඕක බලා ඉන්න එපා. මොකක් හරි දිෂ්ටියක් මහත්තයට බැල්ම දාලා තියෙනවා." ටිකිරි බංඩා එසේ කියත්ම එහා මේසය වෙත හිඳ සිටි අතුල "මං දන්නව දිස්ටිය මොකද්ද කියා"යැයි හඬගා කියා සිනාසුණේය.

අනෝමාත් ඒ අනුව ජයසිරිත් ඉවතට ඇවිද ගියහ. ටිකිරි බංඩාද තවත් මඳ වේලාවක් දිස්ටි ගැන කතා කරමින් සිට වෙනතක ගියේය.



Downloaded from sinhalaebooks.com

"මහත්තය මොකක් හරි ආරස්සාවක් කරගන්නම ඕනැ. අඩුම තරමින් මහපිරිත් පොතවත් කොට්ටෙ යට තියාගන්න නිදාගන්න යනකොට." ටිකිරි බංඩා අන්තිමට කීවේ එයයි.

කළමනාකරු සිරි ජයතුංග කාර්යාලයට ආවේ මඳක් පමාවීය. එහෙත් අනෙක් අයගේ කතා බහ ඇසූ නිසාදෝ ඔහු මගේ මුහුණ දකින්නට නොපමාව පැමිණියේය.

"මේක නිකං දිස්ටියක් නෙමෙයි ජනක" ඔහු දැනුමැත්තෙකු සේ කිවේය. "ඔය වගේ හූරන්නෙ – බෝද්දිලිමා."

"බෝද්දිලිමා?"

"ජනක අහල නැතැයි බෝද්දිලිමා ගැන."

"අහල තියෙනවා. පෙරේත දිස්ටියක් නේද?"

"සමහරු නං කියන්නෙ. කටුස්සෙක් වගේ දිස්ටියක් කියල" සිරි තමා දන්නා දෙයක් විස්තර කළේය. "ඉස්සර මං පානදුර බ්‍රාන්ච් එකේ වැඩකරන කොට එතැන ක්ලාක් කෙනකුට ඔය වගේ වැඩක් වුණා. මිනිහගෙ මූණ විතරක් නෙමෙයි පිටෙත් ඉරි තුනක් හූරල තිබුණා. කීප රැයක්ම ඕක ඔය විදියට සිද්ධ උණා. අන්තිමේදී මන්තර මතුරල නූල් බැන්දා. ඊට පස්සෙ තමයි හරි ගියෙ."

"මං නං හිතන්නෙ මගෙ මූණෙ කැරපොත්තෙක් දුවන්න ඇති" මම ගණනක් නොගෙන කීවෙමි. "ආයෙත් උනොත් බලන්න බැරියැයි"

"මහත්තයගෙ මූණ නං ඒ හැටි හොඳ නැ" දවල් වරුවේද ටිකිරි බංඩා කීවේය. "අසනීප ගතියක් තියෙනවද?"

මා "නැහැ" යි කීව ද තවමත් මා ගතට කෙඩෙත්තු ගතිය දැනිණි. මා බලා සිටියේ කොයි වේලේ නවාතැනට යනවාද කියායි. හවස වැඩ ඇරුණ සැනින් මම ගෙදර බලා ආවෙමි.



Downloaded from sinhalaebooks.com

# 3

වජිරා සාදා දුන් තේ කෝප්පය බොමින් මා ආලින්දයේ හිඳ සිටිද්දීය, අමරසිරි බංඩාර කොහේදෝ ගමනක් ගොසින් විත් ගෙට ගොඩවූයේ. මා හිඳ සිටි තැනට මනාව හවස අව්ව වැටුණු හෙයින්දෝ ඔහු එක්වනම මගේ මුහුණේ වෙනස දුටුවේය.

"මේ මොකද අයියෙ මූණ හූරගෙන?"

"නෑ මොකුත් නෑ"

"මොකද නැත්තෙ?"

"මොකුත් නෑ මල්ලි." කතාව වෙනතකට හරවන්නට සිතූ මම "මල්ලි මොකද්ද ඊයෙ රෑ කතාවක් කියන්න ගියා නේද?" යි ඇසුවෙමි.

"මං කියන්න ගියෙ බක්කගෙ ගෑනි – සිසිලින් ගැන කතාව. මං එතකොට පොඩියි අයියෙ ඔන්න බක්කා කසාද බැඳල සිසිලින්ව ගමට කැන්දං ආවා. ලස්සන ගෑනියෙක්ලු! මට යන්තං වගේ මතක. ඔන්න එක ළමයෙක් හම්බ උනාලු. ඊළඟ ළමය වදන්න ගිහින් ඒ අහිංසක ගෑනි මැරුණා. මට මතකයි ඔන්න අපිත් යනව මිනියට පාර සරසන්න. එතකොට තමයි ඔය ගමේ ගෑනු කිව්වෙ. "පුතා පරිස්සං වෙලා ඉන්න දැන් ඔය දරුව වදන්න ගිහින් මැරුණ ගෑනි බෝඳිලිමෙක් වෙලා ඒවි කියලා."

Downloaded from sinhalaebooks.com

"බෝදිලිමෙන්?" මට ඉබේම කියැවිණි. සිරි පදහන් කළෙත් ඒ වචනයම නොවේද?

"බෝදිලිමා? මල්ලි මොනවද බෝදිලිම ගැන දන්නෙ?"

"ඔය ටික තමා. මං තව අහල තියෙනවා බෝදිලිමගෙ බඩ ලොකුයිලු. බඩදරු ගෑනියෙක් වගේ. ඇස් දෙක ලොකුවට කඳුළු පිරිලාලු. උණ හපුලුවෙකුගෙ වගේ. දරු දුකට රට අඬනවාලු. ළමයි ලැබෙන්න ගිහින් මැරෙන ගෑනුලු බෝදිලිමා වෙන්නෙ."

පසුගිය රාත්‍රියේ පාර අද්දර කැලේ මා දුටු දිලිසෙන දෑස මගේ මතකයේ මැවී ගියේය.

"අයිය ඊයෙ රෑ කතාව කියන කොටම මට හිතුණා......"

අපේ කතාවට බාධා කරමින් ලීලාවතී මැණිකේ ඇතුළු ගෙයින් ආවාය. "මොනවද ආයෙත් හොල්මන් කතා කරනවද පුතාල?"

"නෑ අම්මෙ මේ බලන්නකො අයියගෙ මූණෙ පහුරු ගාලා?"

"ඒ කවුද?"

"මං දන්නෙ නෑ අම්මෙ"

"කෝ බලන්න" මගේ මුහුණ බැලූ ලීලාවතී මැණිකේ චි; චි; ගා හුණු හඬක් නඟා "මේක නං හොඳ ලකුණක් නොවේ." යැයි කීවාය.

"අපේ මැනේජර් නං කියනවා මට බෝදිලිමගෙ දිස්ටියලු."

"ඇත්තට අයියා?"

"මං නං ඕව ගණන් ගන්නෙ නෑ"

"බලං ඉන්න එපා පුතා. දිගටම ඔය වගේ මොනව හරි උනොත් මොකක් හරි ආරස්සාවක් කරගමු." ලීලාවතී මැණිකේ තවත් මොනවාදෝ මුමුණමින් ගෙට යන්නට කලින් කීවාය.

තව මඳ වේලාවකින් වජිරා ගෙතුළින් ආවේ බෙහෙත් තෙල් බෝතලයකුත් රැගෙනය. "අයියෙ අම්මා කිව්වා මෙන්න මෙයින් ටිකක් ඔය මූණෙ ගාගන්න කියලා"

මා අකමැත්තෙන් වුව බොහෙත් තෙල කම්මුලේ උලා ගනිද්දී නයනා ද ඇතුළු කාමරයේ පාඩම නවත්වා ඉස්තෝප්පුවට ආවාය.

"මොකද්ද අයියෙ මූණට උනෙ?"



Downloaded from sinhalaebooks.com

''නෑ නංගි. මේ ඊයෙ රෑ කැරපොත්තෙක් කාලා''

''ඔයා ද කැරපොත්තව කැවෙ?'' නයනාගේ කතාවට සිනා නොඉ නොහැකිය. ''නැත්නං අයියෙ ඔයා ඊයෙ රෑ කාපු හැටියෙ නිදාගත්ත ගියානෙ. කටේ කෑම සුවඳට කැරපොත්තා එන්න ඇති.''

''වෙන්නත් ඇති නංගි''

''කොයිකටත් අයියා හොඳට දොර ජනෙල් වහලා නිදාගන්නකෝ.''

''අම්මා නම් කියන්නෙ. ආයෙ මොනව හරි උනොත් අයියා මොකක් හරි ආරක්ෂාවක් කර ගන්න ඕනෑ කියලා'' වජිරා කීවාය. ''කවුරු හරි හොඳ කට්ටාඩියෙක් අල්ලල නූලක් මතුරල...''

''අමරසිරි මල්ලි අපි යමු ද පාර දිහාවට?'' ඇගේ කතාවට බාධා කරමින් මම කීවෙමි. තවදුරටත් දිස්ටි මනස්ගාත කතාවලට සවන් දීමට මා තුළ කැමැත්තක් නොවීය.

''අයිය හිතනවද බෝදිලිමා අයියට කරදර කරනව කියල?'' පාරට ආ පසු අමරසිරි බංඩාර යළිත් කතාව ඉස්මතු කළේය.

''අනේ මල්ලි ඔත්න ඔය කතාව අල්ලල දාමු.''

''අයියට තව එකක් කියන්නං. බෝදිලිමා අඩන කොට ගෑනියෙක් දරුවො වදන්න ගිහින් අඬන සද්දෙලු.''

මා කතා නොකළෙන් අමරසිරි බංඩාර ද මඳකට නිහඬ විය. ඉන්පසු අප කතා කළේ පන්දු, පාපන්දු තරඟ ගැනත් ක්‍රීඩකයන් ගැනත්ය. අප ආපසු ආවේ ඉර බැස යද්දීය. මෙයින් පසු අපි ළිඳ වෙතට ගොස් ඇඟ සෝදා ගත්තෙමු. මුළුතැන්ගෙයි අම්මා සහ ලොකු දුවණියන් විසින් රෑ කෑම පිසිනු ලබන්නේ වෙනදා නැති නිහඬියාවකිනැයි මට සිතිණි.

කාමරයට ආපසු මම ගෙදරින් එනවිට ගෙන ආ නවකතාවක් කියවන්නට සිතා ඇඳෙහි ඇලවුණෙමි. පොත කොතෙක් කියෙව්වා දැයි මතක නැත. මා ඇස් හැරියේ අමරසිරි බංඩාර විත් දොරට තට්ටු කොට රෑ කෑම ලෑස්තිය කියද්දීය. මෙතෙක් ලද නින්දෙන් සුවයක් ද නව පණක් ද ලැබිණි.

රෑ කෑමෙන් පසු අපි හැමදෙනාම ආලින්දයේ අඩ අඳුරේ හිඳ මඳ වේලාවක් සතුටු සාමිචි කතාවේ යෙදුණෙමු. මා යම්කිසි අසාමාන්‍ය



Downloaded from sinhalaebooks.com

සිද්ධියකට පෙරදා රැයේ මුහුණ දුන්නා නම් ඒ ගැන කිසිවක් මේ මොහොතේ නම් කතා නොවීය. එහෙත් අප අතරවූ කතාබහ වැයමෙන් වූවක් යැයි මට හැඟුණි. ලීලාවති මැණිකේත්, වජිරාත් පිහන් වළං සෝදන්නට 'මුළුතැන්ගෙය'ට ගිය අතර, නයනා නිදාගන්නට කියා ගියාය.

තනිවූ ඇසිල්ලේ අමරසිරි බංඩාර යෝජනාවක් ගෙන ආවේය. "අයියෙ...." ඔහු කතා කළේ රහසෙනි. "අද රෑ යමුද බක්කගෙ පැල තිබුණ තැනට?"

මොහොතකට මම අවිශ්වාසයෙන් ද අතීරණයෙන් ද නිහඬවීමි. "මොකද අයියා කියන්නෙ යමුද?"

"මගෙ අකමැත්තක් නෑ ඒත්......"

"අයිය බයද?"

"මං මොකටද බය වෙන්නෙ? මටත් ඕනැ එතෙන්ට ගිහින් බලන්න. හිතේ සැක ඇරගන්න."

"ඒක තමයි මාත් හිතුවෙ. මොකද කියන්නෙ අයියෙ?"

"යමු යමු "

"මං රෑ ඇවිත් දොරට තට්ටු කරන්නංකො"

"ඕන නෑ මං දොර ඇරල තියන්නං."

"අම්මලට නින්ද ගියාට පස්සෙ මං එන්නං"

"දොළහට විතර?"

"ඊට ටිකක් කලින් යමු"

ගෙතුළින් ලීලාවතී මැණිකේ අඬ ගැසූ හෙයින් අමරසිරි බංඩාර එහි ගියේය. මම නිදන තියායෙන් ඇඳෙහි ඇළවුනෙමි. ගෙතුළ දොර කවුළු වැසෙන හඬ ඇසිණි. පිටත සිහින් සුළඟක් හැමීය.

සිතෙහි යම් කිසි බියක් ඇතිවුන ද තවත් අතකින් ඒ සිතම කියන්නේ සියල්ල මනෝ විකාර බවයි. ගඟේ ගැඹුර බලන්නට නම් ගඟට බැස පතුළටම පීනා බැලිය යුතු නොවේද? බිය පහකර ගන්නට නම් බියටම මුහුණ දිය යුතුය. බිය යනු කුමක්දැයි ඇසුවේ ධර්මපාල තුමාය. බිය යනු හැඟීමක්ම පමණක් නම් අප බිය විය යුත්තේ කුමටද? මෙවැනි තර්ක විතර්ක ඇඳෙහි ඇළවී සිටි මා මනස පුරා හොල්මන් කරන්නට විය.



Downloaded from sinhalaebooks.com

මා ඇසූ නොයෙකුත් අවතාර කතා මා හිතේ නැඟී එන්නට විය. ඇතැම්වා බොරු යැයි ඔප්පු වුන ඒවාය. ඒවා කියන්නන් කියූ පලියට හැමදෙනාමත් විශ්වාස කළා නම් අදත් ඒවා සැබෑ අවතාර කතාය. සියල්ල රඳන්නේ හිතේම නොවේද?

සාලයේ බිත්ති ඔරලෝසුවේ එකොළහක් වදිනු මම අසා සිටියෙමි. කාමරය දැන් අඳුරේය. පොප් පොප් ගෑ විමිනි ලාම්පුවේ දැල්ල ඒ ආචාරයත් සමග නිවී ගොසිනි.

මම ඇඳෙන් නැංගෙමි. මා සරම් ගැටය තද කොටගත්තේ කිසිවකුට – යකෙකුටවත් – බය නෑ කියන සිතුවිල්ලෙන් සිත දැඩි කොටගෙනය. ඇඳ ළඟම වූ කවුළුව මම සෙමින් හැරියෙමි. සීත සුළං පහරක් මුහුණ තෙත් කරන්නට මෙන් ඇතුළතටම ඇදිණි. ගස් අතු සර සර ගෑය. ඒ අතරේ කණා මැදිරි එළි කීපයක් නිවි නිවී පත්තුවෙනු පෙනිණි. නින්ද නම් මගෙන් ඉතා ඈත විය.

කවුදෝ පිටත බිම වියළි කොළ මත්තේ ඇවිද යන්නාක් වැනි කරස් කරස් හඬක් ඇසිණි. මොහොතකට හද ගැස්සුණද, ඒ අමරසිරි බංඩාර පිටුපස දොරෙන් වටෙන් එනවා වනැයි මම අනුමාන කළෙමි.

"මල්ලී!" මම රහසෙන් පිටතට මිමුණුවෙමි.

එහෙත් පෙනෙන මානයේ අඩ අඳුරේ නම් කිසිවකුත් නොවීය.

යළිත් හිතට බිය ඇතුළු වූයෙන් මම කඩිනමින් කවුළු පියන වසා කමිසය හැඳ ගත්තෙමි. විදුලි පන්දම අතට ගත්තෙමි. බියට මුහුණ දිය යුතුය. බිය යනු කුමක්ද? දෙපයට රබර් සෙරෙප්පු දෙක දමාගෙන දොර හැරගෙන මම අඳුරු ඉස්තෝප්පුවට ආවෙමි.

පෙරදා නියපොත්තක් වැනිවූ සඳ අද තව ටිකක් ලොකු මහත් වුවද එයින් විහිදෙන එළිය මළානිකය. ඉස්තෝප්පුවේ බිත්තිත් කුළුණුත් අළු පැහැයකි. පිටත සියල්ල සෙවණැලි අඳුරය; කොහේදෝ ඈතක බළලෙකු කෑවි ගෑ හඬ ඇසී නැසී ගියේය.

අර ගස් ගඳ යළිත් අවට දැනෙන්නට විය. ඒ අතරින් රෑහැයි හඬ ද නැඟී එන්නට විය.

"මං බය නැහැ" යි මටම කියාගත් මම විදුලිපන්දමේ එළිය වත්ත අතට හැරෙව්වෙමි. එළිය පලින් පල වැටෙද්දී එය මගේම හදවතේ ආලෝකයක් සේ ශක්තියක් මට දැනිණි.



Downloaded from sinhalaebooks.com

"ෂ්" ඒ හඬින් තිගැස්සී මා අතින් විදුලි පන්දම බිම වැටිණි. හද වේගවත් විය. "අයියෙ"

"මල්ලි!"

"බය වුනාද?"

"නෑ නෑ" මම විදුලිපන්දම අහුලා ගත්තෙමි. තද නිල් කමිසයත්, නිල් ඉරි සරමත් හැඳගත් අමරසිරි බංඩාර ඉස්තෝප්පුවට ගොඩ වී ළඟටම එනතෙක් මා දුටුවේ නෑ නොවැ? "බයවුනේ නෑ ගැස්සුණා"

"අපි යමු ද?"

"යමු"

"සේරම නිදි"

"මට ඉස්සෙල්ලා ඇහුණා කවුද එළියෙ ඇවිදිනව වගේ ඒකයි මං එළියට ආවෙ."

අප දෙදෙන කතා කළේ කුටු කුටුවෙනි.

"කවුද?"

"මං හිතුවෙ මල්ලි ඒ පැත්තෙන් ආවා කියලා."

"නෑ"

අපි එකිනෙකා මුහුණෙන් මුහුණ බලා ගත්තෙමු.

"අයියා මාව බය කරන්න හදනවා?"

"යමු යමු යන මඟුලෙ ගිහින් බලල එමු."

"අපි යන්නෙ බය නැහැ කියන්නනෙ."

මම විදුලි පන්දමෙන් මහ එළිය කළෙමි. අමරසිරි බංඩාර මට ඉස්සර වුණේය. වත්තෙන් පිටුවූ අපි මළානික එළියේ ඇවිද ගියෙමු. වත්ත පසු කළ පසු බය යන්නටත් එක්ක මම මහ හඬින් කතා කළෙමි.

"අපි මොකාටවත් බය වෙන්න ඕනැ නෑ මල්ලි, සේරම තියෙන්නෙ හිතේ."

"ඒක හරි අයියා"

"අඩේ – පීන පයෝදර චංචල නේත්‍රා දෑත දෙපා මේවා" මම සිහියට නැඟුණු පැරණි ගීතයක පද හඬ නඟා කිව්වෙමි. "තනි රත්තරනෙන් කළ පත්තිනි රූපෙක චිත්ති කියා පෑවා."



Downloaded from sinhalaebooks.com

"මොකද්ද අයියා සිංදුව? තව කියන්ඩකො"

"මම පුංචිම කාලෙදි උන්නා ලියක් මෙහි ඉන්දුමතී කියලා" මම මතක්වූ අනෙක් පදයක් ද හඬ නගා ගැයුවෙමි. "අනේ අත්තප්පා නෑ තව ඒ වගෙ ලස්සන ඇත්තියක් මම දැකලා"

"හාඃ හා" අමරසිරි බංඩාර ද දන්න තාලෙන් එකතුවුණේය.

පාර දෙපස කැලේය. ගෙවල් ඇත්නම් ඒවා අඳුරේය. හැම දෙනාම නින්දේය. දකුණතින් ගඟ ගලා යයි. වමතින් දැන් පෙනෙන්නේ කඳු ගැටයයි.

"ආන් අතනයි අයිය බක්කගෙ පැල තිබුනෙ. යමුද?" අමරසිරි බංඩාර වමතට අත දිගු කළේය.

"යමු මල්ලි යමු. මොන බක්කෙක්ටවත් මං බය නෑ දැන්."

ඉහළ මූකලාන්වලට මා අතවූ විදුලි පන්දමේ එළිය විහිදුණි. අහසේ සඳ පළුව හැරෙන්නට තාරකා කීපයක් අඳුර මැද දිස්විය.

මානා පඳුරු පීරාගෙන කන්ද නගින්ම මට හති ලැවුණි. අමරසිරි බංඩාර ද හති හලමින් බඩාගාගෙන මෙන් කඳුගැටය නගින්නට වූණේය. කැලැත්තුන පොඩිවුන මානා පඳුරින් නැඟි සුවඳ අප අවට හැම තැනම විය.

කඳුගැටය මුදුනේ තැන්නට ආ මට මහා වීරකමක් කළා සේය දැනුණේ. අප දෙදෙනාටම සිනා නොවී සිටිය නොහැකි විය.

කඳුගැටයේ කලින් වගා කළ හේන් බිම දැන් වල් පැළෑටි වැවී ගොසිණි. පේන අහලක අතු පැලක් නම් නොවීය. ගස් කීපයක් පමණි.

අපේ සිනා හඬ යටපත් කරමින් එක්වනම "චික් චික්" කියන හඬක් ඇසෙන්නට විය. මනාව හඬ ඇසෙත්ම අපේ සිනහව සිඳී ගියේය.

"මොකෙද්ද උඟරු මීයෙක් ද?" අමරසිරි බංඩාරගේ කට හඬේ බියක් සටහන් විය.

"මොකෙද්ද වල් සතෙක් " මම විදුලි පන්දම එහාට මෙහාට එල්ල කළෙමි. අවට ඇත්තේ වල් පඳුරුම පමණි.

"ඇගෙ පීන පයෝධර වංචල නේත්‍රා දෑත දෙපා මේවා" මම යළිත් හඬ නගා කීවෙමි.



Downloaded from sinhalaebooks.com

ඒ පද පේළිය කිව්වා පමණි. එපිට ගහක් දෙසින් අඳෝනා හඬක් නැගෙන්නට විය. එය සැබැවින්ම ගැහැනියක් හඬන්නා බඳුය. "අම් – මේ" වැනි එහෙත් අපැහැදිලි හඬකි එය.

"යමුද අයියෙ?"

අපි දෙදෙනාම දැන් ගොළුවී නොසෙල්වී සිටියෙමු. හඬ උස්වී යළි තුනී විය.

මම විදුලි පන්දමේ එළිය ගස අතට එල්ල කළෙමි. එය යාර පනහකට වඩා දුර නොවීය.

ගස් අතු අතර කොළ පාටට දිලිසුන ලොකු බෝතල් අඩි දැසක් මගේ විදුලි පහන් එළියට හසුවිය. අමරසිරි බංඩාරට "ආහ්" යැයි කියැවිණි.

මම ද තත්පර කීපයක් ගල් ගැසී බලා සිටියෙමි. "හෝතඹුවෙක්, උණහපුළුවෙක්" යැයි මම මටම කියා ගත්තෙමි. එහෙත් ඒ අතට ගොස් විපරම් කරන්නට තරම් ශක්තියක් දහිරියක් මගේ සිතේ නොවීය.

ඒ දැස ඔරවාගත් ගමන් බලා සිටියේය. අනෙක් සියල්ල අඳුරේය.

අමරසිරි බංඩාර මගේ අතින් අල්ලා ඇද්දේය. අනතුරුව හඬ නඟාගෙන, මානා පඳුරු බිඳගෙන ඔහු කන්ද පහළට දුවන්නට වුණේය. "මල්ලී, මල්ලී" කියා කෑගසමින් මම ද ඒ පස්සෙන් වැටුණෙමි.

අප නැවතුණේ පාරට ඇවිදින්ය.

හති හලමින් අපි තත්පර කීපයක් බලා සිටියෙමු.

"මොකෙක් උනත් ආයෙනං මං එහෙ යන්නෙ නෑ" හතිය අතරින්ම අමරසිරි බංඩාර මට කීවේය.

හැකි කඩිනමින් අපි ගෙදර ආවෙමු. අමරසිරි බංඩාරව පසුපස දොර ළඟට ඇරලූ මම කාමරයට වැදී දොර ජනෙල් සියල්ල වසා දැමුවෙමි.

බොහෝ වේලාවක් යන තෙක් මට නිදාගත නොහැකි විය. සාලයේ බිත්ති ඔරලෝසුවේ පාන්දර දෙක වදින හඬ ද මට ඇසිණි.



Downloaded from sinhalaebooks.com

# 4

පසුදා උදේ වෙනවිට අමරසිරි බංඩාරට උන ගැනී තිබිණි. ලීලාවතී මැණිකේ වෙනිවැල්ගැට පත්පාඩගම් වැනි බෙහෙත් වට්ටෝරුවක් ගැන කියනු කුස්සියෙන් ඇසිණි.

මා මුහුණ කට සෝදාගෙන උදේ කෑමට කුස්සිය අතට යන විට වජිරා එහි බෙහෙත් මුල් උණුකරමින් සිටියාය.

"මොකද නංගි මල්ලිට?"

"අනේ මන්දා අයියා. උන කියල ඉන්නෙ. මං නං හිතන්නෙ වැඩක් පලක් කරන්න කම්මැලි කමට. ඇයි විභාගෙ කරපු දා ඉඳල ඉන්නෙ ගෙදරමනෙ."

ඊයේ රාත්‍රියේ සිදුවූ හරිය හෙළි නොකළ හැකි බැවින් මම නිහඬවම අමරසිරි බංඩාරගේ කාමරයට ගියෙමි. ඔහු ඇඳෙහි ඇලවී මළානික දෑසින් මා දෙස බැලුවේය. මම ඇඳ කෙළවර හිඳ ගත්තෙමි.

"මොකද මල්ලි – ඕක උණ ගන්න කාරියක්ද?" රහසෙනි මා ඇසුවේ.

"නෑ අයියා මට පස්සෙ හරි අමුතු හීනයක් පෙනුණා. කවුදෝ කළු පාටට ඇවිත් මගෙ ඇඟ උඩ ඉඳ ගත්තා. ඉන් පස්සෙ සේරම ඇඟ පණ නැති වෙලා වගේ ගියා."

"සේරම හිත" යැයි කියන්නට සිතුණ ද දැන් නම් මා තුළ එවන් ශක්තියක් නොවීය. "මල්ලී ඔය මොනවටවත් බයවෙන්න එපා. බයට

Downloaded from sinhalaebooks.com

ඉඩ දුන්නාම තමයි සේරම."

"අයියගෙ මූණ පහුරු ගෑවෙ නැද්ද?"

"ඊයෙ රෑ නං එහෙම දෙයක් උනේ නෑ මට හැබැයි නින්ද ගියේ නම් එළිවෙන්න කිට්ටුවෙලා"

"අයියට හරි මහන්සි පාටයි"

"මාන්සි කියල බෑ මල්ලි. ගනමනාව හොයා ගන්න වැඩට යන්නත් එපැයි."

"මං ඉක්මනට සනීප වෙනව අයියා."

"ඒක හොඳයි" ඔහුගේ අත මිරිකා ඔහුගේ සුවය තහවුරු කරන්නට සේ හිනැහුණ මම හුත්තැතින් නැංගෙමි.

උදේට හදා තිබූ පිට්ටු කිරි හොදි ටික පවා මට කෑමට හරිහැටි පිරියක් නොවීය. නයනා නම් වෙනදා පරිදිම හඬ නඟා සිනාසෙමින් කතා කළාය.

පාසලට සුදු ගවුම හැඳගත් නයනාත් මමත් පාරට ආවෙමු.

"අපේ අයියට මොකද වෙලා තියෙන්නෙ ජනකයියෙ?" පාරට ආ සැනෙන් නයනා ඇසුවාය. "එයාටත් දිස්ටියක් වැහිලද?"

"නෑ නංගී උණයක්." මම නොසැලකිල්ලෙන් මෙන් කීවෙමි.

"අයියව ඊට පස්සෙ පහුරු ගෑවෙ නැද්ද?"

"අපිව පහුරු ගාන්නෙ කවුද නංගී?"

"කෝකටත් අයියා ආයෙ එහෙම උනොත් මහ පිරිත් පොත කොට්ටෙ යට තියාගෙන නිදාගන්න. අපේ ගෙදර තියෙන එක මං දෙන්නංකො"

"නංගිට පින්."

ඇගේ පාසල ඇත්තේ බැංකුවට වඩාත් මෙපිටිනි. මෙදින ඉතිරි මඟ අප කතා කළේ මා බයිසිකලයක් මිලදී ගන්නා එක ගැනය. මුල මාසයේ පඩිය ලැබුණු පසු එසේ කරන්නටය මා සිතා සිටියේ. නයනා පාසල් ගේට්ටුව ළඟදි මගෙන් සමුගත්තේ "බයිසිකලය ගත්තාම අයියට මාව හැමදාම ඉස්කෝලෙ ළඟට ගෙනැත් ඇරලූවැකි." කියා සිනාසෙමිනි.



Downloaded from sinhalaebooks.com

"බලමුකො"යි මමද සිනාසී කීවෙමි. නයනා කොතරම් සැහැල්ලුවෙන් ජීවත්වෙන කෙල්ලක්දැයි මට සිතිණි. ඇත්තෙන්ම ඇ හෙටක් ගැන තැවුනේ නැත. පාසල් යන්නන් වාලේ පාසල් ගියා පමණි. "ලොකු වුනාම කවුදැයි වෙන්නේ?" යැයි විමසුවොත් ඇ වරෙක ගුරුවරියක වෙන බව කියන්නීය. වරෙක වෛද්‍යවරියක වෙන බව කියන්නීය. තවත් වරෙක හෙදියක වෙන බව කියන්නීය.

දොස්තර කෙනකු වෙන්නට මා කොතරම් නම් සිහින මැව්වාද? එහෙත් මම දැන් බැංකු ලිපිකරුවකුමි. දෛවය මා ගෙනවිත් හෙළා දැමුවේ කෙතරම් දුර ඈත තැනකටද? එයට යම්කිසි හේතුවක් ඇද්දැයි විටින් විට සිතේ.

මා යනවිට බැංකු දොරකඩ අනෝමා බලා සිටියාය. ඈ හැඳි මල් මල් නිල්, කහ පැහැගත් සාරිය ඇගේ හිනැහෙන මුහුණටම ගැළපේ.

"ඔයාට අදත් හරි මහන්සි පාටයි." ඈ කීවාය. "ඊයෙත් නිදි මරල වගේ."

"හරියට නින්ද ගියෙ නං නෑ තමා" මම ඉවත බලාගනිමින් කීවෙමි.

"ඔයා කවුදෝ ගැන හිතනව නේද?" ඈ හාරා විමසන ආකාරය මගේ සිත් නොගනී.

"ඔව් හිතනව තමා අනෝමා" ඒ කියද්දීත් මට රුවිනී සිහිවිය. රුවිනී පිළිබඳ සියල්ලම අනෝමාට හෙළිකොට සියල්ල කෙළවරක් කරන්නට සිතුණත් ඇගේ සිත රිදවන්නට ද නොහැකිය.

"ඔයා හිතනව වැඩියි. ඒක මූණෙනුත් පේනවා" මා පසුපසින් කාර්යාලයට එමින් අනෝමා කීවාය.

"හිතන්නෙ නැතුව පුළුවන් ද අනෝමා? හිතක් තියෙන්නෙ හිතන්නනෙ?"

"ඒක ඇත්ත. ඒ උනාට අපි හිතන දේවල් වෙනස් කරන්න පුළුවන්."

"මං නං හිතට එන දේවල් හිතනවා."

"ඕතන තමා ඔයාට වැරදුන තැන. මේ ඒක නෙමේ කල් තියා ආවෙ –ඊයෙ ලෙජර් එක බැලන්ස් කරගන්න බැරිවුනා. මට උදව් කරනව නේද?"



Downloaded from sinhalaebooks.com

"ඔව්, ඔව්, යමු"

වැඩට නැඹුරුවූ පසු මට සියල්ල අමතක විය. ගණන් ඉලක්කම් – වලට එබී ඒවා එකතු කිරීම අඩු කිරීම – තුලනය කිරීම වැනි ක්‍රියාවලියක ඇත්තේ එක අතකට හිත එකම අරමුණකට ගැනීමකි. එහෙත් විටින් විට යටි සිත ඈත මෑත නොදිව්වා නොවේ.

ඒ අතරේ මට රූවිනී සිහිවෙයි. අමරසිරි බංඩාර සිහිවෙයි. ඊයේ රාත්‍රියේ කන්දේ මුකලානේ දුටු දිලිසෙන ලොකු කොළ දෑසත්, මූසල අඳෝනා හඬත් සිහිවෙයි. පේරටම කලින් බයිසිකලයක් ගතයුතු බව සිහිවෙයි. ඒ අතරේ අනෝමාගේ වත්සුණු සුවඳත් ඇගේ නෙතඟ බැල්මත් කොමළ සිනහවත් වරින් වර මා කළඹයි.

"අනෝමා කොච්චර කල් ද දැන් මෙහේ වැඩට ඇවිල්ලා?"

"අවුරුද්දක් වුණා"

ඇගේ මහගෙදර කටුගස්තොට බව කතා බහේදී මම දැන සිටියෙමි. ඈ නවාතැන් ගත්තේ බැංකුවෙන් හැතපුම් භාගයක් පමණ මගේ නවාතැන දිසාවට ඇති ගෙයකයි. ගෙදර අයිති මේ අඩවියේ ව්‍යාපාරික ඉඩම් හිමියෙකුටයි. අනෝමාගේ අප්පච්චිත් නන්දසේන කරුණානායක නම් ව්‍යාපාරිකයාත් කලින් පටන් මිතුරුව සිටි හෙයින්, නවාතැන අනෝමාට දෙවැනි ගෙදරක් පරිදිය. නන්දසේනගේත්, ඔහුගේ බිරිඳ පාලිකාගේත් තොරතුරු මට ඉඳහිට අසන්නට ලැබේ. ඔවුන්ට මුදිත හා පියලි නම් කුඩා දරු දෙදෙනෙකි. අනෝමා ඔවුන්ට වැඩිමහලු සොහොයුරියක සේය. ඇගේ නවාතැනට ඇවිත් යන්නැයි ඈ නිතර ඇවිටිලි කළ ද මම මෙතෙක් එය මඟ හැරියෙමි. ඕනෑ නැති දේවලට පැටලැවෙන්නට මගේ කිසිදු කැමැත්තක් ආශාවක් නොවීය.

වරින් වර අපේ වැඩ කටයුතුවලට බාධා කරමින් කාර්යාල කාර්ය සහායකයින් වන ජයසිරිත්, ටිකිරි බංඩාත් යමක් විමසන්නට හෝ කතා කරන්නට එති.

"මහත්තයගෙ මූණ අදත් ටිකක් තඩිස්සි වෙලා" යැයි ජයසිරි කී කල

"මට ඊයෙත් හරියට නිදාගන්න බැරිවුණා" යි මම කීවෙමි.

"ඊයෙත් මොකවත් වුණාද මහත්තයා?"



Downloaded from sinhalaebooks.com

"නෑ මොකවත් වුණේ නං නෑ නින්ද ගියේ නෑ."

"ඔය කිව්වට මහත්තය සමහර දේවල් වෙනව අපිට පේන්නෙ නැතුව." ජයසිරි බොහෝ දේ දන්නා සැටියෙන් ය කතා කරන්නේ. "සමහර වෙලාවට ඔය දිස්ටි ඇවිත් කරදර කරනවා. නිදාගන්න බැරිවෙන එකත් ඉතින් කරදරයක් නෙ."

"මට දැනට තියෙන ලොකුම කරදරේ බයිසිකලයක් නැති එක" මම කීවෙමි. "ඒක තිබුණ නං කාටවත් බය නැතුව යන්න එන්න තිබුණා."

"ඒක හරි – යකඩවලට හොල්මන් බයයි කියනවනේ" කී අනෝමා හිනැහුණාය.

"එහෙම කතාවක් මං නං අහල නැහැ" ජයසිරි අවිශ්වාසයකින් අනෝමා දෙස බැලීය. "මං මහත්තයට එකක් හොයන්නංකො. පරණ එකක් කමක් නැතේද?"

"මොක වුනත් කමක් නෑ"

" පරණ ඒවා අරන් හදන මිනිහෙක් මං දන්නවා ඇඩ්ඩිත් කියල. මං අහල බලන්නංකො. මිනිහගෙ වින්කලයක් තියෙනව අපේ ගෙවල් ගාව."

" මොකක් හරි කමක් නෑ." මා සෙවුයේ අලූත්ම බයිසිකලයක් නොවේ. හන්දියේ සිට නවාතැනට යාගන්නට හැකි යකඩ කටුවක් පමණි. "වැඩි ගණන් නං බෑ ඔන්න ජයසිරි."

"මං හොයා දෙන්නංකො මහත්තයා"

"ඕව ටයිම් කරල රෑ වෙලා යන්න ගියාමත් බයිසිකලේ තියෙනවනං ඔයාට ලේසියි" අනෝමා කීවාය.

තව මඳ වෙලාවකින් මට සිරිගේ කාමරයට යන්නට සිදුවිය. වෙනත් බැංකු කතා බහ අස්සේ සිරි ද විපරම් කළේ මගේ මුහුණ සිරීම ගැනය. මේ වන විට සිරීමේ සලකුණු සියල්ල මැකී තිබීම අරුමයක් නොව, එවන් සලකුණු එසේ මැකෙන බවය සිරි තේරුම් කළේ.

කන්තෝරුවේ කිසිවකුගෙන් මට දැන් ගැලවීමක් නොවීය. චිත්‍රා හා අතුල ද මගේ තොරතුරු විමසුවෝය. අලූත විවාහ වූ ඔවුන් දෙදෙනා වඩාත්ම තම තමන්ට ළංවී පාඩුවේ ජීවත් වුවද මා පිළිබඳ



Downloaded from sinhalaebooks.com

මෙසේ උනන්දුවීම ඔවුන් මා මේ කවයට පිළිගෙන මගේ ජීවිතය ගැන සැලකිල්ලක් දැක්වීමකැයි මට සිතිණි.

හැමදෙනාටම වඩා මෙවන් කරුණු ගැන දැන සිටියේ තලතුනා මිනිසකු වූ ටිකිරි බංඩාය.

"මහත්තයා මං තව කාරණාවක් හොයාගෙන ආවා." දිවා අහරින් පසු මද විවේකයේ මා බැංකු මිදුලේ කසගස යට බංකුවේ හිඳ සිටිය දී එතැනට ආ ටිකිරිබංඩා රහසින් මෙන් කීවේය. "මහත්තයගෙ අර මූණ හූරන එක ගැන. ඕකට සමහරවිට තොවිලයක් කරන්න වෙයි"

"මට තොවිල් කරන්න ගායක් නෑ ටිකිරි බංඩා."

" තොවිලයක් නෙවේ නං ආරස්සාවක්. අපේ ගෙවල් ළඟ ඉන්න ආතරයා කිව්වෙ."

"කවුද ආතුරයා?"

"ආතුරයා නෙමේ මහත්තයා ආතරයා"

ටිකිරිබංඩා බුලත් කසට බැඳි දත් පෙන්වා හිනැහුණේය. මැදිවියේ වුවද ඔහුගේ දෑසේ ඇත්තේ දරුවකුගේ අහිංසක බවකි. කෙස් පැහුණ ද ඔහුගේ බුද්ධිය මෝරා ගිය එකකුත් නොවේ. "ආතර්... වෙලේ ආතර්. අපි කියන්නෙ ආතරයා කියලා. මිනිහ තමා කිව්වෙ ඔය වැඩේට කකුලේ ඇස්වටේ සුදු යකඩ වළල්ලක් පළඳින්ට කියලා."

"සුදු යකඩ?"

"ඔව් මහත්තයා වළල්ලක් "

"මං කොහොමද ටිකිරි බංඩා වළලු දගෙන වැඩට එන්නෙ?"

"පේන්නෙ නැනෙ මහත්තයා. මේස් එක යටින් දාන්ට. කකුලෙ ගැවෙන්ට ඕනෑ යකඩෙ. එතකොට දිස්ටිය ළඟට එන්නෙ නැහැයිලු."

"මං නං හිතන්නෙ නෑ මට වළලු පළඳින්ට වෙයි කියල ටිකිරි බංඩා. මේක මහ ඇරිල යාවි."

"හොඳයි. එහෙම නුනොත් මහත්තය අපි කියන එක අහල බලන්නකො" ටිකිරි බංඩා බංකුවෙන් නැගිට ගියේ මා දෙස අමුතුම බැල්මක් හෙළමිනි.

මෙයින් පසු දවස පුරාම මට සිතුණේ හැමදෙනාම මා දෙස අමුතු ආකාරයකින් බලතැයි කියායි. අමනුෂ්‍ය දෝෂයකට මා මුහුණ පෑ



Downloaded from sinhalaebooks.com

පලියට මාත් අමනුස්සයකු වුණා යැයි ඔවුහු සිතුවාද?

වැඩ ඇරුණ සැණින් මම ගෙදර ආවෙමි. ඇතැම් දිනෙක ම, මහත් ඇවිත් ඇත්තේ අනෝමා සමගයි. මා කලින් සඳහන් කළ මෙන් අනෝමාගේ නැවතුම් පළ ඇත්තේත් මා ගමන් ගත්තා අතරම සිරි ජයතුංග කළමනාකරු හෙයින් ඔහුට බැංකුව අසලම නිවෙසක් ලැබිණි. චිත්‍රාත් අතුලත් අනෙක් අතට යන පාරේ නිවෙසක කාමර දෙකක් කුලියට ගෙන ජීවත් වූවෝය. ජයසිරි හා ටිකිරි බංඩා යහ දෙදෙනාටම පා පැදිය බැගින් තිබුණ ද ඔවුන් ද වැඩ ඇරී ගමන් කරන්නේ අනෙක් අතටය.

ලීලාවතී මැණිකෝගේ ගෙදරට බැඳුණ මට දැන් එය හැරදා යා නොහැක. ඔවුන්ට ද මගේ කාමර කුලිය අවශ්‍ය වෙයි. තවද ඒ කාමරයේ මට නිදහසක් ද ඇත. ගෙදර උදවිය ද පවුලේම අය මෙනි. ලීලාවතී මැණිකෝට මා අමතන්නේත් අම්මා කියායි.

"කොහොමද අම්මේ මල්ලීට?" මා ඇත තියාම ඇසුවේ මිදුලේ සුදුරු වගයක් පැදුරක වේලමින් එකතු කරමින් සිටි ලීලාවතී මැණිකේ ගෙනි.

"දැන් නං උණ අඩුයි. කෝ අපිට කියන්නෙ නැතෙ මොකද උනේ කියලා"

ඇඳුම් අහවර කරන්නටත් කලින් මම අමරසිරි බංඩාර සොයාගෙන ගියෙමි. අඩ නින්දේ ගැලී සිටි ඔහු මගේ පා හඬ අසාදේ දෙනෙත් හැරියේය.

"ආ අයියා. – ගෙදරත් ඇවිල්ලා – එච්චර හවස් උණාද?" ඔහුගේ කටහඬේ වූයේ දුබල බවකි. වෙනදා පැහැපත් මුහුණ අද කළුතලා වෙලාය.

"කොහොමද මල්ලි?"

"මට මේක ඇරිල යයි අයිය, අනෙත්දි බය දැනුණට මං එච්චරම බයවුනේ නං නෑ! අයියත් හිටියනෙ" ඔහු කතා කළේ පහත් හඬිනි."

"අම්මලට මොනවත් කිව්වද?"

"නෑ"

"කියන්ඩ එපා. අපිට කොහේවත් යන්න බැරි වෙනවා"

"අරෙහෙම ගමන් යන එක නං මං හිතන්නෙ නෑ හොඳයි කියලා."



Downloaded from sinhalaebooks.com

"අපි දවසක දවල් වරුවෙ යමු. ගිහින් දවසම පික්නික් කරල එමු."

"කවදද මල්ලි ?"

"සෙනසුරාදා ඉරිදා"

"මං කොළඹ යනවනෙ"

ඔහු "චෑ" ගෑවේය. "අයිය හැම වීක්එන්ඩ් එකේම කොළඹ යන්ට ගියාම පඩිය ඉතුරුවෙන එකක් නෑ"

"මේ ටිකේ යන්න ඕනෑ"

"එහෙම තමයි ආපු අලුත නේද? ගෙදර මතක් වෙනවා ඇති. මට මතකයි පොඩිකාලෙ නිවාඩුවට මාතලේ නැන්දා කෙනෙකුගේ ගෙදර ගිහිල්ලා මට ගෙදර එන්න පාවවෙ උණ ගත්තා."

"ඔයාට එහෙම නං හැම එකටම උණ ගන්නවා."

"අනේ මන්දා අයියා. ඇඟට පණක් නෑ. මං අයියට විතරක්ම හින්දා කියන්නං. මේ ගෙදර...." කී ඔහු වටපිට බැලුවේ බිත්ති අසා සිටීදැයි විපරමකිනි. "මේ ගෙදර හොල්මන් තියෙනවා."

"ඔන්න කිව්වා කතාවක්"

"නෑ සත්තයි මං දවසක් දැක්කා රෑ දොට්ට යන්න ගියාම. මිදුලෙ කළුවරට කවුදෝ ඇවිදන් ගියා."

"ඉතිං? "

"ඉතිං ඉන්පස්සෙ මං ඒ පැත්තෙ දෝට්ට යන්නෙ නෑ. හැබැයි අයිය ඉන්න හින්ද දැන්නං බයක් නෑ."

"මල්ලි ඉක්මනට සනීප වෙන්නකො" කියා මම මගේ කාමරය අතට පියමැන්නෙමි.

මා පසුපසින්ම මෙන් තේ කෝප්පය රැගෙන ආවේ වජිරාය.

"මෙන්න අයියා" කී ඇගේ කටහඬෙහි වෙනදාට නැති ළතෙත් ගතියක් වීය.

"කෝ දෙන්න" දොරකඩදීම ගත් තේ කෝප්පය මම කාමරයේ මේසය උඩ තබා, ඇඳුම් මාරු කර සරමට බැසගෙන ගේ පිටුපස ළිඳ වෙතට ගියෙමි. කඩිනමින් මූණ සෝදාගෙන මා කාමරයට එන විට තේ කෝප්පය මේසය මත නොවීය.

තේ කෝප්පය ඇල් මැරුණ නිසා එය රත් කරන්නට කවුරුවත්



Downloaded from sinhalaebooks.com

ගෙන ගියාදැයි මම අනුමාන කළෙමි. මම ඇතුළු ගේ අතට ගියේ විපරමටය. එහෙත් කාගෙන්වත් අහන්නට කලින් මට තේ කෝප්පය පෙනිණි. එය තිබුණේ සාලයේ ටීපෝව මතය. එය අඩක් හිස්විය. මේ මගේම තේ කෝප්පයද?

"වජිරා නංගී" මම කුස්සිය අතට යමින් කතා කළෙමි.

"අයියා?" ඈ කෑම කාමරයේ පසු දොරට ආවාය.

"අර මගේ තේ එකද?"

"අයියගෙ තේ එක කාමරේනෙ."

"නෑ මේ සාලෙ තියෙන එක බාගෙට බීලා"

"කෝ?" වජිරා ඇවිත් බැලුවාය "මේ ඒක තමා. කවුද මෙතැන්ට ගෙනැවෙ?"

"මන්දා" අපි එකිනෙකා මුහුණෙන් මුහුණ බලා ගත්තෙමු.

වජිරා "නංගී" යැයි කෑ ගැවාය. ඇතුළු කාමරයෙන් නයනා පැමිණියේ අතින් ගත් පොතක් ඇතිවය.

"ඇයි අක්කා?" ඇගේ දෑස අවිහිංසකව විවරව ඇත.

"ඔයාද මේ තේ කෝප්පෙ මෙතෙන්ට ගෙනැවෙ?"

"මම ? ඒ මොකටද?"

"මං දන්නෙ නෑ ඔයා මේක ගෙනැවද?"

"මං හිටියෙ කාමරේ. මේ පොත කියව කියව."

"මේක හරි අභිරහසක් තමයි" කී වජිරා තේ කෝප්පය දැතින් ගත්තාය. "මේක බොන්න එපා අයියා. මං තව එකක් හදල ගෙනැත් දෙන්නං. මේක කොහොමටත් ඇල් මැරිලා"

අපේ කතා බහ අසමින් සාලයට ආ ලීලාවතී මැණිකේ "හැමදාම කියනවා අයියා මූණ හෝදන් එනකල් ඉන්න කියල තේ එක හදල දෙන්න"යි කීවාය. "කොහේද හැම එකටම කලබලේ නොවැ."

"වැඩ කීයක් කරන්ට ද මේ අත් දෙකෙන් " යැයි මුමුණමින් කී වජිරා කුස්සිය අතට ගියාය.

තේ කෝප්පයක් නිසා ඔවුන්ගේ හිත් නරක් වේ යැයි මා සිතුවේ නැත. මෙවර මා කාමරයට ගිය පසු තේ කෝප්පය රැගෙන ආවේ නයනායි.



Downloaded from sinhalaebooks.com

"මොකද අයියා කලින් තේ කෝප්පෙට උනෙ?" ඈ තේ කෝප්පය මා අතට දෙමින් ඇසුවාය

"මං දන්නෙ නෑ නංගි ඒක ඇවිද්දා"

"ඇවිදල නෙමෙයි. පියඹලා අයියා පියාඹන පිරිස ගැන අහල තියෙනවනෙ? මේ යට තියෙන පිරිසියත් පියාඹන පිරිසියක් වෙන්න ඇති." කී නයනා සිනාසෙන්නට වුණාය. ඇගේ ජීවිතය කෙතරම් සැහැල්ලුද? හැම එකම විහිළුවක්.

පදමට කහට කිරි සීනි සහිත තේ කෝප්පයෙන් ගතට අමුතුම පණක් ලැබිණි. ගෙතුළ පහන් දැල්විණි. අමරසිරි බංඩාරගේ කාමරයෙන් කුඩා බැටරි රේඩියෝවක හඬ ඇසිණි. නැඟී ආ ගීතය ශෝකාතුල විය.

වජිරා විමිනි ලාම්පුවක් රැගෙන මගේ කාමරයට ආවාය. දැල්ලෙන් එළිය වුන ඇගේ මුහුණේ ඇත්තේ බර කල්පනාවකි.

"අයියා හරි පුදුම වැඩේ නේද තේ එකට වුණේ?" ලාම්පුව මේසය මත්තේ තබමින් කියද්දී ඇගේ දෑසේ බියක් රැඳිණි.

"හැම එකටම හේතුවක් තියෙනවනෙ නංගි."

"අනේ මන්දා. මං කෝප්පෙ අරන් ගියානෙ විසි කරන්න. අඩියෙ පස්වගයක් තිබුණා"

"අඩියෙ කිව්වෙ එළියෙ?"

"නෑ ඇතුළෙ පතුලෙ. තේ මංඩි වගේ"

"එහෙම නං නොබීපු එක හොඳයි."

"අනේ මන්දා අයියා මට බයත් හිතෙනවා. තාත්තා මැරුණට පස්සෙ....."කී ඇය කතාව නතර කළාය.

"මේ ගෙදර හොල්මන් තියෙනවද?"

"එහෙමට කියල නෑ අයියා"

අමරසිරි බංඩාර දුටුවැයි කී අඳුරු අවතාරය ගැන මම සඳහන් නොකළෙමි. වජිරාගේ හිතට තවත් බය ඇතුළු කරන්නේ මොන එහෙකටද?

"නංගි ගෙ හිතේ බය.."

"අනේ මන්දා. මෙහේ මොනව හරි තියෙනව කියල කිව්වොත්



Downloaded from sinhalaebooks.com

අයියා අපිව දාලා යාවි. මේක හොල්මන් ගෙයක් නම් නේවි අයියා, උනාට......"

"ඒ උනාට ඉතින්?"

"සමහර වෙලාවට කවුදෝ ඉන්නවා වගේ මට දැනිලා තියෙනවා ඇයි මන් දන්නෙ නෑ. අද තේ කෝප්පෙ දැක්කාම තමයි ඕවා වැඩියම දැනුණෙ"

"ඒවට ඉඩ දෙන්න නරකයි නංගි. ඔය වගේ ඒවට ඉඩ දුන්නම තමයි ඒව අපිව පාලනය කරන්න එන්නෙ. නරක අඳුරු දේවල් අතුගාලා එහාටම දාන්න ඕනෑ හොඳ දේවල්ම තමයි හිතන්න ඕනෑ".

"කියන්න ලේසි අයියා" කී වජිරා කාමරයෙන් පිටව ගියේ ලීලාවතී මැණිකේ ගෙතුළින් අඬ ගැසූ හඬ අසමිනි.

ඇතැම් දිනෙක අමරසිරි බංඩාර මගේ කාමරයට විත් කතා කරමින් හිඳී. අද ලෙඩ ගණනේ සිටි ඔහුට කරදර කරන්නට නොහැකිය. තවත් වරෙක නයනා ඇවිත් මගෙන් උදව් ඉල්ලන්නේ පාසලේ ගෙදර වැඩ යමක් නිරවුල් කරගන්නටයි. මා බැංකුවේ වැඩ කරන නිසා මා හොඳින් ගණන් දන්නේ යැයි ඈ සිතයි.

මේ රාත්‍රියේ මා ගෙදරින් ගෙන ආ පොතක පිටු පෙරළද්දී දොර ළඟට ඇවිත් සිටි නයනාව මට එකවර නොපෙනිණි. ඈ මා පිටුපසින් මෙන් අවුත් තිර රෙද්ද අද්දරින් බලා සිටින්නට ඇත. තවද මගේ සිත තිබුණේ ඈතය. මා පෙරළු පොතේ පිටු අතර වූ සේයාරුවකටය මගේ නෙත සිත දෙකම ඇදී තිබුණේ.

"අනේ කවුද අයිය ඒ?" නයනා එක්වරම අසද්දී මම තිගැස්සුණෙමි. කඩිනමින් පොත වැසුවද පිටු අතර රැඳවුන සේයාරුව ඇය දකින්නට ඇත.

"කියන්නකො අයියා? කවුද ඒ? පෙන්වන්නකො" නයනාගේ අනේ ගණිතය පොත හා පැන්සලකි.

"මේ මං දන්න එක්කෙනෙක්"

"අක්ක කෙනෙක් නේද? මට පෙන්නන්න. මං කාටවත් කියන්නෙ නෑ"

"ඇත්තමද?"



Downloaded from sinhalaebooks.com

"ඇත්තමයි"

"සත්තකමද?"

"සත්තමයි"

"මේස් දෙක පල්ලා?"

"මේස් දෙක පල්ලා"

මම පොත දිග හැර ඒ තුළ සැඟවුණ රූවිනීගේ වර්ණ සේයාරූව පෙන්වීමි.

"අනේ අයියා හරිම ලස්සනයි. නිළියක් වගේ. ඉතින් නම කියන්ටකෝ"

"බෑ බෑ පින්තූරෙ පෙන්නනව කියල විතරනෙ කිව්වෙ."

"හොඳයි කියන්න එපා එහෙනං මං හොයා ගන්නංකො"

මේ කෙල්ලගෙ විසේ යැයි මට සිතිණි.

"ඔන්න ඔයා පොරොන්දු වුනා කාටවත් කියන්නෙ නෑ කියලා."

"හරි හරි මං කියන්නෙ නෑ"

ඈය ගිය පසු සේයාරූව වෙන තැනක සැඟවිය යුතු බව මගේ සිත කීවේය. හොඳින් බලා "ලස්සන" යි කී නයනා ඡායාරූපය යළිත් මා අතට දුන්නාය. "දැන් ඉතින් අයියා මට ගණන් ටික කියල දෙන්නකෝ."

රෑ කෑම ලෑස්තිය කියන තෙක් මම නයනාට ගණන් කියා දුන්නෙමි. එදා මා රෑ කෑම කෑවේත් නයනා සමගිනි. වෙනදා මා සමඟ මේසයට වාඩිවෙන අමරසිරි බංඩාර බෙහෙත් බී නිදි බව ලීලාවතී මැණිකේ කීවාය.

ගේ තුළ වෙනදා නැති පාළු බවක් මට දැනිණි.

කෑමෙන් පසු මම පිටුපස ළිඳ ළඟට ගොස් දත කට මැද ගත්තෙමි. යළිත් මුහුණ මඳක් සෝදා දෙපය ද සෝදාගත්තෙමි.

මා කාමරයට විත් ඇඳේ ඇලවෙත්ම කොට්ටය යටවූ පොත හසුවිය. එය මහ පිරිත් පොත විය. නයනා හෝ වජිරා එය ගෙනැත් එතැන තබන්නට ඇතැයි මම අනුමාන කළෙමි.

ඒ රාත්‍රිය තිස්සේම මම කවදාවත් නැති සැහැල්ලුවකින් නිදාගත්තෙමි.



Downloaded from sinhalaebooks.com

# 5

බ්‍රහස්පතින්දා වෙනවිට අමරසිරි බංඩාරගේ උණ බැස ගියේය. බදාදා ලීලාවතී මැණිකේ වියෝනිස් නම් වූ කට්ටාඩියෙකු ගෙදරට ගෙන්වා දෙහි කප්පවා වතුර මැතුරුවාය. මේ සියල්ලෙන් ද අමරසිරි බංඩාරගේ හිතට සැහැල්ලුවක් දැනී බිය තුනීව යාමෙන් උණ ගතිය පහවන්නට ඇතැයි මම සිතුවෙමි.

බ්‍රහස්පතින්දා රෑ අමරසිරි බංඩාර මා සමග රාත්‍රි කෑමට ද හිඳ ගත්තේය. වඩාත් කෑම පිරියක් නොතිබිණැයි කීව ද ඔහු බෙදාගත් හැම දෙයම කෑවේය. "බැදුම් කෑම නම් හොඳ නෑ" යි ලීලාවතී මැණිකේ කීවාය. "මේ සුමානෙම මං හිතුවෙ බැදුම් කෑම නොහදන්න."

"ඒකට මොකද අම්මෙ?"

"පුතාට රස ඇතිය ?" ඈ ඇසුවේ මගෙනි.

"අනේ හොඳටම ඇති අම්මෙ"

"පුතා හෙට සිකුරාදා වැඩ ඇරුණාම ගෙදර යනවනේ?"

"ඔව් අම්මෙ"

"ඉරිදා රෑ එනවනෙ?"

"ඔව් නැතුව"

"රෑ පානෙ තනියෙන් එන්න පුළුවන?"

"මට බයක් නෑ"

Downloaded from sinhalaebooks.com

"පුතාට බයිසිකලේ ගත්තනං තමා හොඳ"

"මට සමහරවිට ලබන සුමානෙ එකක් ලැබේවි. බැංකුවෙ වැඩකරන ජයසිරි කිව්වා පරණ එකක් තියෙනව කියල. අද ගිහින් බලන්න හිටියෙ. මිනිහට වෙන වැඩකට යන්න වෙලා ලබන සුමානෙ වෙන කල් කල් ගියා."

"එහෙම එකක් තියෙනවනං හොඳයි. වැඩට යන්න එන්න උනත්"

"ඔව්"

"අයියා මාවත් එනකොට බයිසිකලෙන් ඉස්කෝලෙ ළඟට ඇරලනවනෙ" නයනා පිංසෙන්ඩු වුණාය.

"අනේ මේ ළමයගෙ විසේ" ලීලාවතී මැණිකේ බොරු තරහක් පෑවාය.

"එක්කන් යනව නේද අයියා?"

"බලමුකො" මම සිනාසුනෙමි.

අවට යළිත් පාළුව මැකී සතුට ආවායැයි මට හැඟිණි. වජිරා ද යළිත් සතුටකින් මෙන් හැසිරුණාය. මා අත සෝදා ගත්තා විට ඈ පැපොල් පළු කීපයක් තැබූ තසිමක් මා ඉදිරියෙන් තැබුවාය.

"අයියට ඕනැ නං පිරිත් පොත බෑග් එකේ දාගෙන යන්න" නයනා කීවාය. "තාම ඒක කොට්ටෙ යටනෙ"

"නංගි ද ඒක එතන තිබ්බෙ?"

"නෑ අක්කා"

නයනා එසේ කියද්දී වජිරාගේ මුහුණ විලියෙන් රතු විය.

"කොහොම වුනත් නංගි ඒකෙ ගුණයක් ඇති" යි මා කියද්දී "අත් ගුණේ" යැයි කී නයනා ඇගේ කාමරයට දුව ගියාය.

රෑ කෑමෙන් පසු අමරසිරි බංඩාර පෙර පුරුදු පරිදි මඳ වේලාවක් කතා බහ කරන්නට මගේ කාමරයට ආවේය. ගුවන් විදුලි වැඩසටහනක් ගැන යමක් සඳහන් කළ ඔහු ඉක්මනින් බැස්සේ ප්‍රධාන මාතෘකාවටය.

"අයියෙ බයවෙන්න කියනව නෙමෙයි. මට නං දැන් හිතෙනව මේ ගෙයි දෝසයක් තියෙනව කියල" ඔහු කතා කළේ රහසින් මෙනි.

"ඇයි මල්ලි එහෙම කියන්නෙ?"



Downloaded from sinhalaebooks.com

"නෑ මේ ළඟකදි ඉඳල තමා මට වැඩියම දැනෙන්නෙ."

"මං නවතින්න ආව හින්දද?" එය විහිළුවකට හරවන්නට සිතු මම සිනාසුණෙමි.

"අනේ නෑ අයියා - අයියා ආව හින්ද නෙමේ. මං කලින්ම කිව්වනෙ. මං අර කවුද ඇවිදන් යනව වගේ දැක්ක කියලා?"

"ඒ ඉතින් එක සැරේනෙ."

"අපේ අක්කත් කියනව එයාට මොකද්ද තියෙනව වගේ දැනෙනව කියල"

"ඕක එක්කෙනෙක් හිතන්න කියන්න ගත්තාම අනිත් අයටත් බලපානවා."

දොර රෙද්ද මැත් කරමින් නයනා එබිකම් පෑ හෙයින් අපේ කතාබහ නතරවිණි.

"මොකද්ද ඕගොල්ලන්ගෙ සතරකන් මන්තරේ?" නයනා සිනාසෙමින් ඇසුවාය.

ඇගේ කතාබහ හැසිරීම කෙතරම් සැහැල්ලුද? ඇගේ නොමේරූ මනසට මේ බිය සැක කිසිත් ඇතුළු වී නැති හැඩයි. හිත පිළිබඳ මා කියූ කතාව සනාථ කරන්නට මෙනි ඈ හැසිරෙන්නේ.

"නංගි යනව යනව අපිට කරදර නොකර." අමරසිරි බංඩාර සැරවුණේය

"අපෝ ගිණිපුක්කාරයා"

"ලොකු අයගෙ කතාවලට කටදාන්න එනවා"

"අපෝ හරි ලොකු අය." කී නයනා දුව ගියාය.

ඇත්තෙන්ම ඈ අනිත් දෙදෙනාට වඩා වෙනස් යැයි මට සිතේ. ඇගේ දෑසේ ඇත්තේ දඟකාර බැල්මකි. තල දතින් යුතු සිනහව අනික් දෙදෙනාට උරුම නැති. ඈ සිතන්නේ හැසිරෙන්නේ ද වෙනස්ම ආකාරයකිනි.

"කිය කියා හිටි එකත් මතක නැති උනා අයියෙ. ඔන්න ඊයෙ රෑත් මට දැනුණා කවුද කළුවට මගේ ඇඟ උඩ ඉඳගන්නවා වගේ. ඊට පස්සෙ මගෙ ඇඟ පණ නැතිවෙලා වගේ ගියා. හොඳටම දාඩිය දැම්මා."

Downloaded from sinhalaebooks.com

"දාඩිය දැම්ම නිසා උණ බහින්න ඇති."

"ඔව් උණ නම් බැහැල ගියා. මට ඒ වෙලාවෙ බයක් නම් හිතුනෙ නැහැ. නිකම් ඕනෑ එකකට ඉඩ ඇරල මං හිටියෙ මට ටිකකට පස්සෙ හොඳටම නින්ද ගියා."

"කළුකුම්බර වෙන්ටැති" මම කටට ආවක් කිවෙමි. ඇත්තෙන්ම මා නැත් කළේ ඔහුගේ සිතේ බිය ගතිය මඟ හරින්නටයි.

"අන්න අයියට දැනෙනවද?" මෙවර අමරසිරි බංඩාර නැහැය පුම්බමින් ගෙල දිගු කරමින් ඉව අල්ලන්නට වුණේය.

"මොකද්ද?"

"අර ගඳ"

හොඳින් හුස්ම උරාගත් මට ද ගඳක් දැනෙන්නට විය.

"ගස් ගඳ"

"ගස් ගඳ නෙමේ."

මම කවුළුවෙන් පිටත බැලුවෙමි. අඳුරම පමණි අවට වූයේ. නොයෙක් නිශාචාර හඬ පිටත අඳුර පුරා ඇසිණි.

"මල්ලි ඕවා හිත හිතා නිදාගන්න යන්න එපා."

"නෑ නෑ මං පිරිත් කියල දැන් නිදාගන්නෙ"

මගේ කොට්ටය යට තිබූ මහ පිරිත් පොත මම එතැනින් ඇද අමරසිරි බංඩාරට පෙන්වීමි "මටත් තියෙනව මල්ලි ආරස්සාව."

කතාව වෙනතකට හරවන්නට මම අලුත්ම ඉංග්‍රීසි චිත්‍රපටියක් ගැන ඇසූ තොරතුරු පවසන්නට වුනෙමි. අමරසිරි බංඩාර ද මෑතදී තමා නැරඹූ හින්දි චිත්‍රපටියක නළු නිළි වත ගැන දොඩන්නට වුණේය. ඔහු අන්තිමේදී ගෙට ගියේ ලීලාවතී මැණිකේගේ හඬ ගෑම අසමිනි.

මම අඩක් කියවූ නවකතා පොත පෙරළුවෙමි. රුවිනීගේ සේයාරුව තවමත් එය තුළ විය. ඒ දෙස මඳ වේලාවක් බලා සිටි මම ඒ දැසේ සුන්දරත්වයේ රැඳුනෙමි. අනතුරුව නයනාට හසු නොවන්නට සිතා මම සේයාරුව මේසයට එලූ කඩදාසිය යට සැඟවූයෙමි. මේසය මත නොයෙකුත් කළමනා තිබුණෙන් කඩදාසිය යට එය සුරක්ෂිත බව මට හැඟිණි.



Downloaded from sinhalaebooks.com

කාමරයේ කවුළු වසා දැමූ මම ඇඳෙහි ඇලවුනෙමි. අතේ දුරින් වූ විමිනි ලාම්පුවේ රත් කහ එළිය බිත්ති මත වැතිරෙන හැටිත් වහලයෙහි උළු පරාල අතරින් පතර අඳුරු සෙවණැලි මවන හැටිත් මම මඳ වෙලාවක් බලා සිටියෙමි. මගේ සිතුවිලි අතරට රුවිනී ආවාය. මේ සති අන්තයේ ඇය සමග මුහුදු වෙරළට යන්නටය මා සිතා සිටියේ.

රුවිනීගේ වැන්දඹු අම්මාගෙන් අපට කිසිදු අවහිරයක් නොවේ. රුවනිගේ අයියා එතරම් මා කෙරෙහි මනාපයක් නැතිවුවද අපට බාධාවක් නොකරයි. රුවිනී මුණ ගැසී මිතුරුවීම මගේ හේතුවකැයි මට නොයෙක්වර සිතිණි. කොළඹට මාරුව හදාගත් පසු ඇය විවාහ කරගන්නටය මා සිතා සිටියේ.

මෙවන් සිතුවිලිවල ගැලුණු මම නිදිමත ඉහවහා යද්දී අතේ දුරින්වූ ලාම්පුව නිවා වැතිරුණෙමි.

නින්ද යාගෙන යද්දි පිටත ගඳ යන්නම් දනුන ද මම ඒ ගැන තැකීමක් නොකළෙමි. හදිසියේම රෑ දෙගොඩ හරියේ මා අවදිවූයේ සිහිනයක් දකිමිනි. එය සිහිනයක් ද සැබෑවක් දැයි අද වෙන තුරුත් මම නොදනිමි. එය මගේ සිතේ මවාගත් මනෝ විකාරයක් ද විය හැකිය.

මම උඩුබැලියෙන් වැතිර සිටියෙමි. කවුදෝ කළුවට ඇවිත් මගේ යටිකුස මත හිඳ ගත්තේය. මම පුබුදුව සිටියෙමි. ගතවූ නිමේෂයේ දී මගේ සාරය වැයවෙමින් මම අවදිව ගත්තෙමි. අවට අඳුරේ කිසිවකුත් නොවීය. පිටත නිශාචාරයන්ගේ හඬම පමණි.

මට මහත් අපුලක් දැනිණි. මා මේ සිහිනය දුටුවේ අමරසිරි බංඩාර විස්තර කරමින් කියූ දෙයක් සිතට කාවැදුණ නිසාද? අද වෙන තුරුත් හරි පිළිතුරක් දෙන්නට මම නොදන්නෙමි.

ගැටය ලිහී ගිය සරම යළිත් තද කොට හැඳගත් මම අප්‍රාණිකව නින්දක වැටුණෙමි. උදේ නයනාගේ කටහඬ ඇසෙන තෙක් මම මේ දැඩි නින්දේ ගැලුණෙමි.

“සිකුරාදා!”

සිතට යම් කිසි සහනයක් විය. තවත් සතියක ඉටුවිය යුතු වැඩ කොටස අවසන්. ගෙදර ගෙන යා යුතු ඇඳුම් බැඳුම් ද මල්ලේ ලා ගත් මම ලක ලෑස්ති වී නවාතැනින් පිටවුණෙමි. අමරසිරි බංඩාරත්,


Downloaded from sinhalaebooks.com

වජිරාත් පිලේ බලා සිටියේ තාන්තුවාවකින් මෙනි.

නයනා සුදුගවුම හැඳගෙන මා සමඟ ආවාය. පාසල තෙක් ඈ ගමන් කළේ මා සමඟිනි.

කාර්යාලයේදී කෙනකු අරුම සිදුවීම් ගැන කතා කළා නම් මම ඒවා මහ හැරියෙමි. ඕවාට අවනතවීම ඒවාට ගැතිවීමකියි මට සිතිණි. පසුගිය රාත්‍රියේ වූ සිදුවීම මා සැලකුයේ නොවැදගත් සිහිනයක්ම ලෙසින් පමණි. නමුත් එක් කරුණක් මට වද දුන්නේය.

උදේ නැගිටින විටම වත්තේ දැනුණ දුගඳය ඒ. කෑම මේසය වෙතදී ලීලාවතී මැණිකේද ඒ ගැන සඳහනක් කළාය.

"වත්ත පල්ලෙහායින් මහ වස පෙරේත ගඳක් එනවා" යි ඇය කියද්දී, අමරසිරි බංඩාරත් මමත් මුහුණෙන් මුහුණ බලා ගත්තෙමු.

ඇත්තෙන්ම ඒ ඔස්සේ කතා කරන්නට පවා මා තුළ පිරියක් නොවීය. කිරි හොදිත්, ලුණු මිරිසත් කලවම් වූ කැකුළු බත කෑ මම මේසය ළඟින් නැගිට්ටේ, "මට මොකද?" යන සිතුවිල්ලෙනි. මට මෙතැන නවාතැන් පළක්ම පමණි. අද දින මම ගෙදර යන්නෙමි. සති අන්තයේ මෙතැන මොනවා වුණත් මා වගකිව යුතු නොවේ යන ආකල්පයකි මා තුළ වූයේ.

දින එකහමාරකට හෝ මේ සියල්ල අමතක කර මගේ පුරුදු ලෝකයට යාමටය මා බලා සිටියේ. ලීලාවතී මැණිකේගේ ගෙදර තාවකාලික නවාතැන් පළක්ම පමණි. ඇයත් දරු තිදෙනාත් යන සියල්ල දිනෙක මගේ අතීතයට යන සටහන් පෙළක්ම පමණි. මෙවැනි සිතුවිල්ලකි. මල්ලත් රැගෙන පාරට එද්දී මා තුළ වූයේ.

නයනා මට අතවනා සිනාසී පාසල් ගොඩනැගිලි අතට පිය මැන්නාය. කාර්යාලයේ දී සුපුරුදු පරිදි අනෝමා මට විහිළු තහළු කළාය. මම ද පෙරළා විහිළු කළෙමි. ජයසිරි ලබන සතියේ දිනෙක බයිසිකලය බලන්නට යමුයි කීවේය. ටිකිරි බංඩා සුදු යකඩ වළල්ලක් ගැන කීවද මම ඒ ඔස්සේ කතා නොකළෙමි.

ලබන සතියේ දිනෙක තමාගේ ගෙදර රෑ කෑමට එන්නැයි සිරි ආරාධනාවක් කළේය. "දන්නැද්ද අයියෙ අපේ වයිෆ් මල්කාන්තිගෙ බර්ත් ඩේ එක. කට්ටියටම කෑම ටිකක් දෙන්න කියල පොරේ. ඔන්න තෑගි නම් ගේන්න එපා කියල කිව්වා." සිරී මට කිව්වේ ඔහුගේ කාර්යාල කාමරයේදීය.



Downloaded from sinhalaebooks.com

"කට්ටියම එනවනෙ?"

"ඔව් කන්තෝරුවෙ සේරම"

සිරි ජයතුංගගේ බිරිඳ මල්කාන්ති මා මෙතෙක් දැක ඇත්තේ දෙවතාවකි. දරුඵල නැති සොවින් ඇගේ මුහුණ මලානික වී යැයි මට ඒ දෙවරම සිතිණි. ඇගේ මුහුණ පැහැපත් වුවද එහි පිම්බුණු බර ගතියක් වෙයි. දැසේ කඳුළු ගතියක් වෙයි. ඈ පැබවිත්ම සිටින්නේ සතුටෙන් දැයි ඒ දෙවරම මට සිතිණි. කෙසේ වෙතත් ඊළඟ බදාදා ඇගේ උපන් දිනය උදෙසා ගෙදර රෑ කෑමකට යයි නම් ඇයට සුළු තෑග්ගක් ගෙන යා යුතු යැයි මට සිතිණි. තෑග්ග කොළඹින් ගත්තොත් වඩා හොඳයැයි කියාත් මට සිතිණි.

සෙනසුරාදා දවල් වරුවේ රුවිනීත් සමග මා සාප්පු සවාරියේ ගියේ මේ සිතුවිල්ලත් රඳවා ගෙනය. රුවිනීට ද මා ගවුම් රෙදි කෑල්ලක් අරන් දුන් පසු මා තවත් තෑගි තෝරන්නේ කාටදැයි ඈ විපරම් කළාය.

"මා කා එක්කදෝ පැටලිලා" යැයි ඈ විහිළුවකුත් කළාය.

මට අනෝමා මතක්විය. අනෝමා ගැන කිසිවක් මම රුවිනීට හෙළි නොකළෙමි. ගැහැනියක් තව ගැහැනියකගේ හොඳ අසන්නට මැළිවෙතැයි මා කොහේදෝ අසා තිබුණ බැවිනි.

අන්තිමේදී මල්කාන්තිට හැට්ට රෙදි කෑල්ල තෝරා දුන්නේ ද රුවිනීය. තෑගි මලු ගත් අපි දෙදෙන බම්බලපිටියේ අවන්හලකින් තේ බී මුහුදුවෙරළ අතට ඇවිද ගියෙමු.

හිරුඑළියෙන් නැහැවුණ මේ ලෝකය හබරවැවට වඩා හාත්පසින්ම වෙනස් විය. නිල් තහඩුවක් සේ බබලන මුහුදත්, සුදු වළාකුළු පාවී පාවී යන අහසත්, ළමුන්ගේ කෙළිලොල් දෙපයින් සටහන් ලද වැල්ලත් සියල්ල සිනාසෙන්නාක් මෙනි මට දැනුණේ. රුවිනීගේ අතින් අල්ලා ගෙන සෙවණක හිඳගත් මගේ හදවත ද සිනාසුණි.

"ඉතින් කියන්නකො හබරවැව විස්තර?" රුවිනී ළංව අසද්දී මට ඇගේ වත්සුණු සුවඳ දැනිණි.

"මහ පාළු පැත්තක් – මූසල පැත්තක්" මම කීවෙමි. විස්තර වශයෙන් කියන්නට මට සිතුණේ නැත.

"ගෙදර අය ගැන කියන්නකො"



Downloaded from sinhalaebooks.com

"පොඩි කෙල්ලට නම් විසේ."

"ලොකු කෙල්ලෙකුත් ඉන්නව නේද?"

"එයා වැඩිය කතා කරන්නෙ නැහැ."

"එහෙම නං හොඳයි."

"අමරසිරි බංඩාර නම් ඇවිත් කතා කර කර ඉන්නවා"

"රෑ පාළුව යන්නත් එක්ක හොඳයි එහෙනම්."

මගේ මුහුණේ සීරීම් ලකුණු, මගේ ඇඟ උඩ හිඳගත් කළු අවතාරයේ සිහිනය, අමරසිරි බංඩාරත් මමත් බත්කාගේ පැල සොයාගෙන මහ රෑ ගිය ගමන, මූකලානේ ගසේ පෙනුණ දිලිසෙන දෑස, අමරසිරි බංඩාරට උණගත් සිද්ධිය – මේ කිසිවක් ගැන මම කතා නොකළෙමි.

"මං හිතන් ඉන්නෙ බයිසිකල් කටුවක් ගන්න. එතකොට මට වැඩට යන්නත් ලේසියි. කොළඹ ඇවිත් රෑ යන කොට බෝඩිමට යන්නත් ලේසියි."

"ඔයා කරදරයක් නැතුව ඉන්නවනං මට ඒ ඇති ජනක" රුවිනී මගේ අත්ල මිරිකුවාය.

"මට තියෙන එකම කරදරේ ඔයාව දකින්න ලැබෙන්නෙ නැති එක."

"හැමදාම නෙමෙයිනෙ. ඔයා ඔය අවුරුද්ද ඉඳල එනවනෙ"

සුසුමක් හෙළු මම මුහුදු දිය දෙස බැලූවෙමි. කෙළවරක් නැති සාගරය මෙන් විය. මගේ මේ දුරු ගමන. සිතිජය ඈතට ඈතට යන මායාවක්ම පමණි. රුවිනී ගෙදරට ඇරලා එද්දී මට මහා හිස් බවක් දැනිණි.

ඉරිදා දහවල මා යළිත්. හබරවැව යා යුතු විය. මල්ල අසුරා මා ගමනට ලෑස්තිවූයේ යම්කිසි අලස ගතියකිනි. නොයා නොහැකි ගමනකි මෙය. බස්රියෙන් බැස අඳුරේ යන ගමන මතක් වෙද්දී සිතට යම්කිසි චකිතයක් ද දැනෙන්නට විය. එහෙත් මම සිත දැඩි කර ගත්තෙමි.

රාත්‍රි දහය මඳක් පසුවී මම හබරවැව හන්දියට සේන්දු වූනෙමි. පොද වැස්සක් වැටී හැම තැනම තෙත ගතියක් විය. කුඩයක් අරන් යන්නැයි අම්මා හැමදාම කීවත් මා ඒ අවවාදය කවදාවත්



Downloaded from sinhalaebooks.com

නොඇසුවෙමි. "පිරිමි කමට කුඩේ උස්සන් යන එක මදි කමක්ද?" යි වරක් අම්මා කී කතාවකුත් මට සිහිවිය.

හන්දියේ හැම තැනම, හැමදෙයම සීතල සාලුව පොරවා නිදාගත්තා සේය. බස්රියෙන් බැස්ස දෙතුන් දෙනා අවට අඳුරේ අතුරුදන් වූහ. අන්තිම බස්රිය ඇවිත් යනතෙක් ඇරී තිබුණු කඩයේ කෙළවර දොර ලෑලි දෙකෙන් පිටතට ආ ලාම්පුවේ සුදු එළිය තීරුවේ වැහිදිය දිලිසිණි. යළිත් පොද වැස්සක් වැටෙන්නට පටන් ගති.

රියැදුරාත් කොන්දොස්තරත් 'දිනසිරි' හෝටලයට වැදී උණු තේ ඉල්ලද්දී මටත් එකක් ඇත්නම් යැයි සිතිණි.

මුදලාලි දුන් උණු තේ කහට තොල ගාමින් දොර අද්දරම පුටුවක හිඳගත් මට ළාවට වැටෙන වැහි පොදේ හඬ ඇසිණි. තව මඳකින් රියැදුරාත් කොන්දොස්තරත් කවුන්ටරයේ වීදුරුව මතට කාසි විසිකොට පිටව යද්දී බස්රියේ එන්ජිම නැඟූ අඳෝනා හඬ ඇසිණි.

"මහත්තෙයා යන්නෙ ලීලාවතී මැණිකෙලැයි අහට නෙවද?" මුදලාලි දොරකඩට විත් ඇසුවේය.

"ඔව්"

"ටිකක් දුර පයින් යන්න වෙනවා"

"ඔව් ඉතින්"

"මේ වැස්සෙ? "

"කුඩු පොදයක්නෙ – ගාණක් නෑ"

"කුඩයක් නෑ?"

"ඕන නෑ"

"මං එකක් දෙන්නං මහත්තයා. හෙට බැංකුවට එනකොට ගේන්ටකෝ"

ඇතුළට ගිය ඔහු කළු කුඩ කබලක් ගෙනවුත් මට පෑවේය. මම සිනාසී එය පිළිගත්තෙමි. මේ මොහොතේ ආගන්තුක සත්කාරයට එපා කියන්නට බැරිය.

මල්ල කරේ ලාගත් මම අතකින් ගත් විදුලි පන්දම දල්වා අතකින් කුඩය ඉහළා ගත්තෙමි. කුඩු පොදය කෙමෙන් තදවෙන බව මට දැනුණේ මඳක් දුර යද්දීය.

Downloaded from sinhalaebooks.com

හැකි අයුරින් මම පය ඉක්මන් කළෙමි. තාර පාර මැදටම වී ඇවිද ගිය මගේ දෙපයේ ලූ රබර් සපත්තුවල අඩි වරස් වරස් හඬ නැඟිය. කුඩයෙන් බේරෙන වතුර මා වටේටම විය. විදුලි පන්දමේ එළිය වැටෙන මානයේ වැහි පොද රිදියෙන් දිලිසුණි. අවට අඳුරේ ඇසෙන්නේ වැහි දිය කොළ මත වැටෙමින් නඟන නොයෙකුත් රිද්මයන්ය. තව මඳක් දුර යද්දී වමත බෑවුමේ ගංදිය සැඩව ගලායන හඬද ඇසෙන්නට විය. තෙත් වූ පොළවෙන් ද ගස් වැලින් ද නගින ගඳ – සුවඳ සියල්ල කලවම්ව මගේ පෙණහලු පුරවාගති. මගේ සුසුම් ද ඉක්මන් විය. බයිසිකලයක් තිබුණා නම්'යැයි මට සිතිණි. කොයිකටත් මේ වගේ පළාතක ඉන්දැද්දී වැහි කබායකුත් හිස් වැස්මකුත් තිබිය යුතුය.

කවුදෝ ඉදිරියෙන් ඇවිද යනු යන්තමට පෙනිණි. සෙමින් ගමන් කරන කුඩා රුවකි. සුදු සාරියක් දවටා ගත් ගැහැනියකි. ඇගේ අතක පත් මල්ලකි. මේ ඇ කොහේ යනවාද? මගේ සිත අදිමදි කරන්නට විය. ඇයව පසුකර යනවාද? නැත්නම් ඇයට යන්නට හැර හෙමින් යනවාද?

නොයෙක් හොල්මන් කතා මට මතක් විය. බූස්සේ මිනී පිට්ටනිය ළඟින් රියට නැංග ගැහැනිය මඳක් දුරදී අතුරුදහන් වූ කතාව. මීරිගම දුම්රිය පාර, මහපාර හරහා යන තැන රියට අත ඔසවන ගැහැනිය – රෙදි ගැටය තද කරගන්නා තෙක් දරුවා වඩා ගන්නැයි කියන ගැහැනිය.

ඉදිරියෙන් යන රුව ඉතාම සෙමිනි ගමන් ගත්තේ. හිත දැඩි කරගත් මම ඒ අතට විදුලි පන්දම යොමු කරමින් "වත්තක් වේවා"යි අඩිය ඉක්මන් කළෙමි.

ගැහැනියක් තමා. මැදිවියට ළංවූ ගැහැනියක්.

"තව පොඩ්ඩ දුරයි මහත්තයා" මා යමක් කියන්නටත් පෙර ඈ කතා කළාය.

"කොහේ යනවද?"

"අර කන්දට"

"මට තව ටිකක් දුර යන්න ඕනැ. තෙමෙනවනෙ එන්න කුඩේ යටට"



Downloaded from sinhalaebooks.com

"අනේ පින් සිද්ද වෙනව මහත්තයා" ඈ කුඩයේ සෙවනට ආවාය.

ඈ වෙතින් නික්මී දහදිය ගඳ මට හොඳින්ම දැනිණි. එයට තෙතමනය ද කලවම් වී ඇත.

"මාත් බස් එකේ ආවෙ." ඇය කීවත් මට නම් මතකයක් නොවීය. මා තේ බොන්නට කඩයට ගිය අතරේ ඇය මේ දුර එන්නට ඇතැයි මම අනුමාන කළෙමි.

"කොහේ ගියාද?"

" නුවර ගියා, නංගි බලලා එන්ඩ පැනිදෙනියෙ. සනීප මදි."

"හොඳ දවසක්නෙ ගමනට තෝරාගත්තෙ" මා එසේ කීවේ විහිළුවක ස්වරයෙනි.

"වෙලාවක් කියල නැනෙ මහත්තයා මරණාසන්නයි" ඇගේ කටහඬේ වූයේ බෙලෙක් ගතියකි.

මට අනේ යැයි කියැවිණි.

"ඒක ආවම කාටවත් නවත්තන්න බැනෙ මහත්තයා. කොතැන හිටියත් හැංගෙන්ට බෑ."

"ඒක හරි"

"මහත්තය ඉතින් පරිස්සමෙන් යන්න. මං මෙතනින් උඩහට යනවා"

ඇය මෙසේ කීවේ. අමරසිරි බංඩාරත් මාත් කලින් රාත්‍රියක නැඟී කඳුගැටය පසුකරද්දීය. මගේ හද ගැස්සිණි. මේ ගැහැනිය මේ රාත්‍රී වරුසාවේ එතැනින් යන්නේ කොහොමද?

"ඔය අහ ගෙවල් තියෙනවයැ?" මට කියැවිණි.

"මොකෝ නැත්තෙ මහත්තයා?" ඈ බොල් හඬින් සිනාසුණාය. "තව එහාට යන්ට එපායැ."

"කරුවලේ ඇහැකිද?" මම ඒ අතට විදුලි පන්දම යොමු කළෙමි.

"මොකෝ බැරි මහත්තයා? හැමදාම යන එන පාර"

"පාර?"

"අඩිපාර ඔය උඩහ"

එක්වනම ඈ කුඩයේ සෙවනෙන් ඈත්ව දකුණතට වූ කන්ද නඟින්නට වුණාය. නැංගා නොව පියැඹුවා කියායි මට සිතුණේ.



Downloaded from sinhalaebooks.com

එතරම්ම කඩිනමකින් ඈ මාතා පඳුරු අතරින් උඩට නැංගාය. එක්වනම ඈ තුරුණු සෙයක් පෑවාය. මම ඒ අතට විදුලි පන්දම යොමු කළෙමි. අඩිපාරක් තිබුණා නම් මට එය හරිහැටි පෙනුණේ නැති. හදිසියේම මගේ විදුලි පන්දමේ එළියෙන් කන්ද මඳක් දුර තවත් කවුදෝ බලා සිටිනවා පෙනිණි. සුදු සරම් කඩක් පමණි මුලින් පෙනුණේ.

එක්වනම ඈත විදුලියක් කොටද්දී ඒ තැනැත්තා ද කළු කුඩයක් ඉහළා ගෙන සිටින බව මට පෙනිණි. ගැහැනිය ඒ කුඩය යටට රිංගුවාය. තව මොහොතකින් සියල්ල අඳුරේ නොපෙනී ගියේය.

කෙනෙකුට උදව් කළාය කියන සතුටු සහගත සිතුවිල්ලෙන් මම පය ඉක්මන් කළෙමි. මා බියවිය යුතු නැත. නිකංම නිකං ගැමි ගැහැනියකි ඒ. ඊළඟ මොහොතේ මට කවුදෝ සිනාසෙන්නාක් සේ ඇසිණි. එය ඇසුණේ මා හැරදා ආ කඳුගැටය දෙසිනි. අනතුරුව එය සිනාවක්. ද හැඬුමක් දැයි කිව නොහැකි ආකාරයෙන් ව්‍යාකූලව ඇසිණි.

සිතේ බිය යළිත් ඉස්මතුවිය. නොසිතාම "ඉතිපිසො" ගාථාව මුමුණමින් මම දුවන්නට වුණෙමි.

වැස්ස මැදින් දුව ආ මා හැල්මේ ඉස්තෝප්පුවට ගොඩ නැගෙන විට එහි ගෙදර සතර දෙනාම හිඳගෙන සිටියහ.

"පුළුවන් කමක් තිබුණා නං අපි කවුරු හරි හන්දියට එනවා" යි ලීලාවතී මැණිකේ කීවාය.

"මට සනීප තිබුණා නං එනව අයියෙ"යි අමරසිරි බංඩාර ද කීවේය.

"ඕං බත් පංගුව නිමිලත් ඇති." වජිරා එකතු කළාය "අපි මේ බයේ මඟ බලාන හිටියෙ"

"මාත් නිදිමැරුවා අයියා නිසා" නයනා නෝක්කඩුවට මෙන් කියා ඇනුමක් ඇරියාය.

"යනව යනවා ඉතින් නිදාගන්න දැන් අයියා ආවනෙ." ලීලාවතී මැණිකේ විධාන දුන්නාය. "ලොකු දුවේ අයියට වතුර ටිකක් රත්කරල දෙමු මූණ තවා ගන්න. කාගෙද මේ කුඩේ?"

"හන්දියෙ කඩේ මුදලාලි දුන්නා"

"අනේ හොඳයි – ඒක තිබුනැයින්"



Downloaded from sinhalaebooks.com

"මගදි කවුදෝ ගෑනියෙක් කුඩේ යටට ආවා" මට කියැවුණේ දිග හැරි කුඩය දිය බේරෙන්නට ඉස්තෝප්පුවේ දොරකඩම තබන අතරේය.

"අනේ පිනක් ඒකත්" කී ලීලාවතී මැණිකේ අනුව දැරිවියෝ දෙදෙනා ගෙට ගියාහ.

මා තෙමුණු ඇඳුම් අහවර කරන්නට කාමරයට යද්දී අමරසිරි බංඩාර ද මා අනුව ආවේය.

"කොහේදිද අයියෙ ඔය කියන ගෑනි හදි ගැහුණෙ?"

"අපි එදා ගිය කන්දට මෙහායින්"

"කුඹියන් කැලේ!"

"කුඹියන් කැලේ?"

"ඔව් ඒ හරියට කියන්නෙ කුඹියන් කැලේ කියලා. ඒ හරියෙ කිට්ටුව නං ගෙවල් නැහැ"

"මේ ගෑනි කන්ද නැගල ගියා" කී මම කලිසම උනා සරම් ගැටය තද කර ගත්තෙමි.

අමරසිරි බංඩාර අවිශ්වාසයෙන් මෙන් ඇඳ කෙළවරක හිඳ ගත්තේය. ඔහුගේ දෑසේ රැඳි බිය මට ද පෙනිණි.

"ඇයි මල්ලි මොකද?"

"අයියා දැක්කෙ කවුදැයි කියල මට අඩමානෙට හිතෙනවා"

"කවුද?"

"සිසිලින් – බක්කගෙ ගෑනි"

"අනේ නිකා ඉන්න මල්ලි."

"හොඳයි අයියා මොනවද දැක්කෙ?"

"මොනව දකින්නද? ගෑනි මගේ කුඩේ යටින් ආවා කන්ද නැගල ගියා. කන්ද උඩ කවුදෝ හිටියා කුඩයක් ඉහලගෙන"

"උස මහත මිනිහෙක්?" අමරසිරි බංඩාරගේ ප්‍රශ්නයේ පිළිතුර ද රැඳිණි.

"ඔව්"

"බක්කා!" ඔහු කියත්ම මගේ ගත හිරිගඬු පිපුණි. කාට විශ්වාස කරන්නද? දොරකඩට ආ වජිරා "වතුර ටික ලෑස්ති"යි කී හෙයින් අපේ කතාබහ නතර විණි.


Downloaded from sinhalaebooks.com

# 6

පිටුපස පිලෙහි තිබූ ලොකු බේසමේ වූ උණුදියෙන් මුණ අතපය දොවා ගනිද්දී පිටත වැහි බේරෙන වටපිටාවේ අඳුර දෙස බලන්නට පවා මා තුළ වූයේ බියකි. කඩිනමින් මුහුණ සෝදා පිසදා ගත් මම කෑම මේසය වෙතට ආවෙමි.

වජිරා මගේ කෑම පංගුව වැසූ පියනින් ඇරියාය. එහි සුදු බතුත්, පරිප්පුත්, අල බැදුමකුත්, බණ්ඩක්කා ටිකකුත් විය. මගේ බඩගින්න දැඩි විය. මා කෑම කන්නට පටන් ගනිත්ම, ඒ අසල චිත් හිඳගත් අමරසිරි බංඩාර විවර කරගත් දෑසින් මා දෙස බැලුවේය. වජිරා නොපෙනී ගිය සැණින් –"අයියා බය වුණාද?"යි ඔහු ඇසීය.

"නෑ... මං මොකටද බය වෙන්නෙ? මං එහෙම නං දැන් ඒ හැම එකටම මූණ දීලනෙ තියෙන්නෙ." මම පහත් හඬින් පිළිතුරු දුන්නෙමි "මං එතකොට සිසිලින්වත් දැක්කා– බක්කාවත් දැක්කා. ඒ කාගෙන්වත් මට කරදරයක් උනේ නෑ."

"ඒක හරි. හිතේ බය නැත්තං මොකද?"

"දැන් ඕක වෙලා ඉවරනෙ මල්ලි. දැන් ඕකට බය ගන්න දෙයක් නෑ." මා එසේ කීවේ ඔහුගේ සිත එකලාසයක් කරන්නටය.

"නිදිමතයි" කියමින් ඔහු මේසය ළඟින් ඉවත්ව ගියේය.

මම කෑම කා අත සෝදාගෙන කාමරයට වැදුණෙමි. මේසය මත පෙරදා පරිදි චිමිනි ලාම්පුව දැල්විණි. කවුළු සියල්ල වසා දමලාය.

Downloaded from sinhalaebooks.com

පිටත වැස්ස වැටුණත් ඇතුළත සුරක්ෂිතභාවයක් විය. මම මේසයට එලූ කොළය යටින් රුවිනීගේ සේයාරුව ගෙන කීප මොහොතක් ඒ දෑස් දෙස බලා සිටියෙමි. ඒයේ දින ඇය හමුවීම කතාබස් කිරීම, සියල්ලම සිහිනයක් පරිදිය. අද රාත්‍රියේ සිදුවීම ද එවන්ම සිහිනයක් පමණක් විය.

ඇඳට ගිය මම නිකමට කොට්ටය යට අතගා බැලුවෙමි. පිරිත් පොත එතැන නැත. නයනා හෝ වජිරා හෝ එය ගෙන යන්නට ඇතැයි මම අනුමාන කළෙමි.

පහන නිවා ඇඳට ගොඩ නැඟුණ මට එකවර නිදාගන්නට නම් නොහැකිවිය. මගේ කූඩය යටින් ඇවිද ආ ගැහැනියගේ රුව සිත තුළ හොල්මන් කරන්නට විය. ඇය කවුරුන් විය හැකිද? ඇගේ මුහුණ මම හරිහැටි නොදුටුවෙමි. ඇය වෙතින් නික්මී දහදිය ගඳ පමණි මතක. සුදු සාරියයි–පත් මල්ලයි. බෙලෙක්කයක් සූරන්නාක් වැනි කට හඬයි. "වෙලාවක් කියල නැතෙ මහත්තයා–මරණාසන්නයි" ඇය ඒ දෙඩුවේ කා ගැන ද? ඈ කන්ද නැඟ ගියේ කෙතරම් කඩිනමින්ද? පළපුරුදු කම විය නොහැකිද? එතකොට අර කඳුගැටය උඩ කළු කුඩයක් ඔසවාගෙන සුදු සරමක් හැඳ ගෙන සිටියේ කවුරුද? ඇත්තෙන්ම ඒ බක්කාගේ අවතාරයද? මොක වුනත් මට කරදරයක් වුනේ නැතේ යැයි සිතූ මම කොට්ටය දැතින්ම තලා හරි ගස්සා නිදන්නට ඇලයට හැරුණෙමි. මට අන්තිමට මතක වැස්සේ අඛණ්ඩ හඬ පමණි.

මා අවදිවෙන විට හිරු පායා තිබිණි. නයනාගේ කෙළිලොල් කටහඬ ගේ තුළින් ඇසිණි.පෙරදා රැයේ මා ගෙන ආ කූඩය දිය සිඳී තවමත් ඇරුණ ගමන් ඉස්තෝප්පුවේ දොරකඩ විය. රාත්‍රියේ සිදුවීම සිහිනයක්ම පමණි. මා රැවුල බෑවේ පිටුපස පිලේ කණුවක එල්ලුණ කුඩා හතරැස් කන්නාඩියෙන් බලා ගෙනය. අද මෙසේ කරද්දී කම්මුලේ යන්තමට රැඳුණ සීරීම් පහරක් මට පෙනුණි. යන්තම් එක සීරීම් පහරක් පමණි. කිසිවෙකුටත් ඒ ගැන කියන්නට හෝ කතා කරන්නට මා තුළ උවමනාවක් නොවීය. වඩ වඩා අවුස්සා කතා කිරීමෙන් වන්නේ සියල්ල උවමනාවට වඩා උළුප්පා පෙන්වීමය. අත්‍යවශ්‍ය දෙයට වැඩි තැනක් දීමය.



Downloaded from sinhalaebooks.com

යක්ෂයා, සාතන් වැනි දෙයක් ඇත්නම් එය අපේ ජීවිතයේ ප්‍රධාන දෙය නොව. අඳුරු මුල්ලකට දමා ගුලි කොට විසිකොට දැමිය යුතු දෙයක් බව මා කොහේදෝ කියවා තිබිණි. නොහොඳ නරක හැම දෙයකටම අප කළ යුත්තේ ඒ ටිකයි. ඒවා වගා කිරීම නොව. හෙළා දමා උදුරා දැමීමයි. අප ජීවත්විය යුත්තේ ආලෝකයේයි. සිතිය යුත්තේ ආලෝකය හා හොඳ දෙය ගැනම පමණි. සිතට සැහැල්ලුවක් ලැබෙන්නේ එවිටය. මගේ මුහුණේ වූ සීරීම මම අමතක කර දැම්මෙමි. එය නව දවසකින් ඇකී මැකී යන දෙයක් පමණි. කලින් වතාවේ වූ සීරීම් ද කැළැල් නැතිව මැකී ගියේය. මෙවන් සීරීම්වල කැළැල් නොරැඳෙන බව මට කියා දුන්නේ ටිකිරි බංඩායි.

මා සීරීම කොතෙක් අමතක කර සිටිය ද බැංකුවේ දී අනෝමා එය දුටුවාය. "කවුද ඔයාව පහුරු ගෑවෙ?" ඇය ඇසුවේ විහිළුවට මෙනි. මම පිළිතුරු නොදුන්නෙමි.

"කොළඹදී ඔයා කෙළිපැටික්කිව බලන්න ගියාම එයා පහුරු ගෑවා නේද?"

"එයා පහුරු ගාන ජාතියෙ කෙනෙක් නෙවි අනෝමා"

"අපෝ ආදරේ"

"ඔව් එයා තමා ආදරේට පහුරු ගෑවෙ."

මම කතාව වෙනතකට හරවන්නට සිතුවත්, පහුරු ගෑමේ කතාව අසමින් ටිකිරිබංඩා ද එතැනට ආවේය.

"චැඃ චැඃ පාරක් තියෙනවනෙ මහත්තයා" ඔහු කීවේ අතැඟිල්ලකින් මගේ කම්මුල ද අතගාමිනි. "ඕකට නං මොනව හරි කරන්න ඕනැ."

"මොනවත් කරන්න ඕනැ නැ ටිකිරිබංඩා ඕක ඇරිලා යාවි."

"අනේ මහත්තයා මං කිව්ව විදියට සුදු යකඩ වළල්ලක් පැළැන්දා නං"

අනෝමා සිනාසෙන්නට වූණාය.

"මං වළලු දාන්නෙ නැ ටිකිරි බංඩා" මම තීරණයකින් කීවෙමි. "වළල්ල අපේ මේ අනෝමා නෝනටම දෙන්න."

"ඔයා දුන්නොත් මං දාගන්නවා," කී අනෝමා නැඟිට ගියාය.

"මහත්තයා" මගේ මේසය ළඟ නැඹුරු වූ ටිකිරි බංඩා රහසින් මෙනි කතා කළේ. "මහත්තයා ඊයෙත් රෑ පානෙ තනියෙන් ගියානේ?



Downloaded from sinhalaebooks.com

"ඔව් ඉතින්"

"වැස්සෙම........"

"මට කුඩයක් හම්බ උනා දිනසිරි හෝටලේ මුදලාලිගෙන් අද
උදේ ඒක මං දීගෙන ආවෙ."

"මගදි මොකවත් උනාද?"

"නෑ මොකුත් උනේ නෑ"

"එහෙනං කමක් නෑ" ටිකිරිබංඩා සුසුමක් හෙළුවේය. "අපේ අර
ජයසිරි කිව්වනෙ බයිසිකලයක් අඩුවට හොයාල දෙනව කියල ඒක
අරගන්ඩ. අද නං ජයසිරි එන එකක් නෑ."

"මිනිහ කොහේ ගිහින්ද?"

"හදිසියේ මරණයක් වෙලා කියල උදේ පණිවිඩේ ආවෙ. නැන්දා
කෙනෙකුගෙ මරණයක්"

"කොහේද?"

"නුවර පැත්තෙ – පැනිදෙනියෙ"

"පැනිදෙනියෙ?" මගේ කටහඬේ විශ්මය ටිකිරි බංඩාට දැනෙන්නට
ඇත.

"ඇයි මහත්තයා?"

"නෑ නෑ – නිකං" පෙරදා රාත්‍රියේ මගේ කුඩය යටින් ඇවිද ගිය
ගැහැනිය කිව්වේ ඇය පැනිදෙනියට ගිය බවයි. ඇගේ කටහඬ මට
ඇසෙන්නාක් මෙන් විය." නුවර ගියා නංගි බලාලා එන්ඩ – පැනිදෙනියෙ
– සනීප මදි...වෙලාවක් කියල නෑනෙ මහත්තයා – මරණාසන්නයි"
මේ සියල්ල සිහිවද්දී මගේ උගුර කට වියැළිණි.

"මහත්තය දන්නවද පැනිදෙනිය හරිය?"

"නෑ මං අහලවත් නෑ"

"පේරාදෙනිය පැත්තෙ."

"ජයසිරිගෙ කවුද මැරුණායි කිව්වෙ?"

"නැන්දා කෙනෙක්"

"මිනිහ හෙට ඒවිනෙ"

"මළගමටත් ඉඳල ඒවි. හෙටලු ආදාහනේ. බයිසිකලේ මිනිහ අරන්
දේවි ආවාම."



Downloaded from sinhalaebooks.com

දැන් මට වුවමනා වුනේ බයිසිකලයක් නොවේ. ජයසිරිගේ මැරුණේ කවුදැයි දැන ගැනීමය. මේ සියලු සිදුවීම් එකට සම්බන්ධ වෙන පුරුක් මෙන්ය මට දැන් හැඟෙන්නට වූයේ.

අප දවාලට කෑම ගෙන්වා ගත්තේ දිනසිරි හෝටලයෙනි. සාමාන්‍යයෙන් අතුලත් – චිත්‍රාත් මාත්, අනෝමාත් කෑම ගත්තේ කාර්යාලයේ පිටුපස කාමරයේ මේසයක් ළඟ හිඳ ගෙනය. අපි නොයෙක් විහිලු තහලු කරමින් කෑම කන්නෙමු. අද නම් මට කෑම ප්‍රිය්‍යක් නොවීය. වැඩිපුර කතා කිරීමේ කැමැත්තක් ද නොවීය.

"මොකද අද මෙයා වැඩි බහක් නැත්තෙ?" චිත්‍රා විමසූ කල,

"අද එයාට කොළඹ එක්කෙනාව මතක් වෙලා" යැයි අනෝමා කීවාය.

"උඹල සේරම දාලා කොළඹ යන්ට තමා මට ඕනැ" මම අමනාප ස්වරයෙන් කීවෙමි. "මෙහේ කරන්නවත් දෙයක් තියේද?"

"ඇයි බදාදා මල්කාන්තිගෙ පාටිය?" අතුල මතක් කළේය. "ටිකක් ඉවසලා ඉඳපං බං. මෙහේ වරදක් නෑ පුරුදු උනාම."

"ඔයාටත් තියෙන්නෙ මෙහෙම ඕන්න බහින්න" චිත්‍රා ඉඟියක් පෑවාය.

මම කතා නොකළෙමි. අනෝමා ද නිහඬය. චිත්‍රා හදන්නේ අපව පටලවන්නටද?

"ඕන්න බහින්න ඕන නෑ චිත්‍රා. මට දැවැද්දක් හම්බ වෙනවා"

"අනේ ඉතින් එයාගෙ නම කියන්ටකෝ" චිත්‍රා ඇවිටිලි කළාය.

අනෝමා නිහඬව බත් අනන්නේ මා දෙස නොබලා වුවත් ඇගේ දැඩි අවධානය මගේ කතාව කෙරෙහිය.

"නම කියන්නෙ නැහැ. මඟුල් කාඩ් එක එව්වම බලා ගන්ඩකෝ"යි මට කියැවිණි.

"එයා බඳින්නෙ මූණ සූරන එක්කෙනෙක්" අනෝමා කීවිට මම බත් ඉතිරිය පතේම අකුලා හුන් තැනින් නැගිට්ටෙමි. මගේ මුහුණේ සීරීම විහිළුවකට ලක්වීම මා ඉහිළුවේ නැති. ඒයේ සිදුවූ හැම දෙයක්ම කියා දමන්නට සිතුණ ද මම නිහඬවතම රැක්කෙමි.

"සේරම විකාර" බත් ටික කුණු කූඩයට විසිකරන අතරේ මට කියැවිණි. පසු දොරෙන් පිට වී ඇවිද ගිය මගේ කෝපය අන් අයට



Downloaded from sinhalaebooks.com

දැනෙන්නට ඇත. හදිසියේම ඔවුන් අතර නිහැඬියාවක් විය. මම කසගස යට බංකුවේ හිඳ කෝපය තිවාගත්තෙමි.

මඳ වේලාවකින් අනෝමා මා සොයා ආවාය. "ඔයා අපි එක්ක තරහ වෙලාද?" මා ළඟ හිඳගත් ඇය කතා කළේ පෙර නොවූ විරූ ළතෙත් ආකාරයකිනි.

"නෑ මං කා එක්කවත් තරහ වුනේ නෑ" මට කියැවිණි. "මූණ හූරන ඒවා ගැන කතා කරනවට මං කැමති නෑ"

"හොඳයි අපි මින් පස්සෙ එහෙම දේවල් කතා කරන්නෙ නෑ හොඳේ."

"හොඳයි"

"මං දන්නව ඔයාගෙ හිතේ කරදරයක් තියෙනවා ජනක."

"මගේ හිතේ තියෙන කරදර ඕගොල්ලො කවුරුවත් තේරුං ගන්න එකක් නැහැ"

"කාට හරි කිව්වම හිතට සැහැල්ලුවක් දැනෙනවා"

"ඒව සේරම කොළඹදී කියල ආවෙ."

"මං ඕවා අහන්න යන්නෙ නෑ ජනක. ඔයාට ඕනෑ නං විතරක් කියන්න."

"මට දැන්නං කියන්න දෙයක් නෑ"

"හොඳයි අපි තරහ නැනෙ?"

"තරහ වෙන්න අපි යාළුවෙලා හිටියැයි?"

ඇගේ සිනහවට මමත් සිනාසුණෙමි. සියල්ල සැහැල්ලුවෙන් විසඳී යෑම සහනයක් විය. ඇත්තෙන්ම අනෝමා වරදක් නැති කෙල්ලකැයි මට සිතුණි. රුවිනී මගේ ජීවිතයට ඇතුළු නොවී සිටියා නම් සමහර විට මා අනෝමා හා තවත් මිතුරුවන්නට ඉඩ තිබිණි. එහෙත් මගේ හදවතේ ඉඩ තිබුණේ රුවිනීටම පමණි.

මා සවස නවාතැනට එනවිට අමරසිරි බංඩාර සිනාමුසු මුහුණෙන් යුතුව ඉස්තෝප්පුවේ කොට බිත්තිය මත හිඳ සිටියේය.

"මං හිතුව අයිය බයිසිකලේ අරන් ඒවි කියලා"

"නෑ තාම හම්බ උනේ නෑ. මට බයිසිකලේ අරන් දෙනව කිව්ව ජයසිරි මළ ගෙදරක ගිහිල්ලා"



Downloaded from sinhalaebooks.com

"එහෙනං ඒකත් කල් ගියා. ඊයෙ අයියට දෙයක් කියන්න බැරි උනානෙ"

"මොකද්ද මල්ලි?" කියමින් මා කාමරයට යද්දී ඔහුද මා පසුපසින් ආවේය.

"අයියට මතක ද අපේ වත්තෙ තිබුණ ගඳ? ඒකට හේතුව හම්බ උනා"

"මොකද්ද?"

"පිලිකන්නෙ පඳුරු යට උගුරුමීයෙක් මැරිල හිටියා"

"මං කිව්වෙ. හැම එකටම හේතුවක් උත්තරයක් තියෙනවා."

"ඒ උනාට අයියා ඊයෙ රෑ දැකපු දෙන්නා ගැන නං හේතුවක් උත්තරයක් නෑ"

"හොඳයි අපි හිතමු මං හොල්මන් දෙකක් දැක්කා කියලා. ඉතින් ඒකත් වෙලා ඉවරයි. හේතුවක් ඇතත් නැතත්."

"අයියා හැමදේම දිහා බලන්නෙ සැහැල්ලුවෙන්"

"හැමදේම තාවකාලිකයි කියනවනෙ මල්ලි."

මම කලිසම උනා සරමට බැස්සෙමි. මගේ මුහුණ දෙස මඳක් බලා සිටි අමරසිරි බංඩාර "අයියගෙ මූණෙ ආයෙත් පාරක් තියෙනව නේද?" යි කීය.

"ඒක ඇරිල යාවි. ඊයෙ එනකොට රෑ කරුවලේ ගස් අත්තකට හීරෙන්න ඇති."

"එහෙම හිතමු. මේ බලන්න මගෙ පපුවෙ." කමිසය මෑත් කළ ඔහු වම් උරහිසට පහළින් වූ රතු සීරීම් ලකුණක් පෙන්වූයේය. එය තරමක් ඇතුළට කැපුණු අඟල් තුනක් පමණ දිගු රේඛාවක් විය. "අයියා හිතන්නෙ මේක කොහොම උනැයි කියලද?"

"කියන්න බලන්න"

"මාත් මේක දැක්ක වෙලාවෙ ටිකක් බය වුණා. පස්සෙයි මට මතක් වුණේ. මං අර උගුරු මී කුණ අදින්න ගියෙ කමිසයක් ඇඟලන්නෙ නැතුව. මට පස්සෙයි මතක් වුණේ එතන දෙහි ගහක් තියෙනවා. මට නොදැනි ඔය දෙහි කටුවකට මෙතන හීරිලා තියෙනවා."

"මං කිව්වෙ එතකොට හැම එකටම හේතුවක් උත්තරයක් තියෙනවා."

"අයියා හිතන්නෙ හොල්මන් අවතාර ඇත්තද?"



Downloaded from sinhalaebooks.com

"ඇත්ත වෙන්න පුළුවන්. සමහර ඒවා නං නොවෙන්නත් පුළුවන්. මං අහල තියෙනවා. හදිසියේ මැරුණ අය තමන් මැරුණද කියල නොදැන ඒ තැන්වලම සැරි සරනව කියල."

"ඒ ගොල්ලන්ගෙ ආත්මෙ? නොසැනසුන ආත්මෙ?"

"බුදුහාමුදුරුවො කිව්වනෙ මල්ලි අපිට ආත්මයක් නැහැ කියලා"

"එහෙනං?"

"අපේ හිත හිතනවා – අපිට ආත්මයක් තියෙනවා කියලා මොකද හිතට ඕනැ තමුන්ගෙ කියල දෙයක් ඇති කරගන්න. ඉතින් හිත හැම තිස්සෙම හිතනවා. බයෙන් හිතනවා.' මං' මැරුණම මොකද වෙන්නෙ කියලා. එහෙම හිතන හිත ආත්මයක් ඇතිය කියල හිතනවා."

"අයියා හොඳට බණත් දන්නවනෙ. ආත්මයක් නැත්තං මොකක්ද ඔය ගිහින් ඉපදෙන්නෙ?"

"හිතම තමයි මල්ලි. හිතම තමයි ඇල්ම ඇතුව තැන තැන යන්නෙ. හිත හිතනවා. චේතනාවම තමයි කර්මය කියන්නෙ."

"මට ඔව්වා ගැඹුරු වැඩියි අයියා." අමරසිරි බංඩාර කමිස කර සකස් කර ගත්තේය. ඉතිං ඔය හොල්මන් වගේ පේන්නෙ මොනවද?"

"මං අහල තියෙනවා ඒ නොසැනසුන හිත යම් යම් ආශාවල් නිසා ටික වෙලාවකට ශරීරය මවා ගන්නව කියලා, ඒ කියන්නෙ කලින් මතකවලින් ශරීරය ටික වෙලාවකට මැවෙනවා."

"ඒ කියන්නෙ?"

"හරියට තිරේ රූප මැවෙනව වගේ. අපි හිතමු මැරිච්ච කෙනා බැදුම් කෑම කන්න ආසයි කියල – ඒ සුවඳට ආශාවට අර මතකෙන් ශරීරෙ ටික වෙලාවකට මැවෙනවා. ඒක තමයි අපි දකින්නෙ."

"අයියාත් දන්න දේවල්"

"ඒ උනාට මගේ හිතෙත් බය නැතුව නෙමෙයි. ඊයේ රාත්තිරියෙ අර ගෑනිව දැක්කම මට ටිකක් විතර බය හිතුණා. ඒ උනාට ඒ ගෑනි කතා කළාම මගේ බය අඩුවුණා."

"එතකොට අයියා දැන් ඒකට බයක් නෑ"

"ඒකට මූණ දුන්නට පස්සෙ ඒ බය අඩුවුණා." "මං කියන්නෙ නෑ මගේ බය එහෙම පිටින්ම ගියා කියලා."



Downloaded from sinhalaebooks.com

අපේ කතා බහට බාධා කරමින් වජිරා දොරකඩට ආවාය. "ඔන්න අයියා මූණ සෝදන් එනකල් තේ එක හදන්නෙ නෑ. ඇයි අම්ම කිව්වනෙ තේ එක තිමෙනව කියලා."

"අනේ හදන්ඩ නංගි. මං මේ දැන් මූණ සෝදන් එනවා."

එක්වනම මගේ සිතට සැහැල්ලුවක් දැනිණි. හොල්මන්වලට අප බිය විය යුතු නොවේ. මා දුටු දෙදෙනාම හොල්මන් නම් ඒ සියල්ල ද යටගියාවේ සිද්දියක්ම පමණි. අමරසිරි බංඩාරගේ පපුව සීරුණේ දෙහි කටුවකට නම් මගේ මූණ සීරුණේත් ගස් අත්තකට.........

මා මුහුණ සෝදා ගෙන එන විටම කාමර දොරකඩට තේ කෝප්පය රැගෙන ආවේ නයනායි.

"ෂා: නංගි ඔයාද හැදුවෙ?"

ඔව් කියන්නට මෙන් හිස සලා හිනැහුණ නයනා රහසින් මෙන් "නෑ අක්කා"යි මතුළාය.

තේ එක තොලගෑ මම "නංගි පිරිත් පොත අරන් ගියාද?"යි විමසුවෙමි.

"නෑ ඇයි අයිය ඒක කොට්ටෙ යට නැද්ද?"

"නෑ මං හිතුව ඕගොල්ලො අරන් යන්න ඇති කියලා."

"නෑ නෑ නෑ" කී ඈ ඇඳ වෙතට වුත් කොට්ටය පෙරළමින් සෙව්වාය. "මේකට මොකද උනේ?"

"අක්ක ගෙනියන්න ඇති."

"ඉන්නකෝ මං අහල එන්න" කී නයනා කාමරයෙන් පිටතට දුව ගියාය.

මම කවුළුවෙන් පිටත බලමින් තේ තොල ගෑවෙමි. මිදුලේ ඈත තැනක අමරසිරි බංඩාර මල් පාත්තියක් සුද්ද කරමින් සිටියේය.

ගෙතුළතට දුව ගිය නයනා කෑගාමින්ම යළිත් පෙරළා ආවාය.

"නෑ කියනවා. අක්ක කියනව නෑ කියල. අම්මත් කියනවා නෑ කියලා, පිරිත් පොත නැතිවෙලා අයියා. අතුරුදහන් වෙලා."

"ඒකත් එහෙනං අභිරහසක් තමයි."

ටික දවසක් යනතුරු පිරිත් පොතට වූ හදියක් අප දැනගත්තේ නැත.



Downloaded from sinhalaebooks.com

# 7

බදාදා සවස් යාමයේ සිරි ජයතුංගගේ නිවසේ රාත්‍රි කෑමත් සාදයත් විය. මා ඍ බෝවී තනි පංගලමේ ගෙදර පෙරළා ඒම නොසුදුසුය කියාත් මගේ තනි නොතනියට අමරසිරි බංඩාර ආ යුතු බවත් ලීලාවතී මැණිකේ කීවද, ඔහුට උත්සවයට ආරාධනයක් නොවූ හෙයින් ඔහු එහි කැඳවාගෙන යන්නට මගේ කැමැත්තක් නොවීය.

"මං දැන් හොල්මන් දැකල තියෙන්නෙ අම්මේ. මං ඕවට බය නෑ"යි මම ලීලාවතී මැණිකේටම කීවෙමි. "ජයසිරි බයිසිකලේ අරන් දුන්නනං මට රෑං ගාලා ගිහිල්ල එන්න තිබුණා."

"කෝ මිනිහ ආවෙ නැද්ද?"

"අදත් ආවෙ නෑ මළගම කියලා. මං හිතන්නෙ ඍ කෑමට නං ඒවි."

"එතකොට වත් අහල බලනව එහෙනං"

අඳුරු වැටෙන්නට කලින් මම ඇඟ සෝදාගෙන සිරි ජයතුංගගේ ගෙදර'තට පියමං කළෙමි. සවස හිරු එළිය වැටුණු අවට පරිසරය මනස්කාන්ත විය.

බෑවුමට පහතින් ගලා ගිය ගඟේ වතුර ද රන් හිරු එළියට ඔපවී බැබළිණි. කුඹියන් කැලේ මානා පඳුරු පවා රන්වන් වී නැලැවිණි. ඒ පැත්තේ මිනිසුන් හිටියත් නැතත්, හොල්මන් හිටියත් නැතත් මේ වෙලාවේ නම් මගේ සිතට බියක් නොදැනිණි.

අපේ සිතට බොහෝ විට බිය ඇති කරන්නේ අඳුරම නොවේද?

Downloaded from sinhalaebooks.com

එළිය වැටුණ විට එම පරිසරයම සිත සන්සුන් කරවයි. "නොපෙනෙන අඳුර" යැයි මට කියැවිණි.

මා සිරීගේ ගෙදරට ළංවෙන විටත් ඒ තුළින් නැගී සංගීතයක් ඇසිණි. අතුලත් - චිත්‍රාත්, අනෝමාත් කල් ඇතිවම ඇවිත් සිටියහ. චිත්‍රාත් - අනෝමාත් සිටියේ මල්කාන්තිට උදව් දෙමින් මුළුතැන් ගේ තුළය. මම එහි ගොස්, මල්කාන්තිට කොළඹින් ගෙන ආ තෑග්ග පිරිනැමුවෙමි.

"තෑගි එපා කිව්වනෙ. ආ මේ මොනවටද?" කී ඇ පාර්සලය දෑතින්ම ගෙන "තැන්ක් යූ" කීවාය.

මල්කාන්ති කොළඹ හැදුන වැඩුන ගැහැනියකි. ඇ මේ හබරවැවට පාත් වුනේ සිරීගේ රස්සාව නිසාය. බැංකුවෙන්ම ඔවුන්ට ලැබුණ ගේ පොඩිය ඇ ඉතා සීරුවට සරසා සකසා තිබුණාය.

තව මඳ වේලාවකින් අතුලත් - සිරීත් සමග බීර බඳුනක් තොලගාමින් මම ඉස්තෝප්පු කැල්ලේ හිඳ සිටියෙමි. මා බීර ඩිංගක් බිව්වා නම් මෙවන් උත්සව අවස්ථාවකදී පමණි. තව මඳකින් ටිකිරි බංඩාද ඇවිත් අපට හවුල් වුණේය.

"කෝ ජයසිරි? මිනිහ විතරයි අඩු."

"මිනිහා එයි. කිලි සෝදගෙන. අද දවල් කිව්වා මළගමින් ආවෙ" ටිකිරි බංඩා පිළිතුරු දුන්නේය.

අපි නොයෙක් දේවල් ගැන කතා කළෙමු. මගේ මූණ සිරීම මාතෘකාවක් නොවීම සැනසිල්ලක් විය.

අවට අඳුර ගලමින් පහන් ඔපවත් වෙද්දී ජයසිරි සිය බයිසිකලයෙන් මිදුලට ඇතුළුවිය. සුදු බැනියමත්, සරමත් හැඳ සිටි ඔහු වැයමෙන් සිනාසුණේය. මළගමකින් සාදයට පැමිණියේ බෑ කියන්නට බැරි නිසාය වැනි හැඟීමකි ඔහු පෙන්නුම් කළේ.

මියගියේ දුර නෑයකු බවය මා සිතා සිටියේ.

ඒ ඔස්සේ කිසි කෙනකු වැඩි කතා බහක් නොකළ ද මම ජයසිරිගෙන් ඒ ගැන ප්‍රශ්න කළෙමි.

"අපේ නැන්දා මහත්තයා. ටිකක් ලෙඩ ගනෙ හිටියෙ."

"කොහේද ගෙවල් කිව්වෙ? පැතිදෙනියෙ කිව්වනෙ?"

"ඔව් මහත්තයා. නුවර කිට්ටුව"



Downloaded from sinhalaebooks.com

"මට ඉරිදා රෑ හම්බ උනා පැනිදෙනියෙ ගිය එක් කෙනෙක්. ඒකයි මට මතක හිටියෙ"

"ඒ කොහේද මහත්තයා?"

"මං රෑ එනකොට කොළඹ ගිහින් බස් එකෙන් බැහැල බෝඩිමට යනකොට වැස්සෙ මගේ කුඩේ හෙවනට ආවා ගෑනියෙක්. එයා පැනිදෙනියෙ ගියා කිව්වා නංගි කෙනෙක් බලන්න මරණාසන්නයි කිව්වා,"

ජයසිරි වටපිට බැලුවේය. අතුලත් - සිරිත් ටිකිරි බංඩාත් එහා කෙළවරේ වෙනම කතාවක පැටලී සිටියහ.

"කොයි හරියෙද මහත්තය ඔය කියන්නෙ?"

"කුඹියන් කැලේ."

"කුඹියන් කැලේ හිටියා අපේ ලොකු නැන්දා - සිසිලින් කියලා."

ජයසිරි ඒ කියත්ම මගේ ගත පුරා හිරියක් දුව යනු මට දැනිණි.

"සිසිලින්?" යැයි මට ඉබේම කියැවිණි

"ඇයි මහත්තයා බයවෙලා වගේ ?"

"සිසිලින් ගැන කියන්නකො ජයසිරි?"

"ලොකු නැන්දා, අපේ තාත්තගෙ ලොකු නංගි ඒ කිව්වෙ. සිසිලින්. ළමයෙක් ලැබෙන්න ගිහින්ලු මැරුණේ. අපි ඒ දවස්වල පොඩියි මහත්තය. හරියට මතකක් නෑ. කුඹියන් කැලේ අහ තමයි හිටියෙ."

"කවුද බැඳල හිටියෙ?"

"ලොකු බංඩා කියල කෙනෙක්. අපි කිව්වෙ බක්කා මාමා කියලා"

"බක්කා?"

"මහත්තය බයවුනා වගේ. මාත් ඔය කතා අහල තියෙනව මහත්තයා. අපේ නැන්දා මැරුණට පස්සෙ එක එක කතා"

"ජයසිරි විස්වාස කරන එකක් නෑ මගෙ කුඩේ යටින් ඇවිදන් ගිය ගෑනු කෙනා කිව්වා නංගි බලන්න පැනිදෙනියෙ ගියා කියල මරණාසන්නයි කිව්වා,"

ජයසිරි මඳකට ගොළු විය. මට ද කතාකර ගත නොහැකි විය. අප දෙදෙනාගේ කතා දෙක සැබවින්ම සම්බන්ධ ද? ඒ නැත්නම් අහම්බෙන් යාවූ සිද්ධි දෙකක් ද?



Downloaded from sinhalaebooks.com

"ඔය කියන සිසිලින් මොන වගේ ද?"

"ඒ කිව්වෙ මහත්තයා?"

"මං ඇහුවෙ හැඩරුව"

"පොඩි කාලෙනෙ මහත්තයා නැන්දලා දෙන්නම එක විදියක් තියල නම් කියනවා. පුංචි හැඩේ. වැඩි උස මහතක් නම් නැහැ"

"හරි. බක්කා මොන වගේද?"

"මාමා නම් උස මහතයි. ගොඩක් තරහකාරයො නම් හිටියලු. මාමාට හරියට කේන්ති යනවලු. පස්සෙ ඔය පැලකුත් ගිනි තිබ්බලු."

"මාමා මැරුණෙ පැල ගිනි අරන්ද?"

"නෑ නෑ එයිට හුඟක් පස්සෙ, එයිට හුඟක් පස්සෙ" කී ජයසිරි එක්වනම කල්පනාවක වැටුණේය.

කතාව වෙනස් කරන්නට සිතා මම බයිසිකලය ගැන විපරම් කළෙමි.

"ආ, ඔව් ඒක හරි මහත්තයා. ඒක සේරම හදල දැන් හරි. අපි හෙට යමු. අරන් එමු"

"මට ඒක තියෙනවනං ලොකු උදව්වයි"

"ඔව්, මහත්තයා මේ මරණෙ නිසා නොවෙයි නං මෙලහකටත් මහත්තයට ඒක ලැබිලා."

"අපි එහෙනං හෙට වැඩ ඇරිල ඒක ගමු."

බයිසිකලය මා සිතුවාට වඩා අඩු මුදලකට ලැබිය හැකි බව ඇසීම ද මගේ සහනයට හේතුවිය.

තව මඳ වේලාවකින් කෑම සියල්ල පිළියෙල කළ කාන්තාවෝ තිදෙනා ද අප සිටි අහට පැමිණියහ. සියලු දෙනාම මඳ වේලාවක් කතාබහේ යෙදී සිටි පසු "කෑම කමු"යි මල්කාන්ති යෝජනා කළාය. "පිරිමි කට්ටිය කාලා ඉන්නෑ" යි ඈ කීවාය.

ඇගේ කීම පරිදි සිරිත්, අතුලත්, මමත්, ජයසිරිත්, ටිකිරි බංඩාත් මේසයට හිඳ ගත්තෙමු. නොයෙක් වර්ගයේ කෑම හැඩේට සකසා මේසය පුරා විය.

"මඟුල් මේසයක් වගේ " යැයි ටිකිරිබංඩා මුව පුරාම කීවේය.

"දන්නෙ නැද්ද අපේ නෝනා?" සිරි පාරම් බෑවේය. "මට කන්තලව් කර කර මැසිවිලි කිය කියා හිටියෙ, කොළඹ පන්නෙට



Downloaded from sinhalaebooks.com

කාටවත් කැම වේලක් දෙන්න බැරුව.''

''ඕනෑ වෙලාවක කියන්න අපි එන්නම්''

අතුලගේ ඒ කතාවට හැම අතම සිනා නැගිණි.

''නෑ නෑ ඊළඟ වතාවෙ කෑම උයන්නෙ අතුලයි මමයි'' චිත්‍රා කීවාය.

''අතුල ඉව්වොත් නම් කාලා ඉවරයි'' අනෝමා ඇනුම් පදයක් කීවාය.

''ඔයා ඇවිත් උදව් කරනවනෙ අනෝමා?'' අතුල ඇසුවේය.

අප හැමදෙනාම මේ මේසය ළඟදී කාර්යාලයක සේවකයන් මෙන් නොව එකම පවුලක උදවිය මෙන් වී යැයි මට හැඟුණි. එතරම්ම සුහද සමීපත්වයක් අප අතර වීය.

මළ ගෙදර කටයුතුවලින් වෙහෙසට පත් ජයසිරි මුලින්ම අපෙන් සමුගත්තේය. වඩාත් ඈත යා යුතු නිසා ටිකිරි බංඩා ද තම පාපැදියේ නැගී වෙන්ව ගියේය.

චිත්‍රාත්, අනෝමාත් මල්කාන්තිත් කෑම කා අවසන් වූ පසු අපි කීපදෙනා එකතුව ඉදිරි පිලේ හිඳ සුහද කතාබහක යෙදුනෙමු.

''ඇත්තටම කොළඹ කචබචේට වඩා මෙහේ හොඳ නැද්ද ජනක?'' යැයි සිරි මගෙන් විමසුවේය.

''ම්.... හොඳ තමා. ඒ උනාට''

මා අදිමදි කරත්ම ''එයාගෙ හිත තියෙන්නෙ එහෙනෙ'' යැයි අනෝමා කීවාය

''හිත ගිය තැන මාලිගාව'' කී අතුලගේ කට හඬ බියර් වතුරෙන් දියාරු බවක් පෑය.

''බයිසිකලේ හම්බ උනාම ඔය සේරම හරි'' චිත්‍රා කීවාය. ''ඒක හම්බවෙනව නේද ජනක?''

''ඔව් සමහරවිට හෙට''

මේ කොතෙක් කතා කළද දැන් මගේ යටි සිතේ සැරිසැරුවේ සිසිලින් පිළිබඳ පුවතය. ඉරිදා රාත්‍රියේ සැබවින්ම මගේ කුඩය යටින් ඇවිද ගියේ සිසිලින්ගේ අවතාරයද? ''මරණාසන්නව සිටි නංගිව බලන්නට පැතිදෙතියට ගිහින් ආවේ සිසිලින්ගේ අවතාරයද? කන්ද උඩ බලා සිටියේ බක්කාගේ අවතාරයද?''



Downloaded from sinhalaebooks.com

ජයසිරි එක්වනම නිහඬව කල්පනාවක වැටුණේ මා නොදන්නා තවත් බොහෝ දේ දන්නා නිසාද?

තව මඳ වේලාවකින්, මල්කාන්ති පිහත් සෝදන්නට ඕනැයි කී විට චිත්‍රාත් – අනෝමාත් උදව්වට එන්නම් යැයි කීහ. ටිකක් දුර තනිව ගමන් කළ යුතු හෙයින් දැන්ම තවාතැනට ගියොත් හොඳයැයි මම කීවෙමි.

"අනේ එහෙනං මාවත් බස්සගෙන යන්න" අනෝමා කීවාය. "මාත් ඒ පැත්තටනෙ යන්නෙ, නැත්තං චිත්‍රායි අතුලයි ආයි ඒ පැත්තට ගිහින් මේ පැත්තට එන්න වෙනවා."

"එහෙනං එන්න" මම අනෝමාට කීවෙමි.

"කමක් නෑ – නේද ජනක?"

"කමක් නෑ කමක් නෑ"

"එහෙනං මං එනවා"

චිත්‍රාත් – මල්කාන්තිත් මුළුතැන්ගෙට ගියේ මගෙන් ද, අනෝමා ගෙන් ද සමුගනිමිනි.

"පරිස්සමෙන් යන්න ජනක "යැයි සුභපැතූ මල්කාන්ති කීවාය.

අනෝමාත් මමත් පාරට ආවෙමු. මා අත විදුලි පන්දම විය.

පාරෙහි විදුලි පහන් ඇත්තේ හන්දිය අවට පමණි.

"කවදා මේ කැලේට ලයිට් ඒවිද මන්දා?යි දිනසිරි හෝටලය පසුකරත්ම අනෝමා නෝක්කඩු ස්වරයෙන් කීවාය.

"ඔයා ඉන්න ගෙදර මනුස්සය කනෙක්ෂන් තියෙන කෙරුමෙක් නේද?"

"ඔව් ඒ ගොල්ලො පාරෙන් ලයිට් අරන් තියෙන්නෙ. එයින් එහාට ඒගොල්ලො හිතන්නෙ නෑ"

"කවුරුත් එහෙම තමයි" මට කියැවිණි. "තමුන්ගෙ මල්ල තර කරගන්න එක විතරයි. ඒක තමා මේ රට හැදෙන්නෙ නැත්තෙ."

"ඔයත් කියන්නෙ වැදි බණ"

"ඒ මොකද?"

"ඔයාට කැක්කුමක් තියේනං ඔයා ඉඳල මේ ගම හදාවිනෙ. ඔයාටත් ඕනෑ කොළඹම දුවන්න."



Downloaded from sinhalaebooks.com

"නුවර උපන් අයට බැරියැ මෙහේ හදන්න. කොළඹින් එන්න ඕනැයැ"

අනෝමා මට ළංව ගමන් කරනා හෙයින් මට ඇගේ වත්සුණු සුවඳ දැනෙයි. "මේ හරිය හද්දා කරුවලයි" කී ඈ තවත් මට ළංවුණාය. "ඔයාට බය හිතෙන්නෙ නැද්ද ජනක මේ කරුවලේ යන්න?"

"අපි මොකටද බය වෙන්නෙ?"

"හොල්මන්වලට"

"හොල්මන්වලට ශරීරයක් නෑ අනෝමා – අපිට එයිට වැඩිය හයිය තියෙනවා. ඔන්න බලන්න" කී මම ගල් කැටයක් අහුලා පාරෙන් එහා බෑවුමට විසි කළෙමි. "අපිට අත පය තියෙනවා. හොල්මන්වලට ඒවා නෑ"

"ඔයා දන්න තරම" යැයි අනෝමා කියත්ම අප ඉදිරියෙන් යමක් වැටෙන හඬ ඇසිණි.

අනෝමා බියපත් හඬක් නඟා මගේ අතේ එල්ලුණාය.

"බය ගුල්ලී" මම කීවෙමි. "ගහකින් අතු කැල්ලක් වැටෙන්න බෑ ඔයා වෙව්ලනවා."

"අනේ මට නං බයයි ජනක" කී අනෝමා මගේ අත අල්ලා ගත් ගමන් තවත් මට ළංවූවාය.

ඇගේ උණුසුමේ සැනසුමක් ද විය. තනිව අඳුරේ යනවාට වඩා ඇය ළඟින් සිටීම සිතට තව දහිරියක් දුන්නේය.

"ඉතින් ඔයාට ඉතුරු ටික තනියෙන් යන්න බය නැද්ද ජනක?"

"මං සේරම හොල්මන් දැකල තියෙන්නෙ" කීවද ඒ ඔස්සේ තවත් විස්තර කරන්නට මම අකමැති වීමි.

තවද ඇගේ ලාමක සිත බිය ගන්වන්නේ කුමටද?

"ඔයා හොල්මන් දැකල තියෙනවද?"

"ඔව් මේ...අපි ඕවා නැතුව වෙන දෙයක් ගැන කතා කරමු."

"ඒක හොඳයි." එසේ කීවද අනෝමා යළිත් කියන්නට වුනේ හොල්මන් කතාවකි. "අපේ තාත්තා සැරයක් දැක්කලු හොල්මනක්. දවසක් මහ රෑ නුවර වැව අයිනෙන් යන කොට"

"කියන්න බලන්න" මා එසේ කීවේ බියට අභියෝගයක් ලෙසිනි.

"මාලිගාව පැත්තෙ නෙවේ එහා පැත්තෙ. දන්නවනෙ ටිකක්



Downloaded from sinhalaebooks.com

ඉස්සර. තාත්තා කොහේදෝ ගිහින් එනකොට ගෑනියක් සුදු ඇඳගෙන වැවට බැස්සලු."

"ඉතින් නාහේන ගොඩ ආවාද?"

"නෑ. අනේ වතුර යටට ගියාලු. තාත්තා දුවලා ගෙදර ඇවිත්ලු නැවතුණේ."

"මං නං කරන්නෙ නැවතිලා බලන එක"

"ඔයා අහල නැතුව ඇති. ඇහැලේපොල කුමාරිහාමිව වැවේ ගිල්වලා මැරුවට පස්සෙ....."

"ඒ වැව ගොඩ කළා. දැන් තියෙන වැව හැදුනෙ අතීත් වැව ගොඩ කරන්න හාරපු තැන."

"කොහොමෙන් හරි මේ වැවෙත් හොල්මන් තියෙනවා."

"මාත් කියන්නං හොල්මන් කතාවක් මගේ යාලුවෙක් කියපු කතාවක්" යැයි මා කියද්දී අනෝමා තව තවත් මගේ ඇඟට තෙරපුණාය.

"කියන්නකො බලන්න"

"මගේ යාලුවා දවසක් රෑ කොහේද ගිහින් එනකොට ගෑනියෙක් ආවලු ළමයෙක් වඩා ගෙන. ඔයා දන්නවනෙ කතාව. ගෑනි කියනවා. අනේ මේ ළමයව වඩා ගන්න රෙද්ද තදට ඇද ගන්න කල් කියලා. ළමය අතට ගත්තම ගෑනි අතුරුදන් වෙනවලු. ළමයා ඇට සැකිල්ලක් වෙනවලු."

"ඉතිං ඔයාගෙ යාලුවටත් ඒ ටික වුණාද?"

"නෑ මගෙ යාලුවා මොකද දන්නවද කිව්වෙ? එයා ගෑනිට කිව්වලු ඔයාම ළමය අල්ලගන්න මං ඔයාගෙ රෙද්ද හරිගස්සන්නං කියලා." මා හඬ නගා සිනාසෙද්දී අනෝමා මගේ පිටට පහරක් ගසා ඇය ද සැහැල්ලුවෙන් සිනාසුනාය. කතාවෙන් කතාවෙන් අපි ඇගේ නවාතැන වෙතට ඇවිත් සිටියෙමු. අපේ දකුණතට වූ තාප්පයෙන් වටවූ මිදුල මැද නන්දසේන ගේ අලුත් පන්තයේ නිවෙස විය. දොරකඩ තවමත් දැල්වුනු සුදු විදුලි එළියක් පාර අතටද ඇදී ආවේය. එයින් තික්මී මූසල එළියෙන් ගස්වැල් යන්තම් සුදු විය.

අනෝමා මගේ අත අතහැරියේ ගේට්ටුව ළඟට ආ විටය. "අනේ තැන්ක් යූ ජනක. ඔයා දවසක මෙහේ ගෙදරත් එන්න ඕනෑ ඔන්න" මගේ අත අතහරිද්දී ඈ කීවාය.



Downloaded from sinhalaebooks.com

"එන්නංකො"

"ගුඩ් නයිට්" කී ඇ සපත්තු හඬවමින් දොර අතට දුව ගියාය. ඇය දොර හැර ඇතුළට යන තෙක් ද මම බලා සිටියෙමි. කවුදෝ පිරිමි කෙනෙක් යමක් කියනු ඇසිණි. දොර වැසිණි. මම යළිත් ගමන් ඇරඹුවෙමි.

මේ මහ හුරු පුරුදු වූවාසේය මට දැන් දැනුණේ. සිතට චකිතයක් දැනුන සැණෙන් මම ඉතිපිසො ගාතාව හඬ නඟා කීවෙමි. කුඹියන් කැලේ පසු කරද්දී මම උවමනාවෙන් ඒ අඳුර දෙස බැලුවෙමි. මානා පඳුරු පමණයි. ඉහළ අඩ සඳක් බලා සිටියේය.

මා නවාතැනට එන විට දොර කවුළු වැසී තිබිණි. මා රෑ කෑමකට ගිය නිසා ඔවුන්ට මා එන මඟ බලා සිටීම අනවශ්‍ය විය.

හඬ නොනැඟෙන්නට කාමරයේ දොර හැරගෙන ඇතුළු වූ මට දැල්ල අඩුකොට දැල්වෙන චිමිනි ලාම්පුව පෙනිණි.

යන්තම් දැනුණ බීර මත මැද කලිසම උනා සරමට බැස ඇඳෙහි වැටුණෙමි. අනෝමාගේ වත්සුණු සුවඳ තවමත් මා ළඟ දැවටෙන්නා සේය.

අත දිගු කොට මම පහන නිවා දැමුවෙමි. මම කොතෙක් වෙලා නින්දක ගැලුනාදැයි නොදනිමි. කවුදෝ මගේ කම්මුල අත ගාන්නා සේ දැනී මම ඇස් හැරියෙමි.

අඳුරු අතරින් කවුදෝ දොරෙන් පිටව යන්නාක් සේ පෙනිණි. මා කාමරයට ඇතුළුවූ පසු දොර හරි හැටි වැසුවේ නැ නොවේද?

අඳුරේම නැගිට ගත් මම දොරකඩට ගොස් බැලුවෙමි. ඉස්තෝප්පුවේ කොට තාප්පයෙන් කවුරුදෝ පැන අඳුර අතට ගියේය.

"හිතේ විකාර" යැයි මට කියැවිණි. තාප්පයෙන් බැලුවත් කිසිවෙකු නොවීය. සීතලය හිරිගඩු නැංවීය.

කාමරයට ආ මම මෙවර දොර තදින් වසා ඇඳට නැඟ පොරෝනාවෙන් හිස සිට දෙපතුලටම වසා ගත්තෙමි.

පසුදා අවදිවන විට මගේ දකුණු කම්මුලේ අලුත් සීරීම් පාරවල් තුනක් පැහැදිලිවම පෙනිණි.



Downloaded from sinhalaebooks.com

# 8

"මේන් අයියගෙ මූණ පහුරුගාලා" උදෑසනම කෑගා අණ බෙර ගැසුවේ නයනායි. ඈ කෙරෙහි සියුම් කෝපයක් සිත නැඟුණ ද මම එය නොහඟවා පිටුපස පිලෙහි කුඩා කන්නාඩිය ළඟ සිට රැවුල බාන්නට වුණෙමි.

වජිරා ඇවිත් මගේ මුහුණ පිරික්සුවාය.

"ඇත්ත නේන්නම් අයියා, මේ හොඳටම මූණෙ පාරවල් පේනවනෙ."

ඇගේ කතාව අසමින් ලීලාවතී මැණිකේත්, අමරසිරි බංඩාරත් එතැනට ආහ.

"මං කිව්වනෙ ඊයෙ රෑ තනියම එන්ඩ එපා කියල" ලීලාවතී මැණිකේ තැවුණාය." කෝ කිව්වට අහනවද? පුතා ඔය බැඳුම් කැම කාලා මහ රෑ තනියම එන්ට ඇති."

"මං මහදි නං මොනවත් දැක්කෙ නැහැ" මම දිගටම කාරියෙහි යෙදුණෙමි.

"පුතා ඔහොම බලන් ඉඳල හොඳ නෑ. අපි වියෝතිස් ගෙන්වලා වතුර ටිකක් මතුරමු."

"අනේ මන්දා අම්මෙ?"

"පන්සලටත් යමු. බෝධි පූජාවක් තියමු. අද රෑම යමු. හෙට සිකුරාදනෙ. පුතා හෙට රෑට එන්නෙත් නෑනෙ – කොළඹ යනවනෙ"

Downloaded from sinhalaebooks.com

"මට කොළඹ ගියාම මේ සේරම හරි අම්මෙ."

"ජිනකයියා පිරිත් පොත කොට්ටෙ යට තියෙන කල් මොකුත් උනෙ නැතේද? දැන් පිරිත් පොතත් නැති කරගෙන නෙ." ඒ කීවේ නයනාය.

"මං නැති කරගත්තෙ නැතෙ නංගි. ඒක නැති වුණා."

"ඒකත් බහිරවය අරන් යන්න ඇති "යැයි වජිරා කියද්දී

"බහිරවය නෙවෙයි බෝදිලිමා"යි අමරසිරි බංඩාර තොල් මතුළේය.

මම මූහුණ දොවාගෙන වැඩට යන්නට ලෑස්ති වෙන්ට කාමරයට ආවෙමි.

" අයියට හරියට කතා කරන්නවත් බැරි උනානෙ"යැයි කියමින් අමරසිරි බංඩාර ද මා අනුව ආවේය. "අයිය බයිසිකලේ ගන්නවද?"

"අද ගන්න හිතන් ඉන්නෙ මල්ලි"

"ඒක හොඳයි අඩු ගණනේ අයියට මහ රෑදෙන්නෙ නැතුව එන්නවත් පුළුවන්."

"මල්ලිට විතරක් කියන්නං. ඊයෙ පුදුම වැඩක් උනා." මම ජයසිරිගේ නැන්දා ගැනත්, සිසිලින් ගැනත් විස්තර කෙටියෙන් කීවෙමි. අමරසිරි බංඩාර ඇස් ලොකු කරගෙන අසා සිටියේය. "කුඹියන් කැලේ ළඟදී හම්බවෙච්ච ගැනිත් මට කිව්වෙ පැනිදෙතියෙ ගියා – කෙනෙක් මරණාසන්නයි කියලා. නංගි කියලත් කිව්වනෙ"

"බලන්න අයියා. මං හිතන්නෙ සිසිලින්ගේ දිෂ්ටිය පණ අදින නංගිව බලන්න යන්න ඇති."

"එහෙම හිතමු. මට පුදුම හිතුනෙ කතාවෙ ඉතුරු ටිකත් මං අඳුරන කෙනෙක් ගෙන්ම අහන්න ලැබිච්ච එක."

"ඒක තමා පුදුමෙ..."

මා නයනා සමග පාරට එන විට "අද ආ හැටියෙ බෝධි පූජාවට පන්සල් යමු. ලබන සුමානෙ වතුර ටික මතුරන්න මං වියෝනිස්ට එන්න කියනවා" යි ලීලාවතී මැණිකේ කීවාය.

කොළඹ හිටියා නං මේ මනස්ගාත මොනවත් නෑ නොවේදැයි මට සිතුණි.

නයනාත් මාත් අතර අද නම් ඒ තරම් කතා බහක් නොවීය. මා යම්කිසි අතවරයකට මුහුණ පා ඇතැයි යන සාංකාවකින් ඇ



Downloaded from sinhalaebooks.com

නැවුණාය. පාසල ළඟදී ඇය සමු ගනිද්දී මගේ මුහුණ දෙස බැලුවේ යම්කිසි බැගෑබර ආකාරයකිනි.

කාර්යාලයේදී ද මට මුහුණේ සීරීම් ලකුණු සැඟවිය නොහැකිවිය. ඇත්තෙන්ම ඒ ඉරි තුන මදක් පැසවූවාක් සේ සුදු පැහැයකට හැරී තිබිණි.

"ඊයෙ රෑ කවුදෝ ගෙදරටම ඇවිත් වගේ" යි කියා විකිරි බංඩා කීය. "මහත්තය ඕක නං බලන් ඉන්න හොඳ නෑ."

" ලබන සුමානෙ වතුර මතුරනවා"යි මම ගැලැවිල්ලට කීවෙමි.

ජයසිරි ද මා දෙස බැලුවා මිස වැඩි කතාබහක් නොකළේය. "හවසට බයිසිකලේ ගන්න යනව නේද මහත්තයා?" ඔහු එය කීවේද රහසින් මෙනි. "ඒ යද්දී කතා කොමු."

"ඔන්න ඔයාගෙ මූණ පහුරු ගෑවෙ මං නං නෙමෙයි" අනෝමා කීවාය. "හැබැයි ඔයා ඉතින් දිෂ්ටිවලට බය නැහැ කිව්වනෙ"

"මං තවමත් බය නැහැ" මම කීවෙමි. "ඊයෙ රෑ නං මට දැනුණ කවුද මූණ අතගානව වගේ."

අනෝමාගේ දෑසේ බිය දෙගුණ විය. "ඔයා මාව තව බය කරන්න හදනවා. අනේ මට නං ඔයා එක්ක කතා කරන්නත් බයයි."

"ඒක හොඳයි අනෝමා. මං දැන් ප්‍රැන්කන්ස්ටයින්ගෙ මොන්ස්ටර් වගේ. හැමෝම මට බයයි."

"අනේ නෑ නෑ මං කිව්වෙ. ඔයා ඉක්මනට ඕක හොඳ කරගන්න."

"මොකද්ද මට ඇති ලෙඩක් නැනෙ"

"නෑ ඔය බැල්ම"

"කිසිම දෙයක් හැමදාටම තියෙන්න නෑ කියල හිතුවම ඉවරයි අනෝමා. බුදුහාමුදුරුවොත් කිව්වෙ ඔය ටිකනෙ. හැමදේම අනිත්‍ය නම් ඔය දිෂ්ටි බැල්මත් අනිත්‍යයි."

"ඒක හැබෑව. ඒත් ඒ අනිත්‍යය ඔයාවත් අරන් ගියොත්" තවත් කතා කර ගත නොහී ඈ මගේ මේසය ළඟින් ඉවත්ව ගියාය.

එදා වැඩ ඇරුණ පසු මම ජයසිරිගේ බයිසිකලයේ නැගී ඔහුගේ ගෙවල් ඇති ඉසව්වට ගියෙමි. ගඟෙන් එගොඩ වී වෙල් යායක් පසුකර ගිය අපි උණ පඳුරු ගොල්ලක් ළඟින් වූ අතු පාරකින් කඳුගැටයක් නැඟී ඇඩ්ඩින් ගේ මඩුව වෙත සේන්දු වුණෙමු.



Downloaded from sinhalaebooks.com

බුරා හැලූන බල්ලෙක් කාගේදෝ ඇණවුම් හඬක් අසා තකට හකුලාගෙන මුල්ලකට වැදුණේය. ලැලි මඩුව ඉදිරියේ පරණ බයිසිකලය දිස් විය. මඩුවේ දොරෙන් පිටතට ආ කොට රතු මිනිසා මට ආචාරයක් කළේය.

"මේ තමා ඇඩ්ඩින් අයියා" ජයසිරි ඔහුව හඳුන්වා දුන්නේය. මැදිවිය පසුකළ ඇඩ්ඩින් අයියාගේ පපු පෙදෙස සුදු මවිල් ගසින් වැසී ගොසිණි. ඒ සියලු කෙස් තිබිය යුත්තේ ඔහුගේ තට්ටය පැදුණ හිසේ නොවේදැයි මට නිකමට සිතිණි. ඔහුගේ මුව පේම සිනින් දැය ද හිනැහුණි.

"කියන ගාන හරිනෙ මහත්තයා?" ඔහු බයිසිකලයේ අසුනට අතකින් තට්ටු කර ඇසුවේය. "මෙන්න බඩුව"

මම කමිස සාක්කුවෙන් ගත් මුදල යළිත් ගැන බලා ඔහු අත තැබුවෙමි.

ඔහු ද එය යළිත් ගැන්නේය. "සේරම හරි. බඩුව මහත්තයගෙ" ඔහු යළිත් පාපැදි අසුනට තට්ටු කළේය. හොඳ ඉතිහාසයක් තියෙන බයිසිකලයක් මේක." තවත් කියන්නට ගිය දෙයක් ඔහු නොකියා නැවැත්තුවේ ජයසිරිගේ මුහුණ දෙස බලමිනි.

"එහෙනං ඇඩ්ඩින් අයියා – අපි යනවා රෑ වෙනවා" ජයසිරි කීවේය.

"මහත්තයලට සංග්‍රහයක් කරන්නවත් බැරි වුණා." ඇඩ්ඩින් තැවුණේය.

"මං ගෙදර යනවා තේ බොන්න." මම බයිසිකලයට නගිමින් කීවෙමි.

"තෙරුවන්ගෙ සරණයි! දළදා හාමුදුරුවන්ගෙ පිහිටයි.! පරිස්සමෙන් යන්න මහත්තයා" ඇඩ්ඩින් අයියා අප අනුව මඳක් දුර එමින් කීවේය.

බයිසිකලය පරණ එකක් වුවද ඇඩ්ඩින්ගේ අත් බලයෙන් එය දැන් හැසිරුණේ අලුත් එකක් විලසිනි. ජයසිරි ද පාලම ළඟට එනතෙක් මා අනුව විත් මගෙන් සමුගත්තේය.

මගේම බයිසිකලයේ නැඟී ගමන්ගත් මට අමුතු සැහැල්ලුවක් දැනිණි. ඇතැම් කන්දක් පැගීම අසීරු වූ හෙයින් මට යකඩ කඳ



Downloaded from sinhalaebooks.com

තල්ලු කරගෙන යන්නට ද සිදුවිය. එහෙත් පල්ලම් හසුවූ තැන්වල ඒ කඳුවලටත් හරි යන්නට වේගයකින් මට ගමන් කළ හැකිවිය.

සහන් එළියක් වැටී ගෙන යන යාමයේ මම අනෝමාගේ තවාතැන අසලට ඇවිත් සිටියෙමි. ලා රෝස පැහැ මල් ඉහිරුණු ගවුමක් හැඳගත් අනෝමා, නන්දසේනගේ දරුවන් දෙදෙනා සමග මිදුලේ සිටිනු පෙනිණි. අතේ තිබුණු ලොකු රබර් බෝලය කුඩාවුන් අතට විසිකළ ඈ ගේට්ටුව අතට ආවාය.

"දඩු මොණරෙ ලැබිල තියෙන්නෙ" ඈ මුව පුරා හිනැහී කීවාය. "මං හිතුවා ජනක ඔයා දැන් ටිකකින් මේ පැත්තෙන් එයි කියලා"

මම පාපැදියේ තිරිංග තද කොට ඇය ඉදිරියේ නතර වුණෙමි.

"කොහොමද යකඩ අස්සයා හොඳට දුවනවද?"

"වරදක් නෑ"

"ඇවිත් තේකක් බීල යනවද?"

"බෑ අනෝමා ගෙදර තේ තියෙනවා"

"එහේ හදන තේ රස ඇති"

" කොහෙත් තේ රසයි"

බයිසිකලය බලන්නට මෙන් කුඩා දරුවාත් දැරියත් අප වෙතට ආහ.

"මේ තමා මුදිත. මේ පියලි"

මුදිතට අවුරුදු හතක් තරම වන්නට ඇත. පියලිට පහක් පමණ වන්නට ඇතැයි මම අනුමාන කළෙමි.

"කවුද මේ අන්කල්?" මුදිත විමසුවේය.

"මේ බැංකුවෙ අන්කල් කෙනෙක් ජනක කියල"

"ජනක අන්කල් " පියලි කීවාය.

"අන්කල්ගෙද බයිසිකලේ?"

"ඔව් පුතා"

"අපේ තාත්තට වැන් එකක් තියෙනවා."

"හරි ෂෝක්. මේ අනෝමා මං යන්න ඕනැ"

"ඕකෙ ලැයිට් එකක් තියෙනව නේද?"



Downloaded from sinhalaebooks.com

"තියෙනව තියෙනවා"

"දැන් ඔයාට කොළඹ ගිහිල්ලා රෑ එනකොට ලේසියි"

"මට මේක කඩේ තියල යන්න පුළුවන්"

"නැත්තං සිරීලගෙ ගෙදර"

"නෑ ඒ ගොල්ලන්ට කරදර කරන්ඩ බෑ. මං යනවා අනෝමා"

කුඹියන් කැලේ අඩවියේ දී මට අනිවාර්යයෙන්ම බයිසිකලයෙන් බසින්නට සිදුවිය. මෙතැන නැග්ම අසීරුය. එහෙත් එයින් පසු එක පිම්මේ බයිසිකලය පැදගෙන නවාතැනට ඒමට හැකිවිය. මා එන විට අමරසිරි බංඩාර මග බලා සිටියේ ය.

වත්තට ඇතුළු වෙත්ම ඔහු බයිසිකලය අර ගත්තේය. මා කාමරයට ගොස් ඇඳුම් මාරු කරන විටත් ඔහු වත්ත වටේ බයිසිකලය පදිමින් සිටියේය.

අද මට තේ කෝප්පය ගෙන ආවේ ලීලාවතී මැණිකේයි.

"පුතා තව ටිකකින් පන්සලට ගිහින් එමු. මං හිතුවෙ මේ ගෙටත් ආරස්සාවක් කරන්න ඕනෑ. දන්නෙ නැද්ද මිනිහෙක් ඔලුව උස්සල ඉන්න කොට වටේම ඉන්න මිනිස්සු ඉරිසියාවට හදි හූනියං කරනවා. මට හිතෙන්නෙ මේ ළමයින්ගේ තාත්තා මළෙත් ඔය වගේ එකකට අහුවෙලා."

"ඒ කිව්වෙ?"

"නෑ දන්නැද්ද පුතා. ඒ දවස්වලත් මේ වත්තට මොනවාදෝ දාලා තිබුණ. ඒවනං මං දැන ගත්ත හැටියේ අරන් දැම්මා. "අතීතය මතක් වීමෙන් තෙත්වූ දෑස ඈ සාරි පොටෙන් පිස දැමුවාය." ලැස්ති වෙන්නකො පුතා තේ එක එහෙම බීලා. අපි පන්සලට ගිහින් එමු."

මා මේ නවාතැනට එනවිට සිතුවේ කාමරය කුලියට ගෙන මගේ පාඩුවේ ජීවත්වන්නටයි. හැකි තරම් ඉක්මනට මෙතැනින් නික්ම යන්නටයි. එහෙත් දැන් මේ ගෙදර හැම දෙනාමත් මගේ ජීවිතයට උවමනාවටත් වඩා එබිකම් පාතැයි මට සිතිණි. පන්සල් යාමේ වරදක් නැත. එහෙත් දැන් මට එහි යා යුතු බව කියන්නේ ලීලාවතී මැණිකේය. අමරසිරි බංඩාරත් හැම රාත්‍රියකම මගේ කාමරයට අරක් ගනී. දැනුදු ඔහු කරන්නේ මගේ බයිසිකලය වත්ත වටේ පදින එකය. මා ළිඳ ළඟ නාන විටත් ඔහු ඒ අසලින් බයිසිකලය පැද ගෙන



Downloaded from sinhalaebooks.com

ගියේය. නයනා ඇවිත් බේසමකට වතුර පුරවාගෙන පන්සල් යන්නට ය කියා මුහුණ සෝදාගත්තා ය. මගේ ජීවිතයට ඒ තරමම ඇඟිලි නොගහන්නේ වජිරා යැයි සිතුණ ද ඇත්තෙන් ම ඇගේ යටි සිතේ ගැඹුරේ මොන මොන අදහස් ඇද්දැයි මම නොදත්තෙමි. ඇ තේ කෝප්පය ගෙනැත් දෙන විදිය – ඇතැම් රැයක වතුර උණුකර බේසමට හලන විදිය වැනි සුළු ක්‍රියාවල පවා මා දකින්නේ යම්කිසි හැඟුම්බර ළතෙත් බවකි. ඇය නිහඬව මට ආදරය කරතැයි මට වරෙක සිතෙයි.

වජිරාත් – නයනාත් දෙදෙනාම ලීලාවතී මැණිකේත් මාත් සමග පන්සල් යන්නට ආවෝය. අමරසිරි බංඩාර බයිසිකලයත් පැදගෙන ළඟ පාත යාළුවෙකුගේ ගෙදර යන බව කීවේය.

"මය ඉතින් අලුත් සෙල්ලම් බඩුවක් ලැබිල තියෙන්නේ" ලීලාවතී මැණිකේ යන අතර කීවාය. "ජනක පුතා යන කොට ඕකට ඉබ්බෙක් දාලා යන්න. නැත්තං අපේ පුතා ඕක ඉතුරු කරන එකක් නැහැ"

"ඉබ්බෙක් දම්වැලක් නං තියෙනවා. කොයිකටත් මං කොළඹ යනකොට ඕක තියෙන්නෙ හන්දියෙ කඩේනෙ."

"ඒක පරිස්සම් – ඒක හොඳයි." ලීලාවතී මැණිකේ තාලයට මෙන් කීවාය.

හබරවැව පන්සල කුඩා එකකි. එහි මුළු මිදුලම සෙවණ කරමින් බෝධිරාජයා වැඩුණේය. පසෙකින් කුඩා විහාරයත්, පඩි දෙක තුනක් නැඟ යාහැකි වෙහෙර මළුවත්, වෙල්යායට ළංවූ බණ මඩුවත්, ආවාස ගෙයත් යන සියල්ල සිතට ඇතුළු කළේ සන්සුන් බවකි. හැමතැනම නිසලතාවක් විය.

ඉර බැස යන්නට ආසන්නවූ හෙයින් පලින් පල දැල්වෙන තෙල් පහන්වල එළිය කෙමෙන් ඔපවත් විය. වෙල දෙසින් සීත සුළං රළක් හමා ආවේ ය.

හැමදාටමත් මෙතැන්ට එන්න ඇත්නම් යැයි යන සිතුවිල්ලක් මා තුළ උපන.

මා බෝධියට වත් කළ වතුර කළ පුරවා ඔසවාගෙන ආවේ වජිරාත්, නයනාත්ය. ලීලාවතී මැණිකේ ද වතුර කල පුරවා ගෙනවුත් බෝධියට පූජා කළාය. ඇ බොහෝ වේලාවක් බෝමළුවේ හිඳ වැඳුම් පිදුම් කළාය. වජිරා ද අම්මාව අනුකරණය කරන්නටදෝ බොහෝ



Downloaded from sinhalaebooks.com

වෙලාවක් වැලිපොළවේ හිඳගෙන දෑත් එකතු කරගෙන තොල් මැතිරුවද. නයනාත් මමත් ඉක්මනින්ම වැඳ පුදා ගෙන බණ මඩුවේ එහා කෙළවර තාප්පයට හේත්තු වී ගෙන වෙල්යායට ගොම්මන ගලන හැටි බලමින් කතාවක වැටුණෙමු. නයනා ඇගේ පාසලේ තොරතුරු කිවාය. මම කොළඹ විස්තර කීවෙමි. ඈ එකම වතාවක් පාසල් සිසුන් සමග සත්ව උද්‍යානය බලන්නට ගිය හැටි රස කරමින් කිවාය.

බෝධි පූජාවෙන් අනතුරුව අපි පහන් කීපයකුත් දල්වා, මල් පුදා දෙවියන්ට පින්දී ආපසු එන්නට පිටත් වුණෙමු.

"දැන් ඉතින් පුතාට දෙයියන්ගෙ පිහිටයි." ලීලාවතී මැණිකේ ඉමහත් ශ්‍රද්ධාවකින් කියා සුදු සාරි පොටෙන් මුහුණ පිසදා ගත්තාය. ඇය හැසිරුණේ මගේ පාපයන් සියල්ල සෝදාහැරිය කලක මෙනි.

හිරුගේ අන්තිම එළිය බිඳ ආකාසයෙන් පරාවර්තනය වී වෙල්යාය පුරා අළු එළියක් පැතිර විය. දම් අළු ආකාසයේ වවුල් රෑනක් පියඹා ගියේ සුළඟකට හසුවී ගසාගෙන යන කළු කොඩි පේලියක් ලෙසිනි. උන් සමග මගේ හදවතේ වූ බරක් ද ඉගිල ගියාක් මෙනි මට හැඟුණේ.

වෙල ඔස්සේ ආ සීත සුළං පහර මම පෙණහලු පුරවා උරා ගත්තෙමි. නයනා යම්කිසි සැහැල්ලුවකින් වටයක් කැරකී රැඟුමක් පෑවාය. වජිරා මා දෙසත් බලා කිංකිණි හඬකින් හිනැහුණාය. මේ ගමනින් ඔවුන් සැමදෙනාම තව තවත් මට සමීප වූවා සේය. ඔවුන් මේ ගමන ආවේ මා වෙනුවෙනි. මගේ සුභ සිද්ධිය තකාය.

පන්සලෙන් එන අතර අපි වියෝතිස් නම් කට්ටාඩියා ගේ ගෙට ද ගොඩවැදුනෙමු. ඊළඟ සඳුදාට ගෙට ආරස්සාවක් කරන්නට එන බවට වියෝතිස් පොරොන්දු වුණේය.

දැන් ඉතින් සියල්ල හරිය කියන හැඟීමක් මා තුළ ද විය.

අප ගෙදර එන විට මගේ බයිසිකලය කාමරය ඇතුළේ, දොරෙන් එහා පැත්තේ බිත්තියේ ජනේලය පහළ හේත්තු කර තිබිණි. අමරසිරි බංඩාර ළිඳෙන් නාගෙන ආවේ මා ඇඳුම් අහවර කරමින් සරමට බසිද්දීය.

"හොඳට දාඩිය දාන කල් පැද්දා" ඔහු සතුටකින් කීය.



Downloaded from sinhalaebooks.com

තාව මඳ වේලාවකින් වජිරා ගෙන ආ චිමිනි ලාම්පුවෙන් කාමරය එළිය විය. නයනා මගේ කම්මුලේ ගාන්නට සර්වවිශාදිය තෙලක් ගෙන ආවාය. එය මගේ කම්මුලේ ඇතිල්ලුවේ ද ඇයයි.

"ඔන්න දැන් අයියට හොඳටම හොඳයි" ඈ තොල් උල් කරමින් කියද්දී ඇය කෙරේ අමුතුම සෙනෙහසක් මා තුළ උපන්නේය.

ඒ සිකුරාදා වැඩ ඇරී, බයිසිකලය දිනසිරි හෝටලයේ තබා මා කොළඹ යන බස්රියට නැංගේ දැන් ඉතින් සියල්ල හරි කියන සිතුවිල්ලකිනි.



Downloaded from sinhalaebooks.com

# 9

සෙනසුරාදා උදේ අවදිවන විට මගේ කම්මුලේ වූ සිරීම් සලකුණු සියල්ල මැකී ගොසිණි. හබරවැව සිදුවූ බොහෝ සිදුවීම් ද සිහිනයන්ම පමණි. සෙනසුරාදා සවස රුවිනී මුණ ගැසුන විට අනෙක් සියල්ලම මට අමතකව ගියේය.

අපි දෙදෙන කොල්ලුපිටියේ සිනමාහලක චිත්‍රපටියක් නරඹන්නට ගියෙමු. එය ත්‍රාසජනක ඉංග්‍රිසි චිත්‍රපටියක් විය. ඒ අතරේ එහි ආදර කතාවක් ද ගැබ්විය. මම රුවනීගේ අතින් අල්ලාගෙන ඒ තිරයේ ලෝකයට පාවී ගියෙමි.

චිත්‍රපටියෙන් පසු අපි සාප්පු සංකලනයක ඇවිද බැලුවෙමු. මගෙන් කිසිදු තෑග්ගක් බලාපොරොත්තු නොවූ රුවිනී මට වැහි කබායක් අරන් දුන්නාය. "දැන් ඔයාට බයිසිකලේ යනකොට කුඩයක් ඉහළ ගෙන යන්න බෑනෙ. ඒ නිසා මේක බයිසිකලේම පිටුපස්සෙ බැඳල තියාගන්නකො." ඈ කෙතරම් උවමනාවකින් මා ගැන සිතුවාදැයි මා තුළ ආදරයක් උපණි.

අපි මුහුදු ඉවුරේ අවන්හලකින් රෑ කෑම ගත්තෙමු. ඇයව වැල්ලවත්තේ නිවෙසට හැරලා මා නුගේගොඩ අපේ ගෙදරට ආවේ යම්කිසි තෘප්තියකිනි. සතියක්ම දුරු ඈත දුක් විඳීම ඇය සමග පැය කීපයක් ගත කිරීමේ අගය වැඩි කළේය. ඇය හා ගත කළ සීමිත කාලය මෙසේ වඩාත් සුන්දර විය.



Downloaded from sinhalaebooks.com

ඉරිදා මම අලස ලෙස උදය වරුව ගත කළෙමි. අක්කා මගේ රෙදි ටික සෝදා දුන්නාය. අම්මා පිසූ බත් වේල මම රස කරමින් කෑවෙමි. හබරවැවදී මා මුහුණ පෑ සිදුවීම් කිසිවක් මම ඔවුන්ට හෙළි නොකළෙමි.

හබරවැව වනාහි තාවකාලික නැවතුම් පළක්ම පමණි.

ඉරිදා දවල් කෑමෙන් පසු මඳක් විවේක ගත් මම අම්මා හදා දුන් තේ කෝප්පයක් ද බී ගමනට පිටත් වුණෙමි. සෝදා නැවූ රෙදි අතර රුවිනී මට තෑගි කළ වැහි කබාය ද විය.

තවත් සති අන්තයක් ඇවිත් ගිහින් නුවරට ගමන් ගනිද්දී මට සිහිවූයේ ඊ තනිවම නවාතැනට යන ගමන ගැනය. පෙර වතාවන්හි අත්දැකීම් සිහින පමණක් වුවද, මේ වතාවේ මා මුහුණ පාන්නේ කුමන අවස්ථාවකටදැයි යන කුතුහලය මා පෙළුවේය.

නුවරින් හබරවැවට ගිය අන්තිම බස්රියට මා ගොඩවූයේ වන්නක් වේවායි සිතමිනි. මේ වතාවේ බස්රිය අවසන් නැවතුමට ළංවත්ම රිය තුළ ඉතිරිවූ හැම දෙනාම දෙස මම හොඳිසියෙන් බැලූවෙමි. මා එසේ කළේ පසුගිය වතාවේ මගේ කුඩය යටට ආ ගැහැනිය මෙන් මේ වතාවේත් කවුරුන් හෝ මගදී මුණ ගැසුනහොත් ඔවුන් කවුදැයි තහවුරු කරගන්නටයි.

අන්තිමට ඉතිරිවූයේ සරම් හැඳි තරුණයින් දෙදෙනකුත්, කලිසම් කමීස හැඳගත් මැදිවියේ තට්ට මිනිසකුත්, වයසක ගැමි යුවලකුත්ය. මම හැමටම බසින්නට ඉඩ හැර බස්රියෙන් බැස්සෙමි. ඔවුන් හැමදෙනම අඳුර අතට විසිර ගිය පසු මම හෝටලයට ගොඩ වුණෙමි.

දිනසිරි මුදලාලි මගේ බයිසිකලය දොර ළඟම ඇතුළත තබා තිබුණේය. මම උණු තේ කෝප්පයක් බී මුදල් ගෙවන අතරේ බස් රියැදුරාත් කොන්දොස්තරත්, මුදලාලි හා කතාවක පැටලුණෝය. මම මුදලාලිට ස්තූති කර, බයිසිකලය දම්වැල් රැහැනින් මුදා පිටතට ගෙන එයට ගොඩනැංගෙමි.

අවට වාගැබ සිසිල් පැහැදුල් එකක් විය. රැහියන්ගේ ඊයම් කපන හඬත්, ළඟපාත ගුවන් විදුලියක වර බරයත් පමණි ඇසුණේ.

අනෝමාගේ නවාතැනට යන තෙක් මඟ මඳ නැග්මක් විය. එහෙත් තේ කෝප්පයෙන් ලද උත්තේජනයෙන් දෝ මට ඒ කඳු නැග්ම අපහසුවක් නොවීය. අනෝමාගේ නවාතැනවූ නන්දසේනගේ



Downloaded from sinhalaebooks.com

ගෙදර දොරකඩ අදත් සුදු එළිය දැල්විණි. තාප්පයෙන් මෙපිටට එයින් මඳ එළියක් ගලා ආවේය.

මෙතැන පසු කළාට පසු ගමන පහසු විය. පාර පැතලි විය. මහතොට කිසිවකුත් නොවූයෙන් මට මුළු පාරම බදු අරගෙන මෙන් ගමන් ගත හැකි විය. බයිසිකලයේ ඉදිරියේ වූ කණාමැදිරි එළිය පාර යන්තමට එළිය කළේය. අවට තිත්ත කරුවල විය. සඳ ඉතා ඉහල වියනේ වළාකුල් ගොන්නක සිරවී සැඟවී තිබිණි.

කුඹියන් කැලේට ළංවෙද්දී මට යළිත් බයිසිකලයෙන් බසින්නට සිදුවිය. මෙතැන නැග්ම වැඩිය. පාගන්නට බැරි තැන මම හති අරිමින් බයිසිකලයෙන් බැස්සෙමි. දැන් එය තල්ලු කරගෙන කුඹියන් කැලේ කොටස පසුකළ යුතුය.

එක්වනම ඉදිරියෙන් සිහින් හඬක් ඇසෙන්නට විය. මගේ හද ගැස්සිණි. හඬ තවත් පැහැදිලි විය. කිංකිණි සෙලවෙන්නාක් බඳු හඬකි. විලිං විලිං සලං සලං......

අඳුරේ කිසිවකුත් නොපෙනේ. මම ගමන බාල කළෙමි. හඬද නැවතුනාක් මෙන් හැඟුණි. යළිත් විලිං විලිං සලං සලං ගෑ හඬ මඳක් ඇත් විය.

කුඹියන් කැලේ අඩවියේ සෙමින් යාමත් අනුවණ කමකි. මම හොඳින් අඳුර දෙස බැලූවෙමි. කිසිවකුත් නැත. "හොල්මන් වුනත් හැමදාම නෑ නොවේ" දැයි සිත කීවේය. "හොල්මන්වලටත් නිවාඩුවක් එපැයි" මම ඉතිපිසො ගාථාව මැතිරුවෙමි.

කුඹියන් කැලේ පසුකළ සැනෙන් මම බයිසිකලයට නැඟී පැගුවෙමි. පාර යළිත් සමතලාවකි. හුළං කපාගෙන ගිය මට යළිත් අර කිංකිණි සෙලවෙන හඬ ඇසෙන්නට විය. අඳුරේ කිසිවක් නම් නොපෙනේ.

එහෙත් මම සිත දැඩි කරගෙන වන්නක් වේවායි ඉදිරියටම පැගුවෙමි.

එක්වනම විලිස්සෙන සිනහවකුත් දිලිසෙන දෑසකුත් මා ඉදිරියේ මතුවිය. බයිසිකලයේ ලාම්පු එළියෙන් දිලිසුන කුඩා දෑස රත් පැහැයකි; විලිස්සෙන දත්වලින් සමහරක් උල් වී තිබිණි. එයට ඉහළින් තවත් අඳුරු මුහුණකි. ඒ මුහුණේ සම ඇකිලි වියැළී ගොසිනි. දෑස ඔරවාගත් ගමන්ය. හිස වටා සුදු පණුවන් නටන්නාක් සේ කෙස් කැරලි ගැසිලාය.



Downloaded from sinhalaebooks.com

විලිස්සුණු මුවින් "වීස්" හඬක් නික්මුණි. ගෙජ්ජි වැලේ හඬ උස්ව ඇසෙන්නට විය.

"බර බාගයක්!"

එහි පිටුපස හිඳ සිටියේ කුඩා වඳුරෙකු තුරුළු කරගත් වයසක ගැහැනියකි. බරබාගය පිරෙන්නට ලට්ට ලොට්ට විය. මා වෙත විරිත්තුවේ වඳුරායි. සුදු පණුවන් නටන්නාක් සේ පෙනුණේ අර මහලු ගැහැනියගේ කෙස් රොදයි.

"මානියා" යි ඈ බැගෑබර හඬකින් කිවාය. "හා කොහොමද?" මම දහිරියකින් කීවෙමි. "මං බයවුණේ මේකටදැයි" සිතුණි. කරත්තය දක්කා ගෙන ගියේ මැදිවියට ළංවෙන් මිනිසෙකි. ඔහුගේ හිරුවන් උඩකයත්, මුහුණත් කළුවන් කළු විය. රතු කළ ඉරි දිවූ සරම ඔහු කැසපට කවා සිටියේය.

මම හොඳින් ඔහු දෙස බැලුවෙමි.

ඔහු බුලත් කහට බැඳි දත් පෙන්වමින් සිනාසුණේය. ඒ දෑසේ වෙහෙසබර ගතියක් විය.

ඔවුන් කොහේ සිට කොහේ යනවාදැයි මම නොදත්තෙමි. මිනිසා යමක් කීවද මට නොවැටහිණි. ඒළඟ මොහොතේ මට සිතුණේ ඔවුන් ද අවතාර විය නොහැකි ද කියායි. කලින් වතාවේ මගේ කුඩය යටින් ආවේ සිසිලින්ගේ අවතාරය නම් – කන්ද උඩ බලා සිටියේ බක්කාගේ අවතාරය නම් – මේත් අවතාර විය නොහැකිද?

මම හැකි වෙර යොදා බයිසිකලය පැගුවෙමි. තව විනාඩි පහළොවකින් පමණ මට ගෙදරට ළඟා විය හැකි විය.

"අම්මේ ජනක අයියා එනවා" ඉස්තෝප්පුවේ බලා සිටි නයනා කෑගසමින් ගෙට දිව්වාය.

අමරසිරි බංඩාර ඉස්තෝප්පුවට ආවේය.

"අයියා නැතුව අපි පාලුවෙ හිටියා" ඔහු මුලින්ම කීවේය. "කරදරයක් උනාද අයියට එනකොට?"

"බරකරත්තයක් නම් හම්බ උනා. ඒක ඇතුළෙ වඳුරෙකුත් හිටියා."

"හොල්මන් කරත්තයක්"

"නෑ මල්ලි හොල්මන් කරත්තයක් නොවි. තව ටිකකින් මග ඒවි."



Downloaded from sinhalaebooks.com

තව මඳකින් නයනා යළිත් පිලට දුව ආවේ අතකින් ගත් පොතක් ඇතිවය. කහ පැහැ කවරය සහිත පොත ඈ මා වෙතට පෑවාය.

"මේක අයියට. අලුත් පිරිත් පොත කොට්ටෙ යට තියන් බුදියෙන්ට."

"අනේ...."

"අනේ නෙමෙයි ගන්ට. අපි ඊයෙ ගෙනැවෙ."

"බොහෝම ස්තුතියි නංගී"

"ඉස්තුතියි කියල මදි. දැන් ඉතින් හැමදාම මාව බයිසිකලේ තියාගෙන ඉස්කෝලෙ ළඟට ගිහින් දාන්න ඕනැ."

සිතුරාදා මා ඇයව මහ හැරියේ තවම පළපුරුදු මදි බව කියමිනි. දැන් නම් මට ගැලවීමක් නොවීය.

අමරසිරි බංඩාර බයිසිකලය ගෙන ගොස් කාමරයේ එහා බිත්තියේ කවුළුව ළඟ හේත්තු කළේ කෞතුක වස්තුවක් තරම් පරිස්සමකිනි. වජිරා මට වතුර බේසමක් පිළියෙළ කර දුන්නාය. සඳුදා හවසට දෙහි කැපීම වතුර මැතිරීම සේරම ලක ලැහැස්ති බව ලීලාවතී මැණිකේ කීවාය. මූණ කට සෝදාගත් මම මහා බඩගින්නකින් කෑම ටික කැවෙමි. කැකුළු බතේත් ව්‍යංජන වලත් හොඳ රසයක් තිබිණි.

අමරසිරි බංඩාර වැඩි කතා බහක් නැතිව මේසය ළඟ හිඳ සිටියේ ඇතුළු කාමරයෙන් ලීලාවතී මැණිකේත් නයනාත් පිරිත් කියන හඬ ඇසුණ හෙයිනි.

මා මගේ කාමරයට යන අතරේ ඔවුන් දෙවියන්ට පින් දෙනු ඇසිණි.

අමරසිරි බංඩාර ද මා අනුවම කාමරයට ආවේය. බොහෝ කලකින් නොදුටුවකු සේ ඔහු මා හා දොඩමළු වුණේය.

පාරේ ගෙජ්ජි වැලක හඬක් නංවමින් කරත්තයක් ගියාද නැද්ද කියා විපරම් කරන්නට මට අමතක විය.

මම ඇඳෙහි ඇලවී ගෙන අමරසිරි බංඩාරට කියවන්නට හැරියෙමි. වෙහෙසින් මගේ දෑස පියවී යද්දී ඔහු "අයියට ඉතින් නිදිමතයි වගේ" කියමින් හුනස්නෙන් නැගිට්ටේය.



...loaded from sinhalaebooks.com

"ඔව් මල්ලි මහන්සියි."

"අයියා බුදියෙන්ට. මං යනවා පාන නිවන්වද?"

"නිවාගෙන දොර වහගෙන යන්න මල්ලි" අඳුරේ දොර වැසිණි.

වෙහෙස වැඩිකමටදෝ මම දැඩි නින්දක ගැලුණෙමි. හදිසියේ ර දෙගොඩ හරියේ දැඩි සීතලයක් දැනී මම අවදිවුණෙමි. මා පොරවා සිටි රෙද්ද ඉවත්වීලාය. කාමරයේ දොර යන්තම් හැරිලාය. වළාවෙන් පෙරී එන සඳ එළියෙන් මට පෙනුණේ දොර රෙද්දේ කෙළවරක් සුළඟට නටන ආකාරයයි.

අමරසිරි බංඩාර හරි හැටි දොර නොවසන්නට ඇති. දොර සුළඟට ඇරෙන්නට ඇති. දැඩි අලස කමින් වුවද මම නැගිට දොර තරයේ වසා යළිත් ඇඳට නැඟී රෙදි කඩ පොරවා ගත්තෙමි.

එක්වනම බයිසිකලය සෙලවෙන හඬ ඇසිණි. ඉබ්බා සහිත දම්වැල බර සලං හඬක් නැගීය. මගේ හද ගැස්ම වැඩිවිය. බයිසිකල් සීනුවත් යන්තමට හැඬවිණි.

මම අසා සිටියෙමි. සියල්ල නිහඬය. කොට්ටය කෙළවර වූ විදුලි පහන මම බයිසිකලය වෙත එල්ල කළෙමි. එය තවමත් ජනේලය පහත හේත්තු කළ තැනම තිබිණි. මෙයට හේතුවක් තිබිය යුතුය. අමරසිරි බංඩාර බයිසිකලය ගෙනැවුත් හේත්තු කරද්දී එය හරි හැටිම සීරුවට බිත්තියට හේත්තු නොවන්නට ඇතැයි මා සිත තර්ක කළේය. දොර සුළඟට ඇරෙන්නට ඇති. ඒ සුළං පහරටම බයිසිකලය යන්තම් සෙලැවී බිත්තයට හේත්තු වෙන්නට ඇති. එය සිදුවෙද්දී දම්වැලත් සීනුවත් සෙලවෙන්නට ඇති.

හිත හදාගත් මම හිස සිට දෙපතුලටම රෙදි කඩ පෙරවාගෙන ඉතිපිසො ගාථාවත් මතුරා යළි නින්දට වැටුණෙමි. ඇසෙන හැම හඬටම අප බිය විය යුතු නැ නොවේද? අපට නැසෙන සියුම් හඬවල් කීයක් නම් ඇද්ද? ඒ සියල්ලමත් ඇසුණා නම් අප කොයිතරම් තැති ගනීවිද?

වරක් යන්තම් අවදිවෙද්දී මට ගොනෙකු ගෙල බැඳි ගෙජ්ජි වැලක් සෙලවෙනු ද ඉතා ඈතින් ඇසිණි. රාත්‍රියේ දුටු බර කරත්තයත්, එහි පිටුපස සුදු කෙසින් යුතුව හිඳ සිටි කළුවත් කළු ගැහැනියත්, ඇගේ අතෙහි රැඳුණ විලිස්සෙන මුහුණින් යුතු වඳුරාත්, මගේ මතකයට නැගිණි. ඔවුන් මේ රාත්‍රියේ කොතැනක ඇද්ද?



Downloaded from sinhalaebooks.com

අලුයම් හිරු කිරණින් රාත්‍රියේ ඔතු භූත සියල්ල අමතක වී, ඊවුල බාන්නට පසුපස පිලට ගිය මම මුහුණ පිරික්සා බැලුවෙමි සිරීම සලකුණු එකකුදු නොවීය.

මා කැඩපතින් මුහුණ බලනු දුටු නයනා "අද අයියගෙ මූණ එළිය වැටිලා"යි කීවාය.

"කවුරුවත් ඊයෙ රෑ හිරුවෙ කෑ නේද?"

"නෑ නංගි මං ඒවට බය නැහැ."

"නෑ අයියගෙ කොට්ටෙට යට අලුත් පිරිත් පොත තිබුණානෙ ඒකයි."

"මොනව උනත් නුතත් කමක් නෑ අද හවස අපි ආරස්සාව කරනවා" මුළුතැන්ගෙයි සිටි ලීලාවතී මැණිකේ කීවාය. "ජනක පුතා අද වැඩ ඇරිච්ච හැටියෙ එනවනෙ."

"ඔව් අම්මා"

"අයියා මාව බයිසිකලේ තියන් ඉස්කෝලෙ ළඟට යනවනෙ?" නයනා පිංසෙන්ඩු වුණාය.

"ඔන්න වැටිල තුවාල වුනොත් මට දොස් කියන්න එපා."

"නෑ නෑ අපි වැටෙන්නෙ නෑ අයියෙ අනේ "

"හා හා "

"මොනව හරි උනොත් මං අහකට පනින්නං"

"මේ කෙල්ලගෙ විසේ" ලීලාවතී මැණිකේ අප අතට එමින් කීවාය.

මම ඇසක් වසා සිනාසුණෙමි.

පිටුපස පිලෙන් බැලූ කල ඈතට විහිදෙන වත්තත්, උසට වැඩෙන කොස්, අඹ දඹ වැනි ගස් කොළන්ද පෙනෙයි. මා ඊවුළ බා අවසන් වෙන විටම ඒ දෙසින් කඩිනමින් ඇවිද ආවේ අමරසිරි බංඩාරයි.

"ආන් පල්ලෙහා අමුත්තො වගයක් ඉන්නවා" ඔහු ඈතදීම කීවේය.

"කවුද?" නයනා ඇසුවාය.

"නාකි දෙමළ ගැනියෙකුයි –මිනිහෙකුයි. මිනිහා ඒ ගැනිගෙ පුතා වෙන්ටැති. වඳුරෙකුත් ඉන්නවා බර බාගයකුත් තියෙනවා."



Downloaded from sinhalaebooks.com

"අභිගුණ්ටිකයො" ලීලාවතී මැණිකේ කීවාය. "ඔය මිනිස්සු මීට හුඟාක් කාලෙකට ඉස්සරත් ඇවිත් කූඩාරම් බැඳගෙන ඉඳල ගියා. ඒ ගැනි සාස්තරත් කියනවා."

"දැනුත් ඕං කූඩාරමක් ගහනවා."

"ඒ කාලෙ ජෝඩුවම හිටියා. පුතාත් එක්ක. බූරුවො දෙන්නෙකුත් හිටියා." ලීලාවතී මැණිකේ අතීතය මතක් කළාය.

"බූරුවො නං දැක්කෙ නෑ. බරකරත්තයකුයි - ගොනෙකුයි ඉන්නවා." අමරසිරි බංඩාර වාර්තා කළේය. "අයියා ඊයෙ රාත්තිරියෙ දකින්න ඇත්තෙ ඕගොල්ලො වෙන්ඩැ."

"හරියට හරි"

පෙරදා රැයේ දුටුවන් මෙසේ ජීවමානවීම හිතට සැහැල්ලුවක් විය. නයනාව බයිසිකලයේ තබා ගත් මා හන්දිය අතට පියැඹුවේ ද ඒ සැහැල්ලුවෙනි.



Downloaded from sinhalaebooks.com

# 10

"කොහොමද මහත්තයා බයිසිකලේ ? වරදක් නැනෙ?" ජයසිරි මා දුටු සැණෙන් ඇසුවේය.

"අපෝ නැහැ කිසි කරදරයක් නෑ. කඳු පාගන එක තමයි ටිකක් අමාරූ."

"කඳු නැග්ගොත් පල්ලමකුත් එනවනෙ මහත්තයා"

"ඒක හරි"

"මං දැක්කා ජනක ඊයෙ රෑ ඔයා අපේ ගේ ළඟින් යනවා" අනෝමා හෙළි කළාය.

"මං කාමරේ ජනේලෙන් දැක්කා ඊට පස්සෙ තමා මං නිදාගන්ඩ ගියේ."

"කීයට විතර ද – හොඳයි?"

"දහය පහුවෙලා"

"හොරා බලන් හිටියනේ?"

"ඇයි තහනං නීති දාලා තියෙනවද? ඔයා කරදරයක් නැතුව ගියා කියල දැනගත්තට පස්සෙ තමා මං ඒ ජනේලෙ වැහුවෙ."

මම නිහඬ වීමි.

"ඊට කලින් කරත්තෙකුත් ගියානේ ද ජනක?"

Downloaded from sinhalaebooks.com

"ඔව් මං දැක්කා. ආන් දැන් ඒගොල්ලො අපේ වත්ත පල්ලෙහා කූඩාරං ගහලා. අහිගුණ්ටිකයො වගයක්ලු. ඒ ගැනි සාස්තරත් කියනවලු."

"අනේ මටත් ආසයි සාස්තර අහන්ඩ "

"ඉතින් දවසක ඇවිත් අහගන්න එකයි තියෙන්නෙ"

"දවසක මං එන්නංකො"

"ඒත් ඉතිං කරුවල වැටෙන්ඩ කලින් එපැයි. අත බලලා සාස්තර කියන්න" මම මතක් කළෙමි.

"දවසක වැඩ ඇරිච්ච හැටියෙ මං එන්නං. ඔයා මාව ගෙනැත් බස්සනවනෙ?"

"බලමුකො"

"ඒ හරියෙ හොල්මන් තියෙනව කියනවනෙ"

ඒ කතාව ඇසෙත්ම ජයසිරි කරබාගෙන ඉවතට ඇවිද ගියේය. සිසිලින් ගේ සිද්ධිය අප දෙදෙනා අතරේ රහසක්ම විය. ඒ ගැන තවදුරටත් හාරා අසන්නට මා තුළ පිරියක් නොවීය.

මා ගෙදර එන විටත් වියෝනිස් කට්ටඩියා දෙහි කැපිල්ලට හා සාන්තියට ලැහැස්ති වෙමින් සිටියේය. ඔහුගේ අත් උදව්කරුවා වූ හැන්ඩි ගොක් වියමනෙන් තටු හැදුවේ ඉස්තෝප්පුව බඳු අරගත් තලක මෙනි. මේ සියල්ල මා වෙනුවෙන් යැයි මට සිතුණේ ගොක් අතු නැති තැන්වලින් පනිමින් කාමරයට යද්දීය.

"අයියට නාගන්නැයි අම්මා කියනවා" කාමරයට ආ අමරසිරි බංඩාර කීවේය. "අයියා මං බයිසිකලේ අරන් පෙට්ටි කඩේට දුවල එන්ඩද? කළමනා වගයක් ගේන්ඩ."

"අනේ යන්න අරන් යන්න." යැයි මා කියන විටත් අමරසිරි බංඩාර බයිසිකලය අරන් ඉගිලිලාය. ඔහු බලා සිටියේ මා එනතුරු නොවේ. බයිසිකලය එන තුරුය. මම ළිඳ ළඟට ගොස් නාගෙන විත් සුදු කලිසමත්, කමිසයත් හැඳගත්තෙමි. සෙත් සාන්තියට ආ අයටත් හරියන්නට මුළුතැන් ගෙයි රෑ කෑම පිළියෙළ කරමින් සිටි වජිරා, ඒ අතරේ මට තේ කෝප්පයත් ගෙනැවුත් දුන්නාය.

"අයියා හැමදාමත් සුදු ඇන්දොත් කොච්චර අගේදැ"යි ඈ නිකමට කීවේ දොර රෙද්ද ළඟින් ඈත්ව යන අතරේය.



Downloaded from sinhalaebooks.com

මිදුලේ පහන් පැලක් ගොක් වියමනෙන් ගොඩ නැඟිණි. ඒ තුළ පහන් දැල්වී ඉදිරියේ මල් සත් වර්ගයක් පූජා විය. ඒ සියල්ල තෙළා ගෙන විත් තිබුණේ නයනාය. කෝසලා නම් ඇගේ මිතුරියක් ද උදව්වට ඇවිත් සිටියාය. මේ හැරෙන්නට කෝසලාගේ අම්මාත් අහළ පහළ මා මෙතෙක් නොදුටු කීප දෙනාත් අද ගොම්මනේ මේ ගෙදරට ගොඩවූහ.

ඒ අතරේ වත්ත පහළ කුඩාරම් මඩු බැඳගත් අභිගුණ්ඨික ගැහැනියත් -- ඇගේ පුතාත් මා හොඳ හැටි දැක ගත්තේ මෙදාය.

නීලම්මා නම්වූ ගැහැනියට වයස අවුරුදු හැට පහක් පමණ වන්නට ඇත. ඇගේ කළු මුහුණේ එතරම් වයස් රැලි නොවුවද, පැසුණු හිස කෙස් නිසා වයස් බව පෑවාය. මා තුළ විශ්මය එලවූ අතික් කාරණය වූයේ ඈ උඩුකයට සැට්ටයක් නැතිව සාරිපොටකින් පමණක් දෙතන ආවරණය කර සිටීමයි. ඈ පිටුපස පිලේ කණුවකට හේත්තු වී, ඉදිරියට දිගු කරගත් දෙපය ඇස්වටය ළඟින් හරස් කොටගෙන, දැත ඔඩොක්කුවේ එක්කොට රඳවා දැස් පියා හිඳ සිටියේ භාවනා කරන්නාක් මෙනි.

ඈ අත බලා සාස්තර කියනවා පමණක් නොව, පේනයකින් මෙන් ඉස්සරහට වෙන දේද, හිත ද කියවන බව වජිරා මට රහසෙන් මෙන් කීවාය. ඇත්තෙන්ම නීලම්මා දෙස බැලූ බැල්මටම ඇය තුළ යම්කිසි අද්භූත බලවේගයක් ඇතැයි මට හැඟුණි.

කරුපන් නම් වූ ඇගේ පුතා වැඩිපුර ගැවසුණේ ඉදිරි මිදුලේය. විටින් විට බුලත් විට කෑ ඔහු විටින් විට කෝටු කැබැල්ලකින් හෝ සිහින් යකඩ කටුවකින් කසට බැඳුණු දත් සුද්ද කළේය. ඔහු යම්කිසි අසහනයකින් ජීවත් වෙතැයි බැලූ බැල්මටම මට පෙනුණි. ඔහු හැසිරුණේ යම්කිසි කඩිනමකිනි. ඔහු එක තැනක රැඳුණත් ඒ නොඉවසිලි ගතිය ඔහු තුළ ඇති බව පෙන්නුම් කළේ ඇත මැත බැලූ දෑසයි. මා ඔහුව දුටු හැම වතාවකම ඔහු හැඳ සිටියේ රතු කළු ඉරි දිවු සරම් කඩයි. නිරුවත් උඩුකයේ මතාව වැඩුණු පපුතුරේ කහ නූලකින් එල්ලෙන කුඩා රන් සූරයක් විය. පොකුටු වූ කළුකෙස් වැසෙන්නට ඔහු ඉඳහිට ජටාවක් බැන්දේය.

කරුපන් පලින් පල ගොස් වඳුරා නටවා හෝ නයා නටවා හෝ මුදල් සොයා ගෙන එන බව අමරසිරි බංඩාර මට කීවේය.



Downloaded from sinhalaebooks.com

වියෝනිස් සාලයේ කෙළවරක අඳුන ළඟ හිඳ මතුරන්නට පටන් ගත්තේ රාත්‍රි හතට පමණය. මේ වෙනවිට හැන්ඩි විසින් ගොඩනගන ලද පහන් පැල තටු, සැරසිලි ආදිය මිදුලේත්, සාලයේත් ඉස්තෝප්පුවේත් විය. මෙයින් අවට යම්කිසි අසිරියක් මැවිණි. හොඳක් වෙන්නේය යන සිතුවිලි හැමදෙනාම තුළ විය.

සාලයේ එලූ පැදුරු මත කීපදෙනෙක් හිඳ සිටියහ. මම ද මඳ වේලාවක් බලා හිඳ කුස්සිය පැත්තට ගියෙමි. දෙහි කපන විට තව ඒ වේයැයි වජිරා කීවාය.

හදිසියේම දඩි බිඩි ගාගෙන පිලිකන්න පැත්තට කවුදෝ ඉදිරියේ සිට දුව එන හඬ ඇසිණි. මා තිගැස්සුණ ද පිලේ කණුවට හේත්තුවී හිඳ සිටි නීලම්මා නම් වගක් නැතිව දැස් පියාගත් ගමන්ය. කුස්සියේ දොරකඩ සිටි වජිරා මගේ අතින් ඇල්ලුවේ නොසිතාමය.

නීලම්මාගේ හිසට පිටුපසින් මෙන් මිදුලේ අඩ අඳුර තුළින් ගිනි මල් විසිරුණි. සිදුවන්නේ කුමක්දැයි දැනගත් සැණෙන් වජිරා අත මුදාගත්තාය.

"අනේ මං බය උන තරම අයියා" යි ඈ කීවාය.

අඳුරේ ගිනි විසිවුණේ හැන්ඩි දැල්වූ දුම්මලවලිනි. ඔහු පසු පසින් වියෝනිස් ද තව තුන් දෙනෙක් ද වූහ. ගෙයි වටේ දුවගෙන මෙන් ගිය හැන්ඩි ආවේසයකින් මෙන් හැම මුල්ලකම දුම්මල විසි කරමින් ඒවාට ගිනි ඇවිළුවේ අතින් ගත් පන්දමකිනි. මෙසේ ගෙය වටේම දුවගිය ඔහු අනතුරුව ඉස්තෝප්පුවට වින් එහි දොරකඩ නතර වුණේය.

වියෝනිස් ගෙතුළ වූ අඟුරු කබල දෙකක ගිනියම් වෙමින් තිබූ පොල් කටු අඟුරු ගෙනැවුත් දොරකඩ හලත්ම, හැන්ඩි ඒ ගිනි ගොඩ මත පා තබමින් නැටුමක යෙදුණේය. ඒ හැම අතරින් මට පෙනුණේ නයනාගේත්, කෝසලාගේත් බියගත් දෑස්ය. කුඩා මුව පොව්වන් දෙදෙනකුසේ ළංව සිටගත් ඔවුන් එකිනෙකාගේ අත් අල්ලාගෙනය. හැන්ඩි පරලයකට පත්වී හිස දැතට සලමින් නැටුවේය. ඔහුගේ දිගු කෙස් රල කැරලි හැම අතටම විසිරෙමින් වෙනම නැටුමක් පෑය. තවත් මඳ වේලාවකින් ඔහු හති දමමින් දහදිය වගුරුවමින් සාලයට දුවගොස් අඳුන ඉදිරියේ පැදුර මත ඇද වැටුණේය.



Downloaded from sinhalaebooks.com

වතුර ඉසීමෙන් පසු ඔහු නැගිට හිඳ ගත්තේය. වියෝනිස් ඔහුට සුදු කඩක් පොරවා අඳුන ළඟ වූ පහනෙහි දැල්ල මඳක් උස් කළේය.

හැන්ඩි අපට නොතේරෙන භාසාවකින් මොනවාදෝ දොඩවන්නට වූයේ වෙව්ලන කට හඬකිනි. වියෝනිස් ඒ ළඟම හිඳ අපට ඇසෙන්නට කතා කළේය.

"මේ ගෙට බැල්මක් වැටිලා තියෙනවා. මළගිය පරාණකාරයෙක් කලින් කරපු බන්ධනයක්. ආසාවක් නිසා ඇවිත් හැසිරෙනවා. අපි අද දැන් ගේ හතර වටේ ආරස්සා කරනවා. ඒ අතරෙම අපි මේ ගෙදර අයටත් සෙත් සාන්තියක් කරලා වතුර මතුරලා දෙහි කපනවා. එහෙමයි නේද?"

පැදුරක හිඳ සිටි ලීලාවතී මැණිකේ "එහෙමයි" කීවාය.

"තව ටික වේලාවක් අපි මේ මැතිරීම කරනවා. යන යකා යනකොට සලකුණක් කරගෙන යාවි. එහෙමයි නේද?"

"එහෙමයි" ලීලාවතී මැණිකේ දෝංකාර දුන්නාය.

හැන්ඩි තව තවත් මොනවාදෝ මැතිරුවේය. මගේ අවධානය බිඳුණේ පිටත කවුදෝ ඇවිද එන බව මා සිටි තැනට පෙනුණ නිසාය. මම නැගිට ඉස්තෝප්පුවට ආවෙමි.

එහි දැල්වුන පැට්‍රෝමැක්ස් ලාම්පුවේ එළියෙන් මට පෙනුණේ ගේ අතට ආ තිදෙනෙකි. චිත්‍රා, අතුල සහ අනෝමා ...මම මිදුලට ගියෙමි.

"ඕගොල්ලො මොනව කරනවද මෙහේ?" කටහඬ බාල කොට මම ඇසුවෙමි.

"ඔයා කිව්වෙ නැතුවට අපිට ආරංචි උණා තොවිලෙ" අනෝමා සිනාසී කීවාය.

"තොවිලයක් නෙමේ – ආරස්සාවක් "

"මොකක් හරි. කාටද ජනක යකා වැහිල තියෙන්නෙ?"

"කාටවත් යකෙක් වැහිලා නෑ – අනෝමා දන්නෙ නැද්ද මෙහෙ මැණිකෙ හිතුව ගේ ආරස්සා කරන්න කියලා...."

"ගේ ආරස්සා කරන්න ඕනෑ ඔයාගෙන්!"

"මේ අනෝමගෙ වදේට අපි ආවෙ ජනක" අතුල පැහැදිලි කළේය. "කමක් නැනේද? අපි හිතුව මේ පැත්තට ඇවිදගෙන එන්න."



Downloaded from sinhalaebooks.com

"ඒකට මොකද එන්න එන්න"

"අපි එළියෙන් ඉම්මු" චිත්‍රා කීවාය.

"යං මගෙ කාමරේට. ඉස්සරහ කාමරේ" මම රහසින් මෙන් කීවෙමි. "තව ටිකකින් දෙහි කපල ඉවර වේවි."

"මේ ඒක නෙමේ. අපිට මේ ආවට හොල්මන් මොනවත් නම් හම්බ උනේ නැහැ" අනෝමා තවම කතා කරන්නේ දඟකාර දැරියක ලෙසිනි. ඇගේ සිතේ ඉල්පෙන සතුටක් හැසිරෙන ආකාරයෙන් ද පෙනේ.

"යමු යමු"

මා අනුව තිදෙන ඉස්තෝප්පුවේ පැත්තකින් වූ මගේ කාමරයට ඇතුළු වූහ.

චිත්‍රාත් අතුලත් ඇඳ මත හිඳගත් අතර, අනෝමා මේසය ළඟ පුටුව අරක් ගත්තාය.

"හ්ම්! මේකයි එතකොට ඔයාගෙ නවාතැන් පොළ" ඈ කීවේ විමසුමෙන් වටපිට බලමිනි. ඇය උවමනාවටත් වඩා හොඳට හැඳ පැළඳ ගෙන ආවැයි මට සිතිණි. දිලිසෙන නිල්පාට ගවුමක් අතට රන් වළල්ලක්. ඇගේ වත්සුණු සුවඳත් මට දැනිණි. චිත්‍රා එයට වඩා චාම්ව රෝස පැහැ ගවුමක් හැඳ සිටියාය. අතුල ද ළාපැහැ කමිසයක් කලිසමක් හැඳලාය.

"අපි මෙච්චර කල් හිටියට අද තමයි මෙච්චර දුර මේ පැත්තට ආවෙ." අතුල පහත් හඬින් කීය. "කොහොමද ජනකට මෙතන හම්බ උනේ?"

"අපෙ යාළුවො වගයක් ඉන්නව ගලහ. ලීලාවතී මැණිකෙව කලක ඉඳල දන්නව. ඒගොල්ලො මට හබරවැවට එන්න උනැයි කිව්වම ඒ ගොල්ලො තමයි මෙතැන පංගාඩං කරල දුන්නෙ."

"දුර තමා ටිකක්"

"දැන් මට බයිසිකලේ තියෙනවනෙ. ගාණක් නැහැ. මේ ඩිංගක් ඉන්න" කී මා දොරෙන් පිටවූයේ මුළුතැන්ගෙට ගොස් අමුත්තන්ට බීමට යමක් ගෙන එන්නටයි.

සාලයෙන් යා නොහැකි නිසා මම වටයෙන් පිලිකන්නට ගියෙමි. ඒ යන අතරේ මා මොහොතකට ගැස්සුණේ අඳුරේ මා අතට පිය



Downloaded from sinhalaebooks.com

නගමින් සිටි නීලම්මා දැකීමෙනි. ඈ ඉතා සිරුවෙන් බිම බලාගෙන පිය මැන්නේ භාවනාවකින් මෙනි. ඈ මා ගැන වගක්වත් ගත්තේ නැත. ඇය ජීවත්වන්නේ වෙනම ලෝකයකැයි මට සිතිණි.

වජිරා කුස්සියේ සිටියාය. "අනේ නංගි මේ මගෙ බැංකුවෙ යාළුවො තුන් දෙනෙක් ආවා බොන්න මොනවත්"

"මං හදල ගෙන්නං අයියා, අඳුර ගන්නත් ආසයි"

මට ආපසු සිතූ තරම් ඉක්මනට පෙරළා කාමරයට යාමට ඉඩ නොලැබිණි. මා සොයමින් අමරසිරි බංඩාර පසු පිලට ආවේය. "අන්න අයියා හොයනව. එන්න දෙහි කපන්න"

"මේ දැන්?"

"ඔව් දැන් තමා"

මම ඔහු අනුව සාලයට ගියෙමි. අඳුන ළඟ පැදුරේ මට හිඳ ගන්නට සිදුවිය. සුදු පිරුවටයක් මා හිස වසා වැටිණි. වියෝනිස් ගිරයෙන් අල්ලා ගත් දෙහි ගෙඩියක් මගේ හිස සිට දෙපතුල දක්වා ඇද ගෙන ගොස් යමක් මතුරමින් ළඟවූ දිය බාල්දියක් ඉහළින් දෙහි ගෙඩිය "ටකස්" ගා දෙකට කපා දියට හෙලුවේය. මම සැහැල්ලුවකින් හිඳගෙන සිටියෙමි. දෙහි ගෙඩිය ඇඟ ගෑවෙද්දී පලින් පල කිතියක් මෙන් දැනුණා හැරෙන්නට වෙන හැඟීමක් නොවීය. මෙසේ දෙහි ගෙඩි කීපයක් කැපුණාට පසු මට යන්නට අවසර ලැබිණි.

මා කාමරයට එනවිට තිදෙනා හිඳගත් තැන්වලම සිටියහ.

"කෝ ඔයා කොහේ ගියාද?" කී අනෝමා එක්වනම ඇඳ ඉහළවූ කවුළුවෙන් පිටත බලා බියගත් දෑසින් "අර?" යැයි කීවාය.

ඇය ඇඟිල්ල දිගු කළ දිසාව මම බැලුවෙමි. ජනේලයේ යකඩ කූරු අතරින් බලා සිටියේ අන් කිසිවෙකු නොව නීලම්මාය.

මට සිනා නොවී නොහැකිවිය. "ඒ තමා නීලම්මා. අභිකුණ්ටික ගැණි සාස්තර කියන"

"අනේ ඇත්තට මටත් සාස්තරයක් අහන්න ඕනෑ" අනෝමා කීවාය.

නීලම්මා යමක් මතුරමින් කවුළුවෙන් ඈත්ව අඳුර අතට ගියාය.

"අපි දවසක අහමුකො"

"මං හෙට හවසට එන්නද මෙයා?"



Downloaded from sinhalaebooks.com

"ඕනෑ නං එන්න"

"වැඩ ඇරිල එන්නං"

අපේ කතාව නතර වූයේ බන්දේසියක බීම වීදුරු හතරක් තබා ගත් වජිරා කාමරයට ඇතුළු වූ හෙයිනි. සුදු ගවුම හැඳ සිටි ඈ වෙත වූයේ පෙර මා නොදුටු සන්සුන් ඉරියව්වකි.

ඈ තිර රෙද්ද මෑත් කරමින් බන්දේසිය දෑතින් ඔසවා ගෙන ඇතුළට ආවේ දේවාලයකට ඇතුළු වෙන බැතිමතියක අයුරෙනි.

"මේ තමා වජිරා" මම හඳුන්වා දුන්නෙමි. වජිරාත්, අනෝමාත් එකිනෙකා දෙස බලා සිනා පෑවෝය.

"මම අනෝමා" අතවූ ලේන්සුව ඇඹරවූ අනෝමා කීවාය. "අර ඉන්නේ චිත්‍රා, අතුල" වජිරා සිනාසී බඳුන් පාත්ම, අනෝමා එකක් ගෙන "තෑන්ක්ස්" කීවාය.

වජිරා අනෙක් බඳුන් චිත්‍රාට හා අතුලට දෙන්නට ඒ පැත්තට හැරුණා පමණි. පිටත "කරාස්" ගා මහා හඬක් නැඟිණි. අනෝමා අතවූ වීදුරුව ඇගේ අතින් ගිලිහී බිම වැටී කැලි කැලිවලට බිඳුනේ තවත් හඬක් නගමින් හැම අත සීනි දියරය විසුරුවමනි.

"අනේ!" අනෝමාට කියැවිණි.

"යකා යන්ඩ ඇති" වජිරා කවුළුවෙන් බලා කීවාය. "වියෝතිස් කිව්වනෙ යනකොට සලකුණක් දීගෙන යනවා කියල. අර බලන්න අයියා ජම්බු ගහේ අර අත්ත"

අපි හැමදෙන කවුළුවෙන් පිටත බැලුවෙමු. අඩ අඳුරේ බිඳුණු අත්ත යන්තමට පෙනිණි.

"මං ඕගොල්ලන්ගෙ වීදුරුවත් බින්දා" අනෝමා තැවුණාය.

"ඒකට කමෙක් නෑ අනෝමා වීදුරු බිඳෙනවනෙ" වජිරා සන්සුන් හඬින්ම කීවාය. "ඔත්න කකුල් කපා ගන්න විතරක් එපා. ඉන්න මං කොස්ස ගේන්නං" කී ඈ අඩියට දෙකට කාමරයෙන් පිටවුණාය.

කීපදෙනා දැන් ඉස්තෝප්පුවට ඇවිත් සිටියෝය. ඒ අතරින් අමරසිරි බංඩාර දොර රෙද්ද මෑත්කොට කාමරයට එබී බැලුවේය.

ඔහුගේ දෑස රැඳුණේ අනෝමාගේ දෑස වෙතයි.ඔවුන් එකිනෙකා දෙස උවමනාවෙන් බැලූ ආකාරය මට හොඳ හැටි පෙනිණි.



Downloaded from sinhalaebooks.com

කාන්දමකට ඇදී එන්නා සේ කාමරයට ආ අමරසිරි බංඩාර දොඩමළු වුණේය.

"හරි නේද අයියා. යකා සලකුණක් කරන් ගියා."

"මෙතැනත් සලකුණක්" මට කියැවිණි.

"මොකද වුනේ?"

"අනෝමා අතින් වීදුරුව බිඳුණා."

"අනේ මට සමාවෙන්න" කියමින් අනෝමා පස්සට වුණාය.

"අනේ ඒකට මක්වෙනවද?" අමරසිරි බංඩාර බිම නැමී ලොකු වීදුරු කැලි එකතු කරන්නට වුණේය.

වජ්රා කොස්සත් රැගෙන එන විට ඔහු විසින් බොහොමයක් කැබිලිති එකතු කොට තිබිණි. නයනා පරණ තුවා කඩක් ගෙනැවුත් බිම පිසදැමුවාය. මට බොන්නට ගෙන ආ වීදුරුව මම අනෝමාට දුන්නෙමි.

අපි සියලු දෙනාම එක්වනම ඉතා හිතවත්ව ඒ මොහොතේ සමීප මිතුරු මිතුරියන් බවට පත්වී යැයි මට හැඟුණි.

"සමහරවිට වීදුරුවක් බිඳෙන්නේ හොඳට" යැයි පසුව වෙලාවක අමරසිරි බංඩාර කියූ කතාවේ යම්කිසි ඇත්තක් විය. නමුත් හොඳ නරක සමබර යැයි මට තේරුම් ගියේ කාලයාගේ ඇවෑමෙනි.



Downloaded from sinhalaebooks.com

# 11

ඒ රාත්‍රියේ අනෝමාත්, චිත්‍රාත් අතුලත් ලීලාවතී මැණිකෙලාගේ ගෙදරින් පිටව ගියේ අපේ පෙරැත්තය නිසා රෑ කෑම ටිකකුත් කෑමෙන් පසුවයි.

දෙහි කැපිල්ලෙන් පසු හැමදෙනාම මෙන් විසිර ගිය පසු අමුත්තන් හැටියට ගෙදර ඉතිරි වූයේ ඒ තුන් දෙනා පමණයි.

බැංකුවේ අප සතර දෙනා හැරෙන්නට, අමරසිරි බංඩාර හා වජිරා ද අප සමග කෑම මේසයට හිඳගත්තේය. මට මතක හැටියට වජිරා මා සමග එකම කෑම මේසයකට හිඳගත් මුල්ම වතාව මෙයයි.

අපි නොයෙක් විහිළු තහලු කළෙමු. සෙත් සාන්තියෙන් පසු හැමගේම සිත් සැහැල්ලු වූවා සේය. නයනා පෙනෙන අහලක නොවූවාය. පසුදා පාසල් යා යුතු හෙයින් ඈ නිදිමතේම ඇඳට ගිය බව ලීලාවතී මැණිකේ කීවාය.

ලීලාවතී මැණිකේ, නීලම්මාටත් කරුපන්ටත් කෑම ඔතා ගෙනයන්නට දුන් බවක් සඳහන් කළාය. දවසක වැඩ ඇරී සාස්තර අහන්නට අහිගුණ්ටික ගුබ්බෑයමට එන බවක් අනෝමා යළිත් මතක් කළාය.

මේසයේ පුළුල් පැත්තක හිඳ සිටි මගේ දකුණතට වජිරා හිඳ සිටියාය. මගේ වම් පසින් මේසයේ කෙටි පැත්තේ හිඳ ගත්තේ අනෝමායි. ඇයට මුහුණලා අනෙක් කෙළවරේ අමරසිරි බංඩාර හිඳ සිටි අතර මටත්, වජිරාටත් අනෙක් පැත්තෙන් චිත්‍රාත් – අතුලත් හිඳ

Downloaded from sinhalaebooks.com

සිටියහ. ''පෝඩු තුනක් ''යැයි මට සිනාමට සිතිණි. අමරසිරි මංඩිය හෝරා බලා පුටුවක හිඳගත්තේ අනෝමාගේ මුහුණ දෙස එක එල්ලේ බැලීමට බව මට තේරුණේ පසුවයි.

වරක් වජිරා මගේ පිගානට යමක් බෙදූ විට අනෙක් පසින් අනෝමා ද මට යමක් බෙදුවාය. අනතුරුව දෙදෙනාම සිනාසුණෝය. මට රුචිනී මතක් විය.

එදා රාත්‍රියේ මම කිසිදු කරදරයකින් තොරව නිදාගත්තෙමි. එළිවෙන යාමයේ මා අවදිව ගත්තේ පුළුගේ හමා යන සිරි සිරි පොද වැස්සක හඬ අසමිනි. සියලු වස් දොස් සේදී ගියාක් මෙනි. මගේ ගතටත් සිතටත් නව පණක් දැනිණි. වෙනදා මෙන් වෙහෙසකර ගතියක් නොවීය. සේරටම බලපාන්නේ සිත නම්, ඒ සිත වෙනස් කරන්නට ඇතැම් විදියේ හෞතික අවස්ථාවන් උපකාරී වෙයි. පෙරදා රැයේ දෙහි කැපිල්ල හැමදෙනාගේම සිත්වලට ගෙන ආ සහනයේ යම්කිසි බලපෑමක් වූ බව පැහැදිලි විය.

පොද වැස්සෙන් වට දිය බිඳු සිඳිමින් ළහිරු නැගී ආවේය. වදුළුවල නොයෙක් කිචි බිචි කුරුළු හඬද, වත්ත පාමුල අභිගුණ්ටික කුඩාරම ළඟ තප්පුලන ගවයාගේ හඬද මට පැහැදිලිවම ඇසිණි. වැස්සෙන් වා ගැබද පැහැදුල් විය. සියල්ල අලුත් වී නැවුම් බවක් පෑය.

මම නයනාව බයිසිකලයේ හිඳුවාගෙන පාසල ළඟට ඇරලා කාර්යාලයට ගියෙමි. අනෝමා මා එනතෙක් මෙන් මඟ බලා සිටියාය. ඇගේ මුහුණේ සිනාව පිරිලාය. නවාතැනට ආ එක ගමනින්ම ඇය තවත් සුහද වූවා සේය.

"ඒ ගෙදර හැමෝම හරිම හොඳයි" ඇ කීවාය. "වජිරාත් හරි හැඩකාරි නේද?"

"මං නං ඔච්චර බැලුවෙ නැහැ. මගේ ම නංගිලා වගේනෙ ඒ දෙන්නා. මේ ඒක නෙමෙයි ඕගොල්ලො ඊයෙ රෑ කරදරයක් නැතුව ආපහු ගියාද?"

"ඔව් හොල්මන් නං දැක්කෙ නැහැ. ඔයා කියපු බෝදිලිමා වගේ ඒවා."

"මං නෙමෙයි – ඒව කිව්වෙ අනිත් අය."

"ආ ඒ උනාට අපි අර කුඹියන් කැලේ හරියෙ එනකොට වූටි සුදුපාට බල්ලෙක් පාර පැනල ගියා ගඟ පැත්තට. අපි ඉස්සරවෙලා



Downloaded from sinhalaebooks.com

හිතුවෙ හාවෙක් කියලා. කාගෙ හරි ගෙදරකින් පැනල ගිය එකෙක් වෙන්නැති."

"ඔයොල්ලො බය උනාද?"

"හිතට නිකං බයක් වගේ නම් දැනුණා. අපි තුන්දෙනාම හිටියනෙ..."

ඇය මේ කතාව කියත්ම පෙර ඇසූ කතාවක් මට සිහිවිය. මගේ සහෝදරියගේ මිතුරියක පැවසූ සිද්ධියකි එය. ඇයත් තව දෙදෙනකුත් නුවරඑළියේ නිවාඩුවට ගිය විටය, එය සිදුවී ඇත්තේ රාත්‍රියේ සාදයකට ගොස් පෙරළා තම නවාතැන් පළට ඇවිදගෙන එන අතර, ඔවුන් තිදෙනා ඉදිරියෙන් කුඩා සුදු බල්ලකු ඇවිද ගියාලු. නමුත් ඔවුන් විපරම් කර බැලූ නමුත් ඒ සතා සොයා ගත නොහැකි වුණාලු. මදක් දුරදී යළිත් එම බල්ලාම පාරෙහි අනික් අතට ඇවිද ගියාලු. මේ දෙවතාවේම ඔවුන්ට යම්කිසි සුවඳකුත් දැනුනාලු. ගෙජ්ජියක් සෙලවෙන හඬකුත් ඇසුණාලු.

පසුව මේ සිද්ධිය නවාතැන් පළේදී කීවිට එතැන මෙහෙකරුවෙකු එය සනාථ කළාලු. කලකට ඉහත ඒ අඩවියේ ජීවත්වූ ධනවත් කාන්තාවක් ඇගේ බල්ලාත් කැටිව හවස් වරුවක පාරේ ඇවිදින්නට ගිය ගමනකදී බීමත් වූ රියැදුරෙකු එළවා ගිය රියක හැපී මිය ගියාලු. වරින් වර මෙම බලු අවතාරය දෘශ්‍යමාන වෙනවාලු.

මේ සිද්ධිය සිහිවුවද මම ඒ කිසිවක් අනෝමාට නොකීවෙමි. නමුත් කුඹියන් කැලේ සුදු බල්ලෙක් කොයින්ද? අනෝමාව බිය ගැන්වීමේ තේරුමක් නොවීය.

බදාදා වැඩ ඇරී තමා නීලම්මාගෙන් සාස්තර අහන්නට එන බව අනෝමා කීවාය.

"ඒ ගැනි කියන ජීවා හරියට හරිලු" යැයි කීවේ චිත්‍රාය. "කිරි ගහට ඇන්න වගේලු."

"කිරි ගහට ඇන්නම මොකද වෙන්නෙ?" අතුල විහිලුවට ඇසුවේ චිත්‍රාගෙන් ද පහරක් කමිනි.

අපි සියලු දෙනාම වඩාත් මිතුරු වූ සේය මට හැඟුණේ.

බදාදා සවස වැඩ ඇරුණාට පසු අනෝමා මා සමගම පෙරළා ආවාය. ඇය ඇගේ නවාතැනේ රැඳුණා නම් ඒ ටික මොහොතකට පමණයි. ඈ ඇගේ කාමරයට දුවගොස් දුඹුරු කඩදාසියෙන් එතූ තරමක ලොකු පෙට්ටියක් රැගෙන ආවාය.



Downloaded from sinhalaebooks.com

"කොටද තැගී?" යැයි මා ඇසුවද "බලමුකො" කී ඇය පිළිතුරු සිනාසුණා පමණි.

තවමත් රන්වන් හිරුඑළිය අප අවට විය. රෑ වෙන්නට කලින් අත බලා සාස්තර අසා ගත යුතු බවය ඇය කීවේ. මම බයිසිකලය තල්ලු කරගෙන ඇය සමග ඇවිද ආවෙමි.

අප ගෙදරට ළඟා වෙත්ම ඉස්තෝප්පුවේ බලා සිටි නයනා අප අතට දුව ආවේ පළපුරුදු සිනාපාමිනි. ඈ අනෝමාගේ අතේ එල්ලුණේ බොහෝ කලක සිට හඳුනන කුළුපග කෙනකුගේ අතේ එල්ලෙන්නා සේය.

"අනේ අනෝමා අක්කා ෂෝක් වලලු - ෂෝක් ගවුම" නයනා තොදොල් බසින් කීවාය.

"මෙන්න ඕගොල්ලන්ට තෑග්ගක්" අනෝමා තමා අතවූ පාර්සලය නයනාට දුන්නාය.

"මොනවද අක්කා?"

"ගෙනිහුන් බලන්නකො"

අපට පෙරාතුව දුව ගිය නයනා ඉස්තෝප්පුවට ගොඩවූ සැණෙන් කොට තාප්පයේ තබාගත් පාර්සලය ලිහන්නට වුණාය.

අප ගෙට ළංවත්ම, නයනාගේ කෑගැමෙන් ලීලාවතී මැණිකේ ද ඉස්තෝප්පුවට ආවාය.

"අනේ දුව මොනවට මේවා ගෙනාවද?" යි ඇයට කියැවිණි.

පාර්සලයේ වූයේ අලුත්ම මල් මල් වීදුරු හයකි.

"මගේ අතින් බිඳිච්ච එකට"

"ඒකට මොකද එහෙම හරියනවද?"

"මේක මගෙන් තෑග්ගක් තරහ නැතුව ගන්න ඕනැ"

"අනේ" කී ලීලාවතී මැණිකේ "ලොකු දුව" යැයි හඬ ගාමින් ගෙතුළට ගියාය.

මම බයිසිකලය කාමරයට ගෙන ගොස් කෙළවර ජනේලය පහළ බිත්තියට හේත්තු කළෙමි. නයනාත් අනෝමාත් ඉස්තෝප්පුවේ කතා කරන හඬ ඇසිණි. පය තැම්බු සපත්තු දෙක කඩිනමින් ගලවා දැමූ මා සෙරෙප්පු ලා ගන්නා විට, අමරසිරි බංඩාරගේ කට හඬ ද පිටත ඇසිණි.



Downloaded from sinhalaebooks.com

"ඔං සාස්තර අහන්න යන්න ආවා"

"ඔං එක්කන් යන්නං" අමරසිරි බංඩාර සුහද හඬින් කියන විට මම ද ඉස්තොප්පුවට ඇවිත් සිටියෙමි.

"අපි යමුද එහෙනම්?" කියමින් අනෝමා හුනස්නෙන් නැංගාය.

"මේ මොකටද?" යැයි අමරසිරි බංඩාර විමතියකින් විමසුවේ වීදුරු දකිමිනි.

අනෝමා විලියකින් මෙන් ලේන්සු පටින් මුව පිසදා ගත්තාය. ඇගෙන් පිළිතුරක් නොලැබිණි. නයනා වීදුරු හය සහිත පෙට්ටිය රැගෙන යද්දී අපි තිදෙන මිදුලෙන් වත්ත පිටුපසට ඇවිද ගියෙමු.

මා මෙතරම් ඈතට මේ වත්තේ ඇවිද ගියේ මෙදාය. ඒ තරම් ඈතට ඇවිද ගොස් බලන්නට මට මෙයට පෙර හේතුවක් හෝ කාල වේලාවක් හෝ නොතිබිණි. ලීලාවතී මැණිකේගේ වත්තේ මායිම ඉවර වෙන තැන් බිඳ වැටුණු වැටක් ද පෙළට සිටවූ ගස් කීපයක් ද විය.

අභිගුණ්ටිකයින්ගේ කූඩාරම තිබුණේ එයිනුත් යාර දෙසියයක් තරම් ඈත විවරවූ බිම් කඩක් මැදය.

කූඩාරමට මෙපිට දෙල් ගස යට කරත්තය රැඳවුණ අතර ඒ අසලම කළු ගොන් නාම්බා උලා කමින් සිටියේය. එයින් මඳක් ඈත කූඩාරමට පිටුපසින් සුදු දුමක් නැඟුණි. කිරු බල්ලෙක් කාගේදෝ ඇණවුමකින් නිහඬ විය. කූඩාරම අවට බිම මනාව ශුද්ධ පවිත්‍ර කර තිබුණ අතර අසල ගස් දෙකක් යා කරමින් ඇදුණු ලණු පටක් මත මඳ සුළඟට වැනෙන පාට පාට රෙදි කෑලි කීපයක් විය. කූඩාරමේ කුඤ්ඤයකට කර බඳින ලද වඳුරා මට පෙනුණේ තවත් ලංවද්දීය. ඌ රතු සායක් හැඳ රන් ඇට මාලයක් පැළඳ සිටියේය. අප දැක විලිස්සූ ඌ යළිත් දෑතට ගත් යමක් හපන්නට වූයේ අපව අමතක කරමිනි.

අපේ ගමන දැනගත් නියායෙන් නීලම්මා කූඩාරමෙන් පිටතට ආවාය. හැට්ටයක් නොවූ ඇගේ උඩකය තැඹිලි පැහැ සාරියේ පටින් වැසී තිබිණි.

"ආ මාත්තේලා නෝනාලා එන්ඩ එන්ඩ" ඇය කීවේ බුලත් කසට රැඳුණු දත් කිපය පෙන්වා සිනාසෙමිනි.

අපට හිඳගන්නට ඈ කූඩා ලෑලි පෙට්ටි දෙකකුත් බංකුවකුත් පෑවාය. නීලම්මා ද බංකු පොඩියක් ළඟට අදිමින් හිඳගත්තේ ඉතා



Downloaded from sinhalaebooks.com

උවමනාවෙන් අනෝමාගේ මුහුණ දෙස බලමිනි.

"මේ නෝනාට තමා වැඩියම අහන්ඩ ඕනෑ සාස්තරේ එහෙම නේද?"

අනෝමා උනන්දුවකින් "ඔව්" කීවාය.

"පඬුරු ගෙනැව?"

"පඬුරු?"

"ඔව් බුලත් අතේ තියල දෙන්ට"

"අපි බුලත් නං ගෙනැවෙ නෑ"

"බුලත් නං මා ගාව තීනවා"

නිලම්මා යළි කූඩාරම ඇතුළට නැවීගෙන යත්ම "හොඳ ජාවාරම" යැයි අමරසිරි බංඩාර මැතිරුවේය.

නිලම්මා යළි පිටතට ආවේ මදක් වියළුණු බුලත් කොළ කීපයක් දෑතින් රැගෙනය.

"නෝනා මාතියා කැමති ගානක් තියන්ට. මං කීව දේ ෂරි නං තව කීයක් හරි කෙමති ගානක් දෙන්ට. ෂරි?"

අනෝමා බුලත් අතගෙන එහි මැද රුපියල් දහයක් තබා යළි නිලම්මා අතට දුන්නාය. නිලම්මා එය දෝතින් නළලට කර යමක් මතුරා, මුදල ඉණ තුරේ ගසාගෙන බුලත පසෙකින් තබා, ගොළු බසින්ම, අනෝමාගේ දෑත ඉල්ලා දෑතින් අල්ලාගෙන මඳ වේලාවක් දෑස පියා සිටියාය.

මට ඇසුණේ ඈත කරව් කළ කපුටෙකුගේ තනිවුණ හඬ පමණි. දෑස් හැරිය නිලම්මා අනෝමාගේ දකුණතත් අනතුරුව වමතත් පෙරලමින් බැලුවාය. වරෙක ඇගේ මුහුණට විශ්මය මතුවිය. වරෙක ප්‍රශ්නාර්ථය මතුවිය. වරෙක ඈ "හුම්" හඬක් නැඟුවාය.

"නෝනා ඉස්සරාට අපලයි නෝනා පරිස්සං වෙන්ඩෝනෑ. පරිස්සං තේරුණාද?"

"ඔව්"

"දැන්ට නං හොඳම හොඳ තමා"

" හිතේ තියෙන්නා කාරණයක් එකක් ඉෂ්ඨ වෙනවා – එකාක් ඉෂ්ඨ වෙන්නෑ– එකක් ඉෂ්ඨ වුණෝතිත් ඒක තමා කරදර ගේනවා තේරුණාද?"



Downloaded from sinhalaebooks.com

"ඔව් "

"අවුරුදු දානෙනේ දී තමා අම්මා මෙරුණා? ෂරි?"

අනෝමා "ඔව්" කියන්නට හිස වනද්දී ඇගේ දෑස් වලට කඳුළු පිරුණි.

"අම්මා නාම ආරස්සාවට තමා ඉන්නවා. ඒත් අපල තමා නාටවන් වෙනස් කොරාන්ට අමාරු. තව නංගීයි මල්ලීයි ඉන්නවා ෂරිද?"

"හරි"

"කිරි ගහට ඇන්නා වගේ කියනවා. නෝනා තාත්තා – අප්පා නව කසාදෙ ගැන ඉතුවා කෙරගත්තෙ නේ?"

"නෑ"

"ෂරි. දරුවො ගැනම තමා ඉතනවා ෂරි නෝනා!" කී නීලම්මා යම්කිසි දෙයක් දකින්නට අකමැත්තෙන් මෙන් දෑස වසා හිස සැලුවාය.

අනතුරුව දෑස් හැරිය ඈ මටත් – අමරසිරි බංඩාරටත් ඇඟිල්ල උළුක් කොට යමක් මැතිරුවාය.

"මහත්තේලා මේ නෝනාව ආරස්සා කොරාන්ට ඕනැ ෂරි?"

"ෂරි" යැයි පිළිතුරු දුන්නේ අමරසිරි බංඩාරයි. ඔහුගේ මුවහට සිහින් සිනහවක් ද නැගිණි.

"නෝනා හිතේ දෙගිඩියාවෙන් තමා ඉන්නවා. අරක කරනව ද මේක කරනවද කියා? තනී තීරණේ ගන්ට නෝනා. මාරුව හම්බ උනොත් නෝනා අරාන් යන්ට. ඉන්ට එපා. ඉන්ට එපා ෂරි"

"හ්ම්" කී අනෝමා බිම බලා ගත්තාය.

"නෝනා හොඳට දෙයියො බුදුන් වැඳලා ඉන්ට. ඕක තමා ඔඳම දෙයියොන්ට පින් තමා දෙන්ට ඕනා. එත්තකොට තමා දෙයියො පලනවා." කී නීලම්මා තම දෑතින් ආනෝමාගේ දෑත් එකතුකොට දෑස් පියා යමක් මතුරා මඳක් ඈතට වුණාය.

අනෝමා මෙතෙක් කර පහත සඟවා සිටි ලේන්සුව ගෙන තෙත් වූ දෑස පිසදා ගත්තාය.

"සේරම ෂරිනෙ නෝනා?"



Downloaded from sinhalaebooks.com

"හරි. හරි"

වඳුරා අප වෙත විලිස්සුවේය. අනෝමා නම ලේන්සුවේ ගැටය ලිහා නව රුපියල් දහයක කොළයක් ගෙන දිගහැර නීලම්මා අත තැබුවාය.

"මාත්තේලා ශාස්ත්‍ර අහනවා?"

"නෑ නෑ නීලම්මා නෑ"යි හිස සැලූ අමරසිරි බංඩාර මා දෙස බැලුවේය.

"නෑ වෙන දවසක" යැයි මට කියැවිණි.

"කෝ කරුපන්?" අමරසිරි බංඩාර විමසීය.

"හන්දියෙ ගියා මාතියා"

"වඳුරා ගෙනිච්චෙ නෑ?"

"අද නයා තමා ගෙනිච්චා"

අනෝමා බියකින් අප දෙස බැලුවාය "අපි යමුද ජනකා?"

"යමු යමු"

අප ආපසු එන්නට හැරෙත්ම කූඩාරම තුළින් බල්ලා බුරන හඬ ඇසිණි. නීලම්මා ඉයූ කෑමවල සුවඳත්, ඇය ළඟ තිබූ තුළු බඩුවල සුවඳත් මේ අවට විය. මට වඩාත්ම එය දැනුණේ කූඩාරමෙන් ඈතට ඇවිද එද්දීය.

"කියපුව හරිද අනෝමා?" මඳක් නැනදී අමරසිරි බංඩාර විමසුවේය.

"හුඟක්වා නං හරි. මට සමහර දේවල් නං තේරුණේ නැහැ"

"පවුලෙ අය ගැන හරියටම කිව්වනේද?"

"එව්වා නං සේරම හරි. බලන් හිටියා වගේ කිව්වා."

"මොනවද අපල ගැන කිව්වෙ?" මම ඇසුවෙමි.

"ඕගොල්ලො හැමෝම අපල ගැන කියනවා" අමරසිරි තර්ක කළේය. "ඇයි අපල තිබ්බාම සාන්ති කර්ම කරන්න ඒගොල්ලො ළඟට යන්න එපැයි. එතකොට තව කීයක් කීයක් හරි කඩා ගන්නවා.

"වෙන්නත් පුළුවන් " මම එකඟ වුණෙමි.

අපල වෙන්න තියෙනවනං ඒවත් ඉතින් මග අරින්නෙ කොහොමද?" අනෝමා සුසුමක් ලෑවාය.



Downloaded from sinhalaebooks.com

පිලාවනී මැණිකේගේ වත්තේ මායිමට එත්ම, අනෝමා එක්වනම නතර වුණාය. "අර බලන්න ජනක" යැයි ඇය කීවේ මගේ අත තරයේ අල්ලමිනි.

"මොකද්ද?"

"අර ගහේ අත්තේ"

අප ඉදිරියෙන් නමිනං ගසක අත්තක් පැත්තකට බරවී තිබිණි. ඒ අත්තේ අපව නොදුටුවාක් මෙන් ඈත බලා සිටියේ ලොකු කටුස්සෙකි. උගේ හම දිලිසෙන ලා කොළ පැහැයක් විය. දැස ඔරවා ගත් ගමන් ඌ යන්තමට හිස සැලුවේය.

"කටුස්සෙක්"යැයි මා කියද්දී "බෝදිලිමා" යැයි අමරසිරි බංඩාර කියා බිය ස්වරූපයක් මවා පෑවේ විහිළුවට මෙනි.

අනතුරුව ඔහු ගල් කැටයක් ගෙන එය කටුස්සා අතට දමා ගැසුවේය.

ඌට එය දැනුණ වගක්වත් නොහැඟිණි. එහෙත් අප තවත් ළංවත්ම ඌ අත්ත දිගේ ගොස් කොළ අතු අතරේ අතුරුදහන් වුණේය.

අවට යන්තමට අඳුර පැතිර එමින් තිබිණි. අප තිදෙන පිටුපස පිලෙන්ම ගෙට ගොඩ වෙද්දී වජිරා මුව පුරා සිනාසෙමින් පිලට ආවාය.

"සාස්තර ඇහුවද ඕගොල්ලො?" ඇය ඇසුවේ අනෝමා දෙස එක එල්ලේ බලමිනි.

"හරියට හරි අනේ" අනෝමා කීවාය. "වජිරා ඇහුවෙ නැද්ද?"

"අම්මා කැමති නැතෙ අපි ඕවට යනවට." වජිරා පහත් හඬින් කියා "ඔන්න අයියල එනකල් බලන් හිටියා උණු තේ හදල දෙන්න" යැයි එකතු කළාය.

අපේ කටහඬ ඇසී නයනා ද ඇගේ කාමරයෙන් පිටතට ආවාය.

මඳවේලාවකින් වජිරා හැදූ තේ තොළ ගාමින් අපි හැමදෙන ඉස්තෝප්පුවේ හිඳ සිටියෙමු. ඒ හැන්දෑවේ අනෝමාව ගෙදර හැරලන්නට මගේ තනි නොතනියට අමරසිරි බංඩාර ද ආවේය. එය එක් අතකට මගේ සැනසිල්ලට හේතුවිය.



Downloaded from sinhalaebooks.com

# 12

සතියේ ඉතිරි දින දෙක තුළ මා අනෝමා දුටුයේ වඩාත් කල්පනාවට බරවූ ආකාරයෙනි. මා හා සුහදව කුළුපගව දෙඩුවද ඇ වරින් වර ගැඹුරකට වැටෙනු මට පෙනිණි.

“ඔය සාස්තර ඔය තරම ගණන් ගන්න එපා” යැයි මා කීවේ මේ වෙනස දකිමිනි.

“ඒ උනාට ඒ ගැනි කියපුවා සීයට අනූවක් විතර හරි” ඈ කීවාය.

“කොහොමද ජනක අත බලලා ඒ තරම කියන්නෙ?”

“මං හිතන්නෙ අත විතරක් නෙමෙයි. ගැනි හිතත් කියනවා.”

“මටත් එහෙම හිතුණා.”

“මං නං ඔය තරම ඕවා ඔස්සෙ එළවලා යන්නෙ නෑ. සමහර දේවල් අපි නොදැනගත් තරමට හොඳයි අනෝමා.”

“ඒක ඇත්තයි. මං අහල තියෙනවා අපේ අප්පච්චි කියාපු කතාවක්. අඳුරන කෙනෙක් ගැන. ඒ මනුස්සය කේන්දර බලලා හරියටම කෙනෙක් මැරෙන වෙලාව ගණන් බලලා කියනවලු. මිනිහා එයාගෙම කෙන්දරේ බලලා ඒ විදියට මැරෙන වෙලාව හොයා ගත්තලු. පස්සේ ඒ දවසයි වෙලාවයි ආවාම එල්ලිලා මැරුණලු.”

“මට නම් ඕන නෑ මැරෙන වෙලාව දැනගන්න.”

“ඔයා හිතන්නෙ එහෙම දැනගන්න පුළුවන්ද?”

“මං හිතන්නෙ ග්‍රහවාරෙ – ඒ කියන්නෙ ග්‍රහයෝ පිහිටලා තියෙන

Downloaded from sinhalaebooks.com

හැටියට පුළුවන්. ග්‍රහයො උපතින් ඉන්න තැන්වල හැටියට ඒ ග්‍රහයන්ට එක්තරා ආවිසක් තියෙනවා. ඊළඟට වෙන වෙන ග්‍රහයො එක්ක ඉන්නවනං ඒවැයිනුත් බලපෑම්වලින් ආයුස වෙනස් වෙනවා. ඒවා සේරම එකතු කරල මරණ ස්ථානෙත් බලලා ආයුස, මාරක අපල එහෙම කියන්න පුළුවන්ලු."

"මොකද්ද අනේ මරණස්ථානෙ කියන්නෙ?"

"අට වෙනි කොටුවලු."

"මට නම් ඔව්වා තේරෙන්නෙ නෑ ජනක. ඔයා නං සෑහෙන්න දන්නව හැඩයි."

"මාත් ඔය තැනින් තැනින් අහපුවා තමයි. ඒ උනාට මං ඕවා එළවල හොයන්න යන්නෙ නෑ. සමහරවිට අපිට පාරක යනකොට ඉස්සරහ දුර පේනවා. කඳු වංගු එහෙම. එතකොට හිතෙනවා ඒ දුර සේරම යන්න ඕනෑ නේද කියල. එතකොට හිතට නිකං බයක් වගේ දැනෙනවා."

"ඒක හරි."

"එහෙම ඈතට පේන්නෙ නැතිකොට අපි ඔහේ යනවා. ජීවිතේදිත් කරන්නෙ ඒ ටිකයි. හුඟක් ඉස්සරහට පේන්න ගත්තොත් ඒක සමහර විට හිතට හරි නැහැ."

"ඔයාගෙ දර්ශනය" කී අනෝමා වැයමකින් සිනාසුණාය. "මට නං පේනවා ඔයා අද හවසට යන පාර." ඈ මෙසේ කීවේ සිකුරාදා හවස වැඩ ඇරෙන්නට කලිනි.

"මොන පාරද?"

"ඔයාගෙ වාහනේ කෙළින්ම යන්නෙ ඔයාගෙ ගෑනු ළමයා ඉන්න පාරට හරිනෙ?"

මගේ සිනහවම ඇගේ ප්‍රශ්නයට පිළිතුර විය. පුරුදු පරිදි මම බයිසිකලය කඩයට බාරදී නුවර යන බස්රියට නැංගෙමි. එයට මඳකට කලින් අනෝමා ඇගේ අප්පච්චිත් සමඟ ඔහුගේ රථයේ නැඟී යනු මා බලාගෙනය. ඇගේ අප්පච්චි ඇයව කැටිව යන්නට එන හැම සති අන්තයකම, තම මිතුරා වූ නන්දසේනගේ ගෙට ගොඩ වැදිලාය යන්නේ. ඇතැම් සිකුරාදාවක ඔවුන් ආපසු නුවරට යන්නේ ඒ ගෙදරින් කෑමත් රැගෙන බව මට අනෝමා කියා තිබිණි. මට නම් පමා වීමට නොහැක. නුවරට යන සැණෙන් මම කොළඹ යන දුම්රියකට



Downloaded from sinhalaebooks.com

හෝ බස්රියකට හෝ නගින්නෙමි. මෙසේ මහ ගෙවා මා අලේ නුගේගොඩ ගෙදරට යනවිට රාත්‍රි නවය පමණ වේ.

ඒ වනවිට අම්මා කෑම උයා මඟ බලා සිටින්නීය. අසල්වැසියෙකු හෝ මිතුරෙකු හෝ කතා බහට නොආවොත් මම වේලාසනින්ම නින්දට යන්නෙමි.

සෙනසුරාදා අනිවාර්යයෙන්ම මට රුචිනි මුණ ගැසෙතැයි මම සිහින මවමින් සිටියෙමි. එහෙත් මේ වතාවේ ඒ එසේ නොවීය. හදිසියේ මළගමකට ඈ ගාලු ගොස් තිබුණාය. එක්වනම කොළඹ ආ ගමන නිෂ්පල එකකැයි මට හැඟුණේ මෙවිටයි.

සවස් වෙනවිට ලීලාවතී මැණිකේගේ ගෙදර මෙයට වඩා පාළු අඩු යැයි මට සිතිණි. මැණිකේ, අමරසිරි බණ්ඩාර, වජිරා, නයනා ඔවුන් හැමදෙනාගේ හිනැහෙන දොඩන මුහුණු මතක් වෙත්ම නුගේගොඩ ගෙදර පාළුව වැඩි විය.

රෑ බෝවෙත්ම මිතුරෙකු සොයා ගියද ඔහුද ගෙදර නොවූයෙන් එයද කලකිරවන සුළුවිය. ලීලාවතී මැණිකේගේ ගෙදර වූ සෙත් සාන්තිය, එහි ආ උදවිය, චිත්‍රා, අතුල, අනෝමා මේ හැම දෙනාම දැන් දැන් මට වඩාත් සමීප වූවෝය. මේ විපර්යාසය වූයේ හදිසියේම මෙනි.

කුස්සියේ හිඳ අම්මා කහින හඬත් ඇය දෙපා අද්දවමින් ඇවිදින හඬත් ප්‍රසන්න ඒවා නොවීය. අම්මාත්, අක්කාත් කතා කරන හඬවල් හිස් බිත්ති අතර දෝංකාර දෙවමින් ඇසේ. මා කොළඹ පෙරළා එන්නට වලිකෑමේ එකම හේතුව රුචිනී නොවේද? හිත ගිය තැන මාලිගාව.....

අක්කා කෑම පිසිද්දී අම්මා මා සොයා ගෙන විත් මැසිවිලි කියන්නේ අක්කාට විවාහයක් කරදිය යුතු බවයි. දැනට ආ ගිය මනමාලයන් එකෙකුවත් නොපෑහීම අම්මාගේ හිතට වදයකි. අක්කා කෙමෙන් වයසට යැමත්, ඇගේ කේන්දරයේ ඇති ග්‍රහ අපල ආදියත් ඇගේ සැනසිල්ලට හේතු නොවේ. මෙවන් සිතුවිලි මටද බලපාන්නට වෙයි. අක්කාත්, අම්මාත් කෙරෙහි උපදින අනුකම්පාවට ළය හුණු වුවද, මේ සියල්ල නොපෙනෙන ඈතක යන්නට වරෙක සිතෙන්නේ මෙවන් අවස්ථා සිහිවෙන විටය.

කවදාවත් නැතිව මෙවර මා පෙරළා හබරවැව බලා ආවේ යම්කිසි කැමැත්තකිනි; පොරොත්තුවකිනි. රාත්‍රියේ බස්රියෙන්



Downloaded from sinhalaebooks.com

බැස්ස පසු මා කඩයට ගියේ පුරුදුකාරයෙකු වෙසිනි. මුදලාලිද වෙනදාට වඩා ඇහැලි මිතුරු වෙසින් කතා කළේය.

තේ කෝප්පයද ඉල්ලන්නට කලින් ලැබිණි. මම එය බී අමතරව මුදල් ගෙවා විස්කෝතු පැකට් එකක්ද මිලදී ගත්තෙමි. මෙය මුදලාලිට ස්තුති කිරීමක් මෙන්ම, නයනා නංගීව සතුටු කිරීමටත්ය.

පුරුදු පරිදි මම බයිසිකලයට නැංගෙමි. අද කවුරුත් මුණ ගැහේවිදැයි හිත යට දෙගිඩියාවකි. බස්රියෙන් බැස්ස මුත්, හැමදෙනාම කවුරුදැයි මම දැක බලා මතකයේ තබා ගෙන සිටියෙමි. ඔවුන් එකතු හෝ යන මඟ හමුවූයේ නම් එයින් මගේ සිතට බයක් නොවේ.

මේ රාත්‍රියේද අනෝමාගේ නවාතැනෙහි ඉදිරි දොර කව පුදු එළිය දැල්විණි. එහි මූසල එළිය ගස්වැල්වල තැවරෙමින් මා ගමන් ගත් අතටත් ඇදුණි. අනෝමා කවුළුවකින් මා යන මඟ බලා සිටින්නේද? ඇතැම් සති අන්තයක ගෙදර යන ඇය පෙරළා වැඩට එන්නේ නුවර සිට සඳුදා උදේ බව ඇය වරක් මට කියා තිබිණි.

කාර් බාර් ඇති අයට ඉතින් ඕක මොන කජ්ජක්දැයි මට සිතිණි. එතැන පසුකරගෙන අඳුර අතට මඳක් දුර ආවා පමණි. පටස් ගා හඬක් ඇසී මගේ හද ගැස්සිණි. මට කුණු හරුපයකුත් කියැවෙන්නට ආවේය. කෙහෙල්මල් බයිසිකලයේ රෝදයක හුළං ගිය බව ඊළඟ මොහොතේම දැනිණි.

දැන් මොකද කරන්නේ? තල්ලු කරන් ඉස්සරහටම යනවාද? ඒ නැත්නම් හන්දියට පෙරළා යනවාද? අනෝමාගේ නවාතැන් පළේ බයිසිකලය දමා ගියොත් හෙට හන්දියේදී මට එය හදා ගන්නටත් හැකි වේවි යන සිතුවිල්ල උපන්නේය.

මම ආපසු හැරී නන්දසේනලාගේ ගෙදර අතට ගියෙමි.

අවට මළ සොහොනක නිහැඬියාවකි. ගස්වැල් පවා නොසෙල්වෙන මොහොතකි. ඒ නිසලතාව බිඳිමින් මම දොරට සෙමින් තට්ටු කළෙමි.

සෙමින් ඇරුණු දොර පිටුපස නන්දසේන කරුණානායක බලා සිටියේය.

"ක–වු–ද?" ඔහු ඇසුවේ ඇද පැදලා අවිශ්වාසයකිනි.

මෙතෙක් මා ඔහුව හරි හැටි දැක තිබුණේ නැති. ඔහුගේ උඩු රැවුළත්, දීප්තිමත් දෑසත්, සිදී යන හිස කෙස් අතරින් පතර වූ සුදුවත් මට දැන් පැහැදිලිවම පෙනිණි.



Downloaded from sinhalaebooks.com

"මිස්ට කරුණානායක. මං අනෝමා එක්ක බැංකුවෙ වැඩ කරන්නෙ"

"ආ ඔව් එන්න එන්න – ජනක නේද?"

"ඔව්"

"ඉන්න අනෝමා ඉන්නවා"

"මං ආවෙ මේ මගේ බයිසිකලේ රෝදෙ හුළං ගියා. මේක තල්ලුකරන් යන්නත් බැහැ."

"එන්න එන්න ගෙට "ඔහුගේ සරම පිටුපසින් විත් බැලූ මුදිතට ඔහු කීවේ "පුතා අනෝමා අක්කට එන්න කියන්න" කියායි.

තව මදෙකින් රෝස පැහැ දිගු ගවුමක් හැඳගත් අනෝමා තනි කරලට ගෙතූ කොණ්ඩයෙන් යුතුව සිනා පාමින් මා අතට ආවාය.

"ජනක?" ඇගේ දෑසේ විශ්මයයි.

"මගෙ රෝදෙක හුළං ගියා අනෝමා"

"ඔයාගෙ රෝදෙකද? බයිසිකලේ රෝදෙකද?" ඇගේ කථාවට මුදිතත්, නන්දසේනත් යන්තමට හිනැහුණාහ.

"මට රෝද නැහැනෙ" මට කියැවිණි.

"ඕක ඉතින් හදාගෙන යන්න පුළුවන් නේද අංකල්?"

"මට නං ඕවා හදන්න තේරෙන්නෙ නෑ"

"මං හිතුවෙ පුළුවන්නං අද රෑ මේක මෙහේ තියල ගිහින් හෙට උදේ වැඩට ගියාම කොහේ හරි අරන් ගිහිල්ලා හදාගන්න."

"ඒකට මොකද? තියල යන්න තියලා යන්න." නන්දසේන එක හිතින්ම කීවේය. අනතුරුව ඔහු මාව අනෝමා හා තනිකොට ගෙතුළට ගියේය.

"කොහොමද ඔයාගෙ කොළඹ චාරිකාව?" අනෝමා පුරුදු පරිදි ලෙන්ගතු කමින් ඇසුවාය.

"වෙනද වගේම තමයි ඉතින්. යනවා – එනවා"

"ඔයාට තියෙන්නෙ එක වීක් එන්ඩ් එකක නොගිහින් ඉන්න."

"මෙහේ මොනව කරන්නද?"

"නුවර එන්න. අපේ දිහා එන්න. වජිරා, අමරසිරි බංඩාර – නයනා එහෙම එක්ක එන්න. අපි මාලිගාවට යමු. පේරාදෙනි මල්වත්තට යමු."



Downloaded from sinhalaebooks.com

"බලමුකෝ" ඇයට වඩාත් සමීපවීමේ කැමැත්තක් මා තුළ නොවීය. "ඊ වුණා අනෝමා යන්න ඕනෑ."

"මොනවත් බීල යන්න."

"බෑ බෑ දැන් අරෙහෙ කට්ටිය කෑම තියාගෙන ඉඳන් ඇති. හන්දියෙනුත් තේ කෝප්පෙ බීලයි ගමන පටන් ගත්තෙ."

"ඔයා ළඟ ටෝච් එකක් තියෙනවද?"

"සේරම තියෙනව මල්ලෙ."

"නයි මල්ලෙ" කී ඈ හිනැහුණාය.

මම යළි දොරෙන් පිටතට ආවෙමි. "බයිසිකලේ මෙහෙම තියල යන්නද?"

"ඉන්න මං අන්කල්ගෙන් අහන්න. ගැරේජ් එකේ දැම්මොත් වැඩිය හොඳයිනෙ." ගෙට ගිය ඇය යළිත් ආවෙ නන්දසේන සමඟිනි.

"අපි ඕක ගැරේජ් එකේ දාමු" නන්දසේන කීවේය.

ඔවුන් හැමදෙනා කොතරම් හොඳ මිනිස්සුදැයි පාරට එද්දී මට සිතුණි. ආපසු හැරී බලද්දී මට පෙනුණේ දොරකඩ සිටගත් අනෝමාත්, නන්දසේනගේ බිරිඳ වූ පාලිකාත්ය. නන්දසේන, මිදුලේ සිටගෙන සිටියේ මුදිත ඔහුගේ සරම වටා දැවටෙද්දීය.

"පරිස්සමෙන් යන්න" යැයි අනෝමා කියද්දී "තුණුරුවන්ගෙ සරණයි" පාලිකා පහත් හඬින් කියනු ඇසිණි.

මල්ල කරලාගෙන, විදුලි පන්දමත් දල්වා ගෙන පාරට ආ මට අඩුවක් දැනිණි. යම්කිසි ශක්තියක් බයිසිකලය සමඟ රඳවා යන්නා සේය, ඒ හැඟීම. ඒ දඩුකඳට මා කොතරම් බැඳී ඇද්ද?

කුඹියන් කැලේට ළං වද්දී හිතට යම් තරමක බියක් නොදැනුණා යැයි කීවොත් එය මුසාවකි. මුල්ම වතාවේ සිදුවූ දේවල් සේම වැහි රාත්‍රියේ සිදුවූ දේවල්ද නිතැතින්ම සිහියට නැඟිණි.

වටපිට කිසිත් නොබලා මම විදුලි පන්දම් එළියේ දහරාව දෙසම නෙත් යොමා පය ඉක්මන් කළෙමි. දකුණු පැත්තේ මාතා පඳුරු ළඟ කවුදෝ හිඳගෙන ඉන්නවා පෙනිණි. මට මුලින්ම පෙනුණේ ඔහුගේ මුවඟ දැල්වුණ සුරුට්ටුවෙහි රතු ගිනි එළියයි. ඒ හා සමඟම සුරුට්ටු ගඳද දැනිණි. මා දකින්ම ඔහු නැගිට්ටේය. දුඹුරු පැහැ සරම් කඩක් පමණක් හැඳ සිටි ඔහු උස මහත මිනිසෙකු විය.



Downloaded from sinhalaebooks.com

මගේ හද බිය සැක නැති කරගන්නටම මම හඬ නගා "ආ කොහොමද ලොකු උන්නැහේ?" යි ආමන්ත්‍රණය කළෙමි.

"ඉන්නවා මහත්තයා" ඉතාම ගොරෝසු බැරැඩි හඬකින් ඔහු කතා කළේය. "අද මහත්තයා බයිසිකලේ නැ?" ඒ කටහඬේ වූයේ වැලි දැමූ බෙලෙක්කයක් සෙමින් සෙලවෙන ගතියකි.

"නෑ රෝදයක් ගියා."

"එහෙම වෙනවා – එහෙම වෙනවා."

මෙයට පෙරද ඔහු මා මෙතැනින් යන එනවා බලා සිටින්නට ඇත. සමහර විට කන්දේ කොතැනක හෝ සිට... මා බිය විය යුතු නැත. "මං යනවා" කියාගෙන මම අඩිය ඉක්මන් කළෙමි. ආපසු හැරී බලන්නට තරම් හිතට එඩියක් ආවේ මඳක් දුර ගිය තැනදීය. මා හැරී බලන විට ඔහු එතැන නොවීය. ඔහු කන්ද නඟින්නට ඇති. එත් මේ තරම් කඩිනමට? මම ඒ අතට විදුලි පන්දම් එළිය එල්ල කළෙමි. මානා පඳුරු සෙලවෙනවා පමණි මට පෙනුණේ.

මල්ල දැඩි කොටගත් මම ගෙදර අතට ඉගිල්ලුණෙමි. මා එසේ දිව්වේ කෙනකුගෙන් ගැලවීමකට වඩා හිත දැඩි කර ගැනීමකටය. බියකට අවනතවී බියකට දුවනවාට වඩා බිය තුරන්කර ගැනීමට කළ දිවීමකි එය.

ගෙය ළංවත්ම මම හැල්මේ ගමන් කළෙමි. එසේ කළේ හතිය නිවාගන්නටය. ගෙට යන කඳු ගැටය නඟින්නට කලින් මම නැවතුණෙමි.

සීතල අතක් මා අත මත රැඳිණි.

මට "ආඃ" ගැවිණි.

"අයියා!"

"අමරසිරි බණ්ඩාර !"

"මං පාරට ආවා අයියා තාම නැති නිසා. අම්මා කිව්වා ඩිංගක් ඇවිල්ල බලන්න කියලා කෝ බයිසිකලේ?"

"ඒකෙ රෝදයක් ගියා. ඒ පාර ඒක අනෝමලාගේ තැන තියල පයින් ආවා."

"අයියට හති."

"ටිකක් දිව්වා."



Downloaded from sinhalaebooks.com

"මොකක්ද උනේ අයියා?"

"අතන කුඹියන් කැලේ ළඟ මිනිහෙක් ඉඳන් හිටියා. පුරුට්ටුවක් බිබී." මම නැවතී හති අරිමින් කතා කරන්නට වුණෙමි. "මං කතාත් කළා. හැරිල බලන කොට මිනිහ නැහැ."

"නෑ" අමරසිරි බංඩාරගේ කටහඬේ විශ්මය පිරී තිබිණි. අඳුරේ මට ඔහුව හරි හැටි නොපෙනිණි.

"මං හිතන්නෙ මිනිහා කන්ද නැඟල ගියා."

"උස මහත මිනිහෙක්?"

"ඔව්. ඇයි?"

"මං හිතන්නෙ අයියා දකින්න ඇත්තෙ බක්කගෙ අවතාරෙ."

"අනේ නිකං ඉන්න මල්ලී ඒ මිනිහ මට කතා කෙරුවා. අද බයිසිකලේ නැද්ද ඇහුවා."

"ඉතිං?" ඔහුගේ කටහඬේ විශ්මය රැඳෙන්නේ ඉක්කාවක් ලෙසිනි. "ඉතිං?"

"අවතාරයක් නං කොහොමද කතා කරල බයිසිකලේ ගැන අහන්නෙ?"

"අපි යමු අයියා ගෙට යමු." මා අතින් මල්ල ගනිමින් අමරසිරි බංඩාර කීවේය. "අම්මලා නංගිල සේරම ඉස්තෝප්පුවෙ බලන් ඉන්නවා."

"ඒ ගොල්ලන්ට නං කියන්න එපා. නිකං බොරුවට බයවේවි."

"නෑ නෑ මං කියන්නේ නෑ"

"මොකා ආවත් මං බයවුණේ නෑ" මම අවට ගස් වදුලුවලට විදුලි පන්දම උඑක් කළෙමි. අතුපතරේ නිශාචර හඬ ඇසිණි.

ඉස්තෝප්පුවේ චිමිනි ලාම්පුව මළාන රතකින් දැල්විණි.

"මොකද මහත්තයා උනේ?" ලීලාවතී මැණිකේ හිඳ සිටි හාන්සි පුටුවෙන් නැගිටිමින් ඇසුවාය.

"බයිසිකලේ ටයර් එකක් ගියා කියන්නෙ" මා වෙනුවෙන් පිළිතුරු දුන්නේ අමරසිරි බංඩාරයි.

"කෝ අයියා බයිසිකලේ?" නයනා සතුටින්දෝ කෑ ගසා විමසුවාය.

"අනෝමා ඉන්න ගෙදර තියල ආවා."



Downloaded from sinhalaebooks.com

"එහෙත් ගියාද?" වජිරා නොසිතාමය ඇසුවේ.

"වෙන කොහේ තියන්නද නංගී? එතන පහු කරන කොටම තමුදු රෝඩෙ ගියෙ."

"අනෝමා අක්කා ඊයෙ හවස කාරෙකෙන් ආවා." නයනා පුවෘත්තියක් හෙළි කළාය. "මෙහේ නෙමෙයි. වත්ත පල්ලෙහා අහිකුණ්ටිකයො බලන්න."

"ඇත්තට?" යි මා අසද්දී

"ඉන්න අයියට වතුර එක දාන්න" කියමින් වජිරා ගෙට ගියාය. ඒ පසු පසින් ලීලාවතී මැණිකේද ගෙට ගියාය.

මම අමරසිරි බංඩාර අතින් බෑග් මල්ල ගෙන හැර එතුළින් ගත් විස්කෝතු පෙට්ටිය නයනා අතට දුන්නෙමි. ඈ එය දැකීන්ම ගෙන සතුටින් දෙකකුල පද්දමින් හිඳ සිටි පුටුවේම හිඳ "ඒ අක්කා ආවෙ එයාගෙ අප්පච්චියි, නංගියි, මල්ලීයි එක්ක" යි කීවාය.

අමරසිරි බංඩාර කතාවකින් තොරවම ගෙතුළ අතට ගියේය. නයනා තව තවත් දොඩමලුවුණාය. "මං ඒ පැත්තට ගියා. අනෝමා අක්කගෙ මල්ලියි, නංගියි මා එක්ක හරියට යාළු වුණා. රවීන්ද්‍රයි, නිලුපුලීයි. අපි වත්තෙ සෙල්ලං කළා. අනෝමා අක්කයි එයාගෙ අප්පච්චියි ආයි සාස්තර ඇහුවා."

"මෙහේ ගෙදරත් ආවද?"

"නෑ ගෙදරට ආවෙ නැහැ. අපිට කරදර කරන්නෙ නෑ කියල ගියා. අපේ අයිය නං ගිහින් කතා කර කර හිටියා."

අනෝමා මේ ආ ගමන මට තිකමටවත් සඳහන් කළේ නෑ නොවේද? සමහරවිට බයිසිකලයේ පලහිලව්ව නිසා ඇයට ඒ වග අමතක වෙන්නටත් ඇති. පසුදා වැඩට ගිය විට ඇය අනිවාර්යයෙන්ම ඒ ගැන සඳහනක් කරනැයි මම සිතුවෙමි. එහෙත් ඒ එසේ නොවීය.

මා විමසන තෙක්ම ඈ ඒ ගැන කිසිවක් නොකීවාය.

පසුවදා පයින්ම කාර්යාලයට ගිය මම කෙටි නිවාඩුවක් ගෙන බයිසිකලය හදන්නට ගෙන ගියෙමි. එදා උදේ ඇගේ නවාතැන ළඟදී අනෝමාද මට එක්වුණාය.

එහෙත් ඈ අහිගුණ්ටිකයින් බලන්නට ආ ගමන ගැන කීවේ මා විමසුවාට පසුවය.



Downloaded from sinhalaebooks.com

"ඔව් අනේ. අප්පච්චිට ඕනෑ කියල. ඒ පාර අපි කට්ටියම ආවා. අප්පච්චිට ඕනෑ උනේ අම්මා ගැන අහන්න. අම්මා අපිව බලාගෙන ඉන්නවා කියල තමයි ඒ ගෑනි ආයෙත් කිව්වෙ. මං දිහා කන්න වගේ බලන් ඉඳල ආයෙත් මට කිව්වා මාරුව හම්බ උනොත් අරන් යන්ට කියලා. අපිට ඕනෑ ඕනෑ විදියට මාරු හම්බ වෙනවද ජනක නේද?"

"ඒක නං හරි."

"මං හිතුවෙ ඔයා ඉන්න කල් මාත් මෙහේ ඉන්නවා."

"ඒ මොකටද?"

"ඔයා තොත්ත බබා වගේ අහන හැටි. මට දැන් මේ හරිය දාලා යන්න බෑ ජනක. ඔයත් මෙහේම ඉන්ට."

"වෙලාවකට එහෙම හිතෙනවා" මා එසේ කීවේ ගිය සති අන්තයේ කොළඹදී ඇතිවූ පාළුව සිහිවීමෙනි. "නෑ මං කිව්වෙ, මෙහේට ටික ටික පුරුදු වෙනකොට එහෙම හිතෙනවා."

"එහෙම තමා මටත් හිතෙන්නෙ." කී අනෝමා මා දෙස බලා හිනැහී "අපි දෙන්නටම හිතෙන්නෙ එකම විදියටද ජනක?" කියා ඇසුවාය.

"ඒක මං දන්නෙ නැහැ. මට කාගෙවත් හිත් කියවන්න නං බැහැ"

"හිත් කියවන්න ඕන නෑ තේරුං ගන්න."

මම කතා නොකළෙමි. ඇ දෙන පොට ඔස්සේ එල්ලී යන්නට මා තුළ කැමැත්තක් නොවීය. ඇය ලස්සන තමා. හොඳට අඳින පළඳින කෙනෙක් තමා – හිනවත් තමා. නමුත් එයින් එහාට මා තුළ හැඟීමක් නම් නොවීය.

මහ දුර කාර්යාලයට යාම හා ආපසු ඒම ඇය හා එක්ව හැමදාම කරන්නටද මා තුළ කැමැත්තක් නොවීය.

එහෙත් මෙයින් පසු බොහෝ දිනෙක ඇ මගේ ගමනට හවුල් වුණාය. ඇය හා නොයෙක් දේ කතා බහ කළද, රුචිනි පිළිබඳ වැඩිදුර යමක් හෙළිකරන්නට මා සිත ඉඩ දුන්නේ නැත.

ඇයට මගේ සිත කියවන්නට නොහැකි වීම එක් අතකට හේතුවක් විය.



Downloaded from sinhalaebooks.com

# 13

නීලම්මාගෙන් සාස්තර අහන්නට යන ඇතැමෙක් ලීලාවතී මැණිකේගේ වත්ත උඩින් ගොස් ඒ පැත්තට යති. එයට ගෙදර කිසිවකුගෙනුත් අවහිරයක් නොවීය.

විටෙක නීලම්මා තම්බන කඩලවල සුවඳ මගේ කාමරයටත් දැනෙයි. කුඩාරම දෙසින් බල්ලා බුරන්නේ ඉතාම කලාතුරකිනි. කරුපත් වඳුරා කරතබාගෙන ගේ ඉදිරියෙන් යනවා මා දුටුවේ දෙවතාවක්ම පමණි. ඔහු ඇතැම් දිනෙක නුවර දක්වාම ගොස් වඳුරා හෝ නයා නටවා මුදල් එකතු කරගෙන ආ බව මට කීවේ නයනාය.

නීලම්මා තැම්බූ කඩල ගෙනවුත් තම පාසල ළඟ තබාගෙන විකුණන බවද නයනා හෙළි කළාය.

"ඔය ජරාව කාලා බඩේ අමාරු හදාගෙන එහෙම එන්න එපා" යි ලීලාවතී මැණිකේ ඇගේ පොඩි දුවට තරවටුවකුත් කළාය.

"මං ජරාව කන්නෙ නෑ" යි නයනා පෙරළා කීවේද අම්මාටම හරියන කට හඬකිනි.

අහිගුණ්ටිකයන්ගේ ජීවිතය කෙතරම් සැහැල්ලු දැයි මට සිතුණේ ඊළඟ වතාවේ ඒ කුඩාරම වෙතට ගිය විටදීය. එය සිදුවූයේ ඒ සතියේ බ්‍රහස්පතින්දා සවසය. චිත්‍රාටත් අතුලටත් සාස්තර අහගන්නට ඕනෑ වූයෙන් ඒ දෙදෙනා අනෝමාත් මාත් සමඟ වැඩ ඇරී ආවෝය.

"ඕගොල්ලො හැමදාමත් මේ පැත්තට ඇවිදන් එනවනං කොච්චර ශෝක්දැ" යි මම කීවෙමි.

Downloaded from sinhalaebooks.com

"අපි කට්ටියම එකට ඉන්න තැනක් ගමු " යැයි අනෝමා කීවද, "අපි දැන් ඉන්න තැන කිසිම කරදරයක් නෑ" යි අතුල ඒ කතාව මග හැරියේය.

අනෝමා හැම අවස්ථාවකම මට තව තවත් ළං වෙන්නට තැත් දරනැයි හැඟෙත්ම මා කළේ තව තවත් ඈත්වීමය. ඇය හා "පටලැවෙන්නට" මගේ හදේ කිසිදු ආසාවක් නම් නොවීය.

අප වත්තට ඇතුළු වෙත්ම නයනා අප වෙත දුව ආවාය. ඈ ඉතා කුළුපගව අනෝමාගේ අතේ එල්ලී සතුටෙන් දෙඩුවාය.

"මමත් අම්මගෙන් අහල ඒ පැත්තෙ එන්නම් අක්කා හොඳේ" කියමින් ඇය ගෙතුළට දුවගියේ අප ආ කාරණය දැනගත් විගසය.

වජිරාට නම් අභිගුණ්ටික ගැහැනියගෙන් සාස්තර අහගන්නට වරම් නැති බව ඇගේ පිට පෙරළූ තොලෙන් යුතු මුහුණෙන්ම පෙනිණි. ඈ පිටුපස පිලේ කණුවකට හේත්තු වී තාන්තුවාවකින් බලා සිටියාය. අමරසිරි බංඩාර ළිඳ ළඟ වතුර ඇද්දේය.

"තව ඩිංගෙන් මාත් එන්නම්" යැයි ඔහු කීවේ වජිරාගේ සිත තවත් රිදවමිනි.

අප යන විට පුරුදු පරිදි කුඩාරම පසුපසින් සුදු දුම් කඳක් නැඟිණි. බිරූ බල්ලා නීලම්මාගේ විධානයෙන් නිහඬ වුණේය. අදත් කරුපන් පෙනෙන්නට නොසිටියේය. සාරි පොටෙන් දෙතන වසාගෙන බුලත් හපමින් අප වෙතට ආ නීලම්මා කීවේ කරුපන් ළඟට ගිය බවකි.

මෙවරද ඈ වඩාත් වුවමනාවෙන් බැලුවේ අනෝමා දෙසය.

මුලින්ම සාස්තර ඇසුවේ චිත්‍රායි. ඔවුන්ට පැවසෙන දෙය ගැන එතරම් උනන්දුවක් නොවූයෙන් මම අවට බැලුවෙමි. ගස් අතු අතර බලා සිටි යෝධ කටුස්සා යළිත් මගේ ඇස ගැසුණේ මෙසේ බලද්දී ඉබේමය. ඌව අනෝමාට පෙන්වන්නට සිතා ඇය අතට හැරී නිහඬව ඇගේ අතකට තට්ටු කරත්ම යමක් කියාගෙන ගේ දෙසින් ආ නයනාගේ හඬට බිය වුන කටුස්සා අතු පතර සැඟවුණේය.

"ඇයි ජනක?" අනෝමා ඇසුවාය.

"වැඩක් නෑ ඔයාගෙ යාළුවා බලන් ඉඳල ගියා." මා රහසින් මෙන් කීවේ නීලම්මාගේ සාස්තර කීමට බාධා නොකිරීමටය.

"කවුද මගෙ යාළුවා?" ඇයද ඒ හඬින්ම අසන විට නයනා අපට තවත් ළං විය. "නයනා ද?"



Downloaded from sinhalaebooks.com

"මමද?" නයනා හඬ උස්කරත්ම මම ඇයට නිහඬ වන්නටැයි සංඥා කළෙමි. "එන්න ටිකක් එහාට යමු."

අනෝමාත්, නයනාත් මා අනුව කූඩාරමෙන් ඈතට ඇවිද ආවෝය. මා උවමනාවෙන්ම ඇවිද ගියේ කටුස්සා රැඳි ගස අතටයි. බියට බිය වෙනවාට වඩා එයට මුහුණ දිය යුතුය යන සිතුවිල්ලය මා තුළ වූයේ.

"එන්න ඔයාගෙ යාළුවා පෙන්නන්න" මම පහත් හඬින් කීවෙමි.

"මොන යාළුවද?" අනෝමාගේ කටහඬේ කුතුහලයයි. නයනාගේ දෑසේ නොඉවසිලිමත් විශ්මයයි – එපිටින් ඇසෙන්නේ නීලම්මා චිත්‍රාගේ අත අල්ලා සාස්තර කියන හඬයි.

ගස ළඟටම ආ මම විපරම් කරමින් බැලුවෙමි. නයනා යමක් කියන්නට තතනත්ම මම අතින් අල්ලා ඇයව නිහඬ කළෙමි. මා ගසවටා ඇවිද යත්ම අනෝමා මගේ අතකින් අල්ලා ගෙන මා අනුව ආවාය. ඇයගේ අත ගසා දමන්නට තරම් සිතක් මා තුළ නොවීය.

"මොකද්ද අනේ ජනක?" ඈ කතා කළේ තොඳොල් රහසිගත අයුරකිනි.

ගස් අතු සෙලැවිණි.

බොරුවක් කියා මා ඇයව මෙතැනට ගෙන ආවා යැයි ඇය සිතුවාදැයි මම නොදනිමි. නයනා ගසෙන් අනෙක් පසට දුව යත්ම අනෝමා මගේ කම්මුලක් සිපගත්තාය. මම ඇගෙන් අත මුදා ගත්තෙමි. මෙය මා බලාපොරොත්තුවූ අවස්ථාවක් නොවීය.

"කෝ ඉතින්?" යැයි කියූ ඇගේ මුහුණ ජම්බු ගෙඩියක් සේ රතු විය.

"මං ආවෙ ඔයාට කටුස්සා පෙන්නන්න?"

"කටුස්සා?" කී ඈ අතකින් මුව වසා හිනැහෙන්නට වුණාය. "කෝ ඉතින් ඔයාද කටුස්සා?"

"නෑ ඇත්තමයි අනෝමා. ඌ බලං හිටියා ආං අර අත්තෙ."

"කෝ ඉතින්?"

"ඒක තමයි ඌ දැන් නෑ"

"අවතාරයක්ද?"

"එහෙම හිතමු."

මා එසේ කියද්දී ගහවටේ දුවගිය නයනා යළි අප සිටි පැත්තට ආවාය.



Downloaded from sinhalaebooks.com

"කවුද අයියා යාළුවා?"

"කටුස්සෙක්ලු" කී අනෝමා යළිත් හිනැහුණාය.

මට සියුම් ලජ්ජාවක් සේම කෝපයක්ද දැනිණි. ඈ මා විහිළුවට බාර ගන්නා හැරෙන්නට, ඈ මා වරදවා තේරුම් ගන්නටද ඇත. මා සාප කළේ අන් කිසිවකුට නොව සැඟවී ගිය කටුස්සාටයි. ඌ සැබවින්ම මායාවක්ද?

අමරසිරි බංඩාර අප අතට ඇවිද ආවේ මේ මොහොතේයි. අනෝමා මගෙන් මදක් ඈතට වුණාය. ලේන්සුවෙන් මුහුණ පිසදා ගත්තාය. ඇගේ දෙකම්මුලේ රත් පැහැය මැකී යමින් තිබිණි. දැසේ කෝල බවක් මතු විය.

"අපි කටුස්සො හොයනවා." ඈ අමරසිරි බංඩාරට ඇසෙන්නට එහෙත් රහස් හඬකින් කීවාය.

"අපි එදා දැකපු එක්කෙනාද?"

"ඔව්"

ඔවුන් කතා කළේ රහස් කියා ගන්නා සේය.

"එයාව හැමදාම පේන්නෙ නෑ" අමරසිරි බංඩාර දෑසට බිය මවා ගනිමින් කීවේය. "මං කිව්වනෙ ඒකා නිකං කටුස්සෙක් නෙමේ—බෝදිලිමෙක්."

"ඔන්න කිව්වා" කී අනෝමා ඔහුගේ පිටට කොලොප්පම් ලෙසින් පහරක් හෙළුවාය.

"නැද්ද අයියා? එහෙම නේද?"

"මං දන්නෙ නෑ මල්ලි – මං ඌව ආයෙමත් දැක්කා. මේ ගහේ. ඒකයි මං මේ අනෝමට පෙන්නන්න එක්කගෙන ආවෙ."

"හරි හරි" අනෝමා එය කීවේ තාලයට ඇද පැද මාව අවිශ්වාස කරන අයුරෙනි.

"එන්න අපි යං අතන ජම්බු ගහක් තියෙනවා – ගෙඩි කඩා ගමු."

අමරසිරි බංඩාර අපව කැටුව ගියේය. නයනා සතුටකින් උඩ පනිමින් ආවේ තටු ගසමින් යන සමනලයකු ලෙසිනි.

අමරසිරි බංඩාර කී ජම්බුගසේ යායට ජම්බු ගෙඩි පිරී තිබුණි. ඔහු පහත් කළ අතුවලින් මමත්, අනෝමාත් ගෙඩි කඩා ගත්තෙමු.



Downloaded from sinhalaebooks.com

නයනාගේ ගවුම් ඔඩොක්කුවේ ඒවා තැන්පත් විය.

ඈ මදක් එපිට ගසක් යට හිඳගත්තේ මේ සියල්ල මෙසේ එකතු කරගෙනය. අනෝමා ගෙඩියක් කඩා මගේ මුවට ළං කළාය. මම එය ඇගේ අතින් ගෙන කෑවෙමි.

"කෝ මට?"

ඇය ඇසුවද මට පිළිතුරක් දෙන්නට ඉඩක් නොලැබිණි.

එක්වනම නයනා මහ හඬින් කෑගැසුවාය. ඈ කඩිනමින් නැගිට්ටම ඔඩොක්කුවේ වූ රතුම රතු ජම්බු ඈ වටා හැම අතම විසිරිණි.

"මොකද නංගී?" අමරසිරි බංඩාරද පෙරළා කෑගැසුවේය.

"අරූ අරූ මගේ ළඟින් – මගෙ – ළ–ඟි–න් ගියා" නයනා ගොත ගසමින් කියමින් මගේ ඇඟේ එල්ලුණාය.

"මොකාද?"

"අර කටුස්සා" ඇය අත දිගු කළ අත අප බැලුවද පෙනෙන මානයක නම් සතෙක් නොවීය.

"කෝ?"

"මෙයා මේ අපිව බය කරන්න."

"නෑ අයියා නෑ–සත්තයි."

"මේ – මේ ජම්බු ටික එකතු කරන් යමු." අමරසිරි බංඩාර නොසැලැකිල්ලකින් කීවේය. "හැමෝටම ඒ පාර නොපෙනෙන කටුස්සො පේන්න වෙලා."

"නෑ නෑ සත්තයි."

"නංගි මේ ඔයා ඔඩොක්කුව අල්ලන්න. අපි මේ ජම්බු ටික දාන්න."

මෙවර නයනා අල්ලා සිටි ගවුම් ඔඩොක්කුවට අපි තිදෙන ජම්බු අහුලා දැමුවෙමු.

අප ආපසු එනවිට, නීලම්මා අතුලගේ අත් සාස්තරය අවසන් කරමින් සිටියාය. කොහේදෝ ගියැයි කී කරුපන්ද පෙරළා ඇවිදිනි. ඔහුගේ හිස මත නයි පෙට්ටියද, අතකින් ගත් ලණුපට කෙළවර දිලිසෙන රතු, රන්, කළු ඇඳුමකින් සැරසුන කුඩා වඳුරාද විය.

"අනේ අයියා අපි වඳුරා නටනවා බලමුකෝ." නයනා පින්සෙන්ඩු වුණාය.



Downloaded from sinhalaebooks.com

"මේ ළමයට ඕන නැති එකක් නෑ" අමරසිරි බංඩාර බොරු අමනාපයකින් කීවේය.

"නටවන්නද මාතියා?" කරුපන් නයි පෙට්ටිය බිම තබමින් ඇසුවේය.

"වඳුර නටනව බලමු අනේ" අනෝමාද කීවාය.

"අපිට නං කොළඹදි ඕව නිතර පේනවා" මම විහිළුවට කීවෙමි.

"නටවන්නං මාතියා?" කියමින් කරුපන් නයි පෙට්ටියෙන් රබානකුත්, ගෙජ්ජි කිපයකුත් ගත්තේය. ඒවා තමා ළඟ බිමින් තබා ඔහු වඳුරාගේ ගෙල බැඳි කඹයේ අනික් කෙළවර නයි පෙට්ටියේ කොනකවූ කුංඤ්ඤයක බැන්දේය. අනතුරුව ඔහු නැඟිට රබාන වයමින් ගෙජ්ජි සොලවමින් ගයන්නට වුණේය.

"හා හා නටපන් පුතා."

"අපි නේගම් යඤ්ඤා

බලාන්ට යඤ්ඤා

නැන්දා මාමා, ලොකු අත්තා."

වඳුරා කකුල් බකල් කරගෙන විරිත්තමින් වටයක් ගියේය. අනතුරුව නයි පෙට්ටිය හැර බියෙන් මෙන් එයට අත රුවා එළියට ඇද ගත්තේය. උගේ පෙනුම හැසිරීම සැබවින්ම විසුළු විය.

ඊළඟ මොහොතේ ඌ පෙට්ටිය තුළට විලිස්සා ඒ තුළින් කුඩා කෝටු කැබැල්ලක් කෙළවර බැඳි පුංචි රෙදි පොට්ටනියක් අතට ගත්තේය.

"අපි නේගම් යඤ්ඤා.

නේගම් යඤ්ඤා

නේගි බෝග රාසියක්ම

කර පිඤ්ඤා – හා –

කර පිඤ්ඤා."

වඳුරාගේ නැටුම සැබවින්ම හාස්‍ය ජනක විය. පොට්ටනිය කරපින්නා ගෙන වටේට ගිය ඌ කරණම් කිපයක්ද ගසමින් අපට විලිස්සුවේය.



Downloaded from sinhalaebooks.com

නීලම්මා ගෙන ආවුත් පෑ කෙසෙල් ගෙඩියකින් උණ කැල්ලක් කඩාගෙන තවත් පිනුම් දෙක තුනක් ගසා පොට්ටනිය හෙළා අත් ඔසවමින් නැටුවේය. කරුපන් වඩ වඩාත් වේගයෙන් ගෙජ්ජි සොලවමින් රබාන වයා නැවැත්තුවේය.

අපි සිනාසෙමින් අත්පොළසන් දුන්නෙමු. අතුල තම සාක්කුවෙන් ගත් කාසි කීපයක් බිමට විසි කරත්ම වඳුරා ඒවා අහුලා ගෙන ගොස් කරුපන්ට බාර දුන්නේය.

"වරෙන් පුතා වරෙන්" කී කරුපන් වඳුරාව වඩා ගත්තේය.

"මොකද්ද උගේ නම?" නයනා හඬ නඟා ඇසුවාය.

"ගුලා" කී කරුපන් තමා වෙතට ආ නීලම්මාගේ දෝතට වඳුරාව දුන්නේය.

නීලම්මා උණව කුඩාරම ළඟ ගැට ගැසුවාය. පිටුපස පිලේ බලා සිටි වජිරා අප වෙත දුව ආවේ අපේ සිනා හඬත් අත් පොළසන් හඬත් අසමිනි.

"මං අතනින් බලන් හිටියා. අනේ උගේ ලස්සන" යැයි වජිරා කියත්ම අමසිරි බංඩාර "ටිකක් අපේ අක්කා වගෙයි" කීවේය.

"ඉතින් මොකද උඹ මගෙ මල්ලිනෙ?" වජිරා පෙරළා කියා තොල් ඇද කළාය.

"නයා නටවන්නෙ නැද්ද?" නයනා විමසුවාය.

"ඒකත් කොම්මුකෝ" කී කරුපන් පෙට්ටිය තුළින් නයි මල්ල එළියට ගත්තේය. එය බිම හළා පෙට්ටියෙන්ම ගත් නලාව ඔහු පිඹින්නට වත්ම, නයා මල්ලෙන් පිටතට ඇදී ඔහු අතට ඇදුණේය. ඔහු උගේ හිසට යන්තම් තට්ටු කරත්ම උණ බඳ ඔසවා පෙණය පිප්පුවේය. වරෙක දරණ, ගසමින් වරෙක පෙණ ගොබය පුම්බමින් උණ මෙසේ නැටුවේය. වජිරාත්, අනෝමාත් එකිනෙකාට ළංව විශ්මයෙන් බලා සිටින අයුරු මට පෙනිණි.

නලාවෙහි හඬ කන් හාරවන සිහින් හඬක් විය.

කුඩාරමේ පිටුපසින් නැඟි සුදු දුමද මේ නලා හඬට වශීව නටන්නේ යැයි මට සිතිණි. දුම් කැරලි නැඟී ඉහළ හවස අහසට **අතුරුදහන්** විය.



Downloaded from sinhalaebooks.com

තාවමත් හිරු බැස නොගියද ඈත අහසේ ඉරබටු තරුව පායා ඇවිය. කුඩාරම පිටුපසින් නැඟී ආවේ කඩල තැම්බෙන සුවඳයි.

නයනාගේ නැටුම අවසන් වී අපේ අත්පොළසන් හඬ නැගෙත්ම, නීලම්මා කුඩාරම තුළින් අප වෙතට ආවේ කඩල ගොටු කීපයක් රැගෙනය.

මා ඒවාට මුදල් දුන් අතර, චිත්‍රාත් අතුලත් කරුපන්ට සන්තෝසමක් දුන්නෝය.

"නංගී මතකනෙ අම්මා කිව්ව ඒවා?" අමරසිරි බංඩාර තරවටු ස්වරයෙන් කීවේ මා කඩල ගොටුවක් නයනා අතට දෙද්දීය.

"කමක් නෑ අනේ අයියා." නයනා බැගෑබරව කීවාය.

"කනවා-කනවා-මටත් දීලා"

මම කඩල ගොටු අතුලටත්, චිත්‍රාටත්, අනෝමාටත් දුන්නෙමි.

"වජිරා නංගී?"

"නෑ අයියා මට එපා"

නයනා ගත් ගොටුවෙන් ටිකක් අත්ලට හලාගෙන ගොටුව අමරසිරි බංඩාරට පෑවාය. ඔහු එය ගෙන මඳක් කටට හලාගත්තේය.

අඳුර ගොනුවෙද්දී අපි ගෙදර අතට ඇවිද ගෙන ආවෙමු.

"මං තේ හදන්නං - ඇවිල්ලා තේ එකක් බීලා යන්න" වජිරා කීවාය. "අනෝමා අක්කා එනවනෙ?"

"නංගිට බෑ කියල බෑනේ...."

ඔවුන් එක වයසේම මෙන් වුවද වජිරා අනෝමාට "අක්කා" යැයි ඇමතුවේ අනෝමා වඩාත් මේරූ ගතියක් පෑ නිසා යැයි මට සිතුණි. කෙසේ වුවද දෙදෙනා ඉතා කුළුපග වූවෝය.

වජිරා මුළුතැන් ගෙට ඇදෙද්දී අපි ඉදිරි පිලට ආවෙමු.

ලීලාවතී මැණිකේ ඇසූ හරස් ප්‍රශ්නවලට වජිරා මුමුණමින් පිළිතුරු දෙනු මට යන්තමට ඇසිණි. අනතුරුව ලීලාවතී මැණිකේ හඬ ගෑවෙන් නයනාද ගේ තුළට දුව ගියාය.

අමරසිරි බංඩාර පිලේ කොට තාප්පය මත මා සමඟ හිඳගත් අතර අනෙක් තිදෙනා පුටුවලට අරක් ගත්තෝය. අමරසිරි බංඩාර තමා අත වූ ගොටුවේ කඩල ටික කා අවසන් කොට කඩදාසි ගොටුව ගුලිකොට මිදුලට විසි කළේය.



Downloaded from sinhalaebooks.com

මා කමින් සිටි ගොටුවද හිස් විය. මම නිකමට එය දිගහැරියෙමි. බැලුවෙමි.

"සන්තුස්සකොච සුභරෝච..

අප්පකිච්චොච සල්ලහුක වුත්ති....."

එය පිරිත් පොතක කොළයක් විය. අමරසිරි බංඩාර එය මා අතින් උදුරා බලා "මේක අපේ නැති වෙච්ච පිරිත් පොතෙන්" කියා නැවත කණ්ඩියෙන් මිදුලට පැන අනිත් කොළයද අහුලා දිග හැරියේය.

ඔහු සියල්ල කළේ යම්කිසි ආවේගයකිනි. ඒ කොළයද පිරිත් පොතේම කොළයක් විය.

"අර අභිගුණ්ටිකයෝ මේක අරන් කඩල ඔතනවා." ඔහු කෝපයෙන් කෑගැසුවේය. "මන් දෙන්නංකො ඕකුන්ට පිරිත්....."

අතුලද තම අතවූ ගොටුව හිස්කොට දිග හැරියේය. එයද එවන්ම කොළයක් විය.

"මං අහන්නංකො ඕකුන්ගෙන්......"

"මොකද්ද අනේ උනේ?" අනෝමා විමසුවාය.

"නෑ අපේ පිරිත් පොත නැතිවුණා. අපේ මේ ජනක අයියගෙ කාමරේ තිබ්බෙ... දැන් මෙන්න ඒකෙ කඩල ඔතනවා."

"මල්ලි – මල්ලි ඕක නැතිවුනේ ඒ මිනිස්සු එන්න කලින් නේද?"

"හරි ඉන්නකො මං අහල එන්න." කොළ ටික එකතු කරගත් අමරසිරි බංඩාර ගේ වටයෙන්ම පිටුපසට දුව ගියේය.

"මොන හුනියමක් කරගන්නද දන්නෙ නෑ ඒ පාර." අනෝමා කීවාය.

"ඉන්න මං බලල එන්න" කී මමද ඔහු අනුව වත්ත පිටුපසට ගියෙමි.

දැන් ගොම්මන් අඳුර ගලන වේලාවයි. කුඩාරම ඉදිරියේ හරිකේන් ලන්තෑරුමක් දැල්විණි. බල්ලා බුරා හැලුණේය.

මා යන විටත් අමරසිරි බංඩාර නීලම්මාට මොනවාදෝ කියමින් සිටියේය.

"නේ නේ මාතියා අප්පෝ නේ..... මේක මේක මේ මේ මං අත්තන ගා යට තිබ්බිලා තමා ගත්තා." නීලම්මා නිදහසට කාරණා කීවාය.



Downloaded from sinhalaebooks.com

"මල්ලි මේ අපි යං ඔන්න ඕක අල්ලල දාලා."

එපිට මුකලාන දෙසින් කරුපන්ගේ කළුවන් කළු මුහුණ අප අතට එනු පෙනිණි. එහි ඇත්තේ එතරම් හොඳ බැල්මක් නොවේ. අප ළඟට ආ ඔහු දත් හාරමින් බලා සිටියේය. නීලම්මා කරුපන්ට දෙමළෙන් යමක් කීවාය. කරුපන්ද පෙරළා යමක් කීවේය.

"මේ මාතියා කරදර නොදී යන්ට මාතියා" ඔහු ඉතා පහත් හඬිනි කීවේ.

"මල්ලි මේ යමු යමු" මම අමරසිරි බංඩාරගේ අතින් ඇද්දෙමි.

"මුන් මෙතනින් යන කල් නිවනක් නැහැ" ඔහු ආපසු හැරෙමින් කීවේය. "මේ විගඩම් බලන්න වත්ත උඩින් එක එකා යනවා. කවුද දන්නෙ කවුද කියලා."

නීලම්මාත් – කරුපනුත් එකිනෙකාට මොන මොනවාදෝ දෙඩූහ. මම අමරසිරි බංඩාරගේ අතින් ඇදගෙන ආපසු ඉස්තෝප්පුවට ආවෙමි.

ඒ එනවිට නයනා චිමිනි ලාම්පුව ඉස්තෝප්පුවට ගෙන එමින් සිටියාය. අනෝමා මගේ කාමර දොරකඩ තිර රෙද්ද මෑත් කරමින් එතැනින් පිටතට ආවාය.

ඈ මගේ කාමරයට මොන එහෙකට රිංගුවා දැයි සිතුණද මම කිසිවක් නොකීවෙමි. ඇය වඩාත් මිතුරු වෙන්නට තැත් කිරීම මා රුස්සන දෙයක් නොවේ.

අමරසිරි බංඩාර තවමත් නොසංසිඳි කෝපයෙන් තාප්පය මත හිඳ ගත්තේය.

"මොකද උනේ?" අතුල විමසීය.

"නෑ අයියා ඔය මිනිස්සු හොරු. මොනව අරන් යනවද අපි දන්නෙ නැහැ."

"ගෙයි තිබිලද පොත ගත්තේ?"

"නෑ නෑ ඕක නැතිවෙලා ටික දවසක්." මම තේරුම් කළෙමි. "ඔය මිනිස්සු ආවෙ ඊට පස්සේ. ඒ ගැනි කිව්වෙ ගහක් යට තිබිල හම්බ උනා කියලා."

"එතකොට ඕක කොහොමද එතැන්ට ගියෙ?" අමරසිරි බංඩාර තර්ක කළේය.



Downloaded from sinhalaebooks.com

"බහිරවය ගෙනිහිල්ලා" අනෝමා කීවාය.

"නෑ බෝදිලිමා" අමරසිරි බංඩාර පහත් හඬකින් කීවේය. එහෙත් ඒ හඬේ තරහව ගැබ් විය.

"මොකද්ද බහිරවය ගෙනිච්චෙ?" යැයි නයනා විපරම් කරන්නී, අනෝමා තමා අතවූ හිස් ගොටුව ඇයට පෑවාය.

නයනා කොළය බලා "හනේ අපේ පිරිත් පොත" යි කීවාය. "කොහෙන්ද අයියා මේ?"

"ඉඹල බලන්න නංගී."

නයනා කොළය සිඹ බලා "කඩල එතුවෙ මේකෙද?" ඇසුවාය.

"තව මොන මොනව ඕකුං අරන් නයි මල්ලෙ දාගනීවිද දන්නෙ නෑ" අමරසිරි බංඩාරගේ කෝපය තවමත් කටහඬේ පැහැදිලි විය.

"මේ මල්ලි ටිකක් පරිස්සමෙන් කතා කරන්න." චිත්‍රා අවවාද ලෙසින් කීවාය. "ඕකුං හදි හූනියං කරන්න දන්නවා."

"ඔය ටිකම තමයි මාත් කියන්න ගියේ." අනෝමාද අනුමත කළාය.

වජිරා තේ බන්දේසිය ගෙන ආවෙන් කතා බහ මඳකට නැවතිණි. සිදුවූ දේ ඇසූ ඇ පිරිත් පොතේ කොළයක් ගෙන බලා පෙරළා "ඕකට මොකටද ඔය හැටි කැගහන්නෙ ඉතින්? හැමදේම පොළවට පස්වෙනවනෙ" යි කීවාය.

"ඒක හරි පොළවට පස්" අනෝමාද එකහව කීවාය.

මෙයින් පසු අපි නිහඬව තේ තොල ගෑවෙමු. අමුත්තන් තිදෙන පිටව යද්දී අමරසිරි බංඩාරද මා සමඟ ඔවුන්ගෙන් සමුගන්නට පාර ළඟට ආවේය. ඔහුගේ කෝපය සංහිඳී තිබිණි. අවට අඳුරු විය.

"චිත්‍රාට කියපු සාස්තරේ හරිද?" ඔහු විමසුමක් කළේය.

"සේරම වගේ හරි."

"කිරි ගහට ඇන්න වගේ" අතුලද එකහවුනේ සමුගන්නට කලිනි.

Downloaded from sinhalaebooks.com

# 14

විමනි ලාම්පුවෙන් එළියවුනු කාමරයට ආ මම බත ඉදෙන තුරු පොතක් කියවන්නට සිතා මේසය අසළ හිඳගත්තෙමි. මට බාධා නොකරන්නටදෝ අමරසිරි බංඩාර මා මගහැර ගෙතුළට ගියේය.

අද හවස ඔහු අභිගුණ්ටිකයින් වෙත හැසිරුණ ආකාරය පුදුම එළවන සුලුවිය. ඔහු අළුයට ගිනි පුපුරකැයි මට සිතිණි. ඔහු කෙතරම් සිනාසී කතා කළත් හිත යට සඟවා සිටි කෝපය මතුවුණේ කෙතරම් සුළු දෙයකින්ද? ඔහු එසේ හැසිරුණේ අනෝමාගේ සිත දිනා ගන්නට විය නොහැකිය. එසේ හැසිරෙන්නෙකු කාගේවත් සිත දිනාගන්නේ කොහොමද?

අභිංසක අභිගුණ්ටිකයින් මේ වත්තේ ජීවත්වීම ගැන අමරසිරි බංඩාර විටින් විට කී වචන වලින් ඔහුගේ අකමැත්තම ප්‍රකාශ කලේය. ඔහු එසේ හැසිරුණේ සැබවින්ම ඔහු ඔවුන් කෙරෙහි අස්ථාන බියක් දැක්වූ නිසා නොවේද?

අමරසිරි බංඩාරගේ මා නොදන්නා පැත්තක් ඇතැයි මට හැඟුණේ මේ හවසය. අනෝමා පිළිබඳ එවැනිම හැඟීමක් මා තුළ ඇති වුණේ මේ හවසය. ගඟ ළඟදී ඈ බලෙන්ම මෙන් මා සිපගත් අකාරය මා කැළඹවූ අවස්ථාවක් විය. ඇය රුවිනීට වඩා කෙතරම් වෙනස්දැයි මට සිතිණි.

රුවිනී....රුවිනීට කොහොම ඇද්ද? මේ සති අන්තයේ නම් කෙසේ හෝ ඇය දකින්නෙමැයි මම සිහින මවමින් සිටියෙමි. ඇගේ



Downloaded from sinhalaebooks.com

නොදැනීම මම ඉතාමත් අවදියෙන් සිටියෙමි. පිබිදුණු ඉඳුරන් යුතුව මම ඇඳෙහි පෙරළිය නොහැකි තැන බිම ඇලවුනෙමි. බිම සීත වුවද මා ඇඟ රත් යවටක් විය. මා පොළඹවන්නේ කවුද? මගේම සිතද? ඒ නැත්නම් දැසට නොපෙනෙනා යම්කිසි බාහිර බලවේගයක් ද? කොයි අයුරෙන් හෝ මට මගේ සිත වාවා ගත නොහැකි විය. තුරුණු මදය යැයි කියා අවනතවන්නට පුළුවන. එහෙත් මේ වෙලාවේ මා හැසිරුණේ යම්කිසි තේරුම් කළ නොහෙන ආවේගයකිනි. රත් යවටක් වූ මා ඉඳුරන් මගේම ග්‍රහණයෙන් සන්තර්පනය වෙන තුරු මට සැනසීමක් නොවීය.

මම දොර හැරගෙන පිටතට ගියෙමි. සිතෙහි කිසිදු බියක් තම් නොවීය. පිනි පොද හෙළන ආකාසයේ මඳ සඳ එළියක් විය. ගස් අතු අතර කණ මැදිරි එළි නැටුවේය. මම නිරුවතින් තරු යට සිටගෙන සිටියෙමි.

මුළු විශ්වයම මගේය, මා එහි කොටසක්ය යන හැඟීම මා ඉහවහා ගියේය. කිසිවකුට මා බිය විය යුතු නැති . කිසිවකුත් මට බිය විය යුතුද නැති යන සිතුවිල්ලකි මා තුළ වූයේ. මෙසේ කාල හෝරාවක් පමණ සිට මම යළි කාමරයට ආවෙමි. හදිසියේම මා සිරුරට මහත් අප්‍රාණික ගතියක් දැනිණි. සියලු සාරය මගෙන් සිඳී ගියාසේ සහනදායි නිදිබර සුවයක් විය එය.

ඇඳට වැටුණ සැණෙන් මම නින්දට වැටුණෙමි. මා අවදිවූයේ පිටත නයනාගේ කටහඬ අසමිනි. නිකමට කම්මුල අතගා බැලූ මට එහිවූ සීරීම් ලකුණ දැනිණි.

මගේ අඩමානය හරි විය. පිටුපස පිලේ කණ්ණාඩි තැල්ල ළඟ රවුළ බාන්නට ගොස් බලද්දී වම් කම්මුලේ වූ පහුරු ගෑ ලකුණු තුන පැහැදිලිවම පෙනිණි.

රැවුළ වැවෙන්නට හැරියොත් මොකද? එවිටත් මේ පහුරු ගෑම් සිදුවෙයිද? එහෙත් අන්තිමේදී මම රැවුළ බැවෙමි. මගේ මුහුණ ගෙදර අයට වඩාත් නොපෙන්වන්නට මෙනි, මේ උදයේ මා හැසිරුණේ.

මෙය තරමක් දුරට සාර්ථක විය. මා සමග බයිසිකලයේ නැඟී ගිය නයනා පාසල ළඟදී වෙන්ව යද්දී මගේ මුහුණේ ලකුණු දැක, "අයියව ඒයේ රෑත් කවුදෝ හූරලා නේද?" යි විමසුමක් කළාය.



Downloaded from sinhalaebooks.com

"නෑ නංගි උදේ රැවුල බාන කොට මේක උණේ" කී මම එතැනින් ඈත් වුණෙමි.

නයනා අවිශ්වාසයකින් හිස සලා සිනාසී වෙන්ව ගියාය. කාර්යාලයේදී නම් මට ගැලවුමක් නොවීය.

"ඔයාගෙ කටුස්ස ද මූණ හීරුවෙ?" අනෝමා මට කොලොප්පමක්ද කළාය.

"ඕවා හැමදාම තියෙන්නෙ නැනෙ අනෝමා" මම සියල්ල සැහැල්ලුව සලකන නියායෙන් කීවෙමි.

එහෙත් මා කෙතරම් මෙය යටපත් කරන්නට හැදුව ද වඩාත්ම තැළඹීමකින් කතා කළේ ටිකිරිබංඩාය. දිවා අහරින් පසු බැංකු මිදුලේ කසගස යට බංකුව මත අප දෙදෙන හිඳගෙන සිටින අතරේය ඔහු එසේ කතා කළේ.

"මහත්තය ඕක නං බලා ඉඳල හොඳ නෑ! ඇඟ දිරාලා යන වැඩක්. මහත්තයට මෝචනයකුත් සිද්ධ වෙනවද?"

විළියෙන් වුවද මම "ඔව්" යැයි කීවෙමි. "සමහරවිට මහත්තයා මහත්තයගෙ හිත උදුරගන්න හදන කාගෙ හරි බලපෑමක් තියෙනවා. අඳුනක් බැලුවත් ඔය ටිකම කියාවි."

"අඳුන් බලලා සෙත් සාන්ති කරල දෙහි කපලා සේරම කළානෙ ටිකිරි බංඩා."

"හරි ඒ උනාට ආයෙත් බැල්ම වැටිලා තියෙනවා."

වත්ත පහළ හදි ගැහුනු කටුස්සා මට සිහිවිය. කටුස්සෙක් කොහොමද මේ තරම් දෙයක් කරන්නේ? යැයි මට සිතිණි.

කාගෙ හරි බැල්ම වැටිලා තියෙනවා යැයි ටිකිරි බංඩා යළිත් කියද්දී මා සිතුවේ අනෝමා ගැනයි. බලෙන් මෙන් ඇ මා සිපගත් ආකාරයයි. මගේ මුහුණේ සීරීම් මතුවුණේ ඇය එසේ කළ දා රාත්‍රියේයි. මෙයට කලින් වතාවකත් සිරීගේ ගෙදර සාදයෙන් පසු මට ඇ හා තනිවෙන්න සිදු වූනා නොවේද? එදා රෑත් ඇ මගේ අතින් අල්ලා ගෙන ආවා **නොවේද?** ඇගේ හද තුළ කකියන නලියන **යම්කිසි ආශාවකින්** මෙසේ මා හඹා එමින් මට වද දෙන්නේද? මුල්ම වතාවේ **සීරීම** වෙනවිට ඇයත් මාත් තනිවූ අවස්ථාවක් නොවීය. එහෙත් මා බැංකුවට ආ මුල් දා පටන් ඇගේ සිතේ එවන් ආශා


Downloaded from sinhalaebooks.com

හැඟීමක් තිබුණා නම් එහි යම්කිසි ශක්තියකින් මට ශරීරිකව මෙවැන්නක් කරන්නට ඒ සිතුවිල්ලට නොහැකිද?

එසේ නම් මා ඇයගෙන් මිදී යන්නේ කෙසේද? ඇයට අවනත වීමෙන්ද? එය නම් මගේ සිතට විරෝධී ක්‍රියාවක් විය. සිතුවිල්ලක් විය. රුවිනිට පිදූ මගේ හද වෙන කෙනෙකුගෙන් කෙලෙසන්නේ කෙලෙසද?

"මහත්තයා මොකද්ද කල්පනාව?"

"නෑ ටිකිරි බංඩා මං හිතන්නෙ මං මේ සේරම අල්ලල දාලා කොළඹ ගියාම සේරම හරි."

"ඒ උනාට මහත්තයා"

"නෑ නෑ අපේ අම්මත් කියනවා, මට මේ ටිකේ හරි අපලයි කියලා මේවා සේරම කවදාහරි ඉවර වෙන්නත් එපැයි. ඒවා ඇරිල යනකොට මට සේරම හරි. "

"මහත්තයා ඔකත් එක්ක සෙල්ලං කරන්න එපා. ඔය බැල්ම දිස්ටිය අරන් දාන්න ඕනෑ අපි අද වැඩ ඇරිල යමු අර වළල්ලක් දාගන්න."

"මට වළල්ලක් ඕනෑ නෑ – ටිකිරි බංඩා වැඩ ඇරිච්ච හැටියේ මට ඕනෑ බස් එකේ නැගිල කොළඹ යන්න."

"එතකොට සේරම හරි ඉතින්?"

"නැත්තං...ටිකිරිබංඩා හිතන්නෙ ඔය දිස්ටිය බස් එකේ නැගිලාමා එක්කම කොළඹ ඒවි කියලද?"

"මහත්තයට සේරම විහිළු"

"මං දන්නෙ නෑ ටිකිරි බංඩා මේවට ඉඩ දෙන්න ගියාම තමයි අපි ඒවයෙ වහල්ලු වෙන්නෙ"

"බුදු හාමුදුරුවොත් කිව්වනෙ හිතම තමයි හැම එකටම මුල කියලා."

"ඒ උනාට හිත දුර්වල වෙන වෙලාවල් තියෙනවා. අපි පෘතග්ජනයො නෙ මහත්තයා"

"ඒක තමයි මං ඒ දුර්වල හිතට ඉඩ දෙන්නෙ නැත්තෙ. හූරල හූරල හති වැටුණාම දිස්ටිය වෙන කොහේ හරි යාවි."



Downloaded from sinhalaebooks.com

"එහෙම ගියොත් හොඳයි. එහෙම නැත්තං මහත්තයව අරන්ම ගිහිල්ල තමයි දිස්ටිය නවතින්නෙ."

මේ කතාව දිගින් දිගට යාමේ තේරුමක් නොවූයෙන් මම බංකුවෙන් නැගිට්ටෙමි.

"ටිකිරි බංඩා මට කොළඹ ගියාම සේරම හරි දන්නවනෙ?" කියා මම කතාව නතර කළෙමි.

ටිකිරි බංඩා සුසුම් හෙළුවා පමණි.

ඒ සුසුමේ වූයේ "මහත්තයා ඕනැ දෙයක් කොරගන්න" කියන විදියේ ගතියකි.

ඇත්තෙන්ම කොළඹ ආපසු සිරීමේ ලකුණු මැකී යත්ම, රුවිනී දකිත්ම, මගේ සිතේ වූ කලකිරීම් පහව ගොස් සතුටක් ඉපැදිණි. රුවිනීත් – මමත් තුම්මුල්ලේ ඉන්දියානු කඩයෙන් දවල් කෑම ගෙන සෙනසුරාදා හවස් වෙනතුරු මුහුදු වෙරළේ හිඳ සිටියෙමු.

ලීලාවතී මැණිකේගේ ගෙදර කළ සාන්ති කර්මයත්, වත්ත පහළට අභිගුණ්ටිකයන් ආ වගත් මම ඇයට හෙළි කළෙමි. එහෙත් සාන්ති කර්මයට මා හවුල් වූ හැටි හෝ පිරිත් පොත අතුරුදහන් වී කඩල ගොඩු බවට පත්වීම හෝ මා ඇයට හෙළි කළේ නැත. එහෙත් මේ කතා බහේදී ඈ නවාතැනේ උදවිය ගැනත්, බැංකුවේ උදවිය ගැනත් තරමක් දුරට දැනගත්තාය.

ඉරිදා දහවල මම පෙරළා ගමනට පිටත් වුණෙමි. ඕනෑම හදියකට මුහුණ දීමකට සූදානමෙති මා මෙවර ගමන් කළේ. හබරවැව හන්දියෙන් බැස්ස මම කඩයට ගොස් පුරුද්දට තේ කෝප්පය බී බයිසිකලය අර ගත්තෙමි. අද රෑ මොනවා වේවිදැයි යටි හිත ප්‍රශ්න කළත්, මම ඒ සිතුවිලි යටපත් කොටගෙන ඉතිපිසො ගාථාව මිමුණුවෙමි.

අනෝමාගේ නවාතැන දොරකඩ සුපුරුදු පරිදි සුදු එළිය දැල්විණි. ඇය කොතැනක හෝ සැඟවී මා යන මඟ බලා සිටිනවාද? මම ඉක්මනින් එතැන පසු කළෙමි.

සඳ පිරී ආවද වලාකුළු ගහණ විය. වමතට වූ බෑවුම දෙසින් ගෙම්බන්ගේ බක බකය ඉතාමත් පැහැදිලිව ඇසුණේ වැස්සක පෙරනිමිති කියමිනි.



Downloaded from sinhalaebooks.com

කුඹියන් තැලේට ළං වෙද්දී මම උවමනාවෙන්ම ඒ අත බැලුවෙමි. පේන මානයක සෙවණැල්ලක්වත් නොවීය. මම හඬ නගා ඉතිපිසෝ ගාථාව කියමින් සන්ද පෑගුවෙමි. මානා පඳුරු මට පිළිතුරු දෙන්නට මෙන් සර් සර් ගෑය.

ගෙදරට ළංවන්ම ගතට අලුත් ශක්තියක්ද ලැබිණි. එක පිම්මට බයිසිකලය ගේ අසාට හරවන විටම මගේ ඇගේ වැදෙන්නට ආ සුදු රුව මට එක්වරම පෙනුණේ නැත. මට කෑ ගැස්සිණි.

අතකින් සුදු ජටාවක් හිස බැඳගනිමින් සිටගෙන සිටි රුව මා හැඳින්නේ බයිසිකලයේ ලාම්පු එළියෙනි.

"මහත්තයා තව ඩිංගෙන් මං දැක්කෙම නෑ නොවැ"

"මේ වියෝනිස් උන්නැහෙ නේද?" කට්ටඩිරාළව මා වඩාත් හැඳින්නේ රළු කටහඬෙනි.

"ඔව් මහත්තයා, මං මේ බලල යන්න ආවා ගෙදර උදවියට කොහොමද කියලා. මහත්තයට කරදරයක් නෑ නොවැ?"

"නෑ නෑ කිසි කරදරයක් නෑ"

"ඒක හොඳයි" කී ඔහු යළිත් ජටාව දැතින් සකසාගෙන බුලත පිරූ මුවින් පාර අද්දරට කෙළ පහරක් විද පන්සල දිසාවට යන්නට ගියේය.

මම ගෙදර ආවෙමි.

ඉස්තෝප්පුවේ චිමිනි ලාම්පුව දැල්විණි. ඒ මළානික එළියේ අමරසිරි බංඩාර හිඳ සිටියේය.

"මං උන්නා අයියා අද එන එකක් නෑ කියලා"

"කොහොමද මල්ලි?"

"වරදක් නෑ අයියා ඇත්තටම අයිය නැති දවස් දෙක අපි සේරෝටම පාළුයි. "

"කෝ නංගියා?"

"නිදාගන්න ගිහිල්ලා"

මම බයිසිකලය තල්ලු කරගෙන කාමරයට යද්දී ඔහු අම්මාට මා ආ වග කියන්නට දෝ ඇතුළු ගෙට ගියේය. තව මඳ වේලාවකින් මම පුරුදු පරිදි ඇඳුම් අහවර කොට සරමට බැස පිටුපස පිලට ගියෙමි.

වජිරා මට වතුර බේසමක් පුරවා පිලේ කෙළවරක තැබුවාය.



Downloaded from sinhalaebooks.com

ලීලාවතී මැණිකේ කුස්සියේ සිට ගමේ තොරතුරක් කීවද මට එවා හරිහැටි ඇසුණේ නැත. මුහුණ දොවා තෙතු මාත්තු කරගෙන මම කෑමට හිඳ ගත්තෙමි.

අමරසිරි බංඩාර මා ඉදිරියෙන් හිඳගෙන කොළඹ තොරතුරුත් විනුපට විස්තරත් ඇසුවේය. මා කෑම කා අත සෝදා ගත්තා පමණි කුස්සිය පැත්තෙන් ලීලාවතී මැණිකේ "වජිරා වජිරා" යැයි කෑ ගසන හඬ ඇසිණි.

"මොකද අම්මේ?" කී අමරසිරි බංඩාර පුටුවත් පෙරළාගෙන පසුපිල අතට යද්දී මම ද ඒ අනුව දිව්වෙමි.

වජිරා ළිඳ ළඟ සිහිසුන්ව වැටී සිටියාය. ඒ ළඟ නැඹුරු වූ ලීලාවතී මැණිකේ "අනේ ලොකු දුව කතා කරන්නකෝ – කතා කරන්නකෝ" යි බැගෑ හඬින් කීවාය.

මම පනිට්ටුවෙන් ගත් වතුර මඳක් වජිරාගේ මුහුණට ඉස්සෙමි.

"වජිරා නංගී"

මඳ වේලාවකින් ඈ යන්තමට දෙනෙත් හැර අවට බැලුවාය.

"මොකද දුවේ උනේ?"

"අ–ම්–මා" කී වජිරා හිඳ ගන්නට තැත් කරත්ම – මමත් – අමරසිරි බංඩාරත් ඈයට අත් උදව් දුන්නෙමු.

වජිරාගේ ගවුම පිට සියල්ල තෙමී තිබිණි.

"මොකද අක්කා උනේ?" යි අමරසිරි බංඩාර ද ඇසුවද අපට පිළිතුරක් ලැබුණේ පිලට ගොඩනැංග පසුවය.

"මං – දන්නෙ නෑ මං සිහි නැතුව වැටුණා" කී වජිරා කණුවකට ඇළ වුණාය.

"ඇඳට යමු ඇඳට යමු." මටත්, අමරසිරි බංඩාරටත් වත්තම් වුණු වජිරා ඇඳට යන විට තින්දෙන් අවදිව ගත් නයනා නිදි බේරෙන දෑසින් කාමරය දොරකඩ බලා සිටියාය.

"මොකද උනේ?" යැයි ඇය ඇසුවද ඇය මෙන්ම අප සියලු දෙනා වෙත ද ඒ පැනයට හරි පිළිතුරක් නොවීය.



Downloaded from sinhalaebooks.com

## 15

මට ඒ රාත්‍රියේ හරිහැටි නින්දක් නම් නොවීය. වජිරා වෙහෙසින්ම නින්දට වැටුණේ ලීලාවතී මැණිකේත්, අමරසිරි බංඩාරත් ඇගේ ඇඳ ළඟ හිඳ පිරිත් කියද්දීය. නිදි බේරෙමින් ඒ අසල සිටි නයනා ද එතැනම නිදා වැටුණාය.

ඇයව ඔසවා ගෙන ගොස් ඇඳෙහි තැබුවේ මාය. ඇයව ඇඳෙහි ඇලකරත්ම ඈ නින්දෙන්ම මගේ අත්ගොබයක් තරකොට අල්ලා මොනවාදෝ මිමුණුවාය. මා ඈයි දැයි ඇසුවද ඇගෙන් පිළිතුරක් නොවීය.

ලීලාවතී මැණිකේටත්, අමරසිරි බංඩාරටත් පිරිත් කියන්නට ඉඩ හැර මම මගේ කාමරයට ආවෙමි. එහෙත් මා කීවා සේ නින්ද නම් කඩින් කඩ විය.

උදයේ අවදිවෙන විට මගේ දකුණු කම්මුලේ එකම එක සීරීම් පහරක් විය.

ඇත්තෙන්ම අන් කිසිවකුත් ඒ ගැන ප්‍රශ්නයක් නොකළේ එයට වඩා විමසිය යුතු තත්ත්වයක් මේ වහල යට උද්ගතවී තිබුණ හෙයිනි. වෙනදා අලුයමින්ම අවදිව තේ හදා බත් උයා දෙන වජිරා අද ඇඳේ ඇලවී ගත් ගමන් සිටියාය.

කුස්සියේ තනිව වැඩ කළ ලීලාවතී මැණිකේ ද දැඩි කල්පනාවෙන් බරව සිටියාය.

Downloaded from sinhalaebooks.com

"කොහොමද අම්මේ නංගිට?" රවුල බානා අතරේ මම විමසුවෙමි.

"අනේ මන්දා පුතා උණ ගතියත් තියෙනවා. ඒ තිස්සේ සැරින් සැරේ දෙඩෙව්වා."

ඊයේ රාත්‍රියේ වියෝතිස් ගෙදරට පැමිණ ගියේ සත්තියේ ගුණාගුණ තොරතුරු දැනගන්නට නම්, සියල්ල හරි යැයි හැඟුණ ඇසිල්ලේම වජිරා යළිත් ලෙඩ ගත්තේ හිතේ බලපෑමකින්දැයි මට සිතිණි.

"නංගි උදව්වට නැතුව අත කැඩුණා වගේ" ලීලාවතී මැණිකේ ඇනූ ලියමින් කීවාය. "වෙනදට වජිරා පාන්දරම නැගිටල තේ ටිකත් හදල දෙනවනෙ."

"අද මමයි තේ හැදුවෙ." ළිඳ ළඟින් මුහුණ සෝදාගෙන ආ නයනා උජාරුවට කීවාය. මුහුණේ රැඳුණ දියබිඳු තුවායෙන් පිස දැමූ ඈ තුවාය වැලේ වනා "ලැස්තිවෙන්ට" කියමින් ගෙට දිව්වාය.

වජිරාගේ අසනීප තත්ත්වය මට මඳ වේලාවකට අමතක විය. උදේ කෑමෙන් පසු මම නයනාව බයිසිකලයේ රඳවා ගෙන හන්දිය අතට ආවෙමි. කාර්යාලයේ වැඩට ගිය පසු ගෙදර සිදුවීම් මඳකට මනසේ යටපත් විය.

"කොහොමද තොරතුරු?" යැයි අනෝමා විමසද්දීය, මට වජිරා පිළිබඳ පුවත කියැවුණේ.

"අපේ වජිරා නංගිට ටිකක් අසනීපයි"

"ඒ මොකද?" අනෝමා විමතියක් පෑවාය.

"උණ වගේ. ඊයේ රෑ ළිඳ ළඟ ඇදන් වැටුණා"

"හරි වැඩේ...."

"එයා හරියට මහන්සි වෙනව වැඩියි. ගෙදර සේරම වැඩ එයා කරපිට"

"පව්...."කී අනෝමා "ඉතිං කොහොමද ඔයාට? ඊට පස්සෙ හොල්මන් එහෙම දැක්කෙ නැද්ද?"

මම කම්මුල වැසෙන්නට අත්ල තබා ගත්තෙමි. "පෙනුණත් මං ඕවට බය නෑ ඔයා දන්නවනෙ?" මම කීවෙමි. සිරි, අනෝමාට කාර්යාලයට කතා කළෙන් ඈ පිටව ගියාය.

මගේ මුහුණේ සලකුණ දුටුවේ ටිකිරි බංඩාම පමණි. දවල් කෑම



Downloaded from sinhalaebooks.com

පැයේ දී ඔහු ඒ දැක යළිත් මට වද කරන්නට වුණේය. "බලන් ඉන්න නං එපා මහත්තයා අපි අද යං අඳුනක් බලන්න. මම දන්න තැනක් තියෙනවා. වැඩි ඈතත් නෑ අපි අද වැඩ ඇරිල යමු."

"ටිකිරි බංඩගේ වදේ....."

"වදේ නැතුව බෑ මහත්තයා. ඕකට හරියට කරපුව හරි ගිහිල්ලා නෑ. නැත්තං ඔහොම වෙන්නෙ නැනෙ."

"ඒ උනාට වියෝනිස් ඇවිල්ල සාන්තියක් කෙරුවා."

"මිනිහ හරියට කරාද කවුද දන්නෙ? මං මේ යන තැන ගිරාඹෙ ගුරුන්නාන්සෙ කිව්වොත් හරියටම කිව්වා. අඳුන කියවන්නෙ එයාගෙ පොඩිදුව."

කොයිකටත් ගිහින් බලන්නට යැයි මා තුළ කුතුහලයක් ඇති විය. එදා වැඩ ඇරුණ සැණින් අපි දෙදෙන බයිසිකල්වල නැගී ගිරාඹේ ගුරුන්නාන්සේගේ ගෙදර ගියෙමු. මේ වන විටත් කීප දෙනෙක් වත්තේ තැන තැන අරක් ගෙන සිටියාහ. හැමදෙනාම හැසිරුණේ යම්කිසි අහේතුවකින් ගොළුවූ ආකාරයෙනි. එය අන්ධ භක්තියක් දැයි මම නොදනිමි. ඔවුන් ඇවිද්දේ – හිඳගත්තේ – යම්කිසි බියකිනි. කතා කළා නම් කතා කළේ පහත් හඬිනි. මේ පරිසරයේ හැමදෙනාම සොම්බි අවතාර වූ හැඩයි.

හවස හිරු එළිය මිදුලේ ගස් අතු අතරින් මළානව ඇද හැලුණි. පේන කීමෙන්ම සෙවූ මුදලින්දෝ ගිරාඹෙ ගුරුන්නාන්සේගෙ ගෙදර අලුතින්ම අලුත් පත්නයට තිමවී තිබිණි. එහි මිදුලේ එත් කෙළවරක තැනූ කාමරයකය, අඳුන බැලුණේ. එහි දොරවල් දෙකක් විය. පැත්තෙහි වැසූ දොර ළඟ බිඳුණු පොල් ගෙඩි ද, දැල්වූ තෙල් පහනක් ද විය. එතැන වැඩෙන නා ගසක නොයෙක් දෙනා විසින් බඳින ලද නත්වත් කොඩි ද මල් මාලා ද රැඳිණි. අනෙක් ප්‍රධාන දොරටුව ද අඩක් වැසී තිබිණි.

ළා කොළ පැහැ සායමකින් බිත්ති පිරියම් විය. අවට වූ බංකු කීපයම කීපදෙනා අරක්ගෙන තිබුණෙන් මම එපිට ගසක් යටට වී මගේ වාරය එනතුරු සිටියෙමි.

ටිකිරි බංඩා කීප දෙනා සමඟ කතාබස් කළේය.

මගේ වාරය පැමිණෙන්නට හෝරාවක් පමණ ගත විය. අන්තිමේදී මට ගුරුන්නාසේගෙ ගෙදරින්ම පොල් ගෙඩියකුත්, බුලත් අතකුත්



Downloaded from sinhalaebooks.com

මිලදීගෙන පඬුරු සමඟ තබන්නට සිදුවිය.

කාමරය තුළ ගුරුන්නාන්සේත් ඔහුගේ ලා බාල දියණියත් පැදුරක හිඳ සිටියහ. ඒ ඉදිරියෙන් කුඩා කවුළුවක් විය. ඒ අසල පොඩි මේසය මත අඳුන තිබිණි. කළුවට දිලිසෙන ඒ පිඟාන ඉදිරියේ දැල්වෙන තෙල් පහනත් නොයෙකුත් මල් ජාතිත් පලතුරු ආදියත් විය.

මම පඬුරු පූජා කොට අඩ අඳුරේ බිම හිඳ ගත්තෙමි. මගේ තනි නොතනියට ටිකිරිබංඩා ද ඇවිත් හිඳ ගත්තේය.

අඳුන බැලූ දැරිය කියවාගෙන ගිය කිසිවක් මට පැහැදිලිව වැටහුණේ නැත. ගිරාඹෙ ගුරුන්නාන්සේ මට ඇසෙන්නට ඒ සියල්ල කියා දුන්නේය.

"එක බැල්මක් නෙමෙයි බැල්ම දෙක තුනක්ම මේ ඉන්න පාදයට වැටෙන්නෙ. හොඳ ඒවා නොවෙයි. කරපු සාන්ති කර්ම හරි ගිහින් නම් නැ. ඒවාම තමයි ආපහු ඇවිත් මේ වැදෙන්නෙ."

"මේ මහත්තයාට බෝදිලිමාගේ බැල්ම වැටිලා තියෙන්නෙ. ඒ ඇරෙන්න තවත් දිස්ටි දෙකක්...."

දැරිය එක්වනම වඩාත් කලබලයෙන් කියන්නට වුණාය. ගුරුන්නාන්සේ සියල්ල පැහැදිලි කළේය.

"මේ දැන් පේන හැටියට. මෙතැන්ට මේ ළඟදි තව විනයක් වෙලා තියෙන්නෙ. ලාභ පොරෝජන බලාපොරොත්තුවෙන් කරපු දෙයක්. මහත්තයගෙ හිත ගන්නත් එක්ක...සේරම නොපිට පෙරළිලා ළමයෙක් ඉන්නවද දිස්ටිය වැහිලා?"

"මං දන්න තරමට නම් නැ"

"බලන්න ගිහින් බලන්න. මේ ළමයට ආවේසයක් වෙනවා. ඕක අරන් දාන්න මං දන්න කෙනෙක් ඉන්නවා. ඕනැ නං"

"ඒකට කෙනෙක් ඒ ගෙදර අය දන්නවා. මං කියල බලන්නං" මට කියැවිණි.

"කොරල බලනවා එහෙනං...කොහොමෙන් හරි ඕක අස්කරව ගන්න ඕනැ. කල් අරින්න එපා."

"මේ මහත්තයගෙ මූණ සූරන එකට මොකද කරන්නෙ?" ටිකිරි බංඩා පසෙක සිට ඇසුවේය.



Downloaded from sinhalaebooks.com

"ඒක තමා ඒකට වැඩිය ලොකු එකක්නෙ දැන් මේ වෙලා තියෙන්නෙ" කියද්දී මට වජ්රා සිහිවිය. "මේ සේරම කැපිල යන්න මොකක් හරි දෙයක් කෙරෙන්න ඕනෑ. දන්න විදියට කොරල බලන්න. බැරි උනොත් මා ළඟට එන්නකෝ."

"හොඳයි"

"දැන් ඉතින් යන්ට පුළුවනි. දැනට ඕකට ආරක්ෂාවට සුරයක් හදා දෙන්ට පුළුවනි. ඒ උනාට ඔය සේරම මඟ ඇරෙන්න එක විටේ තොයිලයක් කෙරුනොත් තමා හොඳ තේරුණාද?"

"ඔව්"

"හොඳමයි යන්ට පුළුවනි."

පිටතට ආ මට සිතුණේ කියැවුණ දෙයක් නෑ කියායි. සුරයක් බැඳගන්ට මගේ උවමනාවක් නොවීය. ගුරුන්නාන්සේ තමා දන්නා කෙනෙක් ගැන කීවේ තමනුත් ගණනක් සොයා ගන්නට බව මම ටිකිරි බංඩාට කීවෙමි. මගේ අවිශ්වාසය ඔහුට තේරුම් යන්නට ඇති. එහෙත් ඔහු හිස සැලුවේ මට තහවුරුවක් ඇති කරවන්නට බැරි වූ තාපයකිනි.

අඳුනේ කියූ දෙයෙහි යම් සත්‍යතාවයක් ඇති බව මට වැටහුණේ නවාතැනට ආ පසුවය. වජ්රා සැබවින්ම ආතුරව සිටියාය. ඇය යම් කිසි ආවේසයකින් දොඩන බව මට කීවේ ඉස්තෝප්පුවේ බලා සිටි අමරසිරි බංඩාරය.

"මොනවද කියවන්නෙ මල්ලි?"

"අපිට හරියට තේරෙන්නෙ නෑ අයියා. සැරින් සැරේ වේව්ලලා මහා ගොරෝසු හඬකින් මොනවද කියවනවා. අම්මා අරෙහෙ අඬනවා. නංගි මෙහෙ අඬනවා. මං මේ වියෝතිස් හම්බවෙලා ආවා විතරයි."

" මිනිහ මොනවද කියන්නෙ?"

"තව ටිකක් වෙලා ඒවි බලල යන්න. හෙටම මොකුත් හරි කරමු කිව්වා. අතේ තියෙන සේසතම යනව මේ හදි හූනියංවලට කියල අම්මා කිව්වා."

"මමත් අද ගියා පේනයක් බලන්න. මට පුදුමෙ මල්ලි මටත් කිව්වනෙ මෙතෙන්ට මෙහෙම දෙයක් වෙලා තියෙනවා කියල, ළමයෙක් ඉන්නව කිව්වා දිස්ටිය වැහිලා."



Downloaded from sinhalaebooks.com

"මං නං හිතන්නෙ අරුන් තමයි මේවා කරන්න ඇත්තෙ." අමරසිරි බංඩාර වත්ත පිටුපසට ගෙල හැරෙව්වේය. "අර අභිගුණ්ටික යක්කු උන් මොනව හරි කරන්න ඇති මා එක්ක කේන්තියට"

"එහෙම එක පාරට තීරණ ගන්න එපා මල්ලි අපි දන්නෙ නැහැනෙ."

"ඕකුංව මං හෙට වත්තෙන් එළවනවා පුළුවන්නං. මං දැන්ම කරන්න ගියෙ නැත්තෙ මෙතන තියෙන මේ කරදර හින්දා. ආරස්සාව කරාට පස්සෙ මං ගිහින් කියන්නංකො ඕකුංට මාත් කපනවා හොඳ දෙහි කැපිල්ලක්." ඔහුගේ මුහුණ කෝපයෙන් රතු විය.

මම බයිසිකලය අඳුරු කාමරයට ගෙන ගොස් බිත්තියට හේත්තු කළෙමි. ගොම්මනේ හැමතැන වූයේ මුස්පේන්තු මූසල ගතියකි. හැමදෙනාම මළාක් මෙනි. වත්ත පිටියට අරක් ගත්තා අඳුර කළු භූතයන් පොරවා ගත් කළු තිර කඩ ලෙසිනි.

වජිරා කෙඳිරි ගාන හඬ ඇතුළු කාමරයකින් ඇසිණි.

සාලයේ දැල්වුණේ කුප්පියක්ම පමණි. අනික් කාමරයේ නයනා ඉකි බින්දාය. දොරකඩින් බැලූ මම එතැනින් ඉවත් වුණෙමි. මා කුමක් කරන්නද? ගොනු ගැහෙන අඳුරේ ළිඳ ළඟට ගිය මම වතුර පතිට්ටුවක් ඇද මුහුණ අතපය සෝදා ගත්තෙමි. අභිගුණ්ටික කුඩාරම ළඟ දැල්වෙන ලන්තැරුමේ රතු මළාන එළිය ගිනි පුපුරක් ලෙසිනි, මෙතැනට පෙනුණේ. කුඩාරමේ බල්ලා පවා නිසල විය. ඒ දෙසින් කඩල බැදෙන සුවඳ ඇදී ආවේය.

මට තේ කෝප්පය සාදා දුන්නේ ලීලාවතී මැණිකේය. එය රැගෙන අඳුරු ඉස්තෝප්පුවට ආ ඇගේ මුහුණ කඳුළින්ම ඉදිමී ඇති සැටි මට යන්තමට පෙනිණි.

"මං දන්නෑ මොනවා කරන්නද කියලා පුතා" ඈ හාන්සි පුටුවේ හිඳ ගනිමින් කීවාය. "අද දවසටම වජිරාට මොනවත් පත්තියන් වුනේ නෑ. සේරම වමනෙ දැම්මා. මේක අස්කරලා දානකල් මොනවත් හරියන්නෙ නෑ."

"මටත් අද එහෙම කෙනෙක් කිව්වා. දිස්ටි දෙක තුනකම බැල්ම මෙතැන්ට තියෙනවා කියලා."

"මටත් හිතුණා පුතා. මටත් එහෙමම හිතුණා. අර දෙහි කැපිල්ල මදි මේ වෙච්ච නැස්පැත්තියට."



Downloaded from sinhalaebooks.com

"ඕව සේරම කරන්න ඇත්තෙ අරුන්." අමරසිරි බංඩාර මිදුලෙන් ඉස්තෝප්පුවට එමින් කීවේය. "මට හිතෙනවා ගිහින් ඕකුන්ට..."

"අනේ නිකා ඉන්න පුතා..ආයෙ තව එකක් පටලවා ගන්න."

"අම්මා අක්කා නිසා ඉවසනවා – මම ආරස්සාව කළායින් පස්සෙ බලමුකො. ගුරුන්නාන්සෙට කියන්න ඕනෑ ඕක ආපහු වදින්නම වැඩේ දෙන්න කියලා."

"අපි ඒවා තීරණේ කොරන්න ඕන නෑ" ලීලාවතී මැණිකේ අවවාද දුන්නාය. "කරුම විපාකෙ කියල දෙයක් බුද්ධාගමේ තියෙනවා නොවැ. කරන මිනිස්සුන්ටම ඕවා පඩිසන් දේවි. නැද්ද පුතා?"

මම "හ්ම්" යැයි අනුමතයෙන් තේ තොලගෑවෙමි. මේ තේ කෝප්පය වජිරා වෙනදා හදා දෙන තේ කෝප්පය තරම් රසවත් නොවීය.

හදිසියේම කාමරයෙන් වජිරා කෑගසන හඬ ඇසෙන්නට විය. අපි තිදෙනාම එහි දුව ගියෙමු. චිමිනි ලාම්පුවෙන් එළිය වුන කාමරයේ ඇඳ මත වජිරා දෑතට වැනෙමින් ඇලවී සිටියාය. ඇගේ හිස වරින් වර වේගයෙන් දෙපසට සැළුන හිස වටා කෙස් විසිරුණේ කළුවන් කළු නාගයින් රැසක් විලසිණි. ලීලාවතී මැණිකේ ඇය ළඟ හිඳ ඇයව නවත්වන්නට තැත් කළ ද එයින් පලක් නොවීය.

වජිරා ඉතාම ගොරෝසු හඬකින් යම් යම් දේවල් කියෙව්වාය. මට නම් කිසිවක් හරි හැටි පැහැදිලි නොවීය.

අතරින් පතර ඇසුණ වදනක් තේරුම් ගන්නට මම වඩාත් උත්සුකව කන් යොමු කළෙමි.

"ඒක මගේ – ඒක මගේ" කියන්නාක් වැනි හඬක් මට ඇසිණි.

ලීලාවතී මැණිකේ ඇඳ ළඟ හිඳ පිරිත් කියන්නට වුණාය.

"කරණීය මත්ථ කුසලෙන – යන්තං සන්තං පදං අභිසමෙච්ච සක්කො උජූච සූජූච....."ඇය ඒ සියල්ල කීවේ ඉතා සන්සුන් ආකාරයෙනි.

කාමර දොරකඩ බලා සිටි නයනා මගේ කාමරයට ගොස් කොට්ටය යටින් පිරිත් පොත ගෙනවුත් අම්මා අසල බිම හිඳ පිරිතට හවුල් වුණාය. කුමක් කරන්නදැයි මට නම් තේරුමක් නොවීය. අමරසිරි බංඩාර සහෝදරියගේ හිස නවතන්නට තැත් කරමින් දෝතෙන් අල්ලා මා දෙස බැගෑ බර බැල්මක් හෙළුවේය.



Downloaded from sinhalaebooks.com

මම ඔහුට සන් කරමින් කාමරයෙන් පිටතට ගියෙමි.

"මල්ලි" ඔහු හා සාලය අතට යමින් මම කතා කළෙමි. "බලන් ඉන්නැතුව වියෝජිස්ව එක්කං එමු. ඕන්නං දෙන්නම යමු"

"අයියට මාන්සි ඇති. මං බයිසිකලේ අරන් යන්නද?"

"තනියෙන් පුළුවන්ද මල්ලිට?."

"මං බය නෑ අයියා ඔය යක්කුන්ට. අක්කාට හදි කරපු එකා හම්බ වුණා නං..."

"මල්ලි – මල්ලි තේන්ති අරං වැඩක් නෑ. යන්න බයිසිකලේ අරන් යන්න."

අපි දෙදෙනා කාමරය අතට ආවෙමු. දොර රෙද්ද මෑත් කරද්දී මට පෙනුණේ බිමට රුටා වැටී තිබුණ බයිසිකලයයි.

මා බයිසිකලය කලින් හේත්තු කරද්දී කඩිමුඩියෙන් එය කරන්නට ඇති. ඒ ළඟට එය බිත්තිය අයිනේ රුටා වැටෙන්නට ඇති. අපට එය වැටෙන හඬක් නොඇසුණේ වජිරාගේ කෑ ගැම නිසා විය යුතුය.

"ඔන්න මං නං නෙමෙයි අයියා" එක එල්ලේ මා මුහුණ බලා කියූ අමරසිරි බංඩාර, බයිසිකලය කෙලින් කොට එය පිටතට ගෙන ගියේය.

කුමක් කරන්නදැයි නොදැන මා ඉස්තෝප්පුවේ බලා සිටියදී ඔහු බයිසිකලයත් පැදගෙන අඳුරු පාර අතට ගියේය. තව මඳකින් නයනා පිරිත් කීම නවතා ඉස්තෝප්පුවට ආවාය. ඇගේ දෙනෙතින් ගැලූ කඳුළ කම්මුල් දිගේ ගලමින් ලාම්පු එළියේ දිලිසුණි.

"අනේ අයියා. අපිට උදව් කරන්න අයියා" ඈ මා වෙතට එමින් බැගෑබරව කීවාය.

"ආන් ඔයාගෙ අයියා කට්ටඩියා එක්කන් එන්න ගියා නංගි" මම කීවෙමි. "නංගි ඔයා පිරිත් පොත ගේන්න කාමරේට එනකොට බයිසිකලේ බිම වැටිල තිබුණද?"

ඈ අවිශ්වාසයෙන් මෙන් බලා හිස සලා "නෑ" කීවාය. ඈය බිය වේතැයි සිතා මම ඒ ඔස්සේ වෙන කිසිවක් නොදෙඩුවෙමි.



Downloaded from sinhalaebooks.com

# 16

ඒ රාත්‍රියේම වියෝතිස් ගුරුන්නාන්සේ මතුරා බැඳි නූලකින් යම් තරමක සමනයක් වූවා සේ වජිරා සන්සුන්ව නින්දකට වැටුණාය. මට නම් හරි හැටි නිදාගත නොහැකි විය. මහ රෑ යළිත් වතාවක් බිත්තියට හේත්තු කළ බයිසිකලය මඳක් ඇලවෙන්නාක් සේ හඬක් ඇසිණි. සීනුවද යන්තමට නාද විය. අමරසිරි බංඩාර හරි හැටි බයිසිකලය හේත්තු කොට රඳවන්නට නැතිව ඇතැයි අඩ නින්දේම මම නිගමනය කළෙමි. පසුව කවුදෝ මිදුලේ ඇවිද යන හඬක් ඇසිණි. වියළුණු කොළ මත්තේ දෙපා සර සර ගා ගෙන කාමරයේ කවුළුව ළඟින් යනවා මම අසා සිටියෙමි. නීලම්මා හෝ කරුපන් මේ රාත්‍රියේ හොල්මන් කරනවාද? ඔවුන් මේ වත්තේ විසිම අගුණදායි බව මටද හිතුණේ මේ රාත්‍රියේය. ඔවුන් නොසිටියා නම් මේ කිසිවක් නොවන්නට ඉඩ තිබුණාද?

අමරසිරි බංඩාර හා කිපී ඔවුන් යම්කිසි හදි හූනියමක් සැබවින්ම කළාද? එසේ කළා නම් එය ගියේ අහිංසක වජිරා මත්තෙනි. කොට්ටය යට අත ගාබැලූ මට පිරිත් පොත එතැන නැති බව පැහැදිලි විය. කලින් නයනා එය රැගෙන ගියා නොවැ. එය එතැන නැතිවීමෙන් මට යම්කිසි හානියක් වෙතැයි මා සිතුවොත් මා කරන්නේ එයට යම්කිසි බලයක් පවරා දීමය. එහෙත් යම්කිසි උත්තේජනයකින් මම අවදිව ගත්තෙමි. මා අවදිව ගත්තේ නොපෙනෙන අද්භූත බලයක මහිමයෙන්ද? ඇඳෙන් නැගිට දොරගුළ ඇර ගෙන පිටතට යද්දී මා සිත වූයේ දෙගිඩි, දෙබිඩි සිතුවිලිය. එක

Downloaded from sinhalaebooks.com

අතකින් මා සිත කීවේ මා යම් අද්භූත බලයකට අවනතව දොරෙන් පිටව යන බවකි. තව සිතුවිල්ලක් කීවේ එම අද්භූත බලවේගයට නොබියව මුහුණ දීමට මෙසේ රාත්‍රී අඳුරට පිටව යන බවකි. කෙසේ වුවද මම තව මොහොතකින් තරු පිරි අහස යට තිරුවතින් සිටගෙන සිටියෙමි. මා එසේ සිටියේ යකෙකුගේ ආවේගයකින් හෝ එයට එරෙහිව යාමේ ආවේගයකින් හෝ වෙන මොන යම්ම ආවේගයකින් හෝ විය හැකිය. එහෙත් මා පෙරළා කාමරයට ආවේ මගේ ගතින් සියලු සාරය උරා ගිය ආකාරයකිනි.

එයින් පසු මම ඉතාම වෙහෙසකර නින්දකට වැටුණෙමි. මගේ දකුණු කම්මුලේ අලුත්ම සීරීම් පහරක් විය. පිටත ඇවිද යද්දී කොහේ හෝ ගස් අත්තක කටුවකින් එය සිදුවිය නොහැකිදැයි මම යළිත් තර්ක කළෙමි. කෝකටත් මේ රාත්‍රියේ වියෝතිස් පැමිණ තොවිලය නටා සියල්ල සමනය කරනු ඇති නොවැ......

වැඩට ගිය කල, මම තොවිලය පිළිබඳව හැමදෙනාටම මෙන් හෙළි කළෙමි. කටින් කට ගිය ආරංචිය අනෝමාට ද ටිකිරි බංඩාට ද සැලවිය. "අනේ හොඳයි මහත්තයා ආරස්සාව කර ගන්න එක" යැයි ටිකිරි බංඩා පැහැදීමකින් කීවේය. "ඕං මහත්තයා ඔය කියන මිනිහට ඕක හරියට සුද්ද කරල දෙන්ඩ බැරිනං අපි ගිහින් ගිරාඹේ ගුරුන්නාන්සෙටම කියමු හොඳේ.?"

"බලමුකො"

"අපිත් එන්නං තොවිලෙ නටනවා බලන්න" යැයි අනෝමා කුඩා එකියකගේ උනන්දුවෙන් කීවාය. "අපි යමුද චිත්‍රා? අනේ අතුල යමුද?"

"එළිවෙන කල් නං ඉන්න බැහැ. ටිකක් වෙලා ඉඳල එමු." අතුලද එකඟ වුණේය.

වැඩ ඇරුණ සැණින් ගෙදර ගිය මට තොවිලය වෙනුවෙන් කරන්නට බොහෝ වැඩ කටයුතු තිබිණි. මල් පලතුරු පිළියෙළ කිරීම, ගෙදර දොර අස්පස් කිරීම, මිදුල ඇමදීම ආදියට අමතරව, යනෙන අමුත්තන්ට සංග්‍රහ කිරීමට දේ සැපයීම, වියෝතිස්ටත් හැන්ඩිටත්, ආ අනික් නැට්ටුවන්ටත්, අවශ්‍ය දේ සැපයීම සියල්ලටම මම හවුල් වුණෙමි. නයනා, අම්මාට කුස්සියේ අත් උදව් දුන්නාය. වරින් වර වජිරාගේ දුක සැප ද විමසුවාය.



Downloaded from sinhalaebooks.com

වජිරාගේ මුහුණ මේ දෙදිනට හැකිළී වෙනස්ම පැහැයක් ගෙන තිබිණි. ඇගේ දෙනෙත ගිලී ගොසිනි. වරින් වර වමනය කළ නිසාදෝ ඈ සිටි කාමරය තුළ දුගඳක් ද, අපුලක් ද විය. ඒ තුළට යාමට පවා මා තුළ වූයේ මැලියකි.

අඳුර වැටෙන්නට කලින් ආ අසල්වාසීන් කීප දෙනෙක් ද අත් උදව්වට සිටියෝ ය. එයින් එක ගැහැනියක් කාමරයට ගෙන ආ ලොකු වතුර බේසමකින් පෙඟවූ තුවායෙන් වජිරාගේ මුහුණ අතපය සේදුවාය.

ඉදිරි මිදුලේ මල් පැලක් බඳින්නට උදව් වෙමින් සිටි මට හදිසියේ ගේ පිටුපස අමරසිරි බංඩාර කෑගසන හඬ ඇසිණි.

“පලයල්ලා පලයල්ලා උඹලගෙ උදව් අපිට ඕන නෑ” යි ඔහු හඬ නගා කියනවා ඇසී මම ඒ අතට කර පොවා බැලුවෙමි.

නීලම්මා හිස නමාගෙන කුඩාරම අතට පරාජිත අයුරකින් ඇවිද යනු මට පෙනිණි.

“දන්නැද්ද අයියෙ උන් එනවා උදව් දෙන්න කියලා. ඔය එන්නෙ උදව් දෙන්න නෙමේ. ඔත්තු හොයන්න. ඔත්තු හොයලා තව විනයක් කරන්න.” අමරසිරි බංඩාර තවමත් කෝපයෙන් කීවේය. “හෙටම මං ඕකුන්ට ඔතනින් යන්න කියනවා. ගියෙ නැත්තං කරන්නංකො හොඳ වැඩක්.”

නීලම්මා කුඩාරම ඉදිරියේ හිඳ අඳුරු ගැහෙන ආකාසය අතට හිස හරවනු මට පෙනිණි. ඈ මතුරමින් සාපයක් කරනවාද යන සැකය මා සිතු තුළ ඉස්මතු නොවුණා නොවේ.

රෑ බෝවෙන්නට කලින් අනෝමා ද, චිත්‍රා හා අතුල ජෝඩුවද තොවිල් ගෙදරට ආහා. චිත්‍රා හා අනෝමා එකතුව පොල් සම්බෝලයකුත්, අල ව්‍යංජනයකුත් හදාගෙන විත් තිබිණි.

අනෝමා හැසිරුණේ කුළුපග නෑදෑයකුගේ ආකාරයෙනි. ඈ කුස්සියටම ගොස් ලීලාවතී මැණිකේට “ඇන්ටී” කියා කතා කළාය. අනතුරුව ඈ වජිරාගේ කාමරයට ගොස් බලා කලකිරුණු සිතින් පිටතට ආවාය. වජිරා සිටියේ වෙහෙසකරවූ නින්දකය.

“අනේ පව් අනේ” යැයි අනෝමා පිටුපස පිලේ දී මට කීවාය. “මං හිතුවෙ නෑ වජිර වගේ කෙනෙකුට කවදාවත් ඔහොම වෙයි කියලා.”

“අපි කාටත් නොහිතපු දේවල් වෙන්න පුළුවන් අනෝමා.”



Downloaded from sinhalaebooks.com

"ඒක නං ඇත්තයි ජනක. ඒ උනාට ඔයා හිතන්නෙ අපිට යම් යම් දේවල් වෙනස් කරන්න බැරිද?"

"මං නං ජීවත් වෙන්නෙ වෙන දෙයක් වෙන්න කියලා."

"එහෙම නම් තොවිල් නටලත් වැඩක් නැතෙ ජනක. මේකෙත් වෙනසක් වෙන නිසානෙ මේක කරන්නෙ?"

"ඒ උනාට මේක වෙන්නෙත් වෙන්න තියෙන හැටියට කියල අපිට කියන්න බැරිද?"

"ඔයත් එක්ක තර්ක කරල මට දිනන්න බෑ – පණ්ඩිතයා" කී ඈ ලේන්සුවෙන් මුව වසා සිනාසුණාය. "මේ ඒක නෙමෙයි ඊට පස්සෙ වත්තෙ පල්ලෙහා කටුස්සො එහෙම දැක්කෙ නැද්ද?"

"තවම නං නෑ" කියා මම ඉවත බලා ගත්තෙමි. මගේ කම්මුලේ වූ සිරිමේ සලකුණ පහන් එළියෙන් ඇයට වඩාත් පැහැදිලිව පෙනෙන්නට ඇත්තේ මෙවිටයි. "අනේ මේ බලන්ඩ" කී ඈ මගේ මුහුණ අතගා බැලුවාය.

මට "වෑඃ" කියැවිණි.

"බලන්න ජනක ඔයා හිතන්නෙ මේකත් මේ තොයිලෙන් ඇරිල යාවිද?"

"එහෙම හිතමු."

"අර අභිගුණ්ටක ගැති කියපුව නං තාම මගේ හිතේ හොල්මන් කරනවා"

"මට නං මතකත් නෑ"

"කොහේද පිරිමි අයට ඕවා මතක තියෙන්නෙ?"

ලීලාවතී මැණිකේ කුස්සියේ දොරෙන් බලා "අනේ මේ ආයු ඇත්තන්ට තේ ඩිංගක්වත් හදන්න ඕනැයි" කී කල "මං හදන්නම් ඇන්ටි" කියා අනෝමා ඒ අතට ගියාය.

තව ටික වේලාවකින් ඇය හැදූ තේ නැඹු බන්දේසිය රැගෙන ආවේ නයනාය. කරුවල වැටෙද්දී පැට්‍රෝමැක්ස් ලාම්පු දෙකක් ද දැල්වුණෙන්, ගෙදර අවට උත්සව සිරියක් විය. හැමදෙනාම පලින් පල කතා කරන හඬ ද එයට ආධාරකයක් විය. මේ හඬ හා ආලෝකය අතරේ සියලු භූතයන් පලා යතැයි මට හැඟිණි. එහෙත් වජිරාගේ කාමරය තුළ මුසල අඳුරක් හා දුගඳක් විය. ඇය කෙරෙහි අපමණ අනුකම්පාවක්



Downloaded from sinhalaebooks.com

මා තුළ උපන්නේය. අප හැමටම උදව් උපකාර කළ වජිරා මෙසේ ඔත්පලව ආතුරව වැටී සිටීම ඉහිලුම් නොදෙන කාරණයක් විය.

ඉදිරි මිදුලේ තොවිලය ඇරඹුණේ එක් කෙළවරක ඉදි කරන ලද මඩුවක් ඉදිරියේය. පුවක් ලීයෙන් ද ගොක් කොළයෙන් ද සරසා කරන ලද මඩුව අසල රතු සොම්බර හිස බැඳගත් අත් උදව්කරුවෝ ගැවසුණාහ.

මෙයට ඉදිරියෙන් මිදුල මැද සුදු රෙද්දකින් වසන ලද පිදේනි විය. අග්ගලා, අලුවා, කැවුම් සහ නොයෙක් කෙසෙල් ජාති ද මෙතැන විය. මේ හැරෙන්නට උගුරැස්ස, නාරං ගැට නාරං, දං, පිනිජම්බු හා රතුම රතු කරවිල කැබැල්ල ආදී පලතුරු ද එහි තැබිණි.

"කෝ මස් මාංස?" යැයි කවුදෝ ඇසුවේය.

"අපි මෙහේ මළ පිදේනි දෙන්නෙ නෑ" යි හැන්ඩි පිළිතුරු දුන්නේය.

ඉස්තෝප්පුවේ එලන ලද පැදුරක සුදු කඩින් හිස වසාගත් වජිරා හිඳ සිටියාය. වියෝනිස් ගුරුන්නාන්සේ කළ දුම් ඇල්ලීමෙන් හා යාදින්නෙන් පසු බෙර පද ඇරඹිණි.

මඩුව ළඟ ගිනි පන්දම් දැල්විණි. මඩුවේ සිට යක් මුහුණ පැළඳ වෙස් ගත් කීප දෙනා නොයෙක් ආවේසයෙන් බෙර පදයට නැටූහ.

රෑ කෑම ගෙන මඳ වේලාවකට පසු අනෝමාත්, චිත්‍රාත්, අතුලත් සමුගත්තේ හෙටත් වැඩට යා යුතු නිසා නිදිමැරිය නොහැකි බව කියමිනි. මම පසු දිනයට නිවාඩු ගෙන සිටියෙමි. එළිවෙන තුරු තොවිලය කෙරෙන නිසා මට හරිහැටි නින්දක් නම් නොවෙන බව කල්තියාම දැන සිටියෙමි.

නොයෙක් බෙර පද වැයෙද්දී නොයෙක් වෙස් ගත් නැටුම් මා නෙත ගැටිණි. ගිනිපන්දම්වල එළිය අවට පැතිරිණි. වරින් වර දුම්මල අහසට විදිමින් ආලෝක විහිදුණි.

වජිරා අඩපණව මෙන් පැදුරේ හිඳ සිටියේ වරින් වර ලීලාවතී මැණිකේට වත්තම් වෙමිනි. නයනා පැදුර කෙළවරම නිදා වැටුණාය. මම ද අනෙක් කීප දෙනා මෙන් කෝපි බොමින් අවදිව සිටියෙමි. හදිසියේම, වජිරා පැදුරෙන් නැගිට මිදුල මැදට ගොස් නටන්නට වුණාය. බෙරපදය දැඩි විය.



Downloaded from sinhalaebooks.com

ඊලාවනී මැණිකේත් නයනාත් කෑගැහුවද ඒ හඬට උඩින් ඇහුණේ යකැදුරාගේ යාදින්නයි. වජිරා පිදේනි වටා යමින් පරලව හිස සලමින් නටා, වියෝනිස්ගේ අතේ වූ පොල් මල් ඉත්තෙන් විදින ලද දියෙන් සමනය වෙමින් යළි පැදුරෙහි ඇවිත් වැටුණාය.

නටන යකුන් පිළිබඳව මා තුළ එතරම් අවබෝධයක් නම් නොවීය. එළිවෙන්නට පෙර යකා බැඳගන්නා වියෝනිස් ගුරුන්නාන්සේ අමු සොහොනට ගොස් එහිදී යකා මුදා හැර එන බව අමරසිරි බංඩාර කීවේය.

"අපිත් යමු අයියෙ ගිහින් බලලා එමු"

"මොනව කියල බලන්නද?"

"වෙන දෙයක් බලමු. සමහරවිට අක්කා පරළ වෙලා දුවාවි. නැත්තං වියෝනිස් යකාව ආවේස කරන් සොහොනට අරන් යාවි. අයියමනෙ කිව්වෙ බයට බයවෙලා බැහැ කියලා"

"මං බය නැහැ"

"එහෙම නං යමු ගිහින් එමු."

සැබවින්ම එක එල්ලේ මෙවැනි දෙයකට මුහුණ දීම බයට අභියෝග කිරීමකි. මේ කිසිවක ඇත්ත නැත්ත දැනගැනීමට මට එතරම් අත්දැකීම් නොවීය. වියෝනිස් ගුරුන්නාන්සේ මේ ගමන යන්නේ තමාගේ ජීවිතයත් අනතුරේ තබාය යන කියමන මට කීපවර ඇසිණි. ඇතැම් විට යකා කට්ටඩියාවත් මරාගෙන යන්නේ යැයි කෙනෙක් කීවේය.

මම වරින් වර නිදා වැටුණෙමි. අඩ නින්දේ පවා මට බෙර හඬ ඇසිණි. වරෙක සෙමින් රිද්මයකට බර අඩි මෙන් ඇසුණ බෙර හඬ වරෙක වේග රිද්මයකින් – උස් හඬකින් කන් දෙදරවමින් ඇසිණි.

කාමරයේ ඇඳෙහි ඇලවී සිටි මට මේ සියලු හඬ අතරේ කෙසේ හෝ ඇහැ පියැවෙන්නට ඇත. අමරසිරි බංඩාර ඇඟට අත තබත්ම මම තිගැස්සී ඇහැරුණෙමි.

"යං අයියෙ අර වැඩේට ලෑස්තියිලු."

"හරි හරි" මම මුහුණ අත්ලෙන් පිස දමා නැගිට ගත්තෙමි.

"අයියා දැක්කෙ නෑ නොවැ අපේ අක්කා හොඳටම ආවේසෙන් නැටුවා."



Downloaded from sinhalaebooks.com

"නැ!? "

"ඔව් මිදුල පුරාම නැටුව. ඊළඟට" අමරසිරි බංඩාරට වෙන යමක් කියන්නට නොලැබිණි. වජිරා ආවේසයෙන් අප සිටි කාමරයට දුව ආවාය. අප බයින් ගල්ගැසී බලා සිටියදී ඇ මහා ගෝරෝසු හඬින් යමක් දොඩමින් මගේ බයිසිකලය බිත්තිය ළඟින් උදුරාගෙන එය තල්ලු කරගෙන පිටතට දිව්වාය. අපි ද ඒ අනුව එළියට දිව්වෙමු.

ජීවිතයටම බයිසිකලයකට අතවත් තබා නැති වජිරා දැන් මිදුල මැද වටයට බයිසිකලය පදින්නට වුණාය. ඇ එය කළේ ඇස් උඩ හිඳුවාගෙනය. ලීලාවතී මැණිකේ මෙන්ම තව බොහෝ දෙනා ද කෑ ගැසූහ.

එහෙත් වජිරාට ඒ කිසිවක් ඇසුණේ නැත. ඇ වියරුවෙන් සිනාසෙමින් යමක් කියමින් වටේටම බයිසිකලය පැද්දාය.

වියෝනිස් ගුරුන්නාන්සේ මැතිරූ වතුර ඇගේ ඇඟට දමා ගැසුවේය.

එක්වනම බයිසිකලය අත හැරිය වජිරා කටින් සෙම වගුරුවමින් බිම ඇද වැටුණාය. ලීලාවතී මැණිකේ ඒ ළඟට දුව ගිය ද, ඇයට අත තියන්නටවත් බියෙන්දෝ "වජිරා වජිරා" යි කෑගාමින් ඈත මෑත නැටුවාය.

හැන්ඩි පැමිණ වජිරාව නැගිටුවේය. මම ද අමරසිරි බංඩාර ද අත් උදව් දුන්නෙමු. අප ඇයව පැදුර ළඟට ඔසවා ගෙන එනවිට තවත් කෑගැසීමක් ඇසිණි.

ආපසු හැරී බැලූ මට පෙනුණේ ආවේසයෙන් නටන වියෝනිස් ගුරුන්නාන්සේයි. යකා ඔහුට වැසී ඇති බව අමුතුවෙන් කිව යුතු නොවීය. එක්වනම ඔහු තුලකුත් අතින් ගෙන වත්ත පහළට දුවන්නට වුණේය.

"යමු අයියෙ" අමරසිරි බංඩාර මට කීවේ තව කීප දෙනා ද ගුරුන්නාන්සේ අඹා දුවන්නට වූ බැවිනි.

වජිරාව පැදුරෙහි සැතපූ අපි ද අනික් කීප දෙනා අනුව දුව ගියෙමු..

මහ පාරට එළඹී ගුරුන්නාන්සේ යමක් දොඩවමින් දිව්වේ කුඹියන් කැලේ අතටයි. එයට මෙපිටින් වූ කුඩා ගුරු පාර දිගේ ඔහු



Downloaded from sinhalaebooks.com

හති දමමින් දිව්වේය. අපේ පිරිසේ හත් දෙනකු පමණ සිටින්නට ඇති. අඩ අඳුරේ කී දෙනෙක් දිව්වාද, කවුරු දිව්වාදැයි සිහියක් මට නම් නොවිය.

අමු සොහොන වූයේ කුඹියන් කැලෙන් පාර අතික් පැත්තේය. හැන්ඩි ඔසවා ආ පන්දමේ එළිය අවට එළිය කරන්නට තරම් සමත් වුණේ නැති. එහෙත් මේ මඳ එළියේ වියෝනිස් ගුරුන්නාන්සේ ඇහැට නොපෙනෙනා බලවේගයක් සමග සටන් කරන්නා සේ පෙනිණි.

එක්වනම ඔහු මහා 'හූවක්' තියාගෙන බිම ඇද වැටුණේය. අපි හැම දෙනා බීරාන්ත වී බලා සිටියෙමු.

තවත් හූ හඬක් ඇසිණි. ඒ හූව නැඟුණේ කොහෙන්දැයි අද වන තුරුත් මම නොදන්නෙමි.

අවට මහා සුළඟක් හමා ගියේය. සොහොන් පලේ වූ ගස්වැල් හඬ නඟමින් සෙලැවිණි. එපිට මානා පඳුරු පවා සෙලැවෙනු මට යන්තමට පෙනිණි.

අනතුරුව තවත් එපිටින් හූ හඬක් ඇසිණි. එය නම් නොවැරදීම ඇසුණේ කුඹියන් කැලේ දෙසිනි. මගේ ගත හිරිගඬු පිපුණි. අනික් පිරිසට ළංව සිටීම එක අතකට සහනයක් විය. හිත නොසැලුණා යැයි කීම නම් මුසාවකි.

වියෝනිස් ගුරුන්නාන්සේ නූල් කඩත් අල්ලාගෙන සොහොන් ගලක් ළඟ වැටී සිටියේය. ඔහුගේ දෑස්, දත කට පියැවිලාය. හැන්ඩිගේ ළඟ සිටියෙක් ගත් වතුර වගයක් ගුරුන්නාන්සේගේ මුහුණට ඉස්සේය. පන්දමත් ගෙන නැඹුරු වූ හැන්ඩි යමක් හඬ නගා මැතිරුවේය.

ඉතා ඈත යළි හූ හඬක් ඇසිණි.

ගස්වැල් සියල්ල නිසල විය. අනතුරුව ඇසුණේ පිළිතුරු දෝංකාරයක් ලෙසින් බකමූහුණෙකු නැඟූ හූම්!හූම්! හඬයි

තව මඳ වේලාවකින් වියෝනිස් ගුරුන්නාන්සේ හිස සලමින් දෑස් හැර හිඳ ගත්තේය. ඔහුගේ මුහුණත්, කඳත් දහදියෙන් නැවී තිබිණි. ඒ දහදිය ද මැතිරූ වතුර බිඳු ද සියල්ල ගිනි පන්දම් එළියට රතු කැට සේ දිලිසුණි.



Downloaded from sinhalaebooks.com

"දැන් ඉතින් සේරම හරි" යැයි හැන්ඩි කියනු ඇසිණි. "බුද්ධානුභාවෙන්, ධම්මානුභාවෙන්, සංඝානුභාවෙන් සියලු දෙවි දේවතාවුන්ගේ ආරස්සාවෙන්" යැයි කියමින් ඔහු තවත් යමක් මැතිරුවේය. කෙනෙක් ගෙන ආ සුදු කඩක්, වියෝතිස් ගුරුන්නාන්සේගේ දෙඋර වැසෙන්නට දැම්මේය.

යළිත් බකමූණාගේ හූම්! හඬ ඇසිණි. පෙරදිග අහසේ ළා අළු එළිය පැතිරෙන්නට විය. ඉතා ඉහළ බැලූ මට උදා තරුව පෙනිණි. අලුයම අතරේ හැඩලූ මුල්ම කුකුළාගේ හඬ ඈතින් ඇසිණි.

කණ්ඩායම අනුව මම ද පෙරළා එන්නට ගුරු පාරට පැමිණියෙමි. හිම්දිරි අලු එළිය මා කුඹියන් කැලේ පැත්ත බැලුවේ නිකමටය. යන්තම් පැතිරුණ මානා පඳුරු අතර වූයේ අලු නිල් පැහැයකි. හදිසියේම පඳුරු අතර දිලිසෙන ලොකු කොළ පැහැ දෑසක් මට පෙනිණි. තවත් හොඳින් බැලූ මට ඒ දෑස සතු කොළ පැහැ කටුසු සිරුර පෙනිණි. ගැබ්බරවූ බඩින් යුතු ඌ මා දෙස රවා බලා සිටියේය. මම අන් අය අනුව පය ඉක්මන් කළෙමි. එක් වරක් හැරී බැලුවත් ඌ පෙනෙන අහළක නොවීය.



Downloaded from sinhalaebooks.com

# 17

ගෙදර වින් ඇඳට වැටුණු මට උණ ගතියක් දැනුණි. නින්දෙදි පවා මට පෙනුණේ අර ඔරවා ගත් දෑසයි. මම කොතෙක් වේලා නිදා ගත්තාදැයි නොදනිමි. ඉර මුදුන්වෙන්නට කලින් මා අවදිව ගත්තේ අමරසිරි බංඩාර කාටදෝ බැණ වදින හඬ අසමිනි.

මම කන් තියා අසා සිටියෙමි. හඬ ඇසුණේ පිටුපස පිලෙනි.

"උඹල වරෙල්ලකො බලන්න ආපහු – ආවොත් අතුගෑවිලා යන්නම දෙනව වැඩේ – හරිද?"

"මේ පුතා දැන් ඇති ඇති" ලීලාවතී මැණිකේ හඬ පහත් කොට කීවාය.

"බලමුකො අපිට වින කරලා"

මම ඇඳෙහි ඇලවී ගත් ගමන් සිටියෙමි. ගතට මහා අප්‍රාණික ගතියක් දැනිණි. මේ කෙඩෙත්තුව නිදි මැරීමෙන්ම පමණක් නොවේ. මගේ ඇඟ කෙමෙන් උණෙන් ගිනියම් වන්නට විය. වජිරාගේ ඇගේ සිටි යකා මට වැහුනාද? එවන් යකෙකුට මගේ ළඟ නම් ඉඩ නැතැයි මම හිත දැඩිකර ගත්තෙමි.

තව මඳ වේලාවකින් අමරසිරි බංඩාර මගේ කාමරයට ආවේය. "ජනක අයියා"යි කියාගෙන පැමිණිල්ලක් කරන්නට මෙන් පැමිණිය ද ඔහු මගේ මුහුණේ වෙනස දැකදෝ "අයියට මොකද මේ?" කියා විමසීය. නිහඬ වූ මගේ නළලතට අත තැබූ ඔහු "ගිනි කබල වගේ"

Downloaded from sinhalaebooks.com

යි කියා "අයියට හොඳටම උණ ඉන්න මං අම්මට කියන්න" කියමින් කාමරයෙන් පිටවුණේය.

අනතුරුව අමරසිරි බංඩාරත්, ලීලාවතී මැණිකේත් කතා කරන හඬ අපැහැදිලිව ඇසිණි. දෙදෙනාම මගේ ඇඳ ළඟට ආවෝය.

"මොකද පුතා මේ?"

"ටිකක් උණ වගේ"

"පුතා මොහොකට හරි බය වුනාද?"

"නෑ"

"අයියට මොකෙක් හරි වැහිල ද ඒ පාර?"

"පුතා" යැයි ලීලාවතී මැණිකේ සැර වුණාය.

"මට වැහිච්ච යකෙක් නෑ මල්ලි. කොහොමද වජිරා නංගිට?"

"දෙයියන්ගෙ බුදුන්ගෙ පිහිටෙන් දැන්නං සනීපයි වගේ. හොඳටම නිදි. මෙච්චර දවසක් හරියට නිදාගත්තෙ නැහැනෙ."

"එහෙනං තොවිලෙ හරියන්න ඇති."

"මටත් හිතෙනවා. දැන් ඉතින් අපේ මේ ජනක පුතාට මොකද කරන්නෙ?"

"මට මේක ඇරිල යයි අම්මා. නිදිමරල මහන්සියට."

"බලමුකො. ඔහොම දිගටම ඉඳල හරියන්නෙ නෑ."

"මං ටිකක් නිදාගන්න ඕනෑ" මම අනික් ඇලයට හැරුණෙමි.

"උදේට මොනවත් කෑවෙත් නෑ"

"මට එච්චර බඩගින්නක් දැනෙන්නෙ නෑ"

"මං තැඹිලි හොද්දක් හදන්නං පුතාට"

"අම්මා කරදර වෙන්න එපා"

"නෑ නෑ කරදරයක් නෑ කරදරයක් නෑ" කියමින් ලීලාවතී මැණිකේ කාමරයෙන් පිටවුණාය.

"අයියෙ" යැයි රහසින් මෙන් කියමින් අමරසිරි බංඩාර මගේ ඇඳ කෙළවර හිඳ ගත්තේය. "මං කියන්න හිටියෙ. අරුන්ට මං අද උදේම හොඳ පැල් එකක් දැම්මා. අක්කට මොනව හරි බන්දන්න ඇත්තෙ ඔය අහිගුණ්ටිකයො තමයි."

"එහෙම තීරණ ගන්න එපා මල්ලි."

"තීරණේ අරන් ඉවරයි අයියා. අන්න උන් දැන් සේරම පොදි බඳිනවා යන්න."

"ආයි යනකොට මොනව හරි කරල යාවි."

"එහෙම කළොත් සේරම ආපහු වදින්න මං වැඩේ දෙනවා. මං ගුරුන්නාන්සෙට කතා කරලයි තියෙන්නෙ"

"අනේ මන්දා" යැයි මා කියත්ම ජනේලය පහත බිත්තියට හේත්තු කර තිබුණ බයිසිකලය මඳක් සෙලවී සීනුව යන්තමට හැඬවිණි.

"ඕගොල්ලො මේ බයිසිකලේ ගෙනැත් තියන කොට කවදාවත් හරියට තියන්නෙ නෑ" මට කියැවිණි.

"මම නෙමේ අයියෙ ඊයෙ නං කවුරු ගෙනැත් තිබ්බද දන්නෙ නෑ."

"වෙන කවුරු ගෙනැත් තිබ්බත් රෑට මේක සද්ද වෙනවා."

" පුදුමයි නේද අයියා ඊයෙ අපේ අක්කා බයිසිකලේ පැදපු හැටි" කියමින් අමරසිරි බංඩාර කතාව වෙනතකට යොමු කළේය. "අපේ අක්කා කවදාවත් බයිසිකලේ පැදල තියා ළඟටවත් ගිහින් නැහැ. ඒක නං පුදුම ආවේසයක් වුණේ."

"ඒක නං පුදුම තමයි. වැහිල හිටපු එකා බයිසිකල් පදින්න දන්න යකෙක් වෙන්න ඇති."

"වෙන්නත් ඇති"යි කී අමරසිරි බංඩාර වැයමකින් සිනාසුණේය. "කොහොම උනත් දැන් අපේ අක්කට සනීපයි. දැන් අයියා සනීප වෙන්න."

"මට ඒ හැටි ලෙඩක් නෑ මල්ලි." මම සීතල මඩින්නට රෙදි කඩ දැඩිව පොරවා ගනිමින් දෑස් පියාගත්තෙමි.

මා අවදි වූයේ ලීලාවතී මැණිකෙගේ කට හඬ අසමිනි. "පුතා මේන් මං තැම්බුං හොදි ටිකක් ගෙනැවා. බතුත් ටිකක් කනවද?"

"නෑ අම්මා හොද්ද විතරක් ඇති."

"මේක බීල නිදාගන්නකො හිස්බඩ ඉන්න හොඳ නෑ"

"ගෙදර ඇස්පිරින් තියේද?"

"ගෙදර නං නෑ - පුතාට කියල ගේන්න ගමු"



Downloaded from sinhalaebooks.com

"ඇස්පිරින් දෙකක් ගත්ත නං මට උණ බැහැල යනවා"

මා ඇදෙහිම වාඩිවී තැම්බුං හොදි තොල ගාද්දී අමරසිරි බංඩාර මගේ බයිසිකලය රැගෙන පෙට්ටි කඩයට ගියේ මට බෙහෙත් පෙති ගෙන ඒමටයි. "ඔන්න ගෙනැත් තියෙන කොට බයිසිකලේ හරියට හේත්තු කරල තියන්න ඕනැ" යැයි මම කීවෙමි.

තැම්බුං හොද්ද බීමෙන් පසු මට ගතට යම් තරමක පණක් ලැබිණි. දැඩි මුත්‍රා බරක් දැනුණෙන් එය හිස් කරන්නට මම කාමරයේ පිට පැත්තට ගියෙමි.

ගෙජ්ජි හඬ මට ඇසුණේ එතැනින් ආපසු ඉස්තෝප්පුවට එද්දීය.

අහිගුණ්ටිකයන්ගේ ගැල වත්ත හරහා යනු පෙනුණි. කූඩාරමත් ඔවුන් සතු සියලු අනිත් වස්තු සම්පත් ආදියත් පුරවා බැඳගත් කරත්තය ඉදිරියෙන් ගොනු ළඟ කරුපන් ගමන් ගත්තේය. ඔහුගේ උර මත ගුලා නම් වඳුරා විලිස්සමින් හිඳ සිටියේ දැතින්ම ඔහුගේ හිස බදාගෙනය. කරුපන්ගේ කළු මුහුණ හැඟීමෙන් තොර විය. ගැල පිටුපස ලණුවක බැඳුණු බල්ලා ද රෝදයට අනුව ඇවිද ගියේ උවමනාවට එපාවට මෙනි. කරත්තය පිටුපසින් නීලම්මා ගමන් ගත්තාය. තැඹිලි පැහැ සාරිය හැඳ සිටි ඇගේ හිස කෙස් වෙනදා සේම අවුල් විය. ඇගේ මුහුණේ ද සිනාවක සේයාවක්වත් නොවීය. ඔවුන්ගේ සිතුවිලි වෙනුවට කතා කළේ කළු ගොනුන්ගේ ගෙල බැඳි ගෙජ්ජි වැලම පමණි. ඒ හඬේ රැඳුණේ පාළු ශෝකී ගතියකි.

එක් මොහොතකට නීලම්මා හැරී ගේ දෙස බැලුවාය. ඉස්තෝප්පුවේ බලා සිටි මගේ හා ඇගේ නෙත් එක කෙළින් ගැටුණාදැයි මම නොදනිමි. එහෙත් ඇගේ බැල්මේ වූයේ රැවිල්ලකි.

"අපෝ" කියන හඬක් ඇසී මම හැරී බැලුවෙමි.

මා පිටුපසින් මෙන් සිටගෙන සිටියේ වජිරාය. ඇයව දැක්ම මා සිතට සතුටක්ම විය.

"නංගී දැන් සනීපද නංගී?"

"මට අසනීපයක් තිබුණෙ නැතෙ අයියා"

ඇත්තෙන්ම ඇයට සියල්ල අමතක වීද?

"අයියට උණ වගෙයි කියල අම්මා කිව්වා"



Downloaded from sinhalaebooks.com

"මටත් ඒ හැටි අසනීපයක් නෑ නංගි. ඇස්පිරින් දෙකක් ගත්තුවාම සේරම හරි."

"අර අභිගුණ්ඨිකයො යනව නේද අයියා?"

"ඔව් ඉතින් ඒ ගොල්ලො එක තැනක රඟදන අය නෙමෙයිනෙ"

"අපේ මලය කැමති නැතෙ ඒගොල්ලන්ට"

"මං හිතන්නෙ නෑ ඒ මිනිස්සු අපිට වරදක් කරාවි කියලා"

"ඒ උනාට වපරැසින් බලන කොට සේරම පේන්නෙ වපරෙට"

"කවුද වපර?" කියාගෙන නයනාද ඉස්තෝප්පුවට ආවාය. "අයියට කරදර කරන්න එපැයි කියපු නිසා මං ආවෙ නෑ දැන් අයියා ඒ පාර නැගිටලා."

"නෑ නංගි මං ආයෙ නිදාගන්න ඕනෑ බෙහෙත් ටිංගක් බීලා."

"අයියා ඉක්මනට සනීප වෙන්න ඕනෑ – මාත් ඕන්න අද ඉස්කෝලෙ ගියෙ නෑ ඊයෙ නිදි මරලා"

"ඔයා ඒ වුණාට පාඩම් කරන්න ඕනෑ නංගි" වජිරා නැඟණියට අවවාදයක් දුන්නාය.

"හරි හරි පාඩම් කර කර ඉඳල තමයි මං මේ ආවෙ – අභිගුණ්ඨිකයො යනවා බලන්න."

කරත්තය කෙමෙන් අපෙන් ඈත් විය. පාරට අවතීර්ණ වූ එය හබරවැව හන්දිය අතට හැරවිණි. තව මඳකින් ගෙජ්ජ හඬද නැසී ගියේය.

මම මඳවේලාවක් වජිරා හා නයනා සමග දොඩා කාමරයට පැමිණ ඇඳෙහි ඇලවුණෙමි. තව මඳ වේලාවකින් අමරසිරි බංඩාර ගෙනවුත් දුන් ඇස්පිරින් පෙති දෙකක් බී මම නින්දට වැටුණෙමි.

හවස් වී මා අවදිවුණේ පුරුදු කටහඬක් ඉස්තෝප්පුව දෙසින් අසමිනි.

"ඇත්තට? මං මේ බලලා යන්න ආවෙ." ඒ කතා කළේ අනෝමාය.

"අද උදේ උණ ගත්තෙ" ඒ කතා කළේ අමරසිරි බංඩාරය.

අනතුරුව ඔහු කාමර දොර තිර රෙද්දෙන් හිස පොවා බැලුවේය. "මේං අයියගෙ යාලුවෙක් ඇවිදින්."



Downloaded from sinhalaebooks.com

අනෝමා තිර රෙද්ද මෑත් කරමින් සිනා පාගෙන කාමරයට ඇතුළු වුණාය. "මේ මොනවද ඔයාට වුණේ ජනක? බයට උණ ගත්තද?"

"මං මොකකටවත් බය වුණේ නෑ අනෝමා"

ඈ මගේ ඇඳ කෙළවරක හිඳ ගත්තාය. අමරසිරි බංඩාර අපව තනිකොට ඇතුළුගෙට ගියේය. අනෝමා වෙතින් නැගී පුයර සුවඳ මගේ පෙණහලු පුරවා ගත්තේය. ඇගේ අතකවූ වළලු කීපයක් ගැටී සෙලැවිණි. ළා දම් පැහැ හැට්ටයයි. සාරියයි. ඇගේ සුදු මුහුණටම කැපෙන පාට. ඈ කෙතරම් සොඳුරුදැයි මෙසේ බලා සිටි මට සිතුණි. ඇත්තෙන්ම මෙයට පෙරාතුව මම ඇය දෙස මෙයාකාරයෙන් බලා සිට නැත්තෙමි. ඇදෙහි ඇලවී සිටි මට මඳක් ඉහළින් මෙන් පෙනුණ ඇගේ මුහුණෙහි අමුතුම කරුණාබර ගතියක් සටහන් විය. සිනහවේ පවා වූයේ වෙනදා නැති ප්‍රබෝධයකි. ඒ දෑසේ අනුකම්පාවත්, දයාවත්, ආදරයත් රැඳිණි. ඈ සුරත මා නළලත රඳවා බැලුවාය.

"ඔයාට තාම උණ තියෙනවා ජනක"

"ඔයා කොහොමද දැනගත්තෙ?"

"අපිට ආරංචි වෙනව ජනක"

"ඔයා තනියම ද ආවෙ?"

"නැතුව කවුද වෙන මගේ තනියට ඉන්නෙ?"

"ඔයා ආපහු යන්නෙ එතකොට?"

"මං ආ විදියටම යන්නංකො – ඔයා බය වෙන්න එපා."

" මං බය වෙන්නෙ නෑ – මං කිව්වනෙ."

"ඊයෙ රෑ ඔයත් හෝම්පළට ගියාලු නේද?"

"හෝම් – පළ – ට?"

"ඔව් අනේ සොහොනට. අමු සොහොනට. ඔයා මොකක් දැකල ද බය වුණේ?"

"මං මොකෙක්වත් දැක්කෙ නෑ අනෝමා"

කටුස්සා ගැන සඳහන් කළොත් ඇය ඒ සියල්ල විහිළුවකට හරවා ගනිතැයි කුකුසක් මා තුළ විය.



Downloaded from sinhalaebooks.com

හවස හිරු එළිය තීරුවක් කවුළුවෙන් කාමරයට ඇදී මගේ පොරෝනා කඩ මතට ද වැටිණි. එයින් පරාවර්තනය වූ එළිය අනෝමාගේ මුහුණ තවත් ඔපවත් කළේය. ඇගේ සෙනෙහසින් මා තුළ පිබිදීමක් නොවුණා යැයි කිව නොහැකිය.

තව මඳ වේලාවකින් නයනා, අනෝමාට තේ කෝප්පයක් ගෙන ආවාය. "ජනකයියා තේ එකක් බොනවද?"

"කහට ටිකක් විතරක් ඇති නංගී"

"මං ගේන්නම් " කියමින් නයනා යළිත් ඉගිල ගියාය.

"අර අහිගුණ්ඩිකයො ගියාලු නේද?" තේ උගුරක් බිව් අනෝමා ඇසුවාය.

"ගියා නෙමෙයි අපේ අමරසිරි බංඩාර එළවගත්තලු නේ? මටත් මහ ලොකුවට කිව්වා. මට නම් ඒ ගැනි කිව්ව සාස්තර හුඟක්ම හරි. ඒ උනාට ඉස්සරහට වෙන අපල උපද්‍රාවල් ගැන අපි කොහොමද තීරණ ගන්නෙ නේද ජනක?"

"මං නං ඕවා ඔය තරම හිතන්නෙ නෑ"

"මං හිතන්නෙ ඒ මිනිස්සු කුඹියන් කැලේ උඩහ කුඩාරම ගහගෙන."

"ඇත්තට?"

"මං දැක්කා එනකොට අර කරුපත් වඳුරත් අරන් ඒ පැත්තෙ කන්ද නගිනවා."

"ඒ මිනිස්සු නං හොල්මන්වලටවත් බය නැතුව ඇති."

"හොල්මන් ඒ මිනිස්සුන්ට බය ඇති" කී අනෝමා හිනැහුණාය.

"හොල්මන් ඒ මිනිස්සුන්ට බය ඇති" කී අනෝමා හිනැහුණාය. ඇගේ අතේවූ තේ කෝප්පය ගැස්සී තේ කහට මඳක් මගේ පොරෝනා කඩ මතට වැටිණි. "අනේ මං කරපුදේ?" කී අනෝමා නැගිට තේ කෝප්පය මේසය මත තබා තම ලේන්සුවෙන් මගේ පොරෝනාව පිසදමන්නට වුණාය. රෙදි කඩේ එතැන වසා සිටියේ මගේ වම් කලවයයි. ඉතා සුමුදු ලෙසින් තේ කහට පිසදැමූ ඈ තවත් ළංවී මට මුහුණලා "සමාවෙන්න ජනක" යැයි කීවාය.

"මොනවටද සමාවෙන්නෙ?"

පිළිතුරක් නොදීම ඈ නැඹුරුව මගේ කම්මුල මත හාදුවක් තැබුවාය.



Downloaded from sinhalaebooks.com

මම අන්දුන් කුන්දුන් වුණෙමි. ඇය යළිත් මගේ කම්මුල සිප දෙතොලට දෙතොල තැබුවාය. නයනා යමක් කියාගෙන කාමරය අතට ආවෙන් අනෝමා මදක් ඈත්ව හිඳ ගත්තාය.

නයනා අත වූයේ මා වෙනුවෙන් ගෙන ආ කහට කෝප්පයයි. "මේ අයියා."

"මං ඔයාට පොවන්නද?" අනෝමා ඇසුවාය.

"මං තොත්ත බබෙක් නෙමෙයිනෙ" මම හිඳ ගනිමින් කීවෙමි.

අනෝමා මගේ තේ කෝප්පය ගෙන මට පාත්ම "එයා තොත්ත බබෙක් නෙමෙයිනෙ" කී නයනා කාමරයෙන් දුව ගියාය.

මම අනෝමාගේ අතින් තේ කෝප්පය අර ගත්තෙමි. ඇයට අවනත විය යුතු නැත.

"අනෝමා ඔයා දන්නවනෙ මං ආදරේ කරන කෙනෙක් ඉන්නවා." මම තේ කහට දෙස බලාගෙන කීවෙමි.

"කවුද වජිරද?"

"නෑ වජිරා නෙමෙයි. වජිරා මගේ නංගී වගේ! ඔයත් මගේ නංගී වගේ!"

"එහෙනං කවුරුද?"

"මං කිව්වනෙ. මං කාටවත් මේවා විස්තර කරල දෙන්න ඕනෙ නැහැ."

"ඉතින් නම කියන්නකො"

"නම කිව්වැයි කියල ඔයාට මොකටද?"

"නිකම් දැනගන්නනෙ."

"පස්සෙ කියන්නං."

"ඔයා නම කියන කල් මං විස්වාස කරන්නෙ නැහැ"

"ඔයා විස්වාස කරන්න ඕන නෑ. මං ගැන දන්නෙ මමනෙ."

"හොඳයි ඔයා මං ගැන මොනවද හිතන්නෙ?"

"මං කිව්වෙ...මට" වෙන යමක් කියන්නට ඉඩ නොලැබිණි. අමරසිරි බංඩාර කාමරයට පැමිණියේය. ඔහු මේසය ළඟ පුටුවක හිඳ, "ආන්....අනෝමටත් එක්ක කෑම හදනව"යි කීවේය.



Downloaded from sinhalaebooks.com

"අනේ අම්මට කියන්න කරදර වෙන්න එපා කියලා"

"කරදරයක් නෙමේලු"

"මාත් එන්නං කුස්සියට"

"එච් ලෙඩාට නිදාගන්න ඉඩ දීලා"

"ඔයා ටිකක් නිදාගන්නකෝ ජනක. මං දැන්ම යන්නෙ නෑ" කියූ අනෝමා හිස් කළ තේ කෝප්පයත් රැගෙන කාමරයෙන් පිටවුණාය.

මම කහට තොලගාමින් හිස සැලුවෙමි.

"අයියා තේ එක බීල දෙන්න. මේ මං බයිසිකලේ පොඩ්ඩක් අරන් යන්නද? "

"ඕක අහන්නත් ඕනැද මල්ලි?"

"අහන්නැතුව හොඳ නැතෙ?"

"හැමදේම මගෙන් අහලද ඔයා ගන්නෙ?"

"අයියට අයිති දේවල් නම් එහෙමයි."

අමරසිරි බංඩාර මා හිස් කළ තේ කෝප්පය ගෙට ගෙන ගොස් තබා පැමිණ බයිසිකලය රැගෙන කොහේදෝ ගියේය.

මට නොදැනීම නින්ද ගියේය.

මා අවදිවූයේ අත්ලක පහසෙනි. කාමරය තුළ අඳුර විය. මගේ රෙදිකඩ සකසා පෙරවූ අනෝමා මගේ මුහුණ අතගෑවාය.

"ඔයාට හොඳටම නින්ද ගියා නේද ජනක?"

"ම්...කීයද වෙලාව?"

"හත පහුඋණා. මං ලාම්පුව ගෙනැවා. ඉස්තෝප්පුවෙ තිබ්බා. ඇතුළට ගේන්නද?"

"ගේන්න" මා කීවේ ඇය හා තනිව අඳුරේ රැඳීම හරි මදි යැයි හැඟුණ හෙයිනි.

"මං ගොඩක් වෙලා හිටියා ඔයා ඇහැරෙයි කියල බලාගෙන"

"කෝ අමරසිරි බංඩාර ආවද?"

"තවම නෑ. බයිසිකලේ අරන් රෝන්දෙ ගහන්න ගිහිං."

"කෝ ගෙදර අනිත් අය "

"සේරමලා කුස්සියෙ"



Downloaded from sinhalaebooks.com

"ලාම්පුව ගේන්න අනෝමා"

"ඔයාට ලැජ්ජයි" කියමින් ඈ දොරෙන් පිටවුණාය.

නිකමට අතගා බැලූ මට මා දෙකලව මැද තෙත්ව ඇති බව දැනුණි. දැඩි මුත්‍රාබරක් ද විය. අපහසුවෙන් වුවද මම නැගිට්ටෙමි.

"ඔය කොහේ යන්නද?" ලාම්පුව රැගෙන කාමරයට එමින් අනෝමා ඇසුවාය.

"මට දොට්ට යන්න"

"ඉන්න ඔහොම හුළං වැදි වැදී යන්න එපා."

"මං කලිනුත් ගියා"

"එහෙම හොඳද? ඉන්න පඩික්කමක් ගේන්න"

"එපා එපා අනෝමා"

"අනේ ලැජ්ජකාරයා. ඔහොම ඉන්නකො"කී ඈ "නංගී" යි හඬ ගෑවාය.

නයනා කොහේදෝ සිට දුව ආවාය. අනෝමාගේ අණට අවනතව ඈ මට පඩික්කමක් සෝදා ගෙනැවුත් දුන්නාය.

"ඕං අපි යනවා ඕනෑ දෙයක් කරගන්න" කී අනෝමා නයනාගේ අතින් අල්ලාගෙන කාමරයෙන් පිටවුණාය.

මම නැගිට පහන් තිරය පහත් කොට දොරද අඩවල් කොට මුත්‍රාශය හිස් කළෙමි. මහා අප්‍රාණික ගතියක් දැනුණෙන් යළිත් ඇඳට වැටුණ මට නොදැනීම නින්ද ගියේය.

මා අවදි වෙන විට බොහෝ රෑ විය. අමරසිරි බංඩාර බයිසිකලය ගෙනැවුත් තැබූ හඬිනි මා අවදිවූයේ. තමා අනෝමාව ගෙදර ගොස් ඇරලූ බවත්, වෙලාව රාත්‍රි නවය පසුඋන බවත් ඔහු හෙළි කළේය.



Downloaded from sinhalaebooks.com

# 18

මේ සති අන්තයේ මට ගෙදර යන්නට තරම්වත් ඇඟට ශක්තියක් නොතිබිණි. සිකුරාදා හවස් වෙන විට උණ බැස ගියද මා ඇඟ කෙඳෙන්තු කර ගනිමින් බස්රියක නැඟී කොළඹ නොයා යුතු බව ලීලාවතී මැණිකේ කීවාය. ඇත්තෙන්ම ගෙදරදී ලැබෙන තරමටම සත්කාර මට නවාතැන් පළේදීද ලැබිණි.

බ්‍රහස්පතින්දාත්, සිකුරාදාත් දින දෙකෙහිම අනෝමා මා බලන්නට ආවාය. ඒ දෙදිනම ඇය පෙරළා ගියේ අමරසිරි බංඩාර සමඟිනි. ඇයට තනිවට කියමින් ගිය මේ ගමන් වලට ඔහු මගේ බයිසිකලය ද රැගෙන ගියේය.

සෙනසුරාදා උදය වන විට මට උණ පහව ගොස් සුවය ලැබිණි. දවල් වරුවේ මට නාගන්නට කියා වජිරා වතුර රත් කර දුන්නාය.

ඇයද සුවයෙන් සිටිනු දැකීම මා සිතට සතුටක් විය. ඇත්තෙන්ම, තමාට කුමක් සිදුවුයේදැයි ඇයට හරිහැටි තේරුමක් නොවීය.

මටම කියා වැටකොලු හොද්දකුත් හදා තිබුණද මම අනෙක් ව්‍යංජනත් රස කරමින් කෑවෙමි. මගේ කෑම පිරිය ආදියද පෙර පරිදි ඇති විය.

"අයියට උණ ගත්තෙ මොහොතකට හරි බයවෙලා නම් තමා" නයනා ඔච්චමට මෙන් කීවාය.

Downloaded from sinhalaebooks.com

"නෑ නෑ ඕක කරගත්තෙ අපෙන් සත්කාර ලබන්නට." වජිරා කීවේ තමා ගෙල බැඳි සූරය අතගාමිනි. ඇගේ ආරස්සාවට කියා ඇයට මේ අලුත් සූරයද ලැබී තිබිණි. ලෙඩ දුකින් තොරවූ ඇගේ මුහුණ පහන් විය.

මේ ගෙදර හැමදෙනම සතුටකින් හැසිරෙන කතා කරන ආකාරය පැහැදිලි විය. උණ පහව ගිය මගේ සිරුරටද සැහැල්ලු – සහන් බවක් දැනුණි.

මෙදින සවස් වරුවේ මගේ දුක සැප බලන්නට පැමිණියේ ජයසිරිත්, ටිකිරි බංඩාත්ය. මා සති අන්තය මෙහිම රැඳෙන බව ඔවුන් දැනගෙන ඇත්තේ අනෝමා ගෙනි. ඉස්තෝප්පුවෙන් පිටත කෙටි තාප්පයට බයිසිකල් හේත්තු කර ගෙට ගොඩවූ ඔවුන් මා වෙනුවෙන් විස්කෝතු පැකට්ටුවක්ද ගෙනැවුත් තිබිණි.

"මහත්තයා ලෙඩ වුණේ තොවිලෙ නැටුවට පස්සෙ. එහෙම හොඳද?" ටිකිරි බංඩා කීවේය.

අපි තිදෙන ඉස්තෝප්පුවේ හිඳ කතාවට වැටුණෙමු.

"අනෝමා නෝනා මහත්තය ගැන හරි තාත්තුවාවෙන් හැම තිස්සෙම කතා කළේ" ටිකිරි බංඩා හෙළි කළේය. "ජයසිරිත් එක්ක මං කිව්වා අපි ගිහින් බලලා එමු කියලා."

"මාත් මේ පැත්තට වැඩිය එවෙන්නෙ නෑ අපේ තාත්තා මළාට පස්සෙ" ජයසිරි වටපිට බලමින් කිවේය. "මහත්තයට බයිසිකලෙන් කිසි කරදරයක් නැතෙ."

"කරදරයක් මොකද රෝද දෙක කැරකෙනව නං තේද මහත්තයා?" ටිකිරි බණ්ඩා ඔච්චම් කළේය.

"සැරයක් නං රෝදයක් ගියා" මම කීවෙමි "මතකනෙ."

"හරි හරි. දැන් ඒ උනාට ලෙඩක් මොකවත් නැතෙ?" ජයසිරි විමසුම් කළේය.

"කිසිම ලෙඩක් නෑ ජයසිරි. මං තමා කරුමෙට ලෙඩ වුණේ."

"අපිට නොකිව්වට මහත්තයා මොහොකට හරි බයවෙලා තියෙනවා." ටිකිරි බණ්ඩා මා දෙස විමසුම් බැලුම් හෙළීය.

"අපි සොහොනට ගියේ එළිවෙන්න කිට්ටුවනෙ ඒ වෙලාවෙ නං හිතට යන්තං බය ගතියක් දැනුණා." කටුස්සා දුටු පුවත හෙළි



Downloaded from sinhalaebooks.com

කරන්නට මම මැලි වුණෙමි. එසේ කීවා නම් යකඩ වළලු පළඳින්නැයි ටිකිරි බංඩා යළිත් අවවාද දේවි. ඒ එකම බෙර පදේ අසන්නට මා තුළ කැමැත්තක් නොවීය.

"මහත්තයගෙ මූණ ඉන්පස්සෙ හීරුවෙ නැහැ?" ටිකිරි බංඩා යළි ප්‍රශ්න නැඟීය.

"නෑ නෑ දැන් ඒවා සේරම හරි."

"මං කිව්වෙ අර වගේ කෙනෙක්ගෙ බැල්ම තියෙන කොට ඒ බැල්මට අවනත වෙනකල් ඕක වෙන්න පුළුවන්."

ටිකිරි බංඩාගේ ඒ කතාවට මට අනෝමා සිහි විය. බදාදා රාත්‍රියේ මා සැබවින්ම ඇයට අවනත වුණාද? අඩ නින්දේ උණෙන් පෙළෙමින් සිටි මා අවදිවූයේ ඇගේ පහසෙනි. ඈ මගේ රෙදි පිළි සැකසූ අන්දම මට යන්තමට මතකය. ඈ කොතෙක් වේලා අඳුරේ මා හා කාමරයේ සිටියාදැයි මට නිච්චි නැත. මගේ මුහුණේ සීරීම් ලකුණුවලට වගකිව යුත්තිය අනෝමා නම්, ඈ මගෙන් ආශාව සපුරා ගත්තී නම් මා තවත් බිය විය යුතු කුමටද?

මගේ සිතුවිල්ලට බාධා කරමින් නයනා තේ බන්දේසියක් රැගෙන ආවාය. යමක් කියමින් සිටි ජයසිරි කතාව නවතා ඇය දෙස බැලුවේය. ටිකිරි බංඩාගේ දෙනෙතද නයනා වෙත යොමුවිය. ඇත්තෙන්ම මේ සැඳෑ එළියේ නයනාගේ අහිංසක මුහුණ ඉතාම ලස්සනට පැහැදිලිව පෙනුණි. ඔවුන් ඇගේ සුන්දරත්වයෙන් වශී වූවා සේය.

නයනා යන්තමට හිස ඔසවා බලමින් අමුත්තන්ට තේ බන්දේසිය පෑවාය.

"බබාට දැන් වයස කීයද?" ජයසිරි තේ කෝප්පය ගනිමින් ඇසීය.

"එකො–ළ–හයි " නයනා පහත් හඬින් ඇද පැද කීවාය.

"බබෙක් නෙමේ එහෙනම්, පොඩි නෝනෙක්." ටිකිරි බංඩාද තේ කෝප්පය ගනිමින් විහිළුවක් කළේය.

ඔවුන් දෙදෙනාම ඇය දෙස බලා සිටියේ යම් කිසි දැපනකට වැටුණ කලක මෙනි. ඇය මටත් තේ කෝප්පය දී ගේ අතට යද්දීද ඔවුන්ගේ දෑස් ඇයව හඹා ගියේය.



Downloaded from sinhalaebooks.com

"හරිම සීදේවි පොඩිනෝනා" ටිකිරි බංඩා තෝ උගුරක් බී කීවේය.

ජයසිරි කල්පනාවකින් තිහඬ විය.

"මහත්තයට කියන්න තව කාරණාවක් තියෙනවා." ටිකිරි බංඩා රහස් හඬින්ය කීවේ. "තෝ ඒක බීලා – මිදුලට යමු ඒක කියන්න."

මා තුළ කුතුහලය වැඩිණි. තව මඳ වේලාවක් කතා බහ කරමින් සිටි ඔවුන් මිදුලට බසිද්දී මමද ඒ අනුව ගියෙමි.

"මොකද්ද ටිකිරි බංඩා කාරණේ?" පාර අතට යමින් මම ඇසුවෙමි.

"අර පොඩි නෝනගෙ වයසෙ අය ඉන්න සමහර ගෙවල්වල එක එක පෙරළිකාර දේවල් වෙනවා. ඒකයි මං කියන්න හිටියෙ."

"ඔය වගේ කතා මාත් අහල තියෙනවා. ඕකට වචනයක් තියෙනවා ටිකිරි බංඩා පෝල්ට ගයිස්ට් කියලා" කලකට ඉහත දුටු චිත්‍රපටියක එවන් සිද්ධියක්ද මට සිහිපත් විය.

"මොන පොල්ද මං දන්නෙ නෑ මහත්තයා. හැබැයි ඔය ලොකු වේගන එන ළමයින්ගෙ තියෙනවා යම්කිසි බලවේගයක්. ඒ ගොල්ලන්ටත් නොදැනි ඒ ගොල්ලො යම් යම් දේවල් කරනවා."

කාමරයෙන් සාලයට ගිය තෝ කෝප්පය මට මතක් විය. එය අඩක් බී එයට පස් දැමුවේ නයනා විය නොහැකිද? එතකොට පිරිත් පොත....ඇයම ගෙනැවුත් දුන් පිරිත් පොත ඇයම ගිහින් විසිකරන්නට ඇද්ද? රුචිනිගේ සේයාරුව ඉරා දැමුවේ නයනා විය නොහැකිද?

"මොකද්ද මහත්තයා කල්පනාව?" ටිකිරි බංඩා මගේ නිහඬ බව දැක විමසුවේය.

"නෑ, නෑ මට දැන් මේ මතක් වුණේ මේ ගෙදර වෙච්ච දේවල් කීපයක්. ඒ උනාට තව දේවල් තියෙනවා මට ඒ විදියෙන් ඔප්පු කරන්න බැරි."

"එහෙම නං මහත්තයා බලවේග එකට වඩා ඇති." ටිකිරි බංඩා තර්කයක් ගෙන හැර පෑවේය.

"ඒකත් වෙන්න පුළුවන්" යැයි කතාව අනුමත කළේ වැඩි කතාබහක් නොකළ ජයසිරිය.

දෙදෙනා පාරට එළඹ බයිසිකල්වල නැඟී හබරවැව අතට යනු මම බලා සිටියෙමි. ඔවුන්ගේ ජීවිත කෙතරම් සරලද? උදේ බැංකුවේ



Downloaded from sinhalaebooks.com

වැඩට යන ඔවුහු සවස ගෙදර යති. දරු පවුල් රකිති. මාරුවක් ගැන සිතන්නට – ප්‍රොමෝෂන් ගැන සිතන්නට ඔවුන්ට හේතුවක් නැතිව ඇති. මට තරම් අසහනයක් ඔවුන්ගේ ඒ උපේක්ෂා සහගත ජීවිතවල නොවේ. සුදු සරම්, කමිස හැඳගත් ඔවුන් දෙදෙනා බයිසිකල් පදවා ගෙන ගියේ තටු සලා ඉගිලෙන සමනලයින් දෙදෙනෙකු විලසිනි. ඇත්තෙන්ම ඔවුන් ජීවිතය ගැන ගැඹුරට නොසිතුවද, ඉතා නැණවත් වී යැයි මට මේ මොහොතේ සිතිණි. ටිකිරි බණ්ඩා, නයනාව දැක්මෙන් ගෙන ආ අදහස සත්‍ය විය නොහැකිද? පෝල්ටර්ගයිස්ට් යන ජර්මන් වචනයේ අරුත දඩ්බිඩ්කාර (පෙරළිකාර හෝ හඬ නගන) ආත්මයක් යනුයි. 1900 ගණන්වල මුලදී හැඳුනු මේ වචනය වෙනුවට අද සයිකොකිනෙසිස් යන වචනය යොදාගන්නා බවද මම කියවා ඇත්තෙමි. ඉබේ යළි යළි සිදුවෙන මෙම ක්‍රියාවන්හි භෞතික බලවේගයකින් තොරව යමක් එහා මෙහා කිරීම සිදුවෙයි. ඉදින් නයනාත් එවන් බලවේගයකින් තේ කෝප්පය එහා මෙහා කරන්නට ඇද්ද?

එහෙත් ගේ අතට එමින් ඉස්තෝප්පුවේ බලා සිටි නයනාගේ අහිංසක සිනහව දකිද්දී මට එය එසේ යැයි විශ්වාස කිරීම අපහසුවිය. එහෙත් රුචිනීගේ සේයා රුව ඉරා දැමීම මා කාගෙන් හෝ ඇසිය යුතු වූ අතර මේ එයට හොඳම අවස්ථාව විය.

"නංගි මේ එන්නකො වෙච්ච වැඩක් කියන්න"

"මොකද්ද අයියා?"

"මෙහෙන් වාඩිවෙමුකො – මේ ඉස්තෝප්පුවෙන්."

"ඉතිං කියමුකො?" බිත්ති කණ්ඩිය උඩ හරිබරි ගැහෙමින් ඈ ඇසුවාය.

"නංගි හරි වැඩේ උනේ. මගෙ ගාව අර පින්තූරයක් තිබුණ ඔයාට පෙන්නුව මතකද?"

"ඔව් ඔයාගෙ ගෑනු ළමයගෙ"

"ඒක නංගි කාවුදෝ ඉරා දාලා?"

"නෑ – ඒ කොහේදිද?"

"ඒක තමයි ඒක තිබුණෙ මේසෙ කඩදාසිය යට."

"මං නං දැක්කෙ නෑ අයියා."



Downloaded from sinhalaebooks.com

“ඒක තමයි මං හිතන්නෙ පිරිත් පොත ගෙනිහුං විසිකරපු බහිරවයම ඒක කරන්න ඇති.”

“ඇයි එතකොට අයියගෙ තේ කෝප්පෙ මතකද?” ඇයම එය මතු කළාය.

“ඒකත් හරි. මින් පස්සෙ නං එහෙම දේවල් වෙන එකක් නෑ නේද නංගී?”

“මං හිතන්නෙ නෑ අයියා. දැන් මේ ගේ ආරස්සාවයි. අපේ අක්කට වැහිලා හිටි යකා ගියානෙ ඉතින්”

“ඔව්, නංගි එහෙම හිතමු.”

ලීලාවතී මැණිකේ හඬ ගැයෙන් නයනා ගෙතුළට දුව ගියාය.

මෙයින් පසු ටික කලක් යන තුරුම අසාමාන්‍ය සිදුවීම් මේ අවට නොවීය. එහෙත් ඒ සන්සුන් බව කුණාටුවක පෙරනිමිත්ත බව අපි කවුරුවත් නොදැන සිටියෙමු.

සිංහල නවකතා 1000කට අධික ප්‍රමාණයක් නොමිලේ
Ebook ආකාරයෙන් කියවන්න...
දැන්ම www.sinhalaebooks.com වෙත පිවිසෙන්න..



Downloaded from sinhalaebooks.com

## 19

මාසයක් පමණ කාලයක් තිස්සේ කිසිදු හැලහොල්මනක් නැතිව ජීවිතය ගෙවී ගියා යැයි කීවොත් වරදක් නොවේ. මට වූ එකම වදය නම් අනෝමාය. ඈ බලෙන්ම මෙන් මගේ "ඇඟට ගොඩවීම" ඇතැම් විට මහා කරදරයක් විය. ඇය කෙතරම් හැඩකාර වුවද, රුවිනී දිනායත් මගේ සිත වෙත අන් ආකර්ෂණයක් නොවීය. එහෙත් මා අනෝමාව මඟ හරින්නට තැත් කරන්ම, ඈ තව තවත් මට ළංවෙන්නටම තැත් දැරුවාය.

ඇතැම් සවසක ඇයත්, චිත්‍රාත්, අතුලත් මගේ නවාතැන පැත්තේ ආවෝය. ඉදහිට සවසක ඇගේ පෙරැත්තය නිසා අපි චිත්‍රපටියක් බලන්නටද ගියෙමු. එසේ ගොස් එනවිට අනිවාර්යයෙන් ඇයත්, මමත් තනිවීමු. අවට අඳුරට මවාගත් බියෙන් ඈ මගේ අත අල්ලා ගත්තාය. මා සිප ගත්තාය. මටම පමණක් ආදරය කරන බවක් වහෙන් ඔරෝ බසින් කීවාය. මට පෙම්වතියක් සිටියත් නැතත් කමක් නැතැයි ඈ වරෙක කියා සිටියාය. දැන් මේ හබරවැවෙන් වෙන්ව යන්නට මට වඩාත්ම උවමනා කළේ මේ හේතුවයි. නැත්නම් ලීලාවතී මැණිකේගේ නවාතැන සුවදායී තැනක් වන්නට ඉඩ තිබිණි. වජිරා, නයනා අමරසිරි බණ්ඩාර මගේම සොයුරු සොයුරියන් ලෙසිනි, මට වරෙක හැඟුණේ.

අනෝමා නිසා නොවේනම් මේ කතාන්දරය මෙතනින් කෙළවර වන්නට ඉඩ තිබිණි. නමුත් මා පිළිතුරු නොලද ප්‍රශ්න රාශියක් තිබුණ බව මා දැන ගත්තේ මෙයිනුත් කලකට පසුවය.

Downloaded from sinhalaebooks.com

ඊළඟ මාසය අග වෙනවිට අනෝමා වඩ වඩාත් කල්පනාකාරීව දවස ගෙවුවාය. ඇගේ මේ හදිසි වෙනස්වීම කාර්යාලයේ වැඩ කළ හැම දෙනාටම මෙන් පෙනෙන්නට ඇත. එහෙත් අප කිසිවකුත් ඒ ගැන තැක්මකින් කතා බහ කළේ නැත.

දිනක් සවස මා හා වැඩ ඇරී ගෙවල් අතට එන අතර ඈ කිසිදු හේතුවක් නැතිව කඳුළු සලන්නට වූවාය.

"මේ මොකද මේ?" මම විමතියෙන් ඇසුවෙමි. මගේ සිත ගන්නට මේ ඇයගේ තවත් මායමක් විය නොහැකිද?

පිළිතුරු වෙනුවට ආවේ ඇගේ හැඬුමම පමණි.

"මේ මොකද මං වැරැද්දක් කළාදැ?" මට කියැවිණි.

"වැරැද්ද වෙලා ඉවරයි ජනක" කී ඈ එක්වනම පාර පැන අපේ වමතට ගඟ දෙස වූ බෑවුම අතට දුවන්නට වුණාය. කුමක් කරන්න දැයි නොදැන මමද ඇය හඹා ගියෙමි.

ගස් අතරින් බෑවුමේ දුවගිය ඈ ගඟට මෙපිට ගලක් ළඟ නැවතුණාය. ඇගේ කඳුළු අලුත් විය.

"මොකද අනෝමා? මොකද කියන්නකො"

"වැරැද්ද වෙලා ඉවරයි ජනක" ඈ ඉකිය අතරින් බිඳුණු හඬින් කීවාය.

"මොන වැරැද්දද?"

"ගැනියකුට වෙන්න පුළුවන් ලොකුම වැරැද්ද" කී ඈ ගල්තලය මත හිඳ දෑතින් මුහුණ වසා ගත්තාය.

"කවුද ඉතින් ඔය වැරැද්ද කළේ?"

"කවුද ඉතින් ඔයා මිසක්." හිස ඔසවා ඈ ගං දිය දෙස බැලුවාය.

"මම?" මට මෙය අදහාගත නොහැකි විය.

"ඔව්, ඔයා තමයි තොත්ත බබා වෙන කවුද?"

"දෙයියනේ මොනවද ඔයා මේ කියවන්නෙ?"

"මටත් දැන් දෙවියන්ට තමයි කියන්න වෙලා තියෙන්නෙ. වෙන කවුද ඉතින් මගේ දුක අහන්නෙ?"

"අනෝමා. මේ මට තේරෙන්න කියන දෙයක් කියන්න හොඳේ..."

"ඔයාගෙ කාමරේ ඔයාට උණගත්තු වෙලාවෙ"



Downloaded from sinhalaebooks.com

"ඉතින්"

"ඔයා නිදාගෙන වගේ හිටියට....."

"මං නිදාගෙන තමයි හිටියෙ......"

"එහෙනං ඔයා සේරම කරන්න ඇත්තෙ හීනෙන්."

"මට තේරෙන්නෙ නෑ අනෝමා"

"මං කිව්වෙ... ඔයා තොත්ත බබා...."

ඇය මේ දොඩවන්නේ විකල්ලෙන්ද? එසේත් නැත්නම් උණ විකාරයෙන් මා විකල්ලෙන් හැසිරුණාද? ඇය පවසන දෙයෙහි සත්‍යයක් තිබිය නොහැකිද? එදා රාත්‍රියේ මා අවදිවන විට අඳුරු කාමරයේ බලා සිටියේ ඇයයි. මෙයට පෙරාතුව සිහිනයෙන් කෙනෙක් මගේ සිරුර මත හිඳගන්නවා මට මතකය. නමුත් මෙදා මා අවදිවූයේ තෙත් මත් ගතියකිනි. එය එසේ සිදුවිය හැකිද?

"මං දැනුවත්ව නම් මං එහෙම දෙයක් කෙරුවෙ නැහැ අනෝමා."

"නෑ නෑ මමයි වරදකාරී..... ඔයාට ආදරේ වැඩිකමට" නී ඈ යළිත් කඳුළු වගුරුවන්නට වුණාය.

"ඉතිං ඔයා මට මොනවද කරන්න කියන්නෙ?"

"මාව අතරමං කරන්න එපා ජනක."

"මං හිතලා නං එහෙම දෙයක් කරල නෑ අනෝමා. මේක හරිම හීනයක්."

"ඔව්, ඒ වෙලාවෙ ඔයා මේක දකින්න ඇත්තේ හීනයක් විදියට නේ? ඒත් මට දැන් වෙන්නෙ......" ඇගේ හැඬුමට වදන් යටපත් විය.

"ඔයා දන්නවනෙ අනෝමා. මං බඳින්න හිතාගත්තු කෙනෙක් ඉන්නවා. ඉතිං......"

"ඉතිං ඔයා එයාටත් මෙහෙමද සලකන්නෙ?"

"තුන් හිතකින්වත් මං කාටවත් වැරදියට සලකලා නැහැ අනෝමා...."

"මිනිහෙකුගෙ ආසාව පිරිච්ච ඔලුවට හිතක් පපුවක් නෑ කියනවනෙ."

"මට ඔය මොනවත් මතක නෑ අනෝමා." මට ද දැන් කතා කිරීම අපහසු විය.



Downloaded from sinhalaebooks.com

"ඔයාට කියල හිටින්නයි මං හිතුවෙ. ඔයා කැමති නැත්තං මං ඉතින් වෙන මාර්ගයක් හොයා ගන්න ඕනෑ"

"මොනවද වෙන මාර්ග?"

"වෙන මාර්ග තියෙනවා ජනක."

"මෝඩ වැඩ කරන්න එපා අනෝමා"

"මෝඩ වැඩේ වෙලා ඉවරයි ජනක." කී ඈ ගල් තලාවෙන් නැගිට යළි පාර අතට නගින්නට වූණාය. "මං බලාගන්නංකො මගෙ ජීවිතේ" ආපසු හැරී බැලූ ඈ කීවාය.

මම මඳ වෙලාවක් අන්දුන් කුන්දුන්ව ගඟ දිය දෙස බලා සිටියෙමි. ගස් අතු අතරින් පෙරී ආ හිරු එළිය රිදී කාසි මෙන් ගඟ දිය මත වැටී දිලිසුණි. ඒ සියලු මායාවේ මමද කොටසක් වුණෙමි. මට මේ කිසිවක් අදහාගත නොහැකි විය. ඈ දැන් පැමිණිලි කළේ මා වරදකාරයා ලෙසිනි. මගේ ඇඟට ගොඩවූයේ ඇයයි. ඒ රාත්‍රියේ අඳුරේ මා උණ විකාරයෙන් සිටියදී මා සිරුර රත් යවටක්ව තිබියදී ඈ සැබවින්ම මගේ ඇඟට ගොඩවුණාද?

ව්‍යාකුලවූ මනසින් මම බෑවුම නැඟ පාරට ආවෙමි. අනෝමා පෙනෙන අසලක නොවීය. වැටුණ තැනින් බයිසිකලය අහුලාගත් මම නවාතැන අතට පය ඉක්මන් කළෙමි. අනෝමාගේ නවාතැන ළඟදී මම වඩාත් වේගයකින් පාපැදිය පැගුවෙමි. කුඹියන් කැලේට ළංවෙද්දී මා සිටියේ හති හලමිනි. එතැන පාර අද්දර නීලම්මා බලා සිටියාය.

ඈ දැතින්ම ඇගේ සුරතල් බල්ලා වඩා තුරුළු කරගෙනය සිටියේ. මා දකින්ම ඈ "ආං මාතියා" කියා සිනාසුණාය. හිතේ කහටක් නැති බව පෙන්වන්නටදෝ ඈ කහට බැඳි දත් දෙක තුන පෙන්වූවාය.

"නීලම්මා මෙහේද දැන්?"

"අපි කන්දේ උඩ මාතියා" ඈ කුඹියන් කැලේ අතට ගෙල දිගු කළාය.

"කොහොමද කරුපන්?"

"නයි නටවන්න ගියා මාතියා."

"නීලම්මා දන්නවනෙ. මමත් මෙහේ නැවතිලා ඉන්නවා විතරයි." මා එසේ කීවේ මගේ නිදොස් බව ඇයට වටහා දෙන්නට මෙනි.



Downloaded from sinhalaebooks.com

"මාතියා?" මා කී දෙය තේරුම් නොගත් ඈ ප්‍රශ්නාර්ථයෙන් කීවාය.

"මං කිව්වෙ මං ඒ ගෙදර කෙනෙක් නෙමේ මං බෝඩිං කාරයෙක්"

"ආ හරි හරි මං දන්නවා මාතියා – සේරම හරි මාතියා."

"මං යනවා නිලම්මා" කියා මම යළිත් බයිසිකලය තල්ලු කරන්නට වුණෙමි.

නිලම්මා දරණ ගැසූ සුදු කෙස් කැරලි හිස වටා විහිදා බලා සිටියාය. ඇය කුඹියත් කැලේ අවතාරවලට බය නැද්දැයි අසන්නට මට සිත්විය. එහෙත් අමරසිරි බංඩාර කීවා සේ අවතාර ඇත්නම් ඒවා නිලම්මාගේ මුහුණට බය වෙතැයි සිතී මට යන්තම් සිනා නැගිණි.

මා ගෙදරට ළං වෙන විට අඳුර ගලලාය. අමරසිරි බණ්ඩාර මා එන තෙක් නොඉවසිල්ලෙන් ඉස්තෝප්පුවේ බලා සිටියේය.

"මං හිතුව අද අයියට මොකද වුණේ කියලා."

"ඩිංගක් පරක්කු වුණා මල්ලි – වැඩ."

"ඕව ටයිම්?"

"එච්චරම ඕවටයිම් එකකුත් නෙමෙයි." හැබැවින්ම සිදුවූ දෙය කෙසේ නම් හෙළිකරන්නද?

"කොහොමද අනෝමා එහෙම?"

"වරදක් නෑ" කියමින් මම බයිසිකලය කාමරය ඇතුළට ගන්නට ගියෙමි.

"අයියෙ බයිසිකලේ දෙනවද? ටිකකට?"

මම වදනකුදු නොදොඩා පාපැදිය ඔහු අතට පෑවෙමි. ඉස්තෝප්පුවේදීම එයට නැඟගත් අමරසිරි බංඩාර තව මොහොතකින් කුරුල්ලෙකු සේ පාර අතට ඉගිලුණේය. කොයිතරම් බරක් පතලක් නැති සැහැල්ලු ජීවිතයක්දැයි මට සිතුණි. අමරසිරි බංඩාර හෙටක් ගැන සිතන කෙනෙක් නොවේ. මා ගෙදර එන විටත් ඔහු හොඳින් හැඳ පැළඳ සිටියේ මගේ බයිසිකලය ගෙන සවාරි යාමටයි. ඔහු හන්දිය අතට නොපෙනී යත්ම මම කාමරයට වැදී ඇඳුම් අහවර කොට සරමට බැස්සෙමි.

"අයියා!" දොරකඩ සිටියේ නයනා ය.



Downloaded from sinhalaebooks.com

"ආ නංගී"

"අයියා මොකද අද දාහට අරන් සීයයට දුන්නා වගේ?"

"එහෙම තමයි නංගී බැංකුවල වැඩ කරන කොට." මගේ කල්පනාකාරී බව ඇයටත් දැනුණා වන්නට ඇත. මම සිනාසුණෙමි. "බැංකුවල අපි හැමදාමත් දාහක් දෙනවා – සීයක් ගන්නවා"

"අයියට තේ ගේන්නං"

"මං මූණ සෝදල එන්නංකො නංගී."

වජිරා මට වතුර අදින්නට ලැහැස්ති වුණද මම ඇයව වළකා වතුර ඇද ගත්තෙමි. වෙනදාට වඩා වැඩි වේලාවක් මා ඇල්වතුරෙන් මුහුණ සේදුවේ මනස පැහැදිලි කරගන්නට මෙනි. එහෙත් එය තාවකාලික සුවයක්ම පමණක් විය.

නයනා ගෙනැවුත් දුන් තේ කෝප්පය තොල ගාමින් මම අඳුරු ඉස්තෝප්පුවේ හිඳ සිටියෙමි. මගේ කල්පනාකාරී බව දැනීදෝ නයනා වදනක් දෙකක් දොඩා ගෙට ගියාය. මටත් නොදැනීම මා නොසිතාම අනෝමාට අවනත වූ හැටි මම මෙනෙහි කළෙමි. එය සිදුවිය හැකිද? වෙනදා සිහිනයෙන් අත් විඳි දෙයක්, මා උණ විකාරයෙන් සැබවින්ම ඇය හා අත්දුටුවාද? එසේ වුණා නම්, එය මා රස විඳි සන්තෘප්ත වූ අවස්ථාවක් නම් නොවීය. දැන් ඈ පිළිසිඳ ගත්තේ මගේ දරුවා යැයි චෝදනාවක් නඟයි. ඈ මෙසේ කරන්නේ රුවිනීගේත් – මගේත් සිත් බිඳවා මාව අයත් කරගන්නටද? බටහිර රටවල්වල නම් දරුවාගේ සැබෑ දෙමාපියන් කවුදැයි විසඳන්නට ජානික පර්යේෂණ වෙයි. ඒවායේදී දෙමාපියන්ගේ සෛල කීපයක් පරීක්ෂා කිරීමෙන්ම සැබෑ දෙමාපියන් කවුරුදැයි තීරණය කළ හැකි වෙයි. මෙවැනි ඩී.එන්.ඒ පරීක්ෂණ අපට කොයින්ද? එහෙත් මගේම ලේ වර්ගය බැරිවෙලාවත් උපදින දරුවා වෙත තිබුණොත් මා රුවිනීට මුහුණ දෙන්නේ කෙසේද? මා මෙතරම් දුර බැහැර දුක් විඳගෙන ආවේ මෙවන් ව්‍යාකූල අත්දැකීමකට මුහුණ දෙන්නද?

මා අතින්, මා ගතින් අනෝමාට එවන් දෙයක් සිදුවුණා නම් එය කොතෙක් කල් ලෝකයාගෙන් සඟවා සිටින්නද? ඇගේ ගැබ මෝරද්දී සියල්ල හෙළිවන්නේය. එයට කලින් යමක් සිදුවිය යුතුය. මා ඇයට අවනත විය යුතුද? මාරුවක් අරගන්නට බැරි නම්, රැකියාව අතහැරදා හෝ මා කාටවත් නොපෙනෙන අහකට යා යුතුය.



Downloaded from sinhalaebooks.com

ඉස්පසුව මා රැවිනීට, අම්මාට, අක්කාට මුහුණ දෙන්නේ කොහොමද? මා අලුත් රැකියාවක් සොයාගන්නේ කෙසේද? හැම ගැහැනියකම මා දෙස සැකයකින් බලන්නට වේවි.

තේ කෝප්පය තොල ගෑවද මට එහි රසයක් නම් නොදැනිණි.

මා කොතෙක් වේලා එසේ සිටියාදැයි නොදනිමි. සාලයේ බිත්ති ඔරලෝසුවේ වේලාව වැදුනත් මට එය පසුබිමින් ඇසුණේ යන්තමිනි.

නයනා චිමිනි ලාම්පුව ගෙනැවිත් ඉස්තෝප්පුවේ වීපෝව මත තබා "පාඩම් කරන්නට" කියමින් ගෙට ගියාය.

නව මඳකින්, බයිසිකලය තල්ලු කරගෙන කඳුගැටය නගින අමරසිරි බණ්ඩාර දෘශ්‍යමාන විය. ඔහු හති හලන හඬ මට ඇත තියාම ඇසිණි. ඉස්තෝප්පුවට ගොඩවූ ඔහු බයිසිකලය කොට තාප්පයට හේත්තු කරන්නට තැත් කළේ හදිසියකිනි. මේ කලබලයේදී බයිසිකලය හඬ නගා ගෙන වැටුණි.

"මොකද මල්ලි මේ?" යැයි මා අසද්දී ඔහුගේ මුහුණ පුරා රැඳී ඩා බිඳු ලාම්පු එළියෙන් පැහැදිලි විය.

ඔහු කතා බහෙන් තොරවම බියගත් දෑසින් මගේ කාමරයට වැදුණේය. මම බයිසිකලය අහුලාගෙන තල්ලුකරගෙන ඔහු අනුව ගියෙමි. ඇඳ කෙළවර හිඳගත් ඔහු බයිසිකලය දෙස හෙළුවේ බියගත් බැල්මකි. මම සීරුවෙන් බයිසිකලය බිත්තියට හේත්තු කෙරුවෙමි.

"මල්ලි මේ ඔයා ඔය විදියට බයිසිකල් එක අතාරිනව නං ආයෙ ගෙනියන්න එපා හොඳේ."

"ආයෙනං මං ඕක පදින්නෙ නෑ අයියෙ දෙයියම්පා." කී ඔහු කල්පනාවක වැටුණේය.

මම ඉස්තෝප්පුවෙන් චිමිනි ලාම්පුව ගෙන ආවෙමි. ඔහුගේ බියගත් මුහුණ වඩාත් පැහැදිලි වූයේ මෙවිටයි.

"මොකද මල්ලි මේ?"

ඔහු නිහඬ විය.

"කියන්නකො මල්ලි මොකද වුණේ?" කියමින් මම ඔහු අසල හිඳ ගත්තෙමි.

දෑත දෙකලව අතර රඳවාගෙන ඇඟ උන්ඩි කරගත් අමරසිරි බණ්ඩාර, විලුම් ඇඳ මතට ගෙන එයින් තල්ලු වෙමින් බිත්තියට හේත්තුවී ඇඳ ඉහළ කවුළුවෙන් බැලුවේ බියගත් දෑසිනි.



Downloaded from sinhalaebooks.com

"කියන්නකො මල්ලි මොකද උණේ"

"හරි වැඩක් නෙ වුණෙ අයියා" ඔහුගේ කටහඬ වෙව්ලුවේය.

"කියන්නකො ඉතින්?"

"මං කුඹියන් කැලේ පහුකළා විතරයි බයිසිකලේට මං නැග්ගා. එක පාරටම කන්ද පැත්තෙන් මොකෙද්ද මන්දා වළාකුලක් වගේ සුදුවට පාත්වුණා. හරියට මීදුමක් වගේ..... හරියටම.... බයිසිකලේ හැන්ඩලේ උඩ ඉඳගත්තා. මං බයටම තවත් හයියෙන් පැගුවා. මේක අහකට යාවි කියලා. මගේ අත් දෙක හැන්ඩලේ බැඳලා අල්ලාගත්තා. ඒ වෙලාවෙ මං දරදඬු උණා. බයිසිකලේ ඉස්සරහටම ගියා. අර මීදුමක් වගේ වලාකුළේ මහා භයානක මූණක් මැවුණා. ඊට පස්සේ හුළඟේම මට ඇහුණා කටහඬක් – "මේක – මගේ– මේක මගේ කිව්වා."

"මේක මගේ?"

"ඔව් මේක මගේ කිව්වා."

"මේක මගේ " මෙයට පෙරත් මා එයම ඇසුවා නේද? ඒ වතාවේ එය ඇසුණේ ආවේසවී සිටි වජිරාගේ මුවිනි. ඈ දෙඩවූ සියළු දෙයින්ම මට පැහැදිලිව ඇසුණේ ඒ වදන් පමණි.

"බයිසිකලේ අයිතිකාරයා වෙන්නැති."

"අනේ මන්දා අයියේ ඕක ගත්තු තැනකට ආපහු දෙන්න. ළඟ නං තියාගන්න එපා...."

"මේක මං ගත්තෙ ඇඩ්ඩින් අයියා කියල එක්කෙනෙකු ගෙන්."

"කවුරු හරි කමක් නෑ අයියා ගිහින් අහන්න මේක කොහෙන්ද හොයාගත්තෙ කියලා. අයියා වුනත් මේකෙ හෙට යන්න එපා."

"නොයා පුළුවන්ද මල්ලි? වැඩට යන්න එන්න කියලනෙ මේක ගත්තෙ. මීට කලින් කවදාවත් මට මේකෙන් මෙහෙම දෙයක් වෙලා නැනෙ."

"අනේ මන්දා අයියට ඕනෑ දෙයක්. අයියමනෙ කිව්වෙ සැරින් සැරේ ඕකෙ බෙල් එක ඉබේ වදිනව කියලා."

"මං හිතන්නෙ මල්ලි මේ හරියට බිත්තියට හේත්තු කරල නොතිබ්බම ඒක ඉබේම එහා මෙහා වෙනවා, හේත්තු වෙනකල් හරියට. එතකොට බෙල් එක සද්ද වෙනවා."



Downloaded from sinhalaebooks.com

"අයියා හැම එකටම හේතු හොයනවා. ඒක හොඳයි. මං නං හිතන්නෙ මේක අර අහිගුණ්ටිකයන්ගෙ සෙප්පඩ විජ්ජාවක්. උන් නාම කුඹියන් කැලේ පැල් බැඳගෙන ඉන්නවා. මං එනවා දැකල මොකක් හරි මවල එවන්නැති එහෙනං."

"ඒක මං දන්නෙ නෑ. මං අදත් වැඩ ඇරිල එනකොට ඒ ගෑනිව දැක්කා එතන පල්ලෙහා ඉන්නවා මා එක්ක නං කතාත් කළා."

"මං කිව්වෙ අයියට හැමෝවම විස්වාසයි ඉතින්."

"මට ඒ ගොල්ලන්ගෙන් වැරැද්දක් උනේ නෑ."

"මොකද නැත්තෙ අයියා. අයියට උණ ගත්තෙ ඇයි?"

මා වෙත පිළිතුරක් නොවිය. පිළිතුරක් තිබුණත් එය හෙළි කරන්නට මා සිත මැළි විය.

"මා දන්නව අයියෙ ඒ ගෑනි අර බෝදිලිමව මවල එව්වා මතකද? එදා පාන්දර අපි සොහොනෙ ඉඳලා එනකොට. මමත් දැක්කා අයියෙ කුඹියන් කැලේ පැත්තෙ මූකලානෙ."

"ඒ කටුස්සෙක්නෙ මල්ලි."

"මොකා හරි අයියා බය වුණා. අයියට උණ ගත්තා."

"දෙකේ සම්බන්ධයක් නොතියෙන්නත් පුළුවන්."

"වෙන්න පුළුවන් අයියා. ඒ උනාට මටත් සැරයක් උණ ගත්තා ඔය කැලේදි හොල්මන දැකලා – මතකයිනෙ?"

"ඒ සැරේ මං බය වුනාට උණ ගත්තෙ නැහැනෙ මල්ලි."

"ඒක තමයි ඒ සැරේ මට උණ ගත්තා. මේ සැරේ අයියට උණ ගත්තා."

"ඒ උණාට මල්ලි ඒ කටුසු අවතාරෙ මැව්වෙ නීලම්මා කියලා අපි සැක කරන්න නරකයි."

"මං නං උන්ව විස්වාස කරන්නෙ නෑ අයියෙ එච්චරයි." කී අමරසිරි බංඩාර ඇඳෙන් නැගිට්ටේය. "මං අයිය නං අද හෙටම ඔය බයිසිකලේ ආපහු දීලා දානවා. ඕකෙ සාපයක් තියෙනවා අයියෙ."

ඒ කතාවට මට සිනා ගියේය. එහෙත් කොතැනක හෝ සාපයක් වූ බව මා දැනගත්තේ පසුවදා ය.



Downloaded from sinhalaebooks.com

# 20

පසුදා පුරුදු පරිදි මම බයිසිකලයේ නැඟී වැඩට ගියෙමි. පුරුදු පරිදි නයනා මා හා බයිසිකලයේ නැඟී ආවාය. පාසල ළඟින් බැස අත වනා වෙන්වී ගියාය.

කාර්යාලයේදී අනෝමාට මුහුණ දෙන්නේ කෙසේද යන චකිතය මා තුළ විය. වෙනදා මට කලින් වැඩට ඇවිත් බලා සිටින අනෝමා අද එතැන නොවීය.

දොරකඩ මැළවුන මුහුණින් බලා සිටි ටිකිරි බංඩා "හරි වැඩේනෙ ඊයේ රෑ උණේ මහත්තය"යි ශෝකී ස්වරයකින් කීවේය.

"මොකද ටිකිරි බංඩා?"

"අපේ අනෝමා නෝනා..මැරුණනෙ" කී ඔහු ඉකි බිඳින්නට වුණේය.

"නෑ! ඒ කොහොමද?" මට දෙකන් අදහාගත නොහැකි විය. ඊයේ සවස මා හා දොඩා – උරණව ගිය ඇයට කුමක් නම් සිදුවීද?

"දන්නෙ නෑ මහත්තයා සමහරු කියන්නෙ විසක් කැවිලා කියලා. ඊයේ රාත්තිරියෙ බඩරුදාව හැදිල තියෙන්නේ. කෑ ගහ ගහා පෙරළි කළාලු. රෑම නුවර ඉස්පිරිතාලෙට ගෙනිහුං එහේදි තමයි මැරිල තියෙන්නෙ."

"නෑ" අඩපණව කාර්යාලයට ගිය මම මේසය අසල හිඳ ගත්තෙමි.

Downloaded from sinhalaebooks.com

කුමක් සිදුවන්නට ඇද්ද? මට සිතා ගත නොහැකි විය. ඇය වසක් විසක් බොන්නට ඇත්තේ මා නිසාද? මා කොයි තරම් පාපියෙක්ද? ඇත්තෙන්ම වරද සිදුවුයේ මගෙන්ද? ඈ දිවි නසා ගත්තා නම් ඒ මා නිසාද?

"ජීවිතේ කියන එක ඔහොම තමයි නේද මහත්තයා. කොයි වෙලාවෙද කියල නැහැනෙ" මේසය ළඟට ආ ටිකිරිබංඩා දුකෙන් කීවේය.

"මට නං විස්වාස කරන්න බෑ ටිකිරි බංඩා. ඊයෙ මේ හොඳට හිටපු එක්කෙනා."

"අපිත් කොයි මොහොතෙද කියන්නෙ කොහොමද මහත්තයා?"

කිසිවක් සිතන්නට කරන්නට තරම් ශක්තියක් මා තුළ නොවීය. නව මඳ වේලාවකින් සිරි මාව කාමරයට කැඳවීය. අනෝමා රෝහලේදී මියගිය පුවත ඔහුද දන්නා හැටියෙන් කීවේය. "අනිද්දලු ෆියුනරල් එක. බ්‍රහස්පතින්දා අපි හැමෝටම පුළුවන්නං යන්න තියෙන්නෙ. ඒත් මෙතන වැඩ ඉවර කරල ඉන්න එපැයි. අපි සේරටම වෑන් එකක් අරන් යනැකි."

"ඒක තමා කරන්න තියෙන්නෙ. මිස්ට ජයතුංග, මට නං මේක ඇහුවට පස්සෙ මොනවත් කරන්න හිතෙන්නෙ නැහැ."

" මට තේරෙනවා ජනක. අනෝමාට ටිකක් ජනක කිට්ටුත් වුණානෙ."

මම ගොළු වුණෙමි.

"ජනක ලීව් එකක් දාලා යන්න. අනිද්දට අපි එක්ක යන්න එන්න."

චිත්‍රාත් – අතුලත් දොරකඩින් එද්දී මම එතැනින් පිටවුණෙමි. ආරංචිය ලද ඔවුන්ගේ මුහුණුවලද වූයේ අපරිමිත ශෝකයකි. චිත්‍රාගේ දෑස්වලට කඳුළු පුරවා ආවේය.

"අනේ මගේම නංගි වගේ හිටි කෙල්ල" යැයි ඈ ඉකිබිඳින්නට වුණාය.

"එක එක කතා කියනව එක එක්කෙනා." අතුල කීවේය. "මං හිතන්නෙ නෑ අනෝමා වස බොන ජාතියෙ කෙනෙක් කියලා."

ඒ ඔස්සේ කතා නොකර මම ඔවුන්ගෙන් සමුගත්තෙමි.



Downloaded from sinhalaebooks.com

බයිසිකලයට නැගුණු මට කොහේ යන්නද, කුමක් කරන්න දැයි තේරුමක් නොවීය. කඩයෙන් තේ එකක් බිව් මම මුදලාලිගේ ප්‍රශ්නවලට කෙටියෙන් පිළිතුරු දුන්නෙමි. අනෝමා දිවිනසා ගත් බවය ඔහු අසා තිබුණේ.

"මං නං හරියටම දන්නෙ නෑ" කියා මම එතැනින් පිටවුණෙමි.

මා ගං දිය අසලට ඇදී ගියේ නොදැනීමය. බයිසිකලය පාර අද්දර ගසකට හේත්තු කළ මම බෑවුම බැස ගල් තලාවට ගියෙමි. ගංදිය පෙර පරිදිම බොර පාටින් ගලා බැස්සාය. හිරු එළිය ගස් අතු අතරින් පෙරී අවුත් ළපලු මැවීය. ඊයේ හවස මාත් අනෝමාත් සිටියේ මෙතැනය. ඈ කී හැමදෙයක්ම මට මතකේ රඳවා ගත නොහැකි වුවද ඈ සිත තුළ වූ කෝපය ද, වේදනාව ද මට දැනෙන්නට විය. ඈ සියල්ල කළේ මගෙන් පලිගන්නද? මට රිදවන්නද? දැනුවත්ව නම් මම ඇයට වරදක් නොකළෙමි. ඈ මගේ "ඇඟට ගොඩවුණේ" ඇගේම වුවමනාවට නොවේද?

මගේ හදවත මහා බරක් විය. පෙරළි කරමින් ඇදෙන ගංදියේ බොරපැහැය මෙන්ම මගේ අභ්‍යන්තරය ද මඩ වගුරක් විය. සියල්ල හරි හැටිම දැනගන්නා තුරු සිතට සහනයක් නම් නොවීය.

මා පාරට එනවිට අහසේ වලාකුළු ගොනුවන්නට විය. නවාතැනට යන්නට කලින් අනෝමාගේ නවාතැන වූ කරුණානායක ගෙදරට ගොස් විමසා බලන්නට මට සිත් විය.

ඒ අවට පාළු විය. මම වසා තිබූ දොරට තට්ටු කළෙමි. දිග මල් මල් ගවුමක් හැඳගත් පාලිකා දොර හැරියාය.

"ආ... මේ.... ජනක නේද?"

"ඔව් මං ආවෙ....මේ...."

"දන්නවනෙ අපේ අනෝමට වෙච්ච හදිය."

ඇගේ දෙනෙත්වලට කඳුළු පිරුණි. "කොච්චර හිනාවෙලා සන්තෝසෙන් හිටි ළමයෙක්ද?"

"මොකද්ද උණේ මිසිස් කරුණානායක?"

"අනේ මන්දා ඊයේ ආව විතරයි. හැරිච්ච අතට ගෙයින් ගියා. මං හිතුවෙ එහේ ජනකලගෙ දිහා ගියා කියල. නිතර ඒ පැත්තෙ යනවනෙ?"



Downloaded from sinhalaebooks.com

"නිතර නං නොවෙයි ඉතින්...." කියත්ම පාලිකාගේ දෙනෙතේ අවිශ්වාසය සටහන් විය.

"අනේ මන්දා කොහොම හරි වෙනද වගේ ඒ පැත්තට ඇවිදන් ගියා. පැයකින් විතර ආපහු ආවා. රට කැවෙන් නෑ. ඒළහට බඩ රිදෙනවා කියලා ඇඳේ පෙරළෙන්න වුණා. නන්දසේන ඒ වෙලාවෙම නුවර එක්කන් ගියා."

"කෝ මිස්ට කරුණානායක?"

"එයා තවම නුවර"

"හරියටම මොකද්ද වුණේ කියල කිව්වද?"

"හෙට තමයි හරියටම දැනගන්න වෙන්නෙ අද කපල බලාවි."

"මං එහෙනං යනවා මිසිස් කරුණානායක."

"හොඳයි ජනක. අනේ අනෝමා කොච්චරවත් ජනක ගැන කියනවා. එදත් ජනකගෙ නම කිව්වා."

ඇගෙන් වැඩි විස්තර අසන්නට තරම් මගේ සිත ප්‍රබල නොවීය. අනෝමා මගේ නම කීවේ තරහකින්ද? ආදරයකින්ද? ව්‍යාකූල වූ සිතුවිල්ලෙන්ද? මට පිළිතුරක් නොවීය.

මා නවාතැනට ළං වෙන විට පොද වැසි වැටෙන්නට විය.

"අයියා යන්නං වැස්සට කලින් ආවා"යි අමරසිරි බංඩාර ඉස්තෝප්පුවේ හිඳ කීවේය. "මොකද මේ හදිස්සියෙ?" කියමින් ඔහු නැගිට්ටේය.

අනෝමාගේ මරණය මම හෙළි කළෙමි. අමරසිරි බංඩාර අඩපණව යළිත් පුටුව මත ඇද වැටුණේය. "අනේ අයියා...කොහොම විස්වාස කරන්නද අයියා?"

"වෙලා ඉවරයි මල්ලි. සේරම වෙලා ඉවරයි."

අමරසිරි බංඩාර ආරංචිය දෙන්නට ගෙට දුවගියේය. තව මඳකින් ලීලාවතී මැණිකේත් වජිරාත් තොරතුරු අසන්නට ආවෝය. අමරසිරි බංඩාර පේන අහලක නොවීය. මම දන්නා හැටියෙන් සියල්ල යළිත් කියා දැම්මෙමි.

වජිරා හඬන්නට වුණාය.



Downloaded from sinhalaebooks.com

ලීලාවතී මැණිකේ ද "අනිච්චං අනිච්චං" කියමින් ගෙතුළට ඇදුණාය.

මම කාමරයට වැදී ඇඳෙහි ඇල වුණෙමි. වැහි පොද එක දෙක වැටෙන්නට විය. මිදුලේ පොල් කිච්චෝ හැඬූහ. අහසත් හඬන්නේ යැයි මට සිතිණි. පසුගිය කාලයේ නොයෙකුත් සිදුවීම් සිතුවම් පට සේ මට මැවී පෙනෙන්නට විය. අනෝමා වදයක් යැයි මා සිතූ සිතුවිල්ල වෙනුවට දැන් වූයේ දැඩි වේදනා බර අනුකම්පාකි. වැස්සේ හඬට කන් දෙමින් මම කොට්ටයට මුහුණ ඔබා ගත්තෙමි.

දහවල. ගෙදර විත් ආරංචිය ඇසූ නයනා ද හඬන්නට වුණාය. හැමදෙනාමත් අවමඟුලට නුවර යන්නට ඕනෑ බව කීවෙන් වැන් රථයේ ඉඩ ඇද්දැයි හෙට දින අසා දැනගන්නට මම පොරොන්දු වුණෙමි.

වැන් රථයෙහි ඉඩ තිබිණි.

බ්‍රහස්පතින්දා දවල් ගෙදර උදවිය ද කාර්යාලයේ කිප දෙනා ද සමග මම නුවර ගියෙමි. ගලහ පාරේ වූ අනෝමලාගේ ගෙදර අවට සැහෙන සෙනඟක් රැස්වී සිටියහ. මඟ දිගට ගොක් කොළයෙන් ද, සුදු කොඩියෙන් ද සැරසිණි. ගෙතුළින් අඳෝනා හඬ වරින් වර ඇසිණි. සග්‍රිකත්වය කියා පෑ ගෙය තුළ ආලෝක දැල්වුණ ද, අවට වූයේ මූසල ගතියකි. ඇගේ සුදු පෙරවූ සිරුර දෙස බැලූ මට, ඒ මුහුණ හඳුනාගන්නට පවා නොහැකි විය. වෙනදා හිනැහී සුදුවට පෙනුණ වුවන අද අළු පැහැයක් විය. දෙතොල වේදනාවකින් පියැවිලාය. දෙනෙත ද එසේමය.

මම මඳ වේලාවක් ඇය දෙස බලා සිටියෙමි. මේ මා හා දෙඩූ, මගේ අතින් අල්ලා ගිය කෙල්ලමද? කෝ ඇගේ සිනහ? කෝ ඇගේ දහකාර සිතුවිලි?

මිදුලට ආ මට කිප දෙනාගේ කසු කුසු හඬ ඇසිණි.

මට සියල්ල වටහා ගන්නට තවත් හෝරා කිපයක් ගත විය.



Downloaded from sinhalaebooks.com

# 21

සුසාන භූමියෙන් පිටත් වන්නට අප වෑන් රියට නගින විට යළි කුඩා පොද වැස්සක් ඇරඹිණි. අප හබරවැවට ළං වෙන විට එය ධාරාණිපාතයක් ම විය.

කවුළුවකට ළංව හිඳ සිටි නයනා ඇගේ හිස මගේ උරහිස මත රඳවා ගත්තාය. ඇගේ ශෝකය තිහඬ බවින්ම පැහැදිලි විය. ඇත්තෙන්ම දොඩන්නට තරම් ශක්තියක් අප කිසිවකුත් තුළ නොවීය.

සිදුවූයේ කුමක්ද? කෙසේද? යන්න මට තවමත් ප්‍රහේලිකාවක් විය. කිසිවකු වෙත එයට පිළිතුරක් ද නොවීය. මග දිගට මගීන් බැස්ස පසු වෑන් රියේ ඉතිරිවූයේ ලීලාවතී මැණිකෙගේ ගෙදර උදවියත්, මාත් පමණි. රියේ වීදුරු කවුළු ඔස්සේ කඳුළු සේ බේරෙන වැහි බිංදු අතරින් පෙනුණේ පිටත ලෝකයේ අඳුරම පමණි.

අප කිල්ලට හසුවී ඇති නිසා නාගෙනම ගෙට යමු යැයි ලීලාවතී මැණිකේ රියෙන් බසිද්දී කීවාය. මේ හෙයින් අපි පිලේදීම දිය රෙදි හැඳගෙන වැස්සේම ළිඳ වෙතට ගියෙමු. මෙසේ වැස්සයට නාද්දී සියලු වස් දොස් සේදී යන ගතියක් මට දැනුණි. අනෝමාගේ මරණයේ බර තවමත් මා සිතට වද දුන්නද, මා දැනුවත්ව නම් වරදක් නොකළේය – යන හැඟුම මෙසේ වැස්සේ තෙමෙමින් සිටියදී මා තුළ ඇති විය. සීතලේ වෙව්ලමින් පිලට ආ මට වජිරා තුවායක්

Downloaded from sinhalaebooks.com

"නයනා!"

මේ මහ රෑ නයනා කුමක් කරන්නේද? දනින් පහළට වැටෙන ළා රෝස පැහැ රෑ ගවුමක් හැඳ සිටි ඈ දෑත් විහිදා වටයක් සෙමින් කැරකී නැටුමක් පෑවාය. අනතුරුව මිදුලට දිව්වාය.

මමද සරම් ගැටය තද කර ගනිමින් ඉස්තෝප්පුවට ගියෙමි. සඳ එළියේ ඈ තවත් වටයක් කැරකුණාය.

මම ඈයට ළං වෙමින් "නංගියි" ඇමතුවෙමි.

මා දෙස බලා සිනාසුණු ඈ "අයියා මා එක්ක එනවද යන්නැයි" රහස් හඬකින් ඇසුවාය.

"කොහේද?"

"එන්නකෝ පෙන්නන්න"

"මොනවද?"

"යංකො කියන්න" කී ඈ පාර අතට දුවන්නට වුණාය.

මම ද අන්දුන් කුන්දුන්ව ඇය අනුව දුව ගියෙමි.

පාර ළඟට ආ ඈ නැවතී ආපසු හැරී බලා මට එන්නැයි කියන්නට මෙන් අතැඟිල්ලෙන් සන් කළාය.

"එන්නකො අයියා කියන්න"

"නවතින්න නංගි මේ" මා කියත්ම ඈ යළිත් දුවන්නට වුණාය. ඈ දිව්වේ හන්දිය අතටයි ඇයට අනතුරක් වෙතැයි සිතමින් මමද ඇය අනුව දුවන්නට වුණෙමි.

තවත් මදක් තැන් ගිය ඈ යළිත් නැවතී හැරී මා දෙස බලා "හිකි හිකි" ගා හිනැහුණාය.

"නංගී මේ සෙල්ලමක් නෙමෙයි යමු ගෙදර" මම ළංවෙමින් කියත්ම ඈ යළිත් ඉදිරියට දුවන්නට වුණාය.

මෙසේ වරින් වර නැවතෙමින් අපි කුඹියන් කැලේටම ආවෙමු.

කිසිදු වෙහෙසකින් තොරව නයනා මානා පඳුරු පීරමින් කඳු ගැටය නැංගේ පළපුරුදුකාරියක විලසිනි. මම ද හති හලමින් කන්ද නැග්ගෙමි. වැස්සෙහි තෙතමනය මේ හැම තැනම විය. එහෙත් මට වඩා ළා බාලවූ නයනා මෙසේ නොබියව දුවද්දී මා බිය ගන්නේ කුමටද?



Downloaded from sinhalaebooks.com

කුඹියන් කැලේ යෝධ අඳුරු ගසක් යට ඇ නතර වුණාය. මෙතැන බිම ළා තණපතින් පමණක් සැදුම් ලද්දකි. ගස් මුල් විසාල දැඩි පිඹුරන් සේ අවට ඇදී වැතිරුණි. මේ මුලක් මත හිඳගත් නයනා. "අයියත් ඉඳගන්නකො" යි පහත් හඬින් කීවාය.

මම ඇය ළඟින් හිඳ ගත්තෙමි.

"ඉතින් කියන්නකො නංගි ඇයි මේ?"

"අයියට කියන්න රහසක්. මං නයනා"

"මං දන්නවා ඔයා නයනා විත්තිය."

"නයනා කවුද දන්නවද?"

"ඔව් නයනා ලීලාවතී මැණිකෙගෙ පුංචි දුව"

"නෑ නයනාව අරන් හදාගත්තා. නයනගෙ අම්මා තමා සිසිලින්. නයනගෙ තාත්තා තමා බක්කා." කී ඇ යළිත් හිකි හිකි ගෑවාය.

"නංගි මොනවද මේ කියවන්නෙ?"

"මේ ඇත්තයි. නයනා කියන්නෙ ඇත්තයි. සිසිලින් ඊළඟ බබා ලැබෙන්න ගිහින් මැරුණාම ලීලාවතී මැණිකෙ නයනව අරන් හදාගත්තා මං මේ සේරම දන්නවා."

"ඇත්තට?"

"මං බොරු කියන්නෙ නෑ අයියා – ජනක අයියා" කී ඇ දෑත මගේ ගෙලවටා දැමුවාය. "මං ඔයාගෙ කාමරේට ආවා. හරිනෙ. පිරිත් පොත ගෙනිච්චා. පින්තූරෙ ඉරුවා. තේ එක ගෙනිච්චා හොඳේ."

"මං හිතුවා,"

"එහෙනං අයියා දන්නවා. මං නයනා. සිසිලින්ගෙයි බක්කගෙයි දුව."

"හොඳයි එහෙනං බක්කට මොකද උණේ?"

"බක්කා? බක්කා මැරුණා."

"හොඳයි කොහොමද?"

"බක්කගෙ පැල ගිනි තිබ්බා මිනිස්සු – සිසිලින්ගෙ හොල්මනට බයේ. බක්කා නයනව දුන්නා. ලීලාවතී මැණිකෙට – පස්සෙ බක්කා බයිසිකලෙන් වැටිල... පස්සෙ මැරුණා."



Downloaded from sinhalaebooks.com

"බයිසිකලෙන් වැටිලා?"

"ඔව් ඔයා පදින්නෙ ඒ බයිසිකලේ තමා" කී ඈ යළිත් හිකි හිකි ගෑවාය. "තේරුණානෙ? අපේ වජීරට ආවේස උණේ බක්කා. ඒකනෙ එයා බයිසිකලේ පැද්දෙ."

යම් යම් දේ මට දැන් පැහැදිලි විය. වජීරාට ආරූඪ වූ බක්කා "මේක මගේ" යැයි කීවේ බයිසිකලයට විය යුතුයි. අමරසිරි බංඩාරව බිය වද්දන්නට බයිසිකලයේ හැන්ඩලය මත හිඳගෙන ආවෙත් බක්කාගේ අවතාරයම විය යුතුය. කාමරයේදී බයිසිකලය සෙලවුණේත් සීනුව නාද වුනේත් මේ හේතු නිසා විය හැකිය. නොයෙකුත් මෙවන් දේ මගේ සිතට ගලා එන්නට විය.

"බක්කා නයනට ආදරෙයි. ඒකයි ගෙදරට ඇවිත් හොල්මන් කරන්නෙ. ඒ උනාට ජනකට බක්කා කරදර කරන්නෙ නෑ. ඇයි දන්නවද?"

"ඇයි?"

"ඇයි එයා නයනව බයිසිකලේ තියන් ඉස්කෝලෙ ගෙනියනවනෙ"

"ඒකත් එහෙමයි එහෙනං"

"බක්කා කාටවත් කරදර කරන්නෙ නෑ. බක්කා නයනට ආදරෙයි."

"කෝ එතකොට සිසිලින්?"

"දෙන්නම ඉන්නවා. දෙන්නම ඉන්නව මේ කුඹියන් කැලේ. ඒකනෙ නයනා මෙහේ ආවෙ. නයනට බය නැහැ. කිසිම බයක් නැහැ."

මගේ කුඩය යටින් ආ ගැහැනිය මට සිහිවිය. කන්ද උඩ කුඩයක් ඉහලා සුදු හැඳ සිටි මිනිසා සිහිවිය.

"බක්කයි සිසිලිනුයි දෙන්නම මෙහේ ඉන්නවද නයනා?"

"ඔව්, ඔව්, ඉන්නවා. සැරයක් කිව්වනෙ. තාම සිසිලින් දරු දුකට අඬනවා. නංගි මැරෙන්න කලින් සිසිලින් එහේ ගිහින් ආවා. ජනකගෙ කුඩේ යටින්."

මගේ ඇඟ හිරි ගඩු පිපුණි. "මං දන්නවා." යි මට කියැවිණි.

"බයවෙන්න එපා. බයවෙන්න එපා නයනා ඉන්නවා."

"මේ නංගි මේ අපි දැන් යමු."



Downloaded from sinhalaebooks.com

"ඉතින් අහන්නකො ඉතුරු ටිකත්"

"මොන ඉතුරු ටිකද?"

"බයිසිකලේ බක්කගෙ. දන්නවනෙ?"

"ඔව් මට කිව්වා." ජයසිරි බයිසිකලය කාගේදැයි කල් තියාම දැන සිටින්නට ඇති. එහි කරදරයක් වරදක් නැද්දැයි ඔහු නිතර නිතර විපරම් කළේ ඒ නිසා විය යුතුය. "බයිසිකලේ මං ආපහු දෙනවා."

"ඔව්, ඒක හොඳයි. ඒක ඔතනින් ගෙනියන්ට. අමරසිරිට නං දෙන්න එපා. අමරසිරි නරකයි. අමරසිරි ඕක අරන් ගියා අනෝමාව බලන්න."

"අමරසිරි බංඩාර අනෝමාව බලන්න ගියා?"

"ඔව් අමරසිරි බංඩාර" කී නයනා ඉකි බිඳින්නට වුණාය. "අනෝමාව අමාරුවෙ දැම්මෙ අමරසිරි බංඩාර. ඔයා නෙමෙයි ජනක, ඔයා නෙමෙයි වරදකාරයා. ඒක කියන්නයි අපි මේ ආවෙ."

මගේ දෑසට ද කඳුළු පිරුණි.

"ලැජ්ජාව වහගන්ට අනෝමා ඔයාව වැරදිකාරයා කෙරුවා. ඇයි දන්නවද? අනෝමා ඔයාට ආදරෙයි ඒකයි. ජනක, ඔයාව බඳින්නයි අනෝමට ඕනැ වුණේ. අනේ ඒක හරි ගියෙ නැනෙ ජනක."

"නංගි අපි දැන් යමු නයනා"

"නයනා නෙමෙයි මම අනෝමා" කී නයනා එක්වරම හිඳ හුන් තැනින් නැගිට්ටාය. "මම අනෝමා මං මැරෙන්න නෙමෙයි ඒක බිව්වෙ ජනක. මැරෙන්න නෙමෙයි. දරු ගැබ හැලෙන්න විතරයි. අනේ ජනක, මට සමාවෙන්න ජනක" කී නයනා මගේ ඇඟට හේත්තු වී ඉකිබිඳින්නට වුණාය.

මගේ ගත සිත සියල්ල ගල් ගැසුණි. මා නයනාව බදාගනිත්ම ඈ වෙව්ලන්නට වුණාය. ඒ වෙව්ලිල්ලෙන් මම ද වෙව්ලුවෙමි. මඳ වේලාවක් මෙසේ සලිත වූ ඈ හදිසියේම අප්‍රාණිකව මගේ ග්‍රහණයෙන් මිදී බිම ඇද වැටුණාය.

"නයනා නංගී" යි මා කතා කළ ද ඇගෙන් පිළිතුරක් නොවීය.

මම ඇයව සෙලෙව්වෙමි. දරදඬු වූ ඇගේ අතපය සීතල විය. සඳ එළිය ඔච්චමට මෙන් වලාකුළු අතරින් එබිකම් පෑවාය.



Downloaded from sinhalaebooks.com

"හරි වැඩේනෙ." කියා මා නළලතට අත තැබූ ඇය "රස්නෙයි නේන්නං. ආයෙත් උණ නේද?" කීවාය. "බයිසිකලේ මෙතැන බිම."

"අනේ මන්දා"

"ඔයාට මැලේරියාවද?"

"කොයිකටත් මං අද හෙටම වෙන කොහේට හරි මාරුවක් ගන්නවා." මට කියැවිණි.

ටික වේලාවකින් නයනා දොර රෙද්ද මෑත් කරමින් බැලුවාය. ඇගේ සිනා පිරි මුහුණේ කිසිදු වෙනසක් මට නොපෙනිණි. මා උගත් රහස් ඇයවත් දන්නවාද? අසිහියෙන් සිටි ඇය කිසිවක් දැන ගන්නේ කෙහොමද? ඇගේ නල දත, ඇගේ සිනහව.. ඈ අනික් දරු දෙදෙනාට වඩා කෙතරම් වෙනස්ද? රහස මට හෙළි කළේ නයනා නොව ඇයට ආවේස වූ අනෝමායි.

"අයියා අද මාව බයිසිකලේ එක්කන් යන්නෙ නැ?"

"නෑ නංගි මට සනීප මදි. මං බයිසිකලේ විකුණනවා."

"අනේ එතකොට මම?"

"නංගි පයින් යන්නකො"

"එතකොට අයියා"

මාරුවක් ගෙන යන බව මොන හිතකින් කියන්නද?

"මම දන්නෙ නැ නංගි. මං සේරටම ඉස්සරවෙලා සනීප වෙලා ඉන්න ඕනැ "කියූ මම හිස සිට රෙදි කඩ පොරවා ගත්තෙමි.



Downloaded from sinhalaebooks.com

## 22

ඊළඟ මාසයේ කෙසේ හෝ මාරුව හදාගත් මම හෝමාගම ශාඛාවට පත්වීමක් ලැබුවෙමි. කොළඹ නොවූවද ගෙදර සිට දිනපතා වැඩට යාමේ හැකියාව මෙයින් මට ලැබිණි. බයිසිකලය යළිත් ඇඩ්ඩින්ටම බාරදී, මා හඬරවැවට ආයුබෝවන් කියද්දී ලීලාවතී මැණිකේ මෙන්ම දරු තිදෙනා ද කඳුළු සැලූවෝය. ඔවුන් හැරදා ඒම හිතට වේදනාකර වුවද ඒ පරිසරයෙන් මිදීම සිතට සැහැල්ලුවක්ම විය. එහි වූ අප්‍රසන්න මතකයන් තවමත් මගේ සිතට යම් තරමකින් වද දුන්නේය.

මේ කතන්දරයේ ප්‍රහේළිකාවේ ඉතිරි කොටස් මා පැහුවේ හෝමාගම වැඩ කරද්දීය. අපේ කාර්යාලය පසුපස හිස් ඉඩමක් වෙයි. දිනක් ඒ පැත්තේ කවුළුවෙන් බලද්දී එතැන කූඩාරමක් ඉදිවෙනු මට පෙනිණි.

මට දෙනෙත් අදහාගත නොහැකි විය. කූඩාරම ඉදි කරමින් සිටියේ අන් කිසිවකුත් නොව නිලම්මා හා කරුපන්ය. ඔවුන්ගේ අත් උදව්වට මෙන් තවත් තරුණ ගැහැනියකුත් සිටියාය.

මගේ කුතුහලය දැඩි විය. එදා හවස වැඩ අවසන් කළ සැණෙන් මම එහි ඇවිද ගියෙමි. කූඩාරම් දොරකඩ සිටි යුවතිය මා දැක මහමින් සිටි රෙදි කඩ හකුලා ගෙන කූඩාරම තුළට ගියාය. තව මොහොතකින් නිලම්මා එතැන දිස්වුණාය.

"මාතියා?"

Downloaded from sinhalaebooks.com

"මාව මතක ද නිලම්මා?"

"මේ නුවර මාතියානේ?"

"ඔව්, ඔව්, නිලම්මා"

"මාතියා මේ කෝද?"

"මං අර බැංකුවෙ දැන් වැඩ කරන්නෙ"

"ආ!"

"කෝ කරුපන්?"

"ඕන් ඇවිදින්ට ගියා. එයා බෙන්දා මාතියා. "දොරකඩ බලා සිටි යුවතිය බිම බලා කොමළ සිනාවක් පෑවාය. "මේ එයාගෙ ගේනි. මහෙස්වරි."

"ආ ෂෝක්නෙ..."

"මාතියා එන්ට යමු අරේට කියාන්ට" කියමින් නිලම්මා කුඩාරමෙන් ඈතට ඇවිද යන්ට වුණාය.

"මොකද්ද නිලම්මා?"

"මාතියා මේ අම්බුවෙච්චි එක දෙයියො තමා එච්චා. අර නෝනා පාවම්. ඒ නෝනා මෙරුණා නේ?"

"අනෝමා?"

"ඔව් මාතියා ෂාඃ යෂ නෝනා. මං ළඟට තමා ආවා කීප සෙරේ. මං සාත්තරේ පලාලා කීවා ඕක තමා සිද්ධ වෙනවා. මං කීවා අපල තමා තීනවා. මාරකේ තමා තීනවා."

"ඒ නෝනා ආවා මාතියා මා ගාවට මාතියාට දෙන්ට ඉනා ඉල්ලුවා. මං ගාව එච්චා නෑ මාතියා. ඒ ගාවට මාතියා මා ගාවට ආවා මාතියා ඒ නෝනා ඒ ගෙදර අනිත් නෝනාට විනයක් කුරාන්ට කියලා."

"වජිරා නෝනට?"

"ෂරි ෂරි වජිරා නෝනාට වින කරන්ට තමා කිච්චා. මං බේ කිච්ච මාතියා. එතකොට තමා අර කට්ටඩියා ඒක කළා."

"වියෝතිස්"



Downloaded from sinhalaebooks.com

"ඔව් ඔව් මාතියා හවස එවිත් තුල දාලා තමා ගියා. කරුපත් දැක්කා මාතියා. ඒ උනාට අපි කියාන්ට ගියේ නේ. අර පොඩි මාතියා හරි වසායි නෙ මාතියා."

එදා සවස වියෝනිස් වත්තෙන් පිටව ගිය හැටිත්, ඒ රෑ වජිරා රෝගී වූ සැටිත් මට දැන් සිහිවිය.

"ඊගාවට මාතියා ඒ මූතියාම ඇවිත් ඒක කපල අරාන් දෙම්මා. දෙපෙත්තෙන්ම ෂල්ලි ගත්තා නෙ මාතියා."

මම අවිශ්වාසයෙන් අසා සිටියෙමි. ටිකිරි බංඩා සමග ගිරාඹේ ගුරුන්නාන්සේ වෙත ගිය විට ඔහු කී දෙයක් මට සිහිපත් විය. "මේ දැන් පේන හැටියට මෙතැන්ට මේ ළඟදි තව විනයක් වෙලා තියෙන්නෙ. ලාභ පොරෝජන බලාපොරොත්තුවෙන් කරපු දෙයක්. මහත්තයගෙ හිත ගන්නත් එක්ක සේරම නොපිටට පෙරළලා. ළමයෙක් ඉන්නවද දිස්ටිය වැහිලා...?" ගිරාඹේ ගුරුන්නාන්සේ කී දෙය කෙතරම් සත්‍යද? ලාභ ප්‍රයෝජන බලාපොරොත්තු වුණේ අනෝමා පමණක් නොවේ. වියෝනිස් ද ඒ සියල්ල කළේ ලාභ ප්‍රයෝජන බලාපොරොත්තුවෙනි. "දන්න විදියට කොරල බලන්න, බැරි උනොත් මා ළඟට එන්නකො" යැයි ගිරාඹේ ගුරුන්නාන්සේ කීවේ සියල්ල අඳුනෙන් දැකලා නොවේද?

නීලම්මා වුවද සියල්ල දැනගෙන තිහඬ වන රැක්කේ අමරසිරි බංඩාරගේ උඩඟු කමට එරෙහිව යා නොහැකි බැවිනි.

"මාතියා ඔව්ව දෙන් කල්පනා කොරල පලාක් නේ. අන්තිමේ අර නෝනා ළමයා නැති කොරන්ංට මා ළඟට ආවා මාතියා. මගෙන් බේත් තමා ඉල්ලුවා. මං දුන්නෙ නේ මාතියා. එව්වගෙ දේ මං කොරන්නෙ නේ. පජ්ජෙ මටාත් බෙනල තමා ගියා. කන්ද පල්ලෙහා අර පොඩි මාතියා පයිසිකලේ තියාන් හිටියා. මං දැක්කා මාතියා. දෙන්නම ඒ පාර ගියා හබරවෙව හන්දියට. ඒ රෑ තමා නෝනා බෙහෙත විෂ වෙලා මෙරුණා."

අනෝමාගේ මරණයට වගකිව යුත්තා අමරසිරි බංඩාරම නොවේද? ඔහු සියල්ල කරා ගැලවී ගියේ කොතරම් සූක්ෂම අයුරින්ද? හැම විටම ඔහු හඬ නඟා වරද පැටවූයේ වෙන කෙනකු මතයි. එවන් මිනිසුන් තව කොතෙක් මෙලොව ඇද්ද? නීලම්මා සේ සියල්ල දැනගෙන නිහඬවත රකිනවුන් කී දෙනෙක් තව මොලොව ඇද්ද?



Downloaded from sinhalaebooks.com

"මාතියා මාතියාට දැන් දෝෂ නැනෙ මාතියා?"

"නෑ, නෑ, එහෙන් ආවට පස්සෙ මට සේරම හරි."

"ඒ භූමි හොඳ නෑ මාතියා. කෂඩ භූමි. සාස්තරේ තමා කියනවා. අපි එක තෙන ඉන්නෙ නැතේ මාතියා. ඒක තමා."

"පෙරළෙන ගලෙහි පාසි නොබැඳේ" යන කියමන මට සිහිවිය. පලින් පල යන නීලම්මා – කරුපන් වැනි උදවිය කොයිතරම් නිදහස්ද? ඇගේ දැනුමෙන් මා කොතරම් පෝෂිත වීද?

"මාතියා මාතියාට බැල්ම දැම්මෙ බෝදිලිමා නෙමේ මාතියා. අර නෝනා. එයාගෙ හිත තමා මාතියාව එලෝගෙන ආවා. මූණ සීරුවා නේ?"

"ඔව්, ඔව් දැන් ඒවා සේරම හරි."

"ඒක තමා. ඒ නෝනාගෙ මාරකේ මං දැක්කා මාතියා. මං කිව්වා මාතියා. මං කිව්වා එතැනින් යන්ට කියා. ඇව්වෙ නෑ මාතියා – කරුමේ මාතියා."

"ඒක තමා නීලම්මා කරුම වෙනස් කරන්ඩ බෑ."

"හිත තමා මාතියා හිත" නීලම්මා පපුවට තට්ටු කර ගත්තාය.

කරුවල වැටී ගෙන ආ හෙයින් ගෙදර යා යුතු බව මම කීවෙමි.

කූඩාරමට ආපසු එමින් සිටි කරුපන් මා හා සිනාසුණේය. ඔහුගේ කරේ වඳුරා සිටියේය.

"මාතියා!"

"කරුපන්ට මාව මතකද?"

"නැතුව මාතියා. යන්නං මාතියා" කියා බයාදුව හිස නැමූ ඔහු කූඩාරමට ළංවිය. මහේස්වරී පිටතට ඇවිත් වඳුරා වඩා ගත්තාය. ඔවුන් යම් යම් දේ දොඩමින් කූඩාරම ළඟ රැඳෙද්දී මම නීලම්මාට ආයුබෝවන් කියා පාර අතට ආවෙමි.

මුඩු ඉඩම කෙළවර මට දැසක් මුණ ගැසිණි. මා දෙස ඔරවා ගත් ගමන් බලා සිටියේ කටුස්සෙකි. මා ගල් කැටයක් ඔසවා විසි කරත්ම උඟ වියළි පඳුරු අතර දුව යමින් සැඟවුණේය.

උඟ බයවුණේ මටයි. මා උඟට බියවිය යුතු නොවේ යන දැඩි සිතුවිල්ලකින් මම පාරට ආවෙමි. බොහෝ කලකට පසු සැහැල්ලුවෙන් හුස්මක් හෙළන්නට මට හැකි විය.



Downloaded from sinhalaebooks.com

හදප් මහින්ද ජයතිලක ලියූ
භයානක රසය දනවන
තුන් ඈඳුතු නවකතාවෙහි දෙවැන්න
මෙතෙකින් නිමා වෙයි.

1997 ජනවාරි 3 සිකුරාදා

භයානක රසය දනවන නවකතා ත්‍රිත්වයේ
තුන්වැන්න
දුර කඳු මත අකුණු
බලාපොරොත්තු වන්න.

තුන් ඈඳුතු නවකතාවෙහි
පළමුවැන්න
සඳ වියරුව
මිල රු. 150.00
සර්වෝදය විශ්ව ලේඛා ප්‍රකාශකයෝ
නමින් මුදල් ඇණවුමක් එවන්න.
**ගෙවන කාර්යාලය: ගල්කිස්ස**

වෙක්පත් සර්වෝදය විශ්ව ලේඛා ප්‍රකාශකයෝ නමින් ලියන්න.
ලිපිනය
**කළමනාකාර – ප්‍රකාශන**
**සර්වෝදය විශ්ව ලේඛා**
**41 ලුම්බිනි මාවත රත්මලාන**
**ටෙලි: 71 4820 71 4829 ෆැක්ස් 738932**

තැපැල් ගාස්තු අය නොකරමු

Downloaded from sinhalaebooks.com

# හදුපී

## මහින්ද ජයතිලක

# බෝදිලිමාගේ සාපය



"කවුදෝ ඉදිරියෙන් ඇවිද යනු යන්තමට පෙනිණි. සෙමින් ගමන් කරන කුඩා රුවකි. සුදු සාරියක් දවටා ගත් ගැහැනියකි. ඇගේ අතක පන් මල්ලකි. මේ රෑ තනිව තනියමේ ගැහැනියක් කොහේ යනවාද? මගේ සිත අදි මදි කරන්නට විය. ඇයව පසුකර යනවාද? නැත්නම් ඇයට යන්නට හැර හෙමින් යනවාද?

ඉදිරියෙන් යන රුව ඉතාම සෙමිනි ගමන් ගත්තේ. හිත දැඩි කරගත් මම ඒ අතට විදුලි පන්දම යොමු කරමින් වන්නක් වේවායි අඩිය ඉක්මන් කළෙමි.

ගැහැනියක් තමා. මැදිවියට ළංවූ ගැහැනියක් .

"තව පොඩ්ඩ දුරයි මහත්තයා"

මා යමක් කියන්නටත් පෙර ඈ කතා කළාය.

"කොහේ යනවද?"

"අර කන්දට"

"මං තව ටිකක් දුර යන්න ඕනෑ. තෙමෙනවනෙ...

එන්න කුඩේ යටට."

"අනේ පින් සිද්ධ වෙනව මහත්තයා"

ඈ කුඩයේ සෙවනට ආවාය.

"කොහේ ගියාද?"

"නුවර ගියා නංගි බලාලා එන්ඩ. පැනිදෙනියෙ. සනීප මදි, මහත්තය ඉතින් පරිස්සමෙන් යන්න. මං මෙතනින් උඩහට යනවා."

"ඔය අහ ගෙවල් තියෙනවයැ."

"මොකෝ නැත්තෙ මහත්තයා?" ඈ බොල් හඬින් සිනාසුණාය.

එක්වනම ඈ කුඩයේ සෙවනෙන් ඈත්ව දකුණට වූ කන්ද නගින්නට වූවාය. ඈ නැංගා නොව පියැඹුවා කියායි මට සිතුණේ. එතරම්ම කඩිනමකින් ඈ මානා පඳුරු අතරින් උඩට නැංගාය.

මම ඒ අතට විදුලි පන්දම යොමු කෙළෙමි. කන්ද මදක් දුර තවත් කවුදෝ බලා සිටී. ඔහු කළු කුඩයක් ඉහළාගෙන සිටින බව පෙනිණි. ගැහැනිය ඒ කුඩය යටට රිංගුවාය.

ඊළඟ මොහොතේ මට කවුදෝ සිනාසෙන්නාක් සේ ඇසිණි.

සිතේ බියක් මතුවෙන්නට විය. ඉතිපිසෝ ගාථාව මුමුණමින් මම දුවන්නට වූයෙමි.

*Cover designed by Priyantha Colombage*
*A Sarvodaya Vishva Lekha Publication*
*Ratmalana: Sri Lanka - 1999*

**ISBN 955-599-135-9**

**මිල රු. 175.00**

VISHVA LEKHA
Printers

Downloaded from sinhalaebooks.com